# ළමා වෙළඳාම හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්ය සංග්‍රහය සහ මෙවලම්

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# ළමා වෙළඳාම හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්ය සංග්‍රහය සහ මෙවලම්

දෙසැම්බර් 2020

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# ළමා වෙළඳාම හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්ය සංග්‍රහය සහ මෙවලම්


ප්‍රකාශනය

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
නො 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර

ප්‍රථම මුද්‍රණය 2020

ISBN 978-955-1417-31-4

පුහුණු විෂය මාලාව සැකසීම සඳහා සහයෝගිතාවය

මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය
කොළඹ විශ්වවිද්‍යාලය

පුහුණු විෂය මාලාව සැකසීම සඳහා මුල්‍යමය දායකත්වය

Save the Children

මුද්‍රණය
Print Zone ආයතනය
Tel: 0112-888355

**මග පෙන්වීම**

- මහාචාර්ය මුදිත විදානපතිරණ, සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- නීතිඥ සුජාතා අලහප්පෙරුම, නියෝජ්‍ය සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- අනෝමා සිරිවර්ධන, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**උපදේශන කමිටුව**

- මහාචාර්ය වසන්තා සෙනෙවිරත්න, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
  (අධ්‍යක්ෂ, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්වවිද්‍යාලය)
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මොහොමඩ් හකීම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්වවිද්‍යාලය
- හිටපු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ශාර්යා ස්කානිවල්, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
  (හිටපු අධ්‍යක්ෂ, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්වවිද්‍යාලය)
- ආචාර්ය එන්. රෝස් විජේසේකර,නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ ශර්මිලා ඇන්තනි පෙරේරා, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ චන්ද්‍රිකා කරුණාරත්න, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
- නීතිවේදී ශානිකා මලල්ගොඩ, අධ්‍යක්ෂ (සැලසුම් හා තොරතුරු), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- නීතිඥ ප්‍රීතිකා සකලසූරිය, සහකාර අධ්‍යක්ෂ (නීති), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- නීතිඥ යශාලි අබේසුන්දර, හිටපු සහකාර අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) , ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**තාක්ෂණික ඇගයීමේ කමිටුව**

- නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්, නීතිපති දෙපාර්තමේන්තුව
- වෛද්‍ය අයේෂා ලොකුබාලසූරිය, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය විශේෂඥ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය
- එම්.ආර්.ලතීෆ්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, විශේෂ කාර්යබලකා මූලස්ථානය
- ඒ.ආර්.පී.සී. උදයකුමාර, අපරාධ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

**මොඩියුල ලේඛකයින්**

- නීතිඥ උදානි ගම්මන්පිල, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ ශර්මිලා ඇන්තනි, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- රජයේ නීතිඥ යෝදනී සෙල්වනාතන්, නීතිපති දෙපාර්තමේන්තුව
- නීතිඥ කුශාංගිකා නවරත්න , මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්වවිද්‍යාලය
- රජයේ නීතිඥ එම්. එච්. ආර්. එච්. රණසිංහ, නීතිපති දෙපාර්තමේන්තුව

### පරිවර්තනය සහ පරිගණකගත කිරීම

- නීතිඥ චතුරිකා අකුරගොඩ, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ තිළිණි ගලප්පත්ති, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- බී. ඒ සුනේත්‍රා, හිටපු ව්‍යාපෘති සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.
- සුමුදු විජේසූරිය, ව්‍යාපෘති සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.
- නීතිඥ කුසල් කාවින්ද අමරසිංහ, සහාය සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.
- නීතිඥ සියාසා ජොහර්දීන්, සහාය සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.

### සමාලෝචනය

- නීතිඥ ශර්මිලා ඇන්තිනි පෙරේරා, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය රෝස් විජේසේකර, ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ උදානි ගම්මන්පිල, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

### සංස්කාරක

- මහාචාර්ය වසන්තා සෙනෙවිරත්න, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

### සහය සංස්කරණය

- බී. ඒ සුනේත්‍රා, හිටපු ව්‍යාපෘති සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.
- නීතිඥ ලේඛා හේරත් ව්‍යාපෘති සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.

### ව්‍යාපෘතිය සම්බන්ධීකරණය

- නීතිවේදී ශානිකා මලල්ගොඩ, අධ්‍යක්ෂ (සැලසුම් හා තොරතුරු), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- නීතිඥ ප්‍රීතිකා සකලසූරිය, සහකාර අධ්‍යක්ෂ (නීති), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**පිටකවර නිර්මාණය** : බුද්ධිනී අනුරාධා සෙනෙවිරත්න, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**සැකැස්ම** : තිළිණි චන්ද්‍රසේකර, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.

**පරිගණක සැකසුම** : මහේෂා අබේවික්‍රම

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය



*'ළමා වෙළඳාම හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්ය භාවිතාව හා මෙවලම් ' යන මැයෙන් රචිත මෙම පුහුණු අත්පොත ළමා වෙළඳාමට එරෙහි ව කටයුතු කරන පාර්ශවයන්ගේ දැනුම හා කුසලතා ඉහළ නැංවීමේ අරමුණින් සම්පාදනය කරන ලද්දකි .*

ගෝලීය වශයෙන් දැඩි අවධානයට යොමු ව ඇති මෙම සංකීර්ණ හා අදෘශ්‍යමාන සමාජ ගැටලුව කිසියම් ජන සමාජයක ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් එකිනෙක ගෙතුණු සාධක රාශියක් හේතුවෙන් පැන නඟී. ළමා ආරක්ෂණ ක්ෂේත්‍රය ද ඇතුළුව සමස්ත ජන සමාජය කෙරෙහි මෙමඟින් ඇති කෙරෙන බලපෑම් විනාශකාරී වේ. මෙම සංකීර්ණ අභියෝගයට එරෙහි ව සටන් කිරීමට අවශ්‍ය දැනුම හා පරිචය නිලධාරීන් වෙත ලඟා කර දීම අත්‍යවශ්‍ය බව මාගේ විශ්වාසයයි.

මෙම පුහුණු අත්පොත මගින් ළමා වෙළඳාම හා බැඳුණු මූලික සංකල්ප, එම සංසිද්ධිය ඇතිවීමට බලපාන සාධක හා එය ක්‍රියාත්මක වන ආකාර, එම ගැටලුවේ ප්‍රතිඵල, ඊට අදාළ ජාත්‍යන්තර නීති, සම්මුතීන්, දේශීය නීතිය මෙන් ම සමාජය හා පුරවැසියාගේ වගකීම් හා බැඳීම් යනාදි මාතෘකා පිළිබඳ ව ගැඹුරින් සාකච්ඡා කරනු ලැබේ. ඊට අදාළ පුහුණු කටයුතු සඳහා භාවිත කළ හැකි සිද්ධි අධ්‍යයන, අභ්‍යාස හා ඉගෙනුම් කාර්යය යනාදි පුහුණු මෙවලම් ද මෙහි අන්තර්ගත ය.

ළමා වෙළඳාමට එරෙහි පරිශ්‍රමයන්හි නිරත නිලධාරීන්ගේ දැනුවත්භාවයට මෙන් ම ඔවුන් විසින් මෙහෙයවනු ලබන පුහුණු කාර්යයන්හි දී පුහුණු මාර්ගෝපදේශයක් වශයෙන් ද මෙම සාරගර්භ පුහුණු අත්පොත භාවිත කළ හැකි ය. ළමා වෙළඳාම යන ගැටලුව ළමා ආරක්ෂණය සමඟ දැඩි ලෙස සම්බන්ධිත ය. මෙම අත්පොත මගින් ළමා ආරක්ෂණයෙහි නියැලී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්හට ඔවුන්ගේ දැනුම් පරාසයන් ඉහල නංවා ගනිමින් ස්වකීය දැනුවත් කිරීම් ඔස්සේ පොදු ජන සමාජය සවිබල ගැන්වීමේ ඉඩ ප්‍රස්ථා ද පුළුල් වනු ඇත.

ශ්‍රී ලංකාවේ දරුවන්හට සුරක්ෂිත අනාගතයක් උදා කරලීමේ අරමුණින් සිදු කළ මෙම මහඟු වෑයම යථාර්ථයක් බවට පත්කරලීම උදෙසා නන් අයුරින් සහාය දැක්වූ සියලුම නිලධාරීන් හා ආයතන වෙත මාගේ ගෞරව පූර්වක ස්තුතිය පළ කර සිටිමි.


මහාචාර්ය මුදිත විදානපතිරණ

MBBS (Col), DLM (Col), MD (Col), MA (SJP), FFFLM (UK)

සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# විධායක සාරාංශය

ළමා වෙළඳාම හඳුනාගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාවල ඉගෙනුම් කාර්යය සංග්‍රහය සහ මෙවලම් අත්පොත සැකසීමේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අරමුණ වන්නේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිළධාරීන් ඇතුළු නීතිය බලාත්මක කරන නිළධාරීන් සහ ළමයින් සමඟ සෘජුව කටයුතු කරන රජයේ නිළධාරීන්ගේ දැනුම සහ ශක්‍යතා වර්ධනය කිරීමයි.

එසේම මෙම අත්පොත ළමා වෙළඳාම පිළිබඳ සිද්ධි හඳුනාගැනීම, වින්දිතයන් ආරක්ෂා කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා නීතිය බලාත්මක කරන නිළධාරීන් විසින් ගතයුතු පියවර පිළිබඳවද දැනුම ලබා දීමට සකසා ඇත.

# පටුන


| මොඩියුල අංකය | මොඩියුලයේ නම හා අන්තර්ගතය | පිටු අංකය |
|---|---|---|
| | | |
| 1 | **මූලික සංකල්ප හඳුනා ගැනීම** | |
| | 1.1 මානව හිමිකම් සහ ළමා අයිතිවාසිකම් අවබෝධ කර ගැනීම | 11-14 |
| | 1.2 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ මාර්ගෝපදේශක මූලධර්ම | 15-16 |
| | 1.3 ළමා අයිතිවාසිකම් | 16-17 |
| | 1.4 සමාප්තිය | 18 |
| | **ඉගෙනුම් මෙවලම් (18,19,20)** | |
| | | |
| 2 | **ළමා වෙළඳාම හා එහි මූල හේතු හඳුනාගැනීම** | |
| | **a. ළමා වෙළඳාම හඳුනාගැනීම** | 21 |
| | 2.1 තැනැත්තන් වෙළඳාම | 21-23 |
| | 2.2 මිනිස් ජාවාරම | 23-27 |
| | 2.3 නීති විරෝධී සංක්‍රමණය | 27-28 |
| | 2.4 අපහරණය | 28-29 |
| | 2.5 පැහැරගෙන යාම | 29-30 |
| | 2.6 වහල්භාවය | 31-33 |
| | **b. ළමා වෙළඳාමට තල්ලු කරනා සහ ඇදගන්නා සාධක** | 33-35 |
| | **c. වෙළදාම සිදුකරන්නන්** | 35 |
| | 2.7 ලිංගික සූරාකෑම/ කාමුක දර්ශන | 35-37 |
| | 2.8 ශ්‍රම හෝ ආර්ථීක සූරාකෑම | 37-39 |
| | 2.9 ළමා සොල්දාදුවන් | 39-40 |
| | 2.10 අවයව ඉවත් කිරීම සඳහා පුද්ගලයින් වෙළඳාම් කිරීම | 40-41 |
| | 2.11 දරුකමට හදා ගැනීම | 41-42 |
| | 2.12 විවාහය | 42-44 |
| | **ඉගෙනුම් මෙවලම් (23,25,34,44)** | |
| | | |
| 3 | **සැකැස්ම, අරමුණ සහ ප්‍රතිඵලය** | |
| | 3.1 දරුවන් වෙළදාම් කිරිම සිදු වන්නේ කෙසේද | 45-47 |
| | 3.2 වෙළදාම සිදුවන ප්‍රධාන ආකාර | 47-51 |
| | 3.3 වෙළදාම හා සම්බන්ධ අපරාධ වරදවල් - පූර්ව වෙළදාම් අවස්ථාව/වරදවල් සංයුක්තකරණය | 51-53 |
| | 3.4 වෙළඳාමේ ඵල විපාක | 53-56 |
| | **ඉගෙනුම් මෙවලම් (57,58)** | |
| | | |


| | | |
|---|---|---|
| 4 | **මූලධර්ම රාමුව සහ අදාල සෙසු ලේඛන** | |
| | *a.* **අන්තර්ජාතික නෛතික රාමුව** | 59 |
| | 4.1 ශ්‍රී ලංකාව විසින් ළමුන් වෙළදාම් කිරීමට අදාල ලේඛන අපරානුමත කිරීමේහි ලා වන තත්ත්වය | 59-60 |
| | 4.2 පැලමෝර් සංධානය යනු | 60-62 |
| | 4.3 ළමා අයිතිවාසිකම් සහ ළමුන් වෙළදාම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සෙසු අන්තර්ජාතික ලේඛන | 63 |
| | 4.4 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය | 64 |
| | 4.5 කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (1979) (CEDAW) | 64-66 |
| | 4.6 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ එහි සංධානයන් | 66-68 |
| | 4.7 තැනැත්තන් වෙළදාම් කිරීම සහ වෙනත් අය වෛශ්‍ය වෘත්තියෙහි යොදවා සූරාකෑම වැළැක්වීම මර්දනය කිරීම සඳහා වන එ.ජා සම්මුතිය (1949) | 68-69 |
| | 4.8 බලහත්කාරයෙන් සේවයේ යෙදවීමට අදාල අන්තර් ජාතික කම්කරු සංවිධානයේ සම්මුතීන් | 70-72 |
| | 4.9 1966 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබද අන්තර්ජාතික සම්මුතිය | 72 |
| | 4.10 විදේශගත ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (1990) (විදේශගත ශ්‍රමිකයින් පිළිබඳ සම්මුතිය) | 72-73 |
| | 4.11 අන්තර්ජාතික මාර්ගෝපදේශ සහ මූලධර්ම | 73-76 |
| | *b.* **කලාපීය නෛතික රාමුව** | 76 |
| | 4.12 සාර්ක් සම්මුතිය පැහැදිලි කිරීම | 76-81 |
| | 4.13 තැනැත්තන් වෙළදාම් කිරීමට අදාල සෙසු කලාපීය ලේඛන | 82 |
| | **ඉගෙනුම් මෙවලම් (73,80)** | |
| | | |
| 5 | **දේශීය නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව** | |
| | 5.1 ළමුන් වෙළෙඳාම් කිරීම සම්බන්ධ දේශීය නීති සහ ප්‍රතිපත්ති | 83-85 |
| | 5.2 ළමුන් ද ඇතුලත්ව තැනැත්තන් වෙළෙඳාම් කිරීම | 86 |
| | 5.2.1 2006 අංක 16 දරන දණ්ඩනීති සංග්‍රහ සංශෝධන පනත - 360(ඇ) (1) වගන්තිය | 86-88 |
| | 5.2.2 2005 අංක 30 දරණ ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීමේ සම්මුති පනත (SAARC- සාක් සම්මුතිය) | 88-89 |
| | 5.2.3 තැනැත්තන් වෙළෙඳාම් කිරීම සම්බන්ධව දණ්ඩ නීති සංග්‍රහයේ වෙනත් විධිවිධාන | 90-96 |
| | 5.2.4 ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ අනෙකුත් නීතින් | 96-101 |
| | 5.3 ප්‍රතිකර්ම යාන්ත්‍රණ | 101-103 |
| | **ඉගෙනුම් මෙවලම් (89)** | |
| | | |
| 6 | **වගකීම් සහ බැඳීම්** | |
| | **a. සහභාගීත්වය, වළක්වා ගැනීම, ආරක්ෂණය, ප්‍රවර්ධනය හා පුනරුත්ථාපනය/ නැවත එක්කිරීම** | 105 |
| | 6.1 හැඳින්වීම | 105-107 |
| | 6.2 ළමා වෙළඳාම වැළැක්වීම සඳහා වූ වගකීම | 107-110 |
| | 6.3 වෙළඳාමට හසු වූ ළමා වින්දිතයන් ආරක්ෂාකර ගැනීම සඳහා වන වගකීම | 110-112 |
| | 6.4 ළමා වෙළඳාමේ වින්දිතයන් පුනරුත්ථාපනය කිරීම හා නැවත සමාජය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා වූ වගකීම | 112 |

| | | |
|---|---|---|
| | 6.5 සහභාගීත්ව සහ අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයක් යොදා ගැනීමේ වගකීම | 112-113 |
| | 6.6 ළමා වෙළඳාම් විරෝධීබව ප්‍රවර්ධනය සහ නැවත සමාජගත කිරීමට වන වගකීම | 113 |
| | 6.7 නිගමනය | 113 |
| | **ඉගෙනුම් මෙවලම් (113,114)** | |
| | | |
| 7 | **තොරතුරු සමග ගනුදෙනු කිරීම** | |
| | **තොරතුරු ලබා ගැනීම, වාර්තා තබා ගැනීම, වාර්තා කිරීම සහ බෙදා හැරීම** | 115 |
| | 7.1 මිනිස් වෙළඳාම සම්බන්ධ ශ්‍රී ලංකා නීතිය | 115-119 |
| | 7.2 තොරතුරු ලබා ගැනීම | 119-121 |
| | 7.3 තොරතුරු පටිගත කිරීම | 124 |
| | 7.4 තොරතුරු වාර්තා කිරීම සහ බෙදා හැරීම | 125-128 |
| | 7.5 වගකිවයුතු වාර්තාකරණය සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා මාධ්‍යයේ කාර්යභාරය | 128-129 |
| | **ඉගෙනුම් මෙවලම් (119,122,123,125,129)** | |

# පළමු මොඩියුලය

| මූලික සංකල්ප හඳුනා ගැනීම | | |
|---|---|---|
| | දේශන පැය ගණන | 2 |
| | ඇගයීම් ක්‍රමවේදය | පන්තිකාමර සාකච්ඡා |
| | අධ්‍යයන අරමුණු | මෙම ඒකකය අවසානයේ දී සහභාගීවන්නන්ට:<br>➢ මානව හිමිකම් පිළිබඳ මූලික සංකල්ප හා ලක්ෂණ විස්තර කිරීමට<br>➢ ප්‍රධාන මානව හිමිකම් ලේඛන නම් කිරීමට<br>➢ ළමා අයිතිවාසිකම් සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (CRC) මාර්ගෝපදේශක මූලධර්ම විස්තර කිරීමට සහ<br>➢ ළමා වෙළඳාම යනු ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස අවබෝධ කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. |

## අ. මානව හිමිකම් හා ළමා අයිතිවාසිකම් පිළිබඳ සංකල්ප හඳුනාගැනීම




මූලාශය : http://leher.org/campaigns/infographics/human-rights-day/



## 1.1 මානව හිමිකම් සහ ළමා අයිතිවාසිකම් අවබෝධ කර ගැනීම

### 1.1.1 මානව අයිතිවාසිකම් පිළිබඳ හැඳින්වීමක්

මානව හිමිකම් යන්නට මිනිසුන් ලෙස ගෞරවාන්විතව ජීවත් වීමට අවශ්‍ය සදාචාරාත්මක හිමිකම්, සම්මතයන් සහ ප්‍රමිතීන් ඇතුළත් වේ. අද මානව හිමිකම් හඳුනාගෙන ඇත්තේ; "සියලුම මිනිසුන්ට ඔවුන්ගේ ජාතිකත්වය, පදිංචි ස්ථානය, ස්ත්‍රී පුරුෂ භාවය, ජාතික හෝ ජනවාර්ගික සම්භවය, වර්ණය, ආගම, භාෂාව හෝ වෙනත් ඕනෑම තත්ත්වයක් නොසලකා හිමිවන අයිතිවාසිකම්"[1] ලෙස ය. කිසිදු වෙනස්කමකින් තොරව මානව හිමිකම් භුක්ති විඳීමට සියලු ම මිනිසුන්ට සමාන අයිතියක් ඇත.

අන්තර්ජාතික සම්මුති නීතිය මානව හිමිකම්වල පවතින රාජ්‍යයන් සම්බන්ධයෙන් වන බන්ධනීය ස්වභාවය පිළිගනී. මානව හිමිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය පහත සඳහන් ලේඛන පහෙන් සමන්විත "අන්තර්ජාතික මානව හිමිකම් ලේඛනය" සම්මත කළේ ය.

1) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) (1948)
2) ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICESCR) (1966)
3) සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR) (1966)
4) සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ වෛකල්පිත සංධානය
5) මරණීය දණ්ඩනය අහෝසි කිරීම අරමුණු කරගත් සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ දෙවන වෛකල්පිත සංධානය.

1948 දෙසැම්බර් 10 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) සම්මත කරන ලද අතර එහි පළමු ව්‍යවස්ථාව ප්‍රකාශ කරන්නේ "සියලු මනුෂ්‍යයෝ නිදහස්ව උපත ලබා ඇති අතර ගරුත්වයෙන් හා අයිතිවාසිකම්වලින් සමාන වෙති" යනුවෙනි.

### 1.1.2 මානව හිමිකම්වල මූලික ලක්ෂණ

මානව හිමිකම්වල මූලික ලක්ෂණ පහත පරිදි වේ. මානව හිමිකම්[2];

- **සහජයෙන් ම හිමි වූ අයිතිවාසිකම් වේ (Inherent)** - මානව හිමිකම් සහජයෙන් ම හිමි වූ අයිතිවාසිකම් ලෙස සැලකෙනුයේ ඒවා කිසිදු පුද්ගලයෙකු හෝ අධිකාරියක් විසින් ලබා දී නොමැති බැවිනි. මිනිසාට මානව හිමිකම් ලැබෙන්නේ ඔවුන් මනුෂ්‍යයන් නිසා ම ය.
- **අන්සතු කළ නොහැකි වේ (Inalienable)** - මානව අයිතිවාසිකම් මිනිසුන්ට අයිති බැවින් ඒවා අන්සතු කිරීමට හෝ අහිමි කිරීමට නොහැකි අතර ඒවා ලබා දීමට හෝ උදුරා ගැනීමට ද නොහැකි ය.
- **වෙන් කළ නොහැකි වේ (Indivisible)** - මානව හිමිකම් වෙන් කළ නොහැකි ය. මානව හිමිකම් බෙදීමට හැකියාවක් නැත. සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජීය හෝ සංස්කෘතික අයිතිවාසිකම් වේවා සියලු මානව හිමිකම් සෑම පුද්ගලයෙකුගේම ගරුත්වයට ආවේණික ය.
- **එකිනෙක හා රඳාපවතින අතර එකිනෙක හා සම්බන්ධ වේ (Interdependent and Interrelated)** - මානව හිමිකම් එකිනෙක හා රඳාපවතින අතර එකිනෙක හා සම්බන්ධ වේ. සෑම අයිතිවාසිකමක් ම ඔහුගේ හෝ ඇයගේ සංවර්ධනාත්මක, ශාරීරික, මානසික හා අධ්‍යාත්මික අවශ්‍යතා තෘප්තිමත් කිරීම තුළින් මානව ගරුත්වය සාක්ෂාත් කර ගැනීමට දායක වේ.
- **විශ්වීය වේ (Universal)** - මානව හිමිකම්වල අදාළත්වය විශ්වීය වේ. යමෙකුගේ උපත සිදු වූ ස්ථානය, තත්ත්වය හෝ ස්වභාවය නොසලකා ඒවා අදාළ වේ.

---

[1] What are Human Rights?, Office of the High Commissioner-United Nations Human Rights, See Further; https://www.ohchr.org/en/issues/pages/whatarehumanrights.aspx

[2] Human Rights Principles, United Nations Population Fund, 2005, https://www.unfpa.org/resources/human-rights-principles

### 1.1.3 සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් හා ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම්

පොදුවේ මානව හිමිකම් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සහ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි (UDHR) 3 සිට 21 දක්වා වගන්තිවල දක්වා ඇති මානව හිමිකම් පහත පරිදි වේ;

- පුද්ගලයාගේ ජීවත්වීමේ අයිතිය, නිදහස සහ ආරක්ෂාව (3 වන ව්‍යවස්ථාව),
- කිසිම පුද්ගලයෙකු වහල්භාවයෙහි නොරැඳවිය යුතු ය. (4 වන ව්‍යවස්ථාව),
- කිසිම පුද්ගලයෙකු වධ හිංසාවට හෝ කෲර, අමානුෂික පහත් සැලකිල්ලකට හෝ දඬුවමකට හෝ භාජනය නොකළ යුතුය.
  (5 වන ව්‍යවස්ථාව),
- සියල්ලන් ම නීතිය ඉදිරියෙහි එකිනෙකාට සමාන වන අතර, කිසිදු විශේෂයක් නොමැතිව නීතියේ ආරක්ෂාව ලැබීමට සියල්ලෝ ම හිමිකම් ලබති. (7 වන ව්‍යවස්ථාව),
- සිතීමේ, හෘදසාක්ෂියේ හා ආගම ඇදහීමේ නිදහස භුක්ති විඳීමේ අයිතිවාසිකම සෑම පුද්ගලයෙකුම සතුව ඇත. (18 වන ව්‍යවස්ථාව),
- තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයෙකුටම අයිතිය ඇත (19 වන ව්‍යවස්ථාව), මේවා ප්‍රධාන වශයෙන් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ලෙස සැලකේ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි (UDHR) 22 සිට 28 දක්වා වගන්ති මගින් ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් සහතික කෙරේ;

- වැඩ කිරීමට හා තම රැකියාව නිදහස්ව තෝරා ගැනීමට ඇති අයිතිය (23 (1) වන ව්‍යවස්ථාව)
- සෞඛ්‍යය හා යහපැවැත්ම සඳහා ප්‍රමාණවත් ජීවන තත්වයක් සඳහා ඇති අයිතිය (25 වන ව්‍යවස්ථාව)
- අධ්‍යාපනයට ඇති අයිතිය (26 වන ව්‍යවස්ථාව), සහ
- ප්‍රජාවේ සංස්කෘතික ජීවිතයට නිදහසේ සහභාගී වීමේ අයිතිය (27 වන ව්‍යවස්ථාව)

එහි ප්‍රතිඵලයක් වශයෙන්, 1966 දෙසැම්බර් 16 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් රාජ්‍යයන් බැඳ තබන්නා වූ, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය **(ICCPR)** සහ ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය **(ICESCR)** සම්මත කරගන්නා ලදී. කෙසේ වෙතත්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය අයිතිවාසිකම් අතර වෙනසක් නොදක්වන බව සඳහන් කළ යුතු ය.[3]

### 1.1.4 ළමා අයිතිවාසිකම් පිළිබඳ හැඳින්වීම

ළමයින්ට මානව හිමිකම් භුක්ති විඳීම සඳහා අයිතියක් ඇත. කෙසේ වෙතත්, දරුවන්ට විශේෂ අවශ්‍යතා ඇති හෙයින් තමන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනය සඳහා විශේෂ රැකවරණය, සැලකිල්ල, නඩත්තුව සහ අධ්‍යාපනය සඳහා ඔවුන් හිමිකම් දරයි.

**නීතිය මගින් විශේෂයෙන් දක්වා ඇති අයිතිවාසිකම් පිළිබඳ උදාහරණ**

- ළමයින්ට ආදරය, සැලකිල්ල, රැකවරණය සහ දෙමාපියන්ගේ හෝ භාරකරුවන්ගේ ආරක්ෂාව අවශ්‍යයි.
- දරුවන්ට අධ්‍යාපනය අවශ්‍යයි.
- දරුවන්ට නඩත්තු හා මූල්‍යමය සහය ලැබිය යුතුයි.

[3] https://www.ohchr.org/en/issues/escr/pages/areescrfundamentallydifferentfromcivilandpoliticalrights.aspx

- ළමයින් විශේෂයෙන් ම අපරාධ වලට හා උල්ලංඝනයන්ට පහසුවෙන් ගොදුරු විය හැකි නිසා විශේෂ රැකවරණයක් මෙන්ම ඒවායින් නැවත වතාවක් වින්දිතයින් බවට පත්වීම වළක්වා ගැනීමට පසු සැලකිල්ල අවශ්‍යයි.
- නෛතික නියෝජනය සහ වෙනත් සේවාවන් සඳහා ළමයින්ට නීතියෙන් හිමිකම් තිබිය යුතුයි.
- ළමයින්ට අදහස් ප්‍රකාශ කිරීමට සහ තමන්ට ඇහුම්කන් දෙනු ලැබීමට අයිතියක් තිබේ.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) දක්වා ඇති ආකාරයට, "ළමා අයිතිවාසිකම් පදනම් වී ඇත්තේ දරුවකුගේ පැවැත්ම, වර්ධනය, සහභාගීත්වය සහ ඔවුන්ගේ හැකියාවන් සපුරාලීම සඳහා අවශ්‍ය දෑ මත ය".

වාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ආගම කුමක් වුවත් ඒවා සෑම දරුවෙකුට ම එකසේ අදාළ වේ.[4] ළමයාගේ අයිතිවාසිකම් විශේෂ ආකාරයකින් ආමන්ත්‍රණය කිරීමේ වැදගත්කම හඳුනා ගනිමින්, 1989 දී එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRC) සම්මත කරන ලදී.

**ඔබ දන්නවා ද ?**

- ශ්‍රී ලංකාව 1990 ජනවාරි 26 වන දින **ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට** අත්සන් තබා 1991 ජූලි 12 වන දින එය අපරානුමත කළේ ය. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය පිළිගැනීමත් සමඟ ශ්‍රී ලංකා රජය විසින් 1992 දී ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය එළි දැක්විය.
(මූලාශ්‍රයඃ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය)

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (1978) මගින් කාන්තාවන්ගේ, ළමයින්ගේ හෝ ආබාධිත පුද්ගලයින්ගේ අභිවෘද්ධිය සඳහා විශේෂ විධිවිධාන සලසා ඇත.

**(ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (4) ව්‍යවස්ථාව)**



ටිකක් ඉන්න!

කාට හරි කියන්න පුළුවන් ද 'ළමයෙක් කියන්නේ කාට ද' කියලා ?

ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය, ළමයා යනු **"වයස අවුරුදු 18 ට අඩු තැනැත්තෙකු"** ලෙස අර්ථනිරූපණය කරනවා.

**ඔබට ළමා අයිතිවාසිකම් සම්මුතියේ මාර්ගෝපදේශක මූලධර්ම ගැන දැනගන්න අවශ්‍ය ද?**

මම ඒවා පැහැදිලි කරන්නම්.

---

[4] https://www.unicef.org.nz/child-rights
* 4 වන පරිච්ඡේදය බලන්න.

## 1.2 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ මාර්ගෝපදේශක මූලධර්ම [5]

➢ **වෙනස්කොට නොසැලකිය යුතුය යන මූලධර්මය (2 වන ව්‍යවස්ථාව)**

*"සම්මුතිය සියලුම දරුවන්ට, ඔවුන්ගේ ජාතිය, ආගම හෝ හැකියාවන් කුමක් වුවත්; ඔවුන් සිතන්නේ හෝ කියන්නේ කුමක් වුවත්, ඔවුන් කුමන ආකාරයේ පවුලකින් පැමිණියත් එකසේ අදාළ වේ. ළමයින් ජීවත් වන ස්ථානය කුමක් ද යන්න, ඔවුන් කතා කරන භාෂාව කුමක් ද යන්න, ඔවුන්ගේ දෙමව්පියන් කරන්නේ කුමක් ද යන්න, ඔවුන් පිරිමි ළමයින් ද ගැහැණු ළමයින් ද යන්න, ඔවුන්ගේ සංස්කෘතිය කුමක් ද යන්න, ඔවුන්ට ආබාධ තත්ත්වයක් තිබේ ද යන්න හෝ ඔවුන් ධනවත් හෝ දුප්පත් ද යනා දී කිසිවක් ගැටළුවක් නොවේ. කිසිම දරුවෙකුට කිසිදු පදනමක් මත අසාධාරණ ලෙස සැලකිය යුතු නැත."*

මෙම මූලධර්මය කිසිදු ආකාරයක හෝ වෙනස්කම් කිරීමකින් තොරව සියලු ම දරුවන්ට සමාන අයිතිවාසිකම් සඳහා හිමිකම් ඇති බව සහතික කරයි. තනි ළමයින්, ළමුන් කණ්ඩායම් සහ පොදුවේ ළමයින් සඳහා වන සියලු ආකාරයේ වෙනස් කොට සැලකීම් කිරීම් තුරන් කිරීම කෙරෙහි ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය අවධානය යොමු කරයි. කෙසේ වෙතත්, විශේෂ සැලකිල්ලක් හා රැකවරණයක් අවශ්‍ය දරුවෙකු සඳහා, නිදසුනක් ලෙස ආබාධ සහිත දරුවෙකුට විශේෂ පහසුකම් සැපයීම, වෙනස් කොට සැලකීමක් ලෙස නොසැලකේ. එසේම, දුප්පත් දරුවෙකු සඳහා මූල්‍යාධාර හෝ ශිෂ්‍යත්ව ලබා දීම වෙනස් කොට සැලකීමක් නොවේ.

| | |
|---|---|
| **උදාහරණය :** | ඔහුගේ හෝ ඇයගේ ජනවාර්ගිකත්වය, ස්ත්‍රී පුරුෂ භාවය, කුලය හෝ පවුලේ ආර්ථික තත්ත්වය හේතුවෙන් දරුවෙක් පාසලකට ඇතුළත් කරගැනීම ප්‍රතික්ෂේප කිරීම වෙනස් කොට සැලකීමක් වේ. |

➢ **දරුවාගේ උපරිම යහපත (3 වන ව්‍යවස්ථාව)**

*"දරුවන්ගේ උපරිම යහපත යන්න, ඔවුන්ට බලපෑ හැකි තීරණ ගැනීමේ දී මූලික අවධානය හිමි වන කරුණ විය යුතු ය. සියලු ම වැඩිහිටියන් දරුවන්ට වඩාත් සුදුසු දේ කළ යුතුය. වැඩිහිටියන් තීරණ ගන්නා විට, ඔවුන්ගේ තීරණ දරුවන්ට බලපාන්නේ කෙසේද යන්න පිළිබඳව සිතා බැලිය යුතු ය. මෙය විශේෂයෙන් ම අයවැය, ප්‍රතිපත්ති සහ නීති සම්පාදකයින්ට අදාළ වේ."*

ළමුන් සම්බන්ධ සියලු ක්‍රියාමාර්ගවල දී මූලික සැලකීමක් ලෙස තනි ළමයකුගේ හෝ ළමයින් කණ්ඩායමකගේ උපරිම යහපත සැලකිල්ලට ගනී.

| | |
|---|---|
| **උදාහරණය :** | ළමුන්ගේ භාරකාරත්වය පිළිබඳව තීරණය කිරීමේ නඩු වලදී, අධිකරණය 'දරුවාගේ උපරිම යහපත' යන මූලධර්මය අනුගමනය කරනු ලැබේ. භාරකාරත්වය ප්‍රදානය කිරීමේදී, දරුවාගේ ශාරීරික හා මානසික යහපැවැත්ම සහ සතුට සහතික කළ හැකි දෙමව්පියන්ට අධිකරණය විසින් භාරකාරත්වය ලබා දෙනු ලැබේ. |

➢ **පැවැත්ම හා සංවර්ධනය (6 වන ව්‍යවස්ථාව)**

*"දරුවන්ට ජීවත් වීමට අයිතියක් ඇත. දරුවන්ගේ පැවැත්ම හා සෞඛ්‍ය සම්පන්න බව රජය විසින් සහතික කළ යුතුය."*

ඔවුන්ගේ පැවැත්ම සහ සංවර්ධනය (ඔවුන්ගේ පූර්ණ හැකියාවන් වර්ධනය කිරීම ලෙස පුළුල් ලෙස අර්ථ නිරූපණය කර තිබේ) හැකි උපරිම ආකාරයෙන් සහතික කිරීමේ වගකීමක් රජයට ඇත.

[5]https://europa.eu/capacity4dev/sites/default/files/learning/Child-rights/2.7.html

- **ළමයින්ට සහභාගී වීමට ඇති අයිතිය (12 වන ව්‍යවස්ථාව)**

  *"වැඩිහිටියන් ළමයින්ට බලපාන තීරණ ගන්නා විට, සිදුවිය යුතු යැයි තමන්ට සිතන දේ කීමට දරුවන්ට අයිතියක් ඇති අතර ඔවුන්ගේ අදහස් සැලකිල්ලට ගත යුතු ය. දෙමාපියන් විසින් කළ යුත්තේ කුමක්දැයි පැවසීමට ළමයින්ට හැකි බවක් මින් අදහස් නොවේ."*

  මෙම ව්‍යවස්ථාව දරුවාගේ අදහස්වලට ගරු කිරීම පිළිබඳ මූලධර්මය තහවුරු කරයි.

  එපමණක් නොව, **13 වන ව්‍යවස්ථාව (අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස)** අවධාරණය කරනුයේ; *"ළමයින්ට තොරතුරු ලබා ගැනීමටත් හුවමාරු කරගැනීමටත් අයිතියක් ඇත. ප්‍රකාශන නිදහස යන්නට කතා කිරීම, චිත්‍ර ඇඳීම හෝ ලිවීම ඇතුළු තමන් රුචි යම් මාධ්‍යයකින් තොරතුරු හුවමාරු කරගැනීමේ අයිතිය ඇතුළත් වේ."* යන්න ය.

## 1.3 ළමා අයිතිවාසිකම්

**4 වන ව්‍යවස්ථාව (අයිතිවාසිකම් ආරක්ෂා කිරීම)**

ළමා අයිතිවාසිකම්වලට ගරු කරනු ලබන බවට, ආරක්ෂා කරනු ලබන බවට හා ඉටු කරනු ලබන බවට සහතික කිරීම සඳහා පවත්නා සියලු ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍යයන්ට වගකීමක් ඇත.

**6 වන ව්‍යවස්ථාව (පැවැත්ම හා සංවර්ධනය)**

දරුවන්ට ජීවත් වීමට අයිතියක් ඇත. දරුවන්ගේ පැවැත්ම හා සෞඛ්‍ය සම්පන්න බව රජය විසින් සහතික කළ යුතු ය.

**9 වන ව්‍යවස්ථාව (දෙමාපියන්ගෙන් වෙන් කිරීම)**

එය ඔවුන්ගේ උපරිම යහපතට හේතු නොවේ නම් හැර, ළමයින්ට ඔවුන්ගේ දෙමව්පියන් සමඟ ජීවත් වීමට අයිතියක් ඇත.

**11 වන ව්‍යවස්ථාව (පැහැරගෙන යාම)**

නීතිවිරෝධී ලෙස ළමයින් තම රටෙන් පිටතට ගෙන යාම වැළැක්වීමට රාජ්‍යයන් විසින් පියවර ගත යුතු ය. මෙම ව්‍යවස්ථාව විශේෂයෙන් ම මව්පිය පැහැරගැනීම් සම්බන්ධයෙන් සැලකිලිමත් වේ.

**16 වන ව්‍යවස්ථාව (පෞද්ගලිකත්වය රැකගැනීමට ඇති අයිතිය)**

ළමුන්ට පෞද්ගලිකත්වය සඳහා අයිතියක් ඇත. නීතිය විසින් ඔවුන්ගේ ජීවන රටාවට, ඔවුන්ගේ හොඳ නමට, ඔවුන්ගේ පවුල්වලට සහ ඔවුන්ගේ නිවෙස්වලට එරෙහි ප්‍රහාරයන්ගෙන් ඔවුන්ව ආරක්ෂා කළ යුතුය.

**19 වන ව්‍යවස්ථාව (සියලු ම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් වලට එරෙහි ආරක්ෂාව)**

ශාරීරික හෝ මානසික හිංසා පීඩාවලින් හා නොසලකා හැරීම්වලින් ආරක්ෂා වීමට ළමුන්ට අයිතියක් ඇත.

**27 වන ව්‍යවස්ථාව (ප්‍රමාණවත් ජීවන මට්ටම)**

සිය ශාරීරික හා මානසික අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් සඳහා ළමයින්ට අයිතියක් ඇත.

**28 වන ව්‍යවස්ථාව (අධ්‍යාපනය සඳහා ඇති අයිතිය)**

සියලු ම දරුවන්ට ප්‍රාථමික අධ්‍යාපනයක් සඳහා අයිතියක් ඇත. මෙම අයිතිය සාක්ෂාත් කර ගැනීමට ධනවත් රටවල් විසින් දුප්පත් රටවලට උදව් කළ යුතු ය.

**29 වන ව්‍යවස්ථාව (අධ්‍යාපන ඉලක්ක)**

ළමා අධ්‍යාපනය සෑම දරුවෙකුගේ ම පෞරුෂත්වය, කුසලතා සහ හැකියාවන් උපරිම ලෙස වර්ධනය කළ යුතු ය.

**31 වන ව්‍යවස්ථාව (විනෝදාත්මක, ක්‍රීඩා හා සංස්කෘතික කටයුතු)**

ළමයින්ට විවේකීව සිටීමට සහ සෙල්ලම් කිරීමට මෙන්ම පුළුල් පරාසයක සංස්කෘතික, කලාත්මක හා වෙනත් විනෝදාත්මක ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වීමට අයිතියක් ඇත.

**32 වන ව්‍යවස්ථාව (ළමා ශ්‍රමය)**

රජය විසින් භයානක හෝ සිය සෞඛ්‍යයට හානි කළ හැකි හෝ අධ්‍යාපනයට බාධා පමුණුවන ක්‍රියාවලින් ළමයින්ව ආරක්ෂා කළ යුතුය.

**34 වන ව්‍යවස්ථාව (ලිංගික සූරාකෑම)**

රජය විසින් සෑම ආකාරයක ම ලිංගික සූරාකෑම්වලින් සහ අපයෝජනයන්ගෙන් ළමයින් ආරක්ෂා කළ යුතු ය.

**35 වන ව්‍යවස්ථාව (අපහරණය, විකිණීම හා වෙළඳාම් කිරීම)**

ළමයින් පැහැරගෙන යාම, විකිණීම හෝ වෙළඳාම් කිරීම සිදු නොවන බවට සහතික කිරීම සඳහා රජය හැකි සෑම පියවරක්ම ගත යුතු ය. ළමුන් විකිණීම, ළමා ගණිකා වෘත්තිය සහ ළමා කාමුක දර්ශන පිළිබඳ වෛකල්පිත සංධානය මගින් සම්මුතියේ මෙම විධිවිධානය වැඩි දියුණු කරනු ලැබී ය.

**36 වන ව්‍යවස්ථාව (වෙනත් ආකාරයේ සූරාකෑම්)**

ළමයින්ගෙන් ප්‍රයෝජන ගන්නා හෝ ඔවුන්ගේ සුභසාධනයට හා සංවර්ධනයට හානි කළ හැකි ඕනෑම ක්‍රියාකාරකමකින් ළමයින් ආරක්ෂා කළ යුතු ය.

**37 වන ව්‍යවස්ථාව (රඳවා තබා ගැනීම හා දඬුවම් කිරීම)**

ළමයින්ට කෲර හෝ හානිකර ආකාරයකින් ද දඬුවම් කිරීමට කිසිවෙකුටත් අවසර නැත. නීතිය කඩ කරන්නා වූ ළමයින්ට කෲර ලෙස නොසැලකිය යුතු ය.

**39 වන ව්‍යවස්ථාව (ළමා වින්දිතයින් පුනරුත්ථාපනය කිරීම)**

නොසලකා හරින ලද, අපයෝජනයට ලක් වූ හෝ සූරාකෑමට ලක්වූ දරුවන්ට ශාරීරිකව හා මානසිකව යථා තත්ත්වයට පත්වීමට හා සමාජය සමඟ නැවත ඒකාබද්ධ වීමට විශේෂ උපකාර හිමි විය යුතු ය.

**40 වන ව්‍යවස්ථාව (බාල වයස්කාර යුක්තිය)**

නීතිය උල්ලංඝනය කළ බවට චෝදනා ලැබ සිටින ළමයින්ට ඔවුන්ගේ අයිතිවාසිකම්වලට ගරු කරන යුක්තිය පසිඳලීමේ ක්‍රමයක් තුළ නීති ආධාරවලට සහ සාධාරණ සැලකීමට අයිතිය ඇත.

**42 වන ව්‍යවස්ථාව (අයිතිවාසිකම් පිළිබඳ දැනුම)**

රාජ්‍යයන් විසින් මෙම සම්මුතිය පිළිබඳව වැඩිහිටියන්ට හා ළමයින්ට දැන ගැනීමට සැලැස්විය යුතු ය.



## 1.4 සමාප්තිය

එහෙයින්, ළමා වෙළඳාම ළමයින්ට එරෙහි අපරාධයක් වන අතර එය ළමයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරයි. මෙම බරපතල ගැටළුව ශ්‍රී ලංකාවට ද බලපා ඇත.




> **ඔබ දන්නවා ද?**
>
> **එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC)** විසින් නිකුත් කරන ලද තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ 2016 ගෝලීය වාර්තාවෙන් හෙළි වී ඇත්තේ; "2014 දී ගෝලීය වශයෙන් මිනිස් වෙළඳාමට ගොදුරු වූවන්ගෙන් සියයට 28 ක් ළමයින් බව ය."

වාර්තා වන පරිදි, ලිංගික සූරාකෑම, බලහත්කාරයෙන් වැඩ ගැනීම, බලහත්කාරයෙන් විවාහ කරවීම, නීති විරෝධී ලෙස දරුකමට හදා ගැනීම හෝ සිඟමනෙහි යෙදවීම ඇතුළු විවිධ අරමුණු සඳහා ළමයින් වෙළඳාම් කරනු ලැබේ.

### පරිශීලක ලැයිස්තුව/වැඩිදුර කියවීම්

- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989)
- මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (1948)
- කාන්තා හා ගැහැණු දරු ආරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා නීති නාමාවලිය, ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, 2012
- Training Manual to Fight Trafficking In Children for Labour, Sexual and other Forms of Exploitation, Facilitators' Guide, ILO and UNICEF, 2009, Available at; https://www.unicef.org/protection/Facilitator_guide.pdf

ඉගෙනුම් මෙවලම්



**අභ්‍යාසය**

**ක්‍රමවේදය**[6]

1. **මුහුණට මුහුණ සිදු කරන දේශන - (පැය එකහමාරක්)**

   න්‍යායාත්මක කොටස් සහ අන්තර්ජාතික ගිවිසුම් නීතිය හා ක්‍රියාකාරකම් ආශ්‍රිත භාවිතයන් අතර සියුම් වෙනසක් පවතින බව සහතික කිරීම වැදගත් ය. මෙහිදී පළමුව මෙම ඒකකයේ අරමුණු විස්තර කළ යුතු ය. මෙහි එන හැඳින්වීමේ කොටස තුළින් ළමා වෙළඳාම යනු මානව හිමිකම් සහ ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් බව දැඩිව අවධාරණය කරයි. එය අපරාධ වරදක් වන අතර නීතිය යටතේ දඬුවම් ලැබිය හැක්කකි.

2. **දෘශ්‍ය ආධාරක**

   පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම්/පෝස්ටර්/වීඩියෝ පට හෝ වෙනත් සුදුසු දෘශ්‍ය ආධාරක භාවිතා කළ හැකි ය.

---

[6] This suggested methodology is compiled with the Training Manual to Fight Trafficking In Children for Labour, Sexual and other Forms of Exploitation, Facilitators' Guide, ILO and UNICEF, 2009

**3. සාකච්ඡා මාදිලිය**

උපදෙස් ලබා දීම සඳහා අන්තර් ක්‍රියාකාරිත්ව ක්‍රමවේදයක් භාවිතා කළ යුතු ය. සංකල්ප හා මූලධර්ම පැහැදිලි කිරීම සඳහා උදාහරණ ලබා දිය යුතු ය. පාරිභාෂික යෙදුම් සුදුසු උදාහරණ සමඟ සරල භාෂාවෙන් පැහැදිලි කළ යුතු ය. මෙම ඒකකය තුළ, පාරිභාෂික යෙදුම් අර්ථ දක්වා ඇති අතර පාඩමේ අන්තර්ගතය තුළ හෝ පාදාන්ත සටහන් තුළ ඒවා සරලව පැහැදිලි කර තිබේ.

**4. ප්‍රශ්න හා පිළිතුරු**

සහභාගිවන්නන්ට ප්‍රශ්න ඇසීමට සහ පැහැදිලි කිරීම් සිදු කර ගැනීමට අවස්ථාව ලබා දිය යුතු ය.

**5. විශේෂ උපදෙස්**

මෙම ඒකකයට අදාළ ඉගෙනුම් අරමුණු සහ අපේක්ෂිත ඉගෙනුම් පරමාර්ථ සහභාගිවන්නන්ට දැනුම් දිය යුතු ය. එසේම, සහභාගිවන්නන්ට දේශනයට පෙර මානව හිමිකම් සහ ළමා අයිතිවාසිකම් යන විෂයයන් පිළිබඳව ගැඹුරු දැනුමක් තිබිය යුතු යැයි අපේක්ෂා නොකෙරන බව සැලකිල්ලට ගත යුතු ය. පුහුණුකරු විසින් අධ්‍යාපනික පසුබිම සහ කණ්ඩායම් සාමාජිකයින්ගේ අවබෝධය කෙරෙහි ඔහුගේ/ ඇයගේ අවධානය යොමු කළ යුතු අතර පසුව වඩාත් සුදුසු ක්‍රමවේදයන් භාවිතා කළ හැකි ය.

## ඇගයීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම
## පළමු ඒකකය අවසානයේ දී

---

**1. සූදානම් වීම**

පුහුණු අත්පොතෙහි තාර්කික පදනම අවබෝධ කර ගැනීම පිණිස, සහභාගිවන්නන්ට තමන් නිරත වන කාර්යයන් සහ ඔවුන්ගේ පසුබිම 'විස්තර කරන ලෙස' ඉල්ලා සිටීමෙන් ආරම්භ කිරීම වඩාත් සුදුසු වනු ඇත. මෙහිදී විශේෂයෙන් ම සහභාගිවන්නන් ළමා වෙළඳාම ආශ්‍රිත ක්ෂේත්‍රයෙහි සේවය කර තිබේද නැතහොත් දැනටත් කටයුතු කරන්නේද යන්න දැන ගැනීම වැදගත් වේ.

(කාලය - මිනිත්තු 10)

**2. ක්‍රමවේදය**

සහභාගිවන්නන් 05 හෝ ඊට අඩු කණ්ඩායම්වලට බෙදන්න. "ළමා වෙළඳාම ළමා අයිතිවාසිකම් දැඩි ලෙස උල්ලංඝනය කිරීමක් ලෙස සැලකිය හැක්කේ ඇයි?" යන මාතෘකාවට අදාළව කෙටි රචනයක් ලියන ලෙස කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.

(කාලය - මිනිත්තු 10)

**3. ඇගයීම**

කණ්ඩායම්වලට ඔවුන්ගේ සොයා ගැනීම් සහ අදහස් පන්තියට ඉදිරිපත් කළ හැකි ය. පුහුණුකරුට සහ පන්තියේ අනෙකුත් සහභාගිවන්නන්ට එකී ඉදිරිපත් කිරීම් පිළිබඳව අදහස් දැක්විය හැකි ය.

(කාලය - මිනිත්තු 10)

**4. ක්‍රියාකාරකමේ අරමුණ (සහභාගිවන්නන් සඳහා)**

මෙම අභ්‍යාසය, සහභාගිවන්නන්ට ළමා වෙළඳාම යන ගැටලුවේ බරපතලකම අවබෝධ කර ගැනීමටත් එය ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස සම්බන්ධ කිරීමටත් ළමා වෙළඳාම තුරන් කිරීම පිණිස වන නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ සහ රජයේ යුතුකම අවබෝධ කර ගැනීමටත් උපකාරී වේ.

## 5. ක්‍රියාකාරකමේ අරමුණ (පුහුණුකරු සඳහා)

පුද්ගල අවශ්‍යතා මත පදනම්ව පුහුණුව වෙනස් කිරීම සඳහා කණ්ඩායමෙහි අවබෝධතා මට්ටම සහ අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද හඳුනා ගැනීමට එය පුහුණුකරුට උපකාරී වේ.

## 6. අවධානය යොමු කළ යුතු කරුණු

සහභාගිවන්නන්ට, අදාළ තොරතුරු හෝ තමන්ගේ සටහන් කියවීමට ඉඩ දිය යුතු අතර ක්‍රියාකාරකම අතරතුර ප්‍රශ්න ඇසීමට ඉඩ දිය යුතු ය.

## දෙවන මොඩියුලය

| ළමා වෙළඳාම හා එහි මූල හේතු හඳුනාගැනීම | | |
|---|---|---|
| | **දේශන පැය ගණන** | 4 |
| | **ඇගයීම් ක්‍රමවේදය** | පන්ති කාමර සාකච්ඡා |
| | **අධ්‍යයන අරමුණු** | මෙම ඒකකය අවසානයේ දී සහභාගීවන්නන්ට :<br>➢ තැනැත්තන් වෙළඳාම් කිරීම වැළැක්වීම, මර්දනය කිරීම හා දඬුවම් කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ සංධානය යටතේ අර්ථ දක්වා ඇති තැනැත්තන් වෙළඳාම් කිරීම යන වරදෙහි මූලිකාංග අවබෝධ කරගැනීමට;<br>➢ තැනැත්තන් වෙළඳාම් කිරීමේ වරද සහ මිනිස් ජාවාරම සහ නීති විරෝධී සංක්‍රමණය වැනි අනෙකුත් වැරදි අතර සමානතා හා වෙනස්කම් හඳුනා ගැනීමට;<br>➢ විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ළමා වෙළඳාමට අදාළ මූල හේතුවල සංකීර්ණතාවය හඳුනා ගැනීම සහ අවබෝධ කර ගැනීමට හැකි වනු ඇත. |

### a. ළමා වෙළඳාම හඳුනාගැනීම


මිනිස් වෙළඳාම සහ වෙනත් වැරදි අතර සමානතා හා වෙනස්කම් ගෙනහැර දැක්වීම

### 2.1 තැනැත්තන් වෙළඳාම

තැනැත්තන් වෙළඳාම පිළිබඳ වඩාත් සවිස්තරාත්මක අන්තර්ජාතික අර්ථ දැක්වීම තැනැත්තන් වෙළඳාම වැළැක්වීම, මර්දනය කිරීම සහ ඊට එරෙහිව දඬුවම් කිරීම සඳහා වන එක්සත් ජාතීන්ගේ සංධානය මගින් සපයනු ලැබේ. (පැලර්මෝ සංධානය)

| පැලර්මෝ සංධානයෙහි 3 (අ) ව්‍යවස්ථාව මගින් තැනැත්තන් වෙළඳාම පහත පරිදි අර්ථ දක්වා තිබේ: | |
|---|---|
| ක්‍රියාව | • බඳවාගැනීම, ප්‍රවාහනය, රැකවරණය දීම, හෝ පුද්ලයින් භාරගැනීම, |
| උපක්‍රමය | • තර්ජනය හෝ බලය යෙදවීම හෝ වෙනත් ආකාරයේ බලහත්කාරයන්<br>• පැහැරගෙන යාම<br>• වංචාව<br>• රැවටීම<br>• යම් පුද්ගලයෙකුගේ අසරණභාවය අයුතු ලෙස භාවිතා කිරීම; හෝ<br>• වෙනත් පුද්ගලයෙකු කෙරෙහි පාලනයක් ඇති පුද්ලයෙකුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා ගෙවීම් හෝ ලාභ ප්‍රයෝජන ලබාදීම හෝ ලබා ගැනීම මගින්. |
| අරමුණ | • සූරා කෑමේ අරමුණ සඳහා |
| සූරාකෑම | සූරාකෑම යන්නට අවම වශයෙන්,<br>• ගණිකා වෘත්තියට යොදා සූරාකෑමට ලක් කිරීම හෝ වෙනත් ආකාරයේ ලිංගික සූරාකෑම,<br>• බලහත්කාර ශ්‍රමය හෝ සේවා ලබාගැනීම,<br>• වහල්භාවය හෝ වහල්භාවයට සමාන වෙනත් ක්‍රියාවන් සිදු කිරීම,<br>• දාසභාවයට පත් කිරීම හෝ<br>• අවයව ඉවත් කරගැනීම ආදිය ඇතුළත් වේ. |

- අපේක්ෂිත සූරාකෑම සඳහා අර්ථනිරූපණය තුළ දක්වා ඇති ඕනෑම ආකාරයක ***උපක්‍රමයක්*** භාවිතා කර ඇත්නම්, එහි දී තැනැත්තන් වෙළඳාම් කිරීමට යටත් වින්දිතයෙකුගේ **කැමැත්ත අදාළ නොවේ.**
- සූරා කෑමේ අරමුණ සඳහා, බඳවාගැනීම, ප්‍රවාහනය, ස්ථාන මාරු කිරීම, රැකවරණය දීම, හෝ ළමයෙකු භාරගැනීම නිර්වචනයේ දක්වා ඇති කිසිදු ***උපක්‍රමයක්*** ඊට සම්බන්ධ නොවුණ ද "තැනැත්තන් වෙළඳාම් කිරීමක්" වේ.
- **'ළමයා'** යන්නෙන් අදහස් කරන්නේ **වයස අවුරුදු 18 ට අඩු** ඕනෑම පුද්ගලයෙකි.





ඔබ දැන සිටියා ද?

දණ්ඩ නීති සංග්‍රහයේ 360 ඇ වගන්තිය අනුව තැනැත්තන් වෙළඳාම් කිරීම ශ්‍රී ලංකාවේ අපරාධමය වරදක් බවට පත් කර ඇත.





**අභ්‍යාසය**

3 දෙනා හෝ 4 දෙනා බැගින් වූ කුඩා කණ්ඩායම් වලට බෙදෙන්න.

පුද්ගල වෙළඳාම පිළිබඳව වචන 50 කට අඩු තාවකාලික නිර්වචනයක් සඳහා එකඟ වන්න.

එකී අර්ථනිරූපණයන් පිටු පෙරළිය හැකි පැඩයක් (flip chart) මතට ගනු ලබන අතර විවෘත කණ්ඩායම් සැසියක දී සාකච්ඡා කරනු ඇත[7]

## 2.2 මිනිස් ජාවාරම

බොහෝ විට මිනිස් ජාවාරම යන වරද, තැනැත්තන් වෙළඳාම් කිරීම යන වරද සමඟ පටලවා ගනු ලැබේ.

**"තැනැත්තන් වෙළඳාම් කිරීම මිනිස් ජාවාරම නොවේ!"**

| | |
|---|---|
| වර්ෂ 2000 අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධවලට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතියට අතිරේක ගොඩබිමින්, මුහුදින් සහ ගුවන් මගින් සංක්‍රමණිකයින් ජාවාරම් කිරීමට එරෙහි සංධානයේ 3 (අ) වගන්තියට අනුව 'සංක්‍රමණිකයන් ජාවාරම් කිරීම' පහත පරිදි අර්ථ දැක්වේ: | |
| **ක්‍රියාව** | • සම්පාදනය කිරීම |
| **උපක්‍රමය** | • යම් රටක ජාතිකත්වය නොදරන හෝ ස්ථිර පදිංචිකරුවෙකු නොවන පුද්ගලයෙකු නීති විරෝධී ලෙස එකී රටට ඇතුළු වීම මගින් |
| **අරමුණ** | • මූල්‍යමය හෝ වෙනත් ද්‍රව්‍යමය ප්‍රතිලාභයක් ඍජුව හෝ වක්‍රව ලබා ගැනීම සඳහා |
| **නීතිවිරෝධී ඇතුළු වීම** | ප්‍රතිග්‍රාහක රාජ්‍යයට (තමන් ඇතුළුවන රටට) නීත්‍යානුකූලව ඇතුළුවීම සඳහා අවශ්‍ය කරන අවශ්‍යතාවයන්ට අනුකූල නොවී දේශසීමා තරණය කිරීම |
| **වංචනික ගමන් හෝ අනන්‍යතා ලේඛන** | ඕනෑම ගමන් හෝ අනන්‍යතා ලේඛනයක්,<br>අ. යම් රාජ්‍යයක් වෙනුවෙන් ගමන් හෝ අනන්‍යතා ලේඛනයක් සෑදීමට හෝ නිකුත් කිරීමට නීත්‍යානුකූලව බලයලත් පුද්ගලයෙකු හෝ ආයතනයක් හැර වෙනත් අයෙකු විසින් කිසියම් ආකාරයකින් ව්‍යාජ ලෙස සකස් කර හෝ වෙනස් කර තිබීම; හෝ<br>ආ. අනිසි ලෙස නිකුත් කර තිබීම හෝ වරදවා දැක්වීම, දූෂණය හෝ තර්ජනය හෝ වෙනත් නීති විරෝධී ආකාරයකින් ලබාගෙන තිබීම; හෝ<br>ඇ. නීත්‍යානුකූලව දරා සිටීමට බලය ලත් අයෙකු හැර වෙනත් පුද්ගලයෙකු විසින් භාවිතා කර තිබීම. |
| **යාත්‍රා** | යුධ නෞකාවක්, නාවික සහායක යාත්‍රාවක් හෝ යම් රාජ්‍යයක් සතු හෝ රාජ්‍යයක් විසින් ක්‍රියාත්මක කරන ලද සහ රජයේ වාණිජ නොවන සේවාවන් සඳහා පමණක් භාවිතා කරන ලද වෙනත් යාත්‍රාවක් හැර, ජලය මත ප්‍රවාහනය කිරීමේ මාධ්‍යයක් ලෙස භාවිතා කරන ලද හෝ භාවිතා කළ හැකි, විස්ථාපන නොවන යාත්‍රා සහ මුහුදු ගුවන් යානා ද ඇතුළුව ඕනෑම ආකාරයක ජල යාත්‍රා. |

[7] බලන්න, Counter-Trafficking training Modules (International Organisation for Migration Management, 7 Hill Street, Dublin) 82 <http://iomireland.ie/wp-content/uploads/2016/04/Train-the-Trainer-Manual-Original.pdf> (accessed 20th Dec 2018)




| වෙළඳාම | ජාවාරම |
| --- | --- |
| වෙළඳාම යනු අවම වශයෙන් පුද්ගලයින් බඳවා ගැනීම, ප්‍රවාහනය, ස්ථාන මාරු කිරීම, රැකවරණය ලබා දීම හෝ පුද්ගලයින් භාර ගැනීම යනාදිය සම්බන්ධ වන ක්‍රියාවලියකි. | ජාවාරම යන්නට සාමාන්‍යයෙන් පුද්ගලයන් ප්‍රවාහනය ඇතුළත් වේ. |
| | |
| වෙළඳාම යන්නට අවම වශයෙන් තර්ජනය, බලහත්කාරය, රැවටීම, බලය අයුතු ලෙස භාවිතා කිරීම හෝ අනාරක්ෂිත බව, වංචාව හෝ පැහැරගෙන යාම යනා දී උපක්‍රම ඇතුළත් වේ. | සාමාන්‍යයෙන් ජාවාරම යන්න සිදුවන්නේ ජාවාරම් කළ පුද්ගලයාගේ **කැමැත්ත** ඇතිව ය.   |
| | |
| වෙළඳාම යන්න අභ්‍යන්තර හෝ බාහිර වශයෙන් සිදු විය හැකි ය. | ජාවාරම යන්න දේශ සීමා ඉක්මවා යන්නකි. |
| | |
| රැවටීම හෝ වෙනත් ආකාරයක උපක්‍රමයක් භාවිතා කර තිබේ නම් හෝ වෙළඳාමට ලක් වන්නා කුඩා දරුවෙකු වන විට, වෙළඳාමට ලක්වූ පුද්ගලයාගේ කැමැත්ත අදාළ නොවේ. | බොහෝ අවස්ථාවල දී ජාවාරම සිදුවන්නේ පුද්ගලයාගේ කැමැත්ත ඇතිව ය. |
| | |
| වෙළඳාම් කරන ලද පුද්ගලයෙකු හෝ දරුවෙකු වින්දිතයෙකු ලෙස සලකනු ලබන අතර ඒ හේතුවෙන් ඔවුන්ට රාජ්‍ය සහාය සඳහා හිමිකම් පවතී. | ජාවාරම් කරන පුද්ගලයෙකු නීතිය උල්ලංඝනය කරන්නෙකු ලෙස සලකනු ලබන අතර නීතියෙන් දඬුවම් කළ හැකි ය. |

<table>
<tr><td></td><td></td></tr>
<tr><td>නිදසුන I<br><br>“A” යනු බලහත්කාරයෙන් ගල් අඟුරු ආකරයක සේවයේ යොදවන ලද 14 හැවිරිදි පිරිමි ළමයෙකි. ගල් අඟුරු ආකරයක වැඩ කිරීම යනු අවසර නොලැබෙන උපද්‍රවකාරී රැකියාවකි. එය සූරා කෑමක් වන අතර චලනය කරවීම (තැනකින් තවත් තැනකට රැගෙන යාම) සමඟ එකතු වූ විට වෙළඳාම් කිරීමක් වේ.<br><br>මෙම පිරිමි ළමයා රටින් පිටතට ගෙන ගොස් ඇත්තේ දෙමව්පියන්ගේ කැමැත්තට පටහැනිව නම්, රැවටීම හෝ බලහත්කාරය පෑම යන මූලිකාංගයක් තිබීමට ඉඩ ඇත. මේ බව පෙන්වා දිය හැකි නම් ළමයා වෙළඳාම් කර ඇති බවට හඳුනාගත හැකි ය. බඳවා ගත් තැනැත්තා ‘ළමයාගේ ශ්‍රමය සඳහා ගෙවීමක් කිරීම වෙනුවට’, “A” නම් ළමයාට රැකියාව පිළියෙල කර දීම වෙනුවෙන් ළමයාගේ පවුලෙන් ගාස්තුවක් අය කර ඇති නමුත් එයින් වෙනසක් සිදු නොවේ.[8]</td>
<td>නිදසුන II<br><br>ගනේෂ් යනු රට හැර යාමට අවශ්‍ය වූ ත්‍රිකුණාමලයේ ශිෂ්‍යයෙකි. කොළඹ සංචාරක ඒජන්සියක් විසින් ඔහුට මාසිකව රුපියල් 60,000ක වැටුපක් සහිතව සුපිරි වෙළඳසැල් අලෙවිකරුවෙකු ලෙස ඕස්ට්‍රේලියාවේ රැකියාවක් ලබා දෙන ලදී. අදාළ රටට ළඟා වූ පසුව ඒ හා සමාන ඉතිරි මුදලක් ගෙවිය යුතුව වීසා බලපත්‍රය සහ ටිකට් පත සඳහා අත්තිකාරම් මුදලක් ගෙවීමට ඔහුට සිදු විය. කිසිදු ලේඛනයක් සැපයූවේ නැත. ත්‍රිකුණාමලයේ සිටි නියෝජිතයෙකු පැවසූයේ රුපියල් 1,000,000 කට ගනේෂ්ව මුහුදු මාර්ගයෙන් ඕස්ට්‍රේලියාවට ප්‍රවාහනය කරන බවයි. ඔහුට රුපියල් 250,000 ක් අත්තිකාරම් වශයෙන් ගෙවීමට නියම කරන ලදී. තවත් 50 දෙනෙකු සමඟ ඔහුව කුඩා බෝට්ටුවක දමා ගැඹුරු මුහුදට ගෙන යන ලදී.</td></tr>
<tr><td colspan="2">කෙසේ වුවද, ජාවාරමක් ලෙස ඇරඹුණු යමක් වෙළඳාමක් බවට පත් වී අවසන් විය හැකි නිසා ජාවාරම් කිරීම හා වෙළඳාම් කිරීම අතර සියුම් සම්බන්ධතාවයක් පවතී.</td></tr>
</table>



**අභ්‍යාසය**

[8] Training Manual to Fight Trafficking in Children for Labour, Sexual and Other Forms of Exploitation – isn’t there a reference for this please?

සාරා යනු "A" නම් රටෙහි පදිංචි 20 හැවිරිදි කාන්තාවකි. ඇය අවිවාහක අතර තමන් විසින් එළවළු විකිණීමෙන් ජීවත් කරවන කුඩා දරුවන් දෙදෙනෙකු ඇයට සිටියි. දිනක් ඇය හමුවට පැමිණෙන මිතුරියක් පවසනුයේ ඇයගේ වර්තමාන මාසික ඉපැයීම මෙන් දස ගුණයක් උපයා ගත හැකි "B" නම් රටේ ළමුන් බලාගන්නා රැකියාවක් ඇයට සොයා දිය හැකි බවයි. "B" නම් රටේ සාරා සිය නව රැකියාව ආරම්භ කළ වහාම වැය වූ වියදම් ආපසු ගෙවීමට එකඟ වන්නේ නම්, ඇගේ සියලු සංචාරක කටයුතු සිදු කර ඇගේ ගමන සඳහා මුදල් ගෙවීමට ද මිතුරිය පොරොන්දු වෙයි. මෙම අමතර ආදායම තම පවුලට ප්‍රයෝජනවත් වනු ඇතැයි තීරණය කළ සාරා, සිය දරුවන්ව තම මවගේ රැකවරණයේ තබා ඇයගේ මිතුරියගේ සමාගමේ බස් රථයකින් ගමන ආරම්භ කරයි. සාරාට විදේශ ගමන් බලපත්‍රයක් නැති නමුත් ඇගේ මිතුරිය සහතික වනුයේ තමන්ට දේශ සීමාවේ මිතුරන් සිටින බැවින් එවැන්නක් අවශ්‍ය නොවන බවයි.

එක් දිනක් සංචාරය කිරීමෙන් පසුව, මිතුරිය සාරාව බෝට්ටු කපිතාන්වරයෙකුගේ රැකවරණයේ තබා පිටත්ව යන්නේ ඔහු විසින් ඇයගේ ගමනාන්තය වන "B" නම් රටට ගෙන යනු ඇතැයි පවසමිනි. තම මිතුරිය විසින් සිය ප්‍රවාහනය සඳහා ගෙවිය යුතු යැයි සාරා අපේක්ෂා කළ බැවින්, එම මිනිසා තම මිතුරියට දිගු බිල් රෝලක් දෙනු දැකීමෙන් සාරා පුදුමයට පත් විය. එය සිය මිතුරියගේ පැත්තෙන් සිදු කෙරෙන තමාට සම්බන්ධයක් නැති ව්‍යාපාරික ගනුදෙනුවක් යැයි උපකල්පනය කරමින් සාරා එකී ගනුදෙනුව පිළිබඳව කිසිදු ප්‍රශ්නයක් නොඅසයි.

බෝට්ටුවේ කපිතාන්වරයා මිත්‍රශීලී අයෙකු වුව ද ඔහු සාරාගෙන් ඉල්ලා සිටින්නේ, රටට ඇතුළු වීමේ දී ප්‍රශ්නයක් ඇති නොවනු පිණිස ප්‍රවාහනයේ දී බෝට්ටුවේ වැසුණු කුටියේ තට්ටුව යට සිටින ලෙසයි. එය අඳුරු, උණුසුම් හා ඉතා අපහසුදායක ස්ථානයක් වූ නමුත්, තමන්ට විදේශ ගමන් බලපත්‍රයක් නොමැති නිසාවෙන් හා විශ්වාසය තැබිය හැක්කේ ඔහුගේ උපදෙස් හා හොඳ හිත මත පමණක් වූ නිසාවෙන් සාරා ඊට එකඟ වෙයි. කෙසේවෙතත්, දවසක සම්පූර්ණ චාරිකාවකින් පසුව රාත්‍රියේ, ඔහු බෝට්ටුව හුදෙකලා කුඩා වරායක නතර කළ අතර කුටිය විවෘත කර ඇයව දූෂණය කරයි. ඉන්පසුව ඔහු සාරාට නැවත කුටියට ඇතුළු වන සේ බල කරමින් එහි ඇතුළු කර පිටුපසින් අගුලු දමන ලබයි. එය ඉතා දිගු ගමනක් වූ අතර සාරාගේ ගමන එක් නැව් තටාකයකින් අවසන් වෙයි.. එහිදී බෝට්ටු කපිතාන්වරයාට මුණගැසෙන්නේ ඔහුට විශාල මුදලක් ලබා දෙන මිනිසුන් සිව්දෙනෙකි. සාරාට පැවසුවේ දැන් ඇය "B" නම් රටේ සිටින බවයි. ගසක් යට පැය කිහිපයක් බලා සිටීමෙන් පසු වාහනයක් පැමිණෙන අතර වාහනයේ පිටුපසට නගින ලෙස සාරාට අණ කරනු ලැබේ. ඒ වන විටත් තවත් තරුණියන් එහි වාඩි කරවා සිටි අතර, ඔවුන් සියල්ලන්ට ම පහර දී ඇති බවට සලකුණු පැවතුණි. සාරා බියෙන් පසුවන අතර, ඇයට පොරොන්දු වූ රැකියාව ලැබෙනු ඇතැයි තවදුරටත් විශ්වාස නොකරයි. ඇය ප්‍රතික්ෂේප කරන විට එහි සිටි පිරිමින් ඇයට තුවක්කුවක් පෙන්වා තර්ජනය කරනු ලබයි.

සාරා සහ අනෙක් කාන්තාවන් නාගරික ප්‍රදේශයක පෞද්ගලික නිවසකට ගෙන යනු ලැබේ. සති කිහිපයක් පුරා, පිරිමින් සිව්දෙනා විසින් කාන්තාවන්ව ශාරීරිකව හා ලිංගික වශයෙන් අතවරයට ලක් කරන අතර ඔවුන්ට එකී පරිශ්‍රයෙන් පිටව යාමට අවසර නොලැබේ. සාරාට කියා සිටියේ ඇය පළාගියහොත් එරට පොලිසිය විදේශ ගමන් බලපත්‍රයක් නොමැතිව "B" නම් රටෙහි රැඳී සිටීම සම්බන්ධයෙන් ඇයව බන්ධනාගාරයක කරනු ඇති බවත්, ඇය නැවත කිසි දිනෙක තම දරුවන් දැකගත නොහැකි වනු ඇති බවත් ය. ඇයට තව දුරටත් කියා සිටියේ, කෙදිනක හෝ පළායාමට උත්සාහ කළහොත් ඇගේ දරුවන් සිටින ස්ථානය සොයාගෙන ඔවුන්ට පීඩා කරන බවයි.

පසුව, අනෙක් පිරිමින් නිවස අසල නතර වීමට පටන් ගත් අතර, සාරාට ඔවුන් සමඟ ලිංගිකව හැසිරීමට බල කෙරෙයි. ඒ සඳහා ඇයව අල්ලා ගත් සිව්දෙනාට ගෙවනු ලැබේ. අවසානයේ දී, සාරාව ගණිකා නිවාසයකට විකුණනු ලබන අතර එහිදී ගණිකාවක් ලෙස දිගට ම වැඩ කිරීමට ඇයට බල කෙරෙයි. ඇගේ ඉපැයීම් ගණිකා නිවාසයේ හිමිකරු විසින් ගනු ලැබේ. එක් රාත්‍රියක පොලිස් විසින් ගණිකා නිවාසය වටලන ලදි. නිසි ලියකියවිලි නොමැතිව "B" නම් රටෙහි රැඳී සිටින බව සොයා ගැනීමත් සමඟ ම වහාම සාරාව එරටින් පිටුවහල් කරනු ලැබේ.[9]

[9] එහිම, 84.

ගැටලු :

1) සිද්ධි අධ්‍යයනය කියවා එම අවස්ථාව වෙළඳාම් කිරීමේ සිදුවීමක් ද ජාවාරම් කිරීමේ සිදුවීමක් ද යන්න තීරණය කරන්න.
2) ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

### 2.3 නීති විරෝධී සංක්‍රමණය



**ඔබ දැන සිටියා ද?**
**යාම් ඊමේ අයිතිය යනු**
**මානව අයිතිවාසිකමකි!**




**යාම් ඊමේ අයිතිය යන මානව අයිතිවාසිකම මූලිකාංග 03 කින් සමන්විත වේ:**[10]

| | | |
|---|---|---|
| 1) රටක භූමිප්‍රදේශය තුළ යාම් ඊමේ නිදහස | මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය- 1948, 13(1) ව්‍යවස්ථාව | 'සෑම තැනැත්තෙකුට ම ඒ ඒ රාජ්‍යයේ දේශසීමා තුළ යාම් ඊමේ සහ පදිංචිය සඳහා අයිතිය ඇත.' |
| 2) ඕනෑම රටක් හැර යාමට ඇති අයිතිය සහ | | |
| 3) ඔහුගේ හෝ ඇයගේ රටට පෙරළා පැමිණීමේ අයිතිය | මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය-1948, 13(2) ව්‍යවස්ථාව[11] | සෑම තැනැත්තෙකුට ම සිය රට ද ඇතුළුව ඕනෑම රටක් හැර යාමට මෙන්ම පෙරළා සිය රටට පැමිණීමට අයිතිය ඇත. |

**සංක්‍රමණය යනු** 'ජාත්‍යන්තර දේශ සීමාවක් හරහා හෝ රාජ්‍යයක් තුළ පුද්ගලයෙකුගේ හෝ පුද්ගලයින් කණ්ඩායමකගේ ගමන් කිරීමයි. එය ජනගහනයේ ගමන් කිරීමක් වන අතර දුර, සංයුතිය සහ හේතුන් කුමක් වුවද පුද්ගලයින්ගේ ඕනෑම ආකාරයක ගමන් කිරීමක් ඊට ඇතුළත් වේ.'

***සරණාගතයින් සංක්‍රමණය වීම,***

***අවතැන් වූවන්,***

***ආර්ථික සරණාගතයින්, සහ***

***පවුලට නැවත එක්වීම ඇතුළුව වෙනත් අරමුණු සඳහා ගමන් කරන පුද්ගලයින්*** මීට අයත් වේ.

---
10 https://www.iom.int/key-migration-terms
11 තවද බලන්න, 1966 සිවිල් හා දේශපාලනිකත අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ 12 වන වගන්තිය.

**නීතිවිරෝධී හෝ අක්‍රමවත් සංක්‍රමණය** යනු 'යවනු ලබන, තැනකින් තවත් තැනකට ගෙනයනු ලබන සහ යවනු ලබන රටවල නියාමන ප්‍රමිතීන්ට පිටින් සිදුවන ගමන් කරවීමකි.' සාමාන්‍යයෙන් නීතිවිරෝධී සංක්‍රමණයක් සිදුවන්නේ නිශ්චිත රටක සංක්‍රමණ නීති යටතේ අවශ්‍ය වන්නා වූ නීති හා රෙගුලාසි සපුරාලීමකින් තොරව කිසියම් කටයුත්තක් සඳහා පුද්ගලයෙකු සංක්‍රමණය වන විට ය. විදේශ ගමන් බලපත්‍රයක් සහ වලංගු වීසා බලපත්‍රයක් වැනි අත්‍යවශ්‍ය ගමන් ලියකියවිලි නොමැතිව දේශසීමා තරණය කිරීම ඊට ඇතුළත් විය හැකි ය. පුද්ගල වෙළඳාමේ වින්දිතයින් බවට පත් වූවන් බොහෝ විට නීති විරෝධී හෝ අක්‍රමවත් සංක්‍රමණිකයන් ලෙස වරදවා හඳුනාගන්නා අතර ඔවුන්ට සංක්‍රමණ ගාස්තු හෝ පිටුවහල් කිරීමකට මුහුණ දීමට සිදුවිය හැකි ය.

## 2.4 අපහරණය



අපහරණය ශ්‍රී ලංකාව තුළ වරදක් වන අතර එය දණ්ඩ නීති සංග්‍රහයේ 350, 351 සහ 352 යන වගන්තිවල අර්ථ දක්වා තිබේ.[12] අපහරණය දෙයාකාර වේ. එනම්, ලංකාවෙන් අපහරණය කිරීම සහ නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම ය.

| වගන්තිය | වරදේ නම |
|---|---|
| **351 වගන්තිය**<br>**ලංකාවෙන් අපහරණය කිරීම** | යම් තැනැත්තෙකුගේ කැමැත්ත නොමැතිව, හෝ ඔහු වෙනුවෙන් කැමැත්ත දීමට නීත්‍යානුකූලව බලය ඇති තැනැත්තෙකුගේ කැමැත්ත නොමැතිව ඔහු ලංකාවේ සීමා වලින් ඔබ්බට යමෙකු ගෙන ගියහොත්, ඔහු එකී තැනැත්තා ලංකාවෙන් අපහරණය කළ ලෙස සලකනු ලැබේ. |
| | |
| **352 වගන්තිය**<br>**නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කිරීම** | පුරුෂයෙකු නම් වයස 14 ට අඩු හෝ, ස්ත්‍රියක නම් වයස 16 ට අඩු වූ බාලවයස්කාරයෙකු හෝ සිහිය විකල වූ තැනැත්තකු එකී බාලවයස්කාරයාගේ හෝ සිහිය විකල වූ තැනැත්තාගේ නීත්‍යානුකූල භාරකාරයාගේ භාරයෙන් ඒ භාරකාරයාගේ කැමැත්ත නොමැතිව යමෙකු ***ගෙන ගියහොත්***, හෝ ***යෑමට පෙළඹුවහොත්*** ඔහු එකී බාලවයස්කාරයා හෝ තැනැත්තා නීත්‍යානුකූල භාරකාරත්වයෙන් අපහරණය කළ ලෙස සලකනු ලැබේ.<br>**පැහැදිලිකිරීම** – මේ වගන්තියේ 'නීත්‍යානුකූල භාරකාරයා' යන වචනවලට එකී බාල වයස්කාරයාගේ හෝ වෙනත් තැනැත්තාගේ ආරක්ෂාව හෝ භාරය නීත්‍යනුකූල ව භාර කරනු ලැබූ තැනැත්තෙක් ඇතුළත් වේ.<br>**ව්‍යතිරේඛය** – තමා අවිවාහජ/ සුජාත නොවන ළමයෙකුගේ පියෙකු බව සද්භාවයෙන් විශ්වාස කරන හෝ එකී ළමයා නීත්‍යානුකූලව තම භාරයේ තබාගැනීමට අයිතිය ඇති බව සද්භාවයෙන් විශ්වාස කරන තැනැත්තෙකුගේ ක්‍රියාවක් සම්බන්ධයෙන් එකී ක්‍රියාව කරනු ලැබුයේ දුරාචාර හෝ නීති විරෝධී කාර්යයකට නොවේ නම් මේ වගන්තිය අදාළ නොවේ. |

**දණ්ඩ නීති සංග්‍රහයේ 354 වගන්තිය අනුව,[13] යම් තැනැත්තෙකු ලංකාවෙන් හෝ නීත්‍යානුකූල භාරකාරත්වයෙන් යමෙකු අපහරණය කළහොත් ඔහුට** අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් **දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය.**

**අපහරණය යන්නට, යමෙකු ඔහුගේ හෝ ඔහු වෙනුවෙන් කැමැත්ත දීමට බලය ඇති තැනැත්තෙකුගේ කැමැත්ත නොමැතිව ලංකාවෙන් පිටතට ගෙන යාම ඇතුළත් වේ. බාල වයස්කරුවෙකුව නීත්‍යානුකූල භාරකරුගේ භාරයෙන් එකී භාරකරුගේ අවසරයකින් තොරව ඉවත් කිරීමේ අවස්ථාවක් ද එමගින් අදහස් කෙරෙයි.**

**අපහරණය යන වරද තැනැත්තන් වෙළඳාම් කිරීම යන වරදින් වෙනස් වේ.**

---

[12] 1883 අංක 02 දරන දණ්ඩ නීති සංග්‍රහය

[13] එහිම.

| අපහරණය | වෙළඳාම් කිරීම |
|---|---|
| **අපහරණය යන වරද තුළින්, ළමයෙකු නීත්‍යානුකූල භාරකාරත්වයෙන් ඉවත් කරන හෝ වැඩිහිටියෙකු සම්බන්ධයෙන් වන විට එම පුද්ගලයාගේ කැමැත්තෙන් තොරව එසේ සිදු කරන පුද්ගලයෙකු/යින් හෝ අපරාධමය වගකීමට යටත් කරයි.** | තැනැත්තන් වෙළඳාම් කිරීම යන්නේ දී පුද්ගලයින් බඳවාගැනීම, ප්‍රවාහනය, ස්ථාන මාරු කිරීම, ඉවත් කිරීම යනාදී කුමක හෝ නිරත වන පුද්ගල ජාලයක් සම්බන්ධ වේ. (360 ඇ වගන්තිය) |
| | |
| **බාලවයස්කරුවා අර්ථනිරූපණය කිරීමේ දී පිරිමි දරුවකු නම් අවුරුදු 14ට අඩු සහ ගැහැණු දරුවකු නම් අවුරුදු 16 ට අඩු ලෙස දක්වයි.** | ළමුන් වෙළඳාම් කිරීම යන වරදට අදාළව ළමයා යනු අවුරුදු 18ට අඩු තැනැත්තෙකු ලෙස අර්ථ නිරූපණය කරයි. |
| | |
| **ඇතැම්විට අපහරණය යන්න දරුවෙකු සූරාකෑම සඳහා යොදා ගන්නා ලද උපක්‍රමයක් විය හැකි ය.** | |
| | |
| **නීත්‍යානුකූල භාරකරුගේ කැමැත්ත පවතින විට පුද්ගලයෙකු වගකීමෙන් නිදහස් වේ.** | තැනැත්තන් වෙළඳාම යන වරදේ දී වංචාව, බලහත්කාරය පෑම, රැවටීම වැනි උපක්‍රම භාවිත කර ඇත්නම් අදාළ පුද්ගලයාගේ කැමැත්ත පැවතීම යන්න අදාළ නොවේ. එසේ ම අදාළ පුද්ගලයා ළමයෙකු අවස්ථාවක දී ඉහත උපක්‍රම යෙදාගත්තාක් මෙන් ම කැමැත්ත යන්න කිසිසේත් ම අදාළ නොවේ. |

## 2.5 පැහැරගෙන යාම




**පැහැරගෙන යාම ශ්‍රී ලංකාවේ අපරාධ නීතිය යටතේ වරදකි.**

| වගන්තිය | වරදේ නම |
|---|---|
| 353 වගන්තිය<br>**පැහැරගෙන යාම** | යමකු විසින් කිසියම් ස්ථානයකින් යාම පිණිස යම් තැනැත්තෙකුට බලහත්කාරකමින් බල කරතොත් හෝ යම් වංචා සහගත ක්‍රමවලින් හෝ බලය අයුතු ලෙස භාවිතා කිරීමෙන් හෝ වෙනත් බල කිරීමේ මාර්ගයකින් පොළඹවතොත් ඔහු ඒ තැනැත්තා පැහැරගෙන ගිය ලෙස සලකනු ලැබේ. |
| | |
| 355 වගන්තිය<br>**මිනීමැරුම සඳහා අපහරණය හෝ පැහැරගෙන යාම** | යම් තැනැත්තෙකු මරණයට පත්කිරීම සඳහා හෝ මරණය ලැබීමේ අන්තරායට භාජනය විය හැකි ලෙස දැමීම සඳහා යමකු අපහරණය කරතොත් හෝ පැහැරගෙන යතොත් ඔහුට අවුරුදු විස්ස දක්වා කාලයක, තදබල බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. |
| | |
| 356 වගන්තිය<br>**රහසිගතව හා අයුතු ලෙස යම් තැනැත්තෙකු සිරකර තැබීමේ අදහසින් අපහරණය කිරීම හෝ පැහැරගෙන යාම** | යම් තැනැත්තකු රහසිගතව හා අයුතු ලෙස සිරකර තැබීමේ අදහසින් යමකු අපහරණය කළොත් හෝ පැහැරගෙන ගියොත් ඔහුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. |


| | |
|---|---|
| | |
| **357 වගන්තිය**<br>**යම් ස්ත්‍රියක විවාහ කරවීම පිණිස අපහරණය කිරීම හෝ පැහැරගෙන යාම** | තමාගේ කැමැත්ත නොමැතිව, යම් තැනැත්තකු සමග විවාහ කරවීමට බල කරවීමේ අදහසින් හෝ එසේ බල කරවීමට ඉඩ ඇති බව දනිමින් හෝ නීති විරෝධී සංසර්ගයට බල කරවීම හෝ පෙළඹවීම සඳහා හෝ එසේ නීති විරෝධී සංසර්ගයට බල කරවීමට ඉඩ ඇති බව දනිමින් යමකු යම් ස්ත්‍රියක අපහරණය කලහොත් හෝ පැහැරගෙන ගියහොත් ඔහුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. |
| | |
| **358 වගන්තිය**<br>**බරපතල තුවාල කිරීමකට හෝ වහල් බවට ගැනීම් ආදියකට යම් තැනැත්තෙකු යටත් කිරීම සඳහා අපහරණය කිරීම හෝ පැහැරගෙන යාම** | යම් තැනැත්කෙු බරපතල තුවාල කිරීමකට හෝ වහල් කමකට හෝ යම් තැනැත්තකුගේ අස්වාභාවික කාමාශාවකට යටත් කිරීම සඳහා හෝ යටත් විය හැකි ලෙස කටයුතු සැලැස්වෙන පරිදි හෝ එසේ යටත් වීමට ඉඩ ඇති බව හෝ කටයුතු සැලැස්වීමට ඉඩ ඇති බව දනිමින් යමකු එකී තැනැත්තා අපහරණය කළහොත් හෝ පැහැරගෙන ගියහොත් ඔහුට අවුරුදු දහය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතු ය. |
| | |
| **359 වගන්තිය**<br>**අපහරණය කරනු ලැබූ තැනැත්තකු අයුතු ලෙස සැඟවීම හෝ සිර කර තබා ගැනීම** | යම් තැනැත්තකු අපහරණය කරනු ලැබූ බව හෝ පැහැරගෙන යනු ලැබූ බව දනිමින් යමෙකු එකී තැනැත්තා, අයුතු ලෙස සඟවතොත් හෝ සිර කර තබතහොත් යම් අදහසකින් හෝ දැනුමකින් හෝ යම් කාර්යයක් සඳහා එකී තැනැත්තා සඟවූයේ නම් හෝ, නතර කොට තැබුයේ නම්, එකී අදහසින් ම හෝ දැනුමෙන් ම හෝ එකී කාර්යය සඳහා එම තැනැත්තා අපහරණය කරනු ලැබූ සේ ම හෝ පැහැරගෙන යනු ලැබූ සේ ම ඔහුට දඬුවම් කළ යුතු ය. |
| | |
| **360 වගන්තිය**<br>**වයස අවුරුදු 10 ට අඩු ළමයකුගේ ශරීරයෙන් චංචල දේපළ සොරකම් කිරීමේ අදහසින් එබඳු ළමයෙකු අපහරණය කිරීම හෝ පැහැරගෙන යාම** | වයස අවුරුදු දහයකට අඩු ළමයකුගේ ශරීරයෙන් වංක ලෙස යම් චංචල දේපළක් ගැනීමේ (**උදාඃ දරුවා පැළඳි මාලයක්, වළල්ලක් සොරා ගැනීමේ අරමුණින්**) අදහසින් එබඳු දරුවකු අපහරණය කරන හෝ පැහැරගෙන යන තැනැත්තකුට අවුරුදු හත දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. තවද ඔහු දඩයකට ද යටත් විය යුතු ය. |

ඉහත දක්වා ඇති පරිදි, යම් තැනැත්තකු හෝ ළමයෙකු පැහැරගෙන යාම පිළිබඳව දණ්ඩ නීති සංග්‍රහයේ විවිධ විධිවිධාන මගින් පුළුල් ලෙස ආවරණය කෙරේ. දණ්ඩ නීති සංග්‍රහය මගින්, පැහැරගෙන යාම; මිනී මැරීමේ අදහසින් පැහැරගෙන යාම; රහසිගතව හා අයුතු ලෙස යම් තැනැත්තෙකු සිරකර තැබීමේ අදහසින් පැහැරගෙන යාම; යම් ස්ත්‍රියක විවාහ කරවීම පිණිස පැහැරගෙන යාම; බරපතල තුවාල කිරීමකට හෝ වහල් බවට ගැනීම් හෝ අයුතු සිරකර තැබීමට හෝ වයස අවුරුදු 10 ට අඩු ළමයකුගේ දේපළ සොරකම් කිරීමේ අදහසින් එබඳු ළමයෙකු පැහැරගෙන යාම යනාදිය අපරාධමය වැරදි බවට පත් කොට තිබේ. පැහැරගෙන යාම එනයින් ම වෙළඳාම් කිරීමක් නොවේ. කෙසේ වුවද, පැහැරගැනීම් යනු බලහත්කාරයෙන් විවාහ කරවීම සහ වහල්භාවය ඇතුළු සූරාකෑමේ අරමුණක් සඳහා පුද්ගලයන් රැවටීමකින් හෝ බලහත්කාරයෙන් ගෙනයාම සම්බන්ධ වන පැහැරගෙන යාම් වෙළඳාම් කිරීමක් වේ.

## 2.6 වහල්භාවය

**වහල් බව පිළිබඳ සම්මුතිය -1926**

එහි 1 (1) ව්‍යවස්ථාව තුළ වහල්භාවය යන්න අර්ථනිරූපණය කරනුයේ, "හිමිකාරීත්වයේ අයිතිවාසිකම්වලට බද්ධ වී ඇති යම් බලතල හෝ සියලු ම බලතල ක්‍රියාත්මක කරනු ලබන්නේ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් ද, ඒ තැනැත්තාගේ තත්ත්වය හෝ ස්ථාවරය වහල්භාවය වේ" යනුවෙනි.



එමගින් තවදුරටත් වහල් වෙළඳාම යන්න අර්ථ දක්වනුයේ, "යම් පුද්ගලයෙකු වහල්භාවයට යටත් කිරීමේ අදහසින් අල්ලා ගැනීම, අත්පත් කර ගැනීම හෝ බැහැර කිරීම හා සම්බන්ධ සියලු ක්‍රියා; වහලෙකු විකිණීම හෝ හුවමාරු කර ගැනීමේ අදහසින් ඔහු අත්පත් කර ගැනීම හා සම්බන්ධ සියලු ක්‍රියා; විකිණීමේ හෝ හුවමාරු කර ගැනීමේ අරමුණින් අත්පත් කරගත් වහලෙකු විකිණීම හෝ හුවමාරු කිරීම මගින් බැහැර කිරීම සිදු කරන සියලු ක්‍රියා සහ පොදුවේ ගත් කල, වහල් වෙළඳාම හෝ ප්‍රවාහනය සිදු කරන සෑම ක්‍රියාවක් ම" වශයෙනි. (1(2) ව්‍යවස්ථාව).

එසේම මෙම සම්මුතිය මගින්, "බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගත හැක්කේ පොදු අරමුණු සඳහා පමණි" යන්න දක්වමින් බලහත්කාරයෙන් වැඩ ගැනීම යන්න වෙන්කොට හඳුනාගෙන ඇති අතර, "අනිවාර්යයෙන් හෝ බලහත්කාරයෙන් වැඩ ගැනීම, වහල්භාවයට සමාන තත්ත්වයන් දක්වා වර්ධනය වීම වැළැක්වීමට" කටයුතු කරන ලෙසට රාජ්‍ය පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටී. (5 වන ව්‍යවස්ථාව).

වහල්භාවය, වහල් වෙළඳාම සහ වහල් භාවයට සමාන ආයතන හා පරිචයන් අහෝසි කිරීම පිළිබඳ අතිරේක සම්මුතිය, 1956

මෙම අතිරේක සම්මුතිය මගින් නිර්වචනය දීර්ඝ කළ අතර වහල්භාවයට අමතරව සාමූහිකව "දාස තත්ත්වය" (servile status) ලෙස හඳුනාගෙන ඇති පහත සඳහන් ආයතන හා භාවිතයන් අහෝසි කිරීමට රාජ්‍ය පාර්ශවයන් බැඳී සිටින බව දක්වයි. ඒවා නම්:

(අ) ණය බැඳුම්කරය[14],

(ආ) දාසභාවය[15]

(ඇ) ඕනෑම චාරිත්‍රයක් හෝ පරිචයක් අනුව:

1. *තමාට හෝ තම දෙමව්පියන්ට, භාරකරුට, පවුලට හෝ ඕනෑම පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට මුදල්මය ප්‍රතිෂ්ඨාවක් ලබා දීමට පොරොන්දු වීම හෝ ගෙවීම මත විවාහය ප්‍රතික්ෂේප කිරීමට අයිතියක් නැති කාන්තාවක්; හෝ*
2. *කාන්තාවකගේ ස්වාමිපුරුෂයාට, ඔහුගේ පවුලට හෝ ඔහුගේ වංශයට ලැබුණු වටිනාකමක් සඳහා හෝ වෙනත් ආකාරයකට ඇයව වෙනත් පුද්ගලයෙකු වෙත මාරු කිරීමට අයිතියක් පැවතීම; හෝ*
3. *කාන්තාවක් තම ස්වාමිපුරුෂයාගේ මරණය හේතුවෙන් වෙනත් පුද්ගලයෙකුට හිමි වීමට බැඳී සිටීම;*

(ඈ) වයස අවුරුදු 18 ට අඩු දරුවෙකු හෝ තරුණයෙකු, ඔහුගේ ස්වාභාවික දෙමව්පියන්ගෙන් එක් අයෙකු හෝ දෙදෙනා ම විසින් හෝ ඔහුගේ භාරකරු විසින් ළමයා හෝ තරුණයාව එසේත් නැතිනම් ඔහුගේ ශ්‍රමය සූරාකෑමේ අදහසින් ප්‍රතිලාභයක් ඇතිව හෝ නැතිව වෙනත් පුද්ගලයෙකුට ලබා දෙන ඕනෑම චාරිත්‍රයක් හෝ පරිචයක්.

---

[14] ණයක් සඳහා ඇපයක් වශයෙන් ණයකරුගේ හෝ ඔහුගේ පාලනය යටතේ සිටින තැනැත්තකුගේ පුද්ගලික සේවාවල සාධාරන ලෙස තක්සේරු කරන ලද වටිනාකම ණය මුදලට එරෙහිව හිලවු කරනු නොලැබුවේ නම් සහ එම සේවාවල කාල සීමාව හා ස්වභාවය නිශ්චිතව පෙන්නුම් කොට නැත්නම්, එම සේවා පොරොන්දු කිරීමකින් පැන නගින ණයකරුගේ තත්ත්වය හෝ ඔහු සිටින ස්ථාවරය අදහස් වේ;

[15] ප්‍රතිලාභයක් සඳහා හෝ එසේ නැතිව සහ තම තත්ත්වය වෙනස් කිරීමට නිදහසක් නොමැතිව වෙනත් තැනැත්තකුට අයත් ඉඩමක පදිංචිවීමට සහ වැඩ කිරීමට සහ එම තැනැත්තාට තීරණාත්මක සේවයක් ලබා දීමට නීතිය මගින්, චාරිත්‍ර මගින් හෝ ගිවිසුමක් අනුව බැඳී සිටින කුලී නිවැසියකුගේ තත්ත්වය හෝ ස්ථාවරය අදහස් වේ;

## 2006 අංක 16 දරන පනත මගින් සංශෝධිත දණ්ඩ නීති සංග්‍රහයේ 358 (අ) වගන්තිය අනුව (1)

*(අ) යම් තැනැත්තෙකු, ණය බැඳුම්කරයකට හෝ දාසභාවයට පත් කරවන හෝ එසේ පත් කරවීමට සලස්වන;*

*(ආ) යම් තැනැත්තෙකු, බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීමට යටත් කරවන හෝ එසේ යටත් කිරීමට සලස්වන;*

*(ඇ) යම් තැනැත්තෙකු වහල්කමට භාජනය කරවන හෝ එසේ භාජනය කිරීමට සලස්වන; හෝ*

*(ඈ) සන්නද්ධ අරගලයක දී යෙදවීම සඳහා යම් ළමයෙකු යොදා ගන්නා හෝ බඳවා ගන්නා,*

*තැනැත්තෙක් වරදකට වරදකරු වන්නේ ය.*



**(1) වන උප වගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේද යටතේ වූ වරදකට වරදකරු වන යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට ද (1) වන උප වගන්තියේ (අ), (ආ) හෝ (ඇ) ඡේදයන් යටතේ ළමයෙකුට අදාළව හෝ (1) වන උප වගන්තියේ (ඈ) ඡේදය යටතේ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක අවුරුදු තිහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට සහ දඩයකට ද ඔහු යටත් විය යුතු ය.**

### මූලික අර්ථනිරූපණයන්

| | |
|---|---|
| **ණය බැඳුම්කරය** | ණයක් සඳහා ඇපයක් වශයෙන් ණයකරුගේ හෝ ඔහුගේ පාලනය යටතේ සිටින තැනැත්තෙකුගේ පුද්ගලික සේවාවල සාධාරණ ලෙස තක්සේරු කරන ලද වටිනාකම ණය මුදලට එරෙහිව හිලව් කරනු නොලැබුවේ නම් සහ එම සේවාවල කාලසීමාව සහ ස්වභාවය නිශ්චිතව පෙන්නුම් කොට නැත්නම් එම සේවා පොරොන්දු කිරීමකින් (pledge) පැන නගින ණයකරුගේ තත්ත්වය හෝ ඔහු සිටින ස්ථාවරය අදහස් වේ. |
| **බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම** | පහත සඳහන් කර ඇති වැඩ හෝ සේවා හැර, යම් **දණ්ඩන නියමයක තර්ජනය** යටතේ එම තැනැත්තාගෙන් ලබා ගන්නා සහ එම තැනැත්තා විසින් ඉටු කිරීම සඳහා **සිය කැමැත්තෙන් ම ඉදිරිපත් නොවූ** සියලු වැඩ සහ සේවා අදහස් වේ :-<br>**අ.** අනිවාර්ය හමුදාමය සේවයට තත්කාලයේ අදාළ වන්නා වූ යම් නීති නිසාවෙන් පැන නගින හුදෙක් හමුදාමය ස්වභාවයක වැඩක් හෝ සේවයක්;<br>**ආ.** සම්පූර්ණ ස්වයං පාලනයක් ඇති රටක පුරවැසියන්ගේ සාමාන්‍ය ප්‍රජා වගකීම්වල කොටසක් වන යම් වැඩක් හෝ සේවයක්;<br>**ඇ.** යම් අධිකරණයක් විසින් පනවන ලද දඬුවමක් වශයෙන් යම් තැනත්තෙකුගෙන් ගනු ලබන යම් වැඩක් හෝ සේවයක්; එසේ වුවද එම වැඩ හෝ සේවය රාජ්‍ය බලධරයෙකුගේ අධීක්ෂණය හා පාලනය යටතේ සිදු කළ යුතු අතර, එම තැනැත්තා පුද්ගලයන් හෝ සමාගම් හෝ සංවිධාන විසින් කුලියට ගෙන නොතිබිය යුතු ය; නැතහොත් එම පුද්ගලයන්ගේ හෝ සමාගම්වල හෝ සංවිධානවල සේවය සඳහා නොයොදා තිබිය යුතු ය;<br>**ඈ.** හදිසි අවස්ථාවන්හි දී ඉටු කර ගනු ලබන වැඩ හෝ සේවා; එනම් යුද්ධයක් ඇති වූ විට හෝ ගින්නක්, ජල ගැල්මක්, සාගතයක්, භූමි කම්පාවක්, දරුණු රෝග වසංගතයක්, සත්තු, කෘමි හෝ එළවළු පරපෝෂිතයන් විසින් ආක්‍රමණය කිරීම වැනි උවදුරක දී හෝ උවදුරු තර්ජනයක දී සහ පොදුවේ සම්පූර්ණ ජනගහනයේ හෝ ඉන් කොටසක පැවැත්ම හෝ යහපතට තර්ජනයක් විය හැකි යම් අවස්ථානුගත කරුණක දී සිදු කරනු ලබන වැඩ හෝ සේවා; |

| | |
|---|---|
| | **ඉ.** යම් ජන සමාජයක ඍජු යහපත උදෙසා එම ජනසමාජයේ සාමාජිකයන් විසින් ඉටු කරනු ලබන්නා වූ ද, එමගින් එය එකී ජනසමාජයේ සාමාජිකයන් වෙත පැවරුණු සාමාන්‍ය ප්‍රජා වගකීම් ලෙස සලකන ලබන්නා වූ ද සුළු සේවාඃ එසේ වුව ද එම සේවාවල අවශ්‍යතාවය සම්බන්ධයෙන් එම ජන සමාජයේ සාමාජිකයන්ගෙන් හෝ ඔවුන්ගේ ඍජු නියෝජිතයන්ගේ අදහස් විමසනු ලැබීමේ අයිතිය ඔවුන්ට තිබිය යුතු ය. |
| **දාස භාවය** | ප්‍රතිලාභයක් සඳහා හෝ එසේ නැතිව සහ තම තත්ත්වය වෙනස් කිරීමට නිදහසක් නොමැතිව වෙනත් තැනැත්තකුට අයත් ඉඩමක පදිංචි වීමට සහ වැඩ කිරීමට සහ එම තැනැත්තාට තීරණාත්මක සේවයක් ලබා දීමට නීතිය මගින්, චාරිත්‍ර මගින් හෝ ගිවිසුමක් අනුව බැඳී සිටින කුලී නිවැසියකුගේ තත්ත්වය හෝ ස්ථාවරය අදහස් වේ. |
| **වහල්භාවය** | හිමිකාරත්වයේ අයිතිවාසිකම්වලට බද්ධ වී ඇති යම් බලතල හෝ සියලු ම බලතල ක්‍රියා**ත්මක** කරනු ලබන්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාගේ තත්ත්වය හෝ ස්ථාවරය අදහස් වේ. |
| **ළමයා** | වයස අවුරුදු **18** ට **අඩු** තැනැත්තකු |

"තැනැත්තන් වෙළඳාම් කිරීම," "මිනිස් වෙළඳාම," සහ "නූතන වහල්භාවය" යනා දී වචන ලිංගික වෙළඳාම සහ බලෙන් වැඩ ගැනීම යන දෙක ම හැඳින්වීම සඳහා යොදා ගනු ලබයි.[16] පැලමෝර් සංධානය මගින්, වහල්භාවය හෝ වහල්භාවයට සමාන පරිචයන්, බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම සහ පරවශ්‍යතා සූරාකෑමේ ස්වරූපයන් ලෙස හඳුනා ගනී.

## b. ළමා වෙළඳාමට තල්ලු කරනා සහ ඇදගන්නා සාධක (Push &Pull Factors)

ව්‍යවස්ථා/නීති හඳුන්වා දීම හා බලාත්මක කිරීම සහ පුද්ගල වෙළඳාමෙහි යෙදෙන්නන්ට එරෙහිව නඩු පැවරීම මගින් පමණක් නොව, සියලු ම පුද්ගලයින්, විශේෂයෙන්ම කාන්තාවන් සහ ළමයින් සූරාකෑමට ලක්වන සියලු ආකාරයන් පෝෂණය කරන්නා වූ ඉල්ලුම අධෛර්යමත් කිරීම පිණිස, ද්විපාර්ශ්වීය හා බහුපාර්ශ්වීය සහයෝගීතාව හරහා ව්‍යවස්ථාදායක හා **අධ්‍යාපනික, සමාජීය හෝ සංස්කෘතික** පියවරයන් වැනි වෙනත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම හා ශක්තිමත් කිරීම තුළින්, පුද්ගල වෙළඳාමේ තල්ලු කරන සාධක (**PUSH FACTORS)** සහ **ඇදගන්නා** සාධක (**PULL FACTORS)** තුරන් කිරීමේ වැදගත්කම පැලමෝර් සංධානය හඳුනා ගනී.

### තල්ලු කරනා සහ ඇදගන්නා සාධක (Push & Pull factors) යනු මොනවා ද?




යම් තැනැත්තෙකු, පුද්ගල වෙළඳාමට ගොදුරු වීමට හේතු වන විශාල හා සංකීර්ණ සාධක සමූහයක් පවතී. බොහෝ විට මේවා **"තල්ලු කරනා" ("push") හෝ සැපයුම් පාර්ශවයේ සාධක ("supply-side") සහ** "ඇදගන්නා" **("pull") හෝ ඉල්ලුම් පාර්ශවයේ සාධක ("demand-side" factors)** යන යෙදුම් මගින් විස්තර කරනු ලබයි. මෙකී යෙදුම් මගින් යෝජනා කරන පරිදි, මුලින් සඳහන් කරන ලද තල්ලු කරන සාධක **(Push factors)** මගින්**,** පහසුවෙන් ගොදුරු බවට පත්විය හැකි පිරිස් තමන්ව පුද්ගල වෙළඳාමට ලක්වීමේ වැඩි අවදානමක් ඇති අවස්ථාවන් කෙරෙහි තල්ලු කරවන අතර, දෙවනුව සඳහන් කරන ලද ඇදගන්නා සාධක මගින්, **(Pull factos)** දැනටමත් උපද්‍රවකාරී තත්ත්වයන් යටතේ ජීවත්වන පිරිස්, දැනට ඔවුන් සිටින තත්ත්වයට වඩා වාසිදායක ජීවන විකල්පයන් සෙවීම කෙරෙහි ඇද දමයි.

"තල්ලු කරන සාධක" (Push factors) යන්න, දුප්පත්කම, ස්ත්‍රී පුරුෂභාවය මත වෙනස්කොට සැලකීම, ගැටුම්, ස්වාභාවික විපත් වැනි සාර්ව මට්ටමේ පහසුවෙන් ගොදුරු විය හැකි සාධකවලින් සමන්විත වන අතර, " ඇදගන්නා සාධක"

[16] https://www.state.gov/j/tip/what/

(Pull factos) අතරට වාණිජමය ලිංගික ශ්‍රමය සපයන්නන් සහ ගෘහ සේවිකාවන් සඳහා වන ගෝලීය ඉල්ලුම වැඩි වීම ආදිය ඇතුළත් වේ. දුප්පත්කම සහ ධනය යනු සාපේක්ෂ සංකල්ප වන අතර වින්දිතයින් අන්ත දරිද්‍රතාවයේ තත්ත්වයන්ගේ සිට දරිද්‍රතාවයේ අඩු අන්තයක තත්ත්වයන් දක්වා ගමන් කරවන්නා වූ සංක්‍රමණ සහ පුද්ගල වෙළඳාමේ රටාවන්ට කෙරෙහි යොමු කරවයි. එකී සන්දර්භය තුළ, සංවර්ධනය වෙමින් පවතින ලෝකය පුරා අන්තර්ජාලය ඇතුළු විකාශන හා විදුලි සංදේශ මාධ්‍ය වේගයෙන් ව්‍යාප්ත වීම සංවර්ධිත රටවලට සංක්‍රමණය වීමේ ආශාව වැඩි කර ඇති අතර, ඒ සමඟම, සංක්‍රමණිකයින් බවට පත් වීමට සිටින්නන් පුද්ගල වෙළඳාමට ගොදුරු වීමේ අවදානමක් ද පවතී.”[17]

කෙසේ වෙතත්, එකී පහසුවෙන් ගොදුරු කරවන සුළු කිසිදු සාධකයක් පුද්ගල වෙළඳාමට හේතුවක් ලෙස හඳුනාගත නොහැකිය; ඒ වෙනුවට, එම සාධක සංකීර්ණ හා පැටලුම් සහගත ආකාරවලින් එකිනෙක හා සම්බන්ධ වන අතර අන්‍යෝන්‍ය වශයෙන් බලපෑනු ලබයි.




මූලාශ්‍රයඃ https://hopenow.dk/what-is-human-trafficking/?lang=en

අභ්‍යාසය 3



-3 දෙනා හෝ 4 දෙනා බැගින් වූ කාණ්ඩායම් ලෙසින් තැනැත්තන් වෙළඳාම් කිරීම සඳහා වන මූල හේතු සාකච්ඡා කරන්න.

- එක් එක් කණ්ඩායම විසින් හඳුනා ගන්නා සියලු ම තල්ලු කරන හා විසි කරන සාධක (push and pull factors) ඇතුළත් කර ලැයිස්තුවක් සාදන්න.

- එක් හේතුවක් අනෙක් හේතූන්ට වඩා වැදගත් ද?

[17] Toolkit to Combat Trafficking in Persons, UNODC https://www.unodc.org/documents/human-trafficking/Toolkit-files/08-58296_tool_9-2.pdf

ශ්‍රී ලංකාව තුළ ළමයින් වෙළඳාම් කිරීම කෙරෙහි යොමු කරවන්නා වූ **තල්ලු කරන** සහ **ඇදගන්නා** සාධක (push and pull factors) හඳුනා ගන්න. ඒ ඇසුරින් අදාළ තීරු පුරවන්න.

| තල්ලු කරන සාධක | ඇදගන්නා සාධක | අනෙකුත් සාධක |
|---|---|---|
| | | |

**සටහන:** ඔවුන්ගේ භූගෝලීය පිහිටීම, ආර්ථික ස්වභාවය හෝ තත්ත්වය එසේත් නැතිනම් අධ්‍යාපන තත්ත්වය, ජනවාර්ගිකත්වය හෝ ආගම යනාදිය හේතුවෙන් ළමයින් සම්බන්ධයෙන් වන තල්ලු කරන/ ඇදගන්නා සාධක (Push/Pull Factors) පොදු බවට සැලකිය හැකි ය. සෙසු කණ්ඩායම් සමඟ සාකච්ඡා කර ලැයිස්තුව අවසන් කරන්න. හඳුනාගත් තල්ලු/ ඇදගන්නා සාධක සඳහා කෙටි පැහැදිලි කිරීමක් සපයන්න.

### C. වෙළඳාම සිදුකරන්නන්

### 2.7 ලිංගික සූරාකෑම/ කාමුක දර්ශන (pornography)

ගණිකා වෘත්තිය සහ ලිංගික සූරාකෑම සඳහා තැනැත්තන් වෙළඳාම් කිරීම ලොව පුරා පුද්ගල වෙළඳාමේ වඩාත් ප්‍රචලිත ආකාරයකි. සෑම වසරක දී ම ලිංගික කර්මාන්තය තුළ කාන්තාවන් සහ ළමුන් වාණිජමය වශයෙන් සූරාකෑමට ලක් වේ. ලිංගික වෙළඳාම රටින් පරිබාහිරව මෙන්ම රට තුළ ද සිදුවිය හැකි ය.

**වර්ෂ 2002 ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළඳාම් කිරීම වැළැක්වීම සහ ඒවාට එරෙහිව සටන් කිරීම පිළිබඳ සාර්ක් සම්මුතිය** කාන්තාවන් සහ ළමුන් ගණිකා වෘත්තියේ යෙදවීම සඳහා වෙළඳාම් කිරීම පිළිබඳව විශේෂයෙන් ම දක්වයි.

සූරාකෑම හා ඒ ආශ්‍රිත වැරදි සඳහා ළමුන් වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ නීති ගණනාවක් පවතී. ඒවා නම්;

- දණ්ඩ නීති සංග්‍රහය
- 1889 ගණිකා නිවාස ආඥා පනත
- අයාල ආඥා පනත
- අශ්ශීල ප්‍රකාශන ආඥා පනත
- ළමා හා යෞවන (හානිකර ප්‍රකාශන) පනත

**තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ වාර්තාව - 2018**

තැනුත්තන් වෙළඳාම් කිරීමේ (TIP) 2018 වාර්තාව මගින්, දේශීය ජනතාවට මිනිස් වෙළඳාම යන්න කල්තියා ම විසඳා ගත හැකි ඵලදායී ආකාරයන් මොනවා ද යන්න සහ රජයන් විසින් ඔවුන්ට සහයෝගය දැක්විය හැක්කේ හා සවිබල ගැන්විය හැක්කේ කෙසේ ද යන්න පිළිබඳව අවධානය යොමු කරයි.

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සලකන විට, එය මූලික වශයෙන් ම මිනිස් වෙළඳාම සඳහා ප්‍රභවයක්, ගමනාන්තයක් වන අතර, යම්තාක් දුරට බලහත්කාරයෙන් ශ්‍රමය සපයන හා ලිංගික වෙළඳාමට ලක්වන පිරිමින්, කාන්තාවන් සහ ළමුන් සඳහා නවාතැන්පොළක් වන රටකි. ඉදිකිරීම්, ඇඟලුම් හා ගෘහ සේවා අංශවල වැඩ කිරීම සඳහා මැදපෙරදිග, අග්නිදිග ආසියාව සහ ඇෆ්ගනිස්ථානය වෙත සංක්‍රමණය වන ඇතැම් ශ්‍රී ලාංකික පිරිමින්, කාන්තාවන් සහ ළමයින් බලහත්කාරයෙන් වැඩ ගැනීමට යටත් කරනු ලැබේ. රට තුළ කාන්තාවන් සහ ළමුන් ගණිකා නිවාසවල ලිංගික වෙළඳාමට ලක් වේ.

ශ්‍රී ලංකා රජය විසින් තැනැත්තන් වෙළඳාම් කිරීම තුරන් කිරීම සඳහා වන අවම ප්‍රමිතීන් සපුරා නොමැති බව ඉහත සඳහන් කළ TIP වාර්තාව සඳහන් කරයි. කෙසේ නමුත් ඒ සඳහා සැලකිය යුතු උත්සාහයක් රජය විසින් දරයි.[18]

පුද්ගල වෙළඳාමේ වින්දිතයින් වීමට වැඩි ඉඩක් ඇති පුද්ගලයින් හඳුනා ගැනීම සහ ජාතික දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කිරීමට හා වින්දිතයින් හඳුනා ගැනීමේ සහ යොමු කිරීමේ ක්‍රියා පටිපාටි පිළිබඳව ග්‍රාමීය, දිස්ත්‍රික් හා රාජ්‍ය නිලධාරීන් මෙන්ම සිවිල් සමාජ ක්‍රියාකාරීන් සිය ගණනක් පුහුණු කිරීම සඳහා ජාත්‍යන්තර සංවිධානයක් සමඟ හවුල්කාරිත්වයක් ඇති කරගැනීමෙන් රජය මේ සම්බන්ධයෙන් වැඩි වැඩියෙන් උත්සාහ කරන බවට එහි සඳහන් විය. තවද, රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවලට සාක්ෂි වාර්තා කිරීමට සහ වින්දිතයින්ගෙන් හෝ විදේශයන්හි සාක්ෂිකරුවන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමට රජය විසින් නීති සංශෝධනය කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගල වෙළඳාම සම්බන්ධ ප්‍රකාශ 29 ක් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ (CID) වැඩිදුර විමර්ශනය සඳහා යොමු කරන ලදී.

කෙසේ වෙතත්, ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක අවම ප්‍රමිතීන් සපුරාලීමට රජය අපොහොසත්ව ඇත. නිදසුනක් වශයෙන්, අඛණ්ඩව සිව්වන වරටත් රජයේ පුද්ගල වෙළඳාම් පනත යටතේ කිසිදු වෙළඳාම්කරුවෙකු අධිකරණය විසින් වරදකරු කර නැත. ඒ වෙනුවට අඩු දඬුවම් පැමිණවිය හැකි ප්‍රසම්පාදන නීතිය යටතේ පුද්ගල වෙඳාම පිළිබඳ නඩු විභාග කිරීම සඳහා ඔවුහු දිගටම කටයුතු කළහ. එපමණක් නොව, රජය විසින් පිරිමි වින්දිතයින්ට කිසිදු විශේෂිත සේවාවක් ලබා නොදුන් අතර කාන්තා සංක්‍රමණික සේවිකාවන් සහ ගෘහ සේවය සඳහා සංක්‍රමණය වන්නන් සඳහා නිශ්චිත අවශ්‍යතා පවත්වාගෙන යනු ලැබී ය. නිරීක්ෂකයින් සඳහන් කළ පරිදි, මෙම ප්‍රවණතාවය කාන්තාවන් නීති විරෝධී ලෙස සංක්‍රමණය වීමේ සම්භාවිතාව වැඩි කරන අතර එමඟින් මිනිස් වෙළඳාමට ඇති අවදානම වැඩි කරයි.

| නඩු පැවරීම | ආරක්ෂණය |
|---|---|
| පුද්ගල වෙළඳාම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නීතිය බලාත්මක කිරීමේ සමස්ත උත්සාහයන් අඩු බව වාර්තාවේ සඳහන් විය. වින්දිතයින් කල්තියා හඳුනා ගැනීමට දේශීය නිලධාරීන්ට ඇති හැකියාව අඩු වූ අතර ගණිකා වෘත්තිය, සොරකම් කිරීම හෝ සංක්‍රමණික වැරදි සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් හෝ චෝදනාවට ලක්වූ පුද්ගලයින් අතරින් පුද්ගල වෙළඳාමේ දර්ශකයන් ආවරණය කිරීමට බලධාරීන් ප්‍රමාණවත් උත්සාහයක් ගනු නොලැබී ය. ඇතැම් උප නියෝජිතයන් විදේශ සංචාර සඳහා පහසුකම් සැලසීම සඳහා ව්‍යාජ දත්ත සහිත කූඨ හෝ නවීකරණය කරන ලද ලේඛන ලබා ගැනීමට නිලධාරීන් සමඟ කටයුතු කළ බව ද එහි සඳහන් කරන ලදි. | ආරක්ෂණ උත්සහයන්වල දී රජයන් ප්‍රමාණවත් දියුණුවක් ලබා ඇති බව වාර්තාව සඳහන් කරයි. පුද්ගල වෙළඳාමේ වින්දිතයින් 46 දෙනෙකු හඳුනා ගැනීම රජය විසින් වාර්තා කර ඇති අතර එය 2016 දී හඳුනාගත් පුද්ගල වෙළඳාමේ වින්දිතයින් විය හැකි සංඛ්‍යාව වන 23 ට සාපේක්ෂව ඉහළ යාමකි.<br><br>පුද්ගල වෙළඳාමේ වින්දිතයන් විය හැකි තැනැත්තන් හඳුනා ගැනීමට සහ ඔවුන්ව ආරක්ෂණ සේවාවන් සඳහා යොමු කිරීමට රජය විසින් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (Standard Operating Procedures -SOPs) භාවිතා කළ අතර ජාත්‍යන්තර සංවිධානයක් සමඟ සහයෝගයෙන් සිවිල් සමාජ ක්‍රියාකාරීන් 875 දෙනෙකු සහ සෞඛ්‍ය, පරිවාස, පොලිස්, ආගමන, අපරාධ විමර්ශන සහ ජාතික ළමා ආරක්ෂණ අධිකාරියේ (NCPA) නිලධාරීන් ද ඇතුළුව, ජාතික, දිස්ත්‍රික් හා රාජ්‍ය මට්ටමේ නිලධාරීන් සඳහා වින්දිතයින් හඳුනා ගැනීම සහ යොමු කිරීම පිළිබඳ විවිධ පුහුණු කිරීම් සිදු කරන ලදී.<br><br>කෙසේ වෙතත්, රජය විසින් අදාළ ආයතනවල කාර්ය මණ්ඩලයට අනුගමනය කිරීම සඳහා මග පෙන්වීමට ඒ ඒ ආයතනවලට චක්‍රලේඛ සහ නියෝග නිකුත් කර නොතිබුණු අතර රජය සහ සිවිල් සමාජයේ සාමාජිකයින් ප්‍රකාශ කළේ වෙළඳාමට ගොදුරු වූ වින්දිතයින් හඳුනා ගැනීමට දේශීය නිලධාරීන්ට ඇති හැකියාව අඩු බවය. |

[18] ශ්‍රී ලංකාවේ පුද්ගල වෙළඳා පිළිබඳ වාර්තාව, 394

**ශ්‍රී ලංකාව සඳහා පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරන ලදී**

නිසි ක්‍රියාදාමයට ගරු කරන අතරම, පුද්ගල වෙළඳාමට අනුබල දෙන නිලධාරීන් ද ඇතුළුව වෙළඳාමේ නිරත වන බවට සැක සහිත තැනැත්තන් පිළිබඳව විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට මෙන්ම වෙනත් බරපතල අපරාධවලට අදාළව වැරදිකරුවන් කර සුදුසු දඬුවම් නියම කිරීමට අදාළ උත්සාහයන් රජය විසින් වැඩි දියුණු කළ යුතුය;

- පුද්ගල වෙළඳාමට ලක්වීමේ ඍජු ප්‍රතිඵලයක් ලෙස සිදුකරන ලද ආගමන නීති උල්ලංඝනය කිරීම් හෝ ගණිකා වෘත්තිය වැනි නීති විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් වින්දිතයින් රඳවා තබා ගැනීම හෝ ඔවුන්ට වෙනත් ආකාරයකින් දඬුවම් නොලැබීම සහතික කිරීම පිණිස, වින්දිතයින් කල්තබා හඳුනා ගැනීමට සහ වින්දිතයින් හඳුනාගැනීමේ සහ යොමු කිරීමේ ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන් නිලධාරීන් පුහුණු කිරීම සඳහා වන උත්සහයන් වැඩි කිරීම;
- පුරුෂයින් සහ ළමයින් ඇතුළුව හඳුනාගත් වින්දිතයින්ට, විශේෂිත සත්කාර සේවා ලැබීම සහතික කිරීම සඳහා ආරක්ෂණ සේවා වැඩි දියුණු කිරීම, බඳවා ගන්නන් විසින් ශ්‍රමිකයින්ගෙන් අය කරනු ලබන සියලු ම බඳවා ගැනීමේ ගාස්තු ඉවත් කිරීමට පියවර ගැනීම සහ ඒ වෙනුවට සේවා යෝජකයින් විසින් ශ්‍රමිකයින්ට ගෙවීම් සිදු කරනු ලබන බවට සහතික වීම;
- උප නියෝජිතයින් නියාමනය කිරීම පිණිස විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ බලය පුළුල් කිරීම;
- ආරක්ෂිත සහ නීතිමය සංක්‍රමණයන් ප්‍රවර්ධනය කිරීම සහ සංක්‍රමණ රෙගුලාසි තුළ ස්ත්‍රී පුරුෂ භාවය මත වෙනස් කොට නොසැලකෙන බවට සහතික කිරීම; රජයේ තිරසාර සම්බන්ධීකරණ උත්සාහයන් ආයතනිකරණය කිරීම සඳහා කාර්ය සාධක බලකායේ උත්සාහයන් වැඩි කිරීම.

## 2.8 ශ්‍රම හෝ ආර්ථික සූරාකෑම




ශ්‍රමය හෝ ආර්ථික සූරාකෑම සඳහා ළමයින් රට තුළ දී මෙන්ම ඉන් පිටතට ද වෙළඳාම් කරනු ලැබේ. ශ්‍රම සූරාකෑමේ ආකාරයන්ට සිඟමන්හි යෙදවීම, උපද්‍රවකාරී වැඩ සඳහා යොදා ගැනීම මෙන්ම අතීතයේ පුවත්පත්වල වාර්තා කොට ඇති පරිදි මැද පෙරදිග ඔට්ටුවලට ඔටුවන් එළවන්නන් ලෙස යොදා ගැනීම යනාදිය අයත් වේ. අතහැර දැමූ ළමුන්, වීදි දරුවන් හෝ යුදගැටුම්වලට මැදි වූ දරුවන් සංවිධානාත්මක වෙළඳ ජාලවල ගොදුරු බවට පත්වන වින්දිතයන් විය හැකි ය.


තැනැත්තන් වෙළඳාම් කිරීම අධීක්ෂණය හා වැළැක්වීම සඳහා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව 2017 දී වාර්තාවක් නිකුත් කර තිබේ. මෙම වාර්තාවේ, ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳව මෙසේ සඳහන් කරයි;[19]

ඉදිකිරීම්, ඇඟලුම් හා ගෘහ සේවා අංශවල වැඩ කිරීම සඳහා මැදපෙරදිග, අග්නිදිග ආසියාව සහ ඇෆ්ගනිස්ථානය වෙත සංක්‍රමණය වන ඇතැම් ශ්‍රී ලාංකික පිරිමින්, කාන්තාවන් සහ ළමුන් බලහත්කාරයෙන් වැඩ ගැනීමට යටත් කරනු ලැබේ. රට තුළ, කාන්තාවන් සහ ළමුන් ගණිකා නිවාසවල ලිංගික වෙළඳාමට ලක් වේ. වෙරළබඩ ප්‍රදේශවල සංචාරකයින් සඳහා ළමා ලිංගික ශ්‍රමය සපයන ව්‍යාපාරයන්හි වාණිජමය වශයෙන් ලිංගික සූරාකෑමට ලක්වන පිරිමි ළමයින් ප්‍රමාණය ගැහැණු ළමයින්ට වඩා වැඩිය. ළමයින්ට, ශාරීරික විකෘතිතා ඇති පුද්ගලයින්ට සහ සමාජීය වශයෙන් පහසුවෙන් අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට අයත් තැනැත්තන්ට ශ්‍රී ලංකාවේ විශාලතම නගරවල හිඟාකෑමට හෝ අපරාධ ක්‍රියාකාරකම්වල යෙදීමට බල කෙරෙයි."

[19] https://www.state.gov/j/tip/rls/tiprpt/countries/2017/271284.htm

එබැවින්, විදේශ රැකියා සහ ගෘහ සේවක ආයතන යන ආවරණයන් භාවිතා කරමින් සිදු කරනු ලබන ශ්‍රී ලංකාවේ ළමා වෙළඳාම වැළැක්වීම සඳහා විශේෂයෙන් පහත සඳහන් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කළ යුතු බවට මෙම අධීක්ෂණ වාර්තාව යෝජනා කර තිබේ.

2018 පුද්ගල වෙළඳාම පිළිබඳ වාර්තාවට අනුව, වාර්තා කාලසීමාව තුළ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ පොලීසිය විසින් පුද්ගල වෙළඳාම් පිළිබඳ විමර්ශන 15 ක් ආරම්භ කරන ලද අතර ඉන් 10 ක් බලහත්කාරයෙන් වැඩ ගැනීම් බවට පත් විය හැකි සිදුවීම් ලෙසත්, 4 ක් ලිංගික වෙළඳාම් ලෙසත්, 1 ක් සූරාකෑම සඳහා ළමයෙකු විකිණීම ලෙසත් වර්ගීකරණය කර ඇත.[20]




**1883 අංක 02 දරණ දණ්ඩ නීති සංග්‍රහයේ විධිවිධාන**

**2006 අංක 16 දරන පනත මගින් සංශෝධිත 360ඇ (ආ) වගන්තිය**

**'බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම හෝ සේවය ලබා ගැනීමේ, වහල්භාවයේ යෙදවීමේ, පරවශතාවයේ, ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ යෙදවීමේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා'** යොදා ගැනීමේ කාර්යය සඳහා 'තර්ජනය කිරීමෙන්, බලහත්කාරයෙන්, වංචාවෙන්, රැවටීමෙන්, පෙළඹවීමෙන් හෝ වෙනත් තැනැත්තෙකුගේ පීඩාකාරී තත්ත්වයකින් අයුතු ප්‍රයෝජන ගැනීමෙන්'' යම් තැනැත්තෙකු බඳවා ගන්නා, ප්‍රවාහනය කරන, ස්ථාන මාරු කරන, ආරක්ෂාව සලසා දෙන, භාර ගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදු කරන කවර හෝ තැනැත්තෙකු තැනැත්තන් වෙළඳාම් කිරීමේ වරදට වරදකරු වන්නේ ය.



තැනැත්තන් වෙළඳාම් කිරීමේ වරද සිදු කරන යම් තැනැත්තෙක් වරදකරු කරනු ලැබීමේ දී **අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා** දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ඔහුට දඬුවම් කළ යුතු අතර දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය හැකි ය. තවද ළමයෙකු සම්බන්ධයෙන් එම වරද සිදු කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තාට අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් ඔහුට දඬුවම් කළ යුතු අතර දඩයකින් ද ඔහුට දඬුවම් කරනු ලැබිය හැකි ය.

[20] එහිම

<table>
<tr><td colspan="2">1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ පනත</td></tr>
<tr><td>34 වගන්තිය අර්ථනිරූපණ වගන්තිය</td><td>“ළමයා” යනු වයස අවුරුදු 14 ට අඩු තැනැත්තෙකු වේ.</td></tr>
<tr><td>2003 අංක 08 දරන පනතින් සංශෝධිත 14 (1) වගන්තිය</td><td>පහත සඳහන් අවස්ථාවන්හි පමණක් දරුවන් සේවයෙහි යොදවා ගත හැකි ය -<br>(අ) දිනපතා පාසල ආරම්භ වීමේ විධිමත් වේලාවන්ට පෙර හෝ පාසැල අවසන් වීමේ වේලාවට පසුව ඔහුගේ දෙමව්පියන් හෝ භාරකරු විසින් කරගෙන යනු ලබන සැහැල්ලු කෘෂිකාර්මික හෝ උද්‍යාන වැඩකටයුතුවල හෝ ඒ හා සමාන වැඩ කටයුතුවල හැර, හෝ ;<br>(b) යම් රාජ්‍ය අධිකාරියක් විසින් අධීක්ෂණය කරනු ලබන්නා වූ සහ යම් වෙළඳාමක් හෝ රැකියාවක් සඳහා යම් තාක්ෂණික අධ්‍යනයක් හෝ වෙනත් පුහුණුවක් ලබා දෙන්නා වූ යම් පාසලක හෝ ආයතනයක සේවයේ නියුක්ත කරවනු ලැබිය හැකි ය.</td></tr>
<tr><td colspan="2">මේ වගන්තියේ 1 වන උප වගන්තිය උල්ලංඝනය කරමින් ළමයෙකු සේවයේ සේවයේ යොදවා ඇති නම් එම සේවා යෝජකයා හෝ ක්‍රියාව හෝ පැහැර හැරීම ආරෝපණය කළ හැකි පුද්ගලයා (සේවයේ යොදවා ඇති දරුවා හැර) මෙම පනත යටතේ වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ද, නැතහොත් එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ එම තැනැත්තා යටත් විය යුතු අතර, ඊට අමතරව වරද සිදු කරනු ලැබුවේ යම් ළමයෙකු සම්බන්ධයෙන් ද, එම ළමයා වෙත අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි වන්දි මුදලක් ද ගෙවන ලෙස ආඥාවක් ද කරනු ලැබිය හැකි ය.</td></tr>
<tr><td>2006 අංක 24 දරන පනතින් සංශෝධිත 20 (අ) (1) වගන්තිය</td><td>අවුරුදු 18 ට අඩු කිසිම තැනැත්තෙක් කිසිදු උපද්‍රවකාරී රැකියාවක නියුක්ත කරනු නොලැබිය යුතු ය.</td></tr>
<tr><td colspan="2">මේ වගන්තියේ 1 වන උප වගන්තිය උල්ලංඝනය කරමින් වයස අවුරුදු 18කට අඩු තැනැත්තකු සේවයේ නියුක්ත කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරුවෙකු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොවැඩි දඩයකට හෝ මාස දොළහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට ද, නැතහොත් එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ එම තැනැත්තා යටත් විය යුතු අතර, ඊට අමතරව වරද සිදු කරනු ලැබුවේ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් ද, එම තැනැත්තා වෙත මහේස්ත්‍රාත්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි වන්දි මුදලක් ද ගෙවන ලෙස ආඥාවක් ද කරනු ලැබිය හැකි ය.</td></tr>
<tr><td colspan="2">1939 අංක 48 දරන ළමයින් හා තරුණයින් පිළිබඳ ආඥාපනත (CYPO)</td></tr>
</table>

## 2.9 ළමා සොල්දාදුවන්




**අන්තර්ජාතික මානව හිමිකම් සම්මුතීන්වලට අනුව සන්නද්ධ හමුදාවන්ට තැනැත්තන් බඳවා ගැනීමේ අවම වයස අවුරුදු 18 කි**

**ශ්‍රී ලංකාවේ ත්‍රිවිධ හමුදාවන්ට බඳවා ගැනීමේ අවම වයස අවුරුදු 18 කි.**

2002 සිට ළමුන් 7,000 කට ආසන්න සංඛ්‍යාවක් ශ්‍රී ලංකාවේ ළමා සොල්දාදුවන් ලෙස බඳවා ගෙන තිබේ. 2009 මැයි මාසයේ ඇති වූ යුදගැටුම අවසානයේ වයස අවුරුදු 12 ත් 18 ත් අතර ළමුන් 594 දෙනෙකු සන්නද්ධ හමුදාවන්ට යටත් විය.[21]

| **ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය - 1989** | |
|---|---|
| **38 වන ව්‍යවස්ථාව** | වයස අවුරුදු 15 ට අඩු තැනැත්තන් යුද්ධයට සෘජුව සහභාගී නොවීමත්, වයස අවුරුදු 15 ත් 18 ත් අතර වයසේ පසුවන තැනැත්තන් බඳවා ගැනීමේ දී වයසින් වැඩි ම අයට ප්‍රමුඛතාවය ලබා දීමත් සහතික කිරීමට හැකි සෑම පියවරක් ම ගන්නා ලෙස රාජ්‍ය පාර්ශවකරුවන්ට බල කර සිටී. |

| **ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ අතිරේක සංධානය*** | |
|---|---|
| 2000 මැයි මස 25 දින සම්මත කරන ලද සන්නද්ධ ගැටුම්වලට ළමයින් සම්බන්ධ කර ගැනීම පිළිබඳ අතිරේක සංධානය, පොදුවේ සන්නද්ධ ගැටුම් තුළ ළමුන් සඳහා වන ආරක්ෂාව ශක්තිමත් කරයි. ශ්‍රී ලංකාව විසින් මෙම සංධානය 2000 අගෝස්තු මාසයේ දී අපරානුමත කරන ලදී. | |
| **1 වන ව්‍යවස්ථාව** | වයස අවුරුදු 18 ට ළඟා නොවූ සිය ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන් යුද්ධයට සෘජුව ම සහභාගී නොවීම පිණිස වග බලා ගැනීම සඳහා රාජ්‍ය පාර්ශවයන් හැකි සෑම පියවරක් ම ගත යුතු ය. |
| **2 වන ව්‍යවස්ථාව** | වයස අවුරුදු 18 ට අඩු තැනැත්තන් ත්‍රිවිධ හමුදාවන්ට අනිවාර්යයෙන් බඳවා ගැනීම තහනම් ය. |
| **3 වන ව්‍යවස්ථාව** | රාජ්‍ය පාර්ශවයන් විසින් ස්වේච්ඡා බඳවා ගැනීම සඳහා වන අවම වයස අවුරුදු 15 සිට ඉහළ නැංවිය යුතු ය. මෙම නියමය මිලිටරි ඇකඩමිවලට අදාළ නොවේ. |
| **4 වන ව්‍යවස්ථාව** | ජාතික ත්‍රිවිධ හමුදාවන්ට වඩා වෙනස් සන්නද්ධ කණ්ඩායම්, කිසිදු තත්ත්වයක් යටතේ, වයස අවුරුදු 18 ට අඩු තැනැත්තන් බඳවා ගැනීම (අනිවාර්ය හෝ ස්වේච්ඡා පදනමක් මත) හෝ යුද්ධය සඳහා යොදා ගැනීම නොකළ යුතු අතර, එවැනි පරිචයන් තහනම් කිරීම සහ ඒවා අපරාධමය වැරදි බවට පත් කිරීම සඳහා රාජ්‍ය පාර්ශවයන් විසින් නීතිමය පියවර ගත යුතු ය. |

## 2 .10 අවයව ඉවත් කිරීම සඳහා පුද්ගලයින් වෙළඳාම් කිරීම



අවයව ඉවත් කිරීම සඳහා පුද්ගලයින් වෙළඳාම් කිරීම නව සංසිද්ධියක් නොවේ. අවයව ඉවත් කිරීම පිණිස ළමුන් වෙළඳාම් කිරීම යන්න සඳහා අවශ්‍ය වන්නේ අවයව ඉවත් කිරීම මගින් සූරාකෑමේ වසර ගණනාවක් තිස්සේ, මෙම අපරාධයට ජනමාධ්‍යයේ, රාජ්‍ය නොවන සංවිධානවල, ශාස්ත්‍රාලවල සහ විශේෂයෙන් ම කාන්තාවන් හා ළමුන් හා සම්බන්ධව තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ විශේෂ රපෝර්තුකරු වැනි ජාත්‍යන්තර හා කලාපීය ක්‍රියාකාරීන්ගේ විශේෂ අවධානයක් යොමුව ඇත. මෙම ගැටළුව සම්බන්ධයෙන් පොදු උනන්දුවක් තිබියදීත්, මෙකී අපරාධය සැඟවුණු, රහස් ක්‍රියාකාරකමක් ලෙස පවතින අතර ඉතා අඩුවෙන් වාර්තා වී ඇති බව පෙනෙයි. ඉහත ද සඳහන් කර ඇති පරිදි, පුද්ගල වෙළඳාම පිළිබඳ සංධානයෙහි සඳහන් වන්නේ, වින්දිතයා දරුවෙකු නම්, එනම් වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයෙකු නම්, කිසියම් නුසුදුසු උපක්‍රමයක් (රැවටීම, බල කිරීම, අසරණභාවයෙන් අනිසි ලෙස ප්‍රයෝජන ගැනීම වැනි) භාවිතා කර කැමැත්ත ලබාගෙන තිබුණ ද එය නොසලකා කැමැත්ත පැවතීම යන්න අදාළ නොවන බවයි. එනම්, ඉන් අදහස් වන්නේ අරමුණ සඳහා යම් ක්‍රියාවක් (ළමුන් බඳවා ගැනීම, ප්‍රවාහනය, ස්ථාන මාරු කිරීම, රැකවරණය ලබා දීම හෝ භාර ගැනීම) සිදු කර තිබීම පමණි. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (1989) ළමයින් විකිණීම, ළමා ගණිකා වෘත්තිය සහ ළමා කාමුක දර්ශන පිළිබඳ විකල්ප සංධානයේ (2000) 3(1)(අ)(i)(අ.) වගන්තිය යටතේ 2 වන ව්‍යවස්ථාවේ

[21] https://www.unicef.org/srilanka/reallives_7924.htm

* ළමා සොල්දාදුවන් නිදහස් කිරීම පිළිබඳ විශ්ව කාලාන්තර සමාලෝචන වාර්තාවෙන් (UPR report) එකතු කරන ලදී.

අර්ථ දක්වා ඇති පරිදි ළමයින් විකිණීම යන සන්දර්භය තුළ, ලාභය පිණිස ළමයාගේ අවයව මාරු කිරීමේ අරමුණ සඳහා දරුවෙකු ඉදිරිපත් කිරීම, භාරදීම හෝ භාර ගැනීම රාජ්‍ය පාර්ශවයන් විසින් තහනම් කිරීම අවශ්‍ය වේ.[22]

**ඔබ දන සිටියා ද?**

මහජනතාව සහ නීති හා විද්‍යාවට සම්බන්ධ පිරිස් අතර මේ සම්බන්ධයෙන් නිරන්තර ව්‍යාකූලතා පැවතිය ද, අවයව වෙළඳාම් කිරීම සහ අවයව ඉවත් කිරීම සඳහා පුද්ගලයින් වෙළඳාම් කිරීම වෙනස් අපරාධ වේ. අවයව වෙළඳාම් කිරීමේ දී, අපරාධයේ විෂය වස්තුව අදාළ අවයවය වන අතර, අවයව ඉවත් කිරීම සඳහා වන මිනිස් වෙළඳාමේ දී, අපරාධයේ විෂය වස්තුව පුද්ගලයා වේ. අවයව වෙළඳාම් කිරීමේ දී එහි මූලාරම්භය අවයව ඉවත් කිරීම සඳහා වන මිනිස් වෙළඳාම විය හැකි නමුත්, මිනිස් වෙළඳාම හා සම්බන්ධයක් නොමැති අවයව වෙළඳාම ද නිතරන්තරයෙන් සිදු වේ. මෙම සංසිද්ධි දෙක මිශ්‍ර වීම, සංසිද්ධීන් දෙකටම එරෙහිව සටන් කිරීමට සහ වින්දිතයින්ට ආරක්ෂාව සහ සහාය ලබා දීමට දරන උත්සාහයට බාධාවක් විය හැකිය.

**මිනිස් අවයව සොරකම් කිරීමට ලක් වූ  වින්දිත  කාන්තාවක් පිළිබඳව ශ්‍රී ලංකා පවුලක් චෝදනා කරයි**

සෝමලතා සතරසිංහ මැයි මාසයේ කුවේටයට ගොස් ඇත්තේ ගෘහ සේවිකාවක් ලෙස රැකියාවක් ලබා ගැනීම සඳහා ය. 41 හැවිරිදි සතරසිංහ මහත්මිය කුවේට් හිදී මිය ගිය අතර වකුගඩු හා ඇසේ සුදු ඉංගිරියාව නොමැතිව ඇගේ දේහය අම්පාරේ පිහිටි ඇගේ නිවසට ආපසු යවන ලදී. *Colombo Page* නම් වෙබ් පිටුවට අනුව ඇගේ අවයව ලබා ගැනීම සඳහා ඇයව ඝාතනය කර ඇති බවට බවට ඥාතීන් චෝදනා කර තිබේ. ඇගේ දේහය සිය පවුල වෙත යවා ඇත්තේ ඇය මියගොස් දින 35 කට පසුව ය

හදිසි ක්ලාන්ත ගතියක් හේතුවෙන් සතරසිංහ මහත්මිය කුවේට් රෝහලකට ඇතුළත් කර ඇති බව වින්දිතයාගේ පවුලට ජූලි 10 වන දින දැනුම් දෙන ලදී. දින දෙකකට පසු ඇය මිය ගිය අතර ජූලි 28 වන දින මියගිය තැනැත්තිය ඇගේ වකුගඩු පරිත්‍යාග කර ඇති බව පවුලේ අයට පවසන ලදි.

කෙසේ වෙතත් විදේශ සේවා කාර්යාංශයේ (FEB) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී එල්.කේ. රුහුණුගේ සන්ඩේ ටයිම්ස් පුවත්පතට වාර්තා කළේ වින්දිතයා හදිසියේ රෝගාතුර වූ පසු ඇය කෝමා තත්ත්වයට පත්වී මොළය මියගොස් ඇති බවට විශ්වාස කරන බවත් ඇයට ස්වේච්ඡාවෙන් අවයව පරිත්‍යාග කිරීමට ඇති හැකියාව ප්‍රතික්ෂේප කරන බවත් ය. " රෝහලේ වකුගඩු අවශ්‍ය රෝගීන් දෙදෙනෙකු සිටි බැවින් කුවේට් නීතිවලට අනුකූලව අවයව බද්ධ කිරීම සිදු කර ඇති බවට අපට දන්වා තිබෙනවා" යැයි රුහුණුගේ පැවසී ය.[23]

## 2 .11 දරුකමට හදා ගැනීම

**1883 අංක 02 දරන දණ්ඩ නීති සංග්‍රහය**

**360 ඇ වගන්තිය**

දරුකමට හදා ගැනීමට අදාළ නඩු

ළමයෙකු දරුකමට හදා ගැනීමේ කාර්යය සඳහා -

(i) මේ තැනැත්තෙකුගේ දෙමාපියන්ගෙන් කෙනෙකුගේ හෝ නෛතික භාරකරුගේ කැමැත්ත නොමැතිව යම් විදේශ රටකට ගමන් කිරීම සඳහා එම ළමයාට කටයුතු සලස්වා දෙන හෝ ආධාර කරන;

(ii) යම් ගර්භනී කාන්තාවකගේ නූපන් ළමයා දරුකමට හදා ගැනීම සඳහා මුදල්වලට හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා එම ගර්භනී කාන්තාවගේ ලිඛිත හෝ වාචික කැමැත්ත ලබාගන්නා;

(iii) ළමයින් දූරීමේ කාර්යයක් සඳහා කාන්තාවක් හෝ අඹු-සැමි යුවළක් බඳවා ගන්නා;

[22] https://www.unodc.org/documents/human-trafficking/2015/UNODC_Assessment_Toolkit_TIP_for_the_Purpose_of_Organ_Removal.pdf>

[23] <https://www.wsws.org/en/articles/2002/08/orga-a30.html>

(iv) උපත් ලියාපදිංචි කිරීම හා සම්බන්ධ තැනැත්තෙකු වන යම් තැනැත්තෙකු විසින්, උපත් ලියාපදිංචි කිරීම සඳහා භාවිත කරනු ලබන යම් ලේඛනයක් හෝ එම ලේඛනයේ අන්තර්ගත යම් උප්පැන්න වාර්තාවක් ව්‍යාජ ලෙස වෙනස් කිරීමට අවසර දෙන;

(v) මුදල් හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා ආරෝග්‍ය ශාලාවලින්, කාන්තා රැකවරණ භාර නිවාසවලින්, සායනවලින්, ළදරු පාසල්වලින්, දිවා සුරැකුම් මධ්‍යස්ථානවලින් ළමයින් රැකබලාගන්නා වෙනත් ළමා මධ්‍යස්ථානවලින් හෝ සුභසාධක මධ්‍යස්ථානවලින් ළමයින් කුට්ටනය කිරීමේ නියැළී සිටින හෝ ළමයාගේ මවට හෝ වෙනත් තැනැත්තෙකුට තර්ජනය කිරීමෙන් දරුකමට හදා ගැනීම සඳහා එම ආයතනයෙන් හෝ මධ්‍යස්ථානයෙන් ළමයා කුට්ටනය කරන; හෝ

(vi) ළමයාගේ මව සේ ව්‍යාජ ලෙස පෙනී සිටින හෝ එසේ ව්‍යාජ ලෙස පෙනී සිටීමට උපකාරී වන, කවර හෝ තැනැත්තෙකු වරදකට වරදකරුවෙකු වේ.

**දඬුවම** – අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් දඩයක් හෝ ඒ දෙකම.

- **1941 අංක 24 දරන ළමුන් දරුකමට හදා ගැනීමේ ආඥා පනත**

## 2 .12 විවාහය

- **1907 අංක 19 දරන සාමාන්‍ය විවාහ ආඥා පනත**

| | |
|---|---|
| **1995 අංක 18 දරන පනතින් සංශෝධිත සාමාන්‍ය විවාහ ආඥා පනත 15 වන වගන්තිය** | විවාහයේ පාර්ශව දෙක ම වයස අවුරුදු 18 සම්පූර්ණ කර ඇත්නම් මිස කිසිදු විවාහයක් වලංගු නොවේ. |
| **20 වගන්තිය විවාහ සඳහා බල කිරීමේ නඩු නහනම් වේ** | කිසියම් පොරොන්දුවක් හෝ විවාහ ගිවිසුමක් නිසා හෝ ඕනෑම ගැහැනු ළමයෙකු කන්‍යා දූෂණයට ලක්ව තිබීම නිසා හෝ වෙනත් කිසියම් හෝ හේතුවක් නිසා ඕනෑම විවාහයක් සිරිත්කරණය කිරීමට (solemnization) බල කිරීම පිණිස කිසිදු උසාවියක කිසිදු නඩුවක් හෝ ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය. |

- **1962 අංක 44 දරන උඩරට විවාහ හා දික්කසාද පනත**

තවද, 1995 දී උඩරට විවාහ හා දික්කසාද පනත (KMDA) සංශෝධනය කරන ලද්දේ පුරුෂයින් හා ස්ත්‍රීන් සඳහා විවාහ වීමේ අවම වයස අවුරුදු 18 දක්වා ඉහළ නැංවීමට සහ එකී නිශ්චිත වයසට අඩුවෙන් සිදු කරන ලද ඕනෑම විවාහයක් ශුන්‍ය බව ප්‍රකාශයට පත් කිරීමට ය.[24]

**ඒ අනුව නීති ප්‍රකාරව, ලිංගික කටයුතු සඳහා කැමැත්ත දීමේ වයස මුස්ලිම් නොවන ගැහැණු ළමයින් සඳහා අවුරුදු 16 ක් වන අතර නීත්‍යානුකූල විවාහ වීමේ වයස අවුරුදු 18 කි. ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය සහ විවාහ වන වයස සම්බන්ධයෙන් මුස්ලිම් ගැහැණු ළමයින්ට ලිංගික කටයුතු සඳහා කැමැත්ත ලබා දීමේ වයස අවුරුදු 12 ක් ලෙස පවතී.**[25]

- **1951 අංක 13 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත**

මුස්ලිම් නීතිය, සාමාන්‍ය විවාහ ආඥා පනත සහ උඩරට විවාහ හා දික්කසාද පනත මගින් දක්වා ඇති ආකාරයේ අවම විවාහ වයස් සීමාවක් නියම නොකරයි. වයස <u>අවුරුදු 12 ට අඩු මුස්ලිම් දැරියකගේ විවාහය</u> අවශ්‍ය යැයි හැඟෙන

[24] Post War Trends in Child Marriage in Sri Lanka, FOKUS Women, 2015
[25] එහිම

අවස්ථාවක ප්‍රදේශයේ ක්වාසිවරයාගේ අනුමැතියෙන් තොරව ලියාපදිංචි කිරීම පනතේ 23 වන වගන්තිය මගින් තහනම් කර ඇත. එවැනි විවාහයක් දැනුවත්ව ලියාපදිංචි කරන රෙජිස්ට්‍රාර්වරයෙකු හෝ ඊට ආධාර කරන සහ අනුබල දෙන ඕනෑම පුද්ගලයෙකු වරදක් සිදු කරයි.[26] කෙසේ වෙතත් එකී වරද සඳහා වන දඩ මුදල අවම සහ ප්‍රමාණවත් නොවන එකකි. තවද, විවාහය ලියාපදිංචි කිරීමේ දී සාමාන්‍ය විවාහ ආඥා පනතේ සහ උඩරට විවාහ හා දික්කසාද පනතේ අවශ්‍යතාවයන් වන වයස පිළිබඳ විස්තර අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, දණ්ඩ නීති සංග්‍රහයේ 363 වන වගන්තිය[27] හේතුවෙන් මෙම අභිමතය යන්න ප්‍රායෝගිකව යල්පැන ගොස් ඇති අතර, එමගින් වයස අවුරුදු 12 ට අඩු කාන්තාවක් සමග ලිංගික සංසර්ගයේ යෙදීම (එකී කාන්තාව සමග විවාහ වී සිටිය ද) ස්ත්‍රී දූෂණයක් ලෙස සලකනු ලැබේ. එහි ප්‍රතිඵයක් වශයෙන් මුස්ලිම්වරුන්ගේ අවම විවාහ වයස අවුරුදු 12 කි.[28]

### ශ්‍රී ලංකවේ ළමා විවාහ නීතියේ වින්දිතයින්

ශ්‍රී ලංකාවේ නීත්‍යානුකූල විවාහ වයස අවුරුදු 18 ක් වන නමුත් දශක ගණනක් පැරණි ප්‍රජා නීතියක් යටතේ බොහෝ බාල මුස්ලිම් ගැහැණු ළමයින්ට විවාහ විය හැකි ය. මෙම නීතිය සංශෝධනය කිරීම සඳහා වන ඉල්ලීම් වැඩිවන විට, බීබීසී සිංහල සේවයේ සරෝජ් පතිරණට සිය කැමැත්තට එරෙහිව විවාහ වීමට බල කළ එක් තරුණියක් මුණගැසෙයි.[29]

ෂෆාට[30] වයස අවුරුදු 15 දී ඇයට විවාහ වීමට බල කෙරුණි. "විභාග සඳහා පාඩම් කරමින් සිටින අතරතුර, මා පිරිමි ළමයෙකු සමඟ ආදරයෙන් බැඳී සිටියා," ෂෆා පැවසී ය. ඇගේ කම්මුල් දිගේ කඳුළු ගලා එයි. " මගේ දෙමාපියන් එයට කැමති වූණේ නැහැ. ඔවුන් මාව මගේ මාමාගේ නිවසට යැව්වා. මම එහි ඉගෙනුම ලබමින් සිටියදී නිතිපතා පැමිණෙන අමුත්තෙක් මගේ නැන්දාට සහ මාමා මා සමඟ විවාහ වීමට අවශ්‍ය බව පැවසුවා."

මුස්ලිම් පවුලකින් පැවත එන්නා වූ ද ශ්‍රී ලංකාවේ දුර බැහැර ගමක ජීවත් වන ෂාෆා එම යොජනාව ප්‍රතික්ෂේප කළාය. ද්විතීයික පාසල් අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු තමා ආදරය කළ පිරිමි ළමයා සමඟ විවාහ වීමට ඇයට අවශ්‍ය විය. නමුත් ඇගේ විරෝධය නොතකා ඇගේ මාමා සහ නැන්දා තම මිතුරා සමඟ විවාහ වීමට කටයුතු සැලසුම් කරන ලදී. ඇය විවාහයට විරුද්ධ වූ සෑම අවස්ථාවක දී ම ඇයට පහර දෙන ලදී. ඔවුන්ට ඇහුම්කන් නොදුනහොත් තමන්ව මරා දමන බවට පවා ඇගේ මාමා සහ නැන්දා තර්ජනය කරනු ලැබී ය.

*"වෙනත් විකල්පයක් නැති නිසා මම මගේ දෑත් කපා ගත්තා,"* යැයි පවසමින් ෂාෆා කැළැල් පෙන්වීමට ඇගේ ඇඳුමේ අත් ඉහළට ඔසවනු ලැබුවා. *"මම මාමාගේ ගෙදරින් පෙති කිහිපයක් ගෙන බිව්වා. මා රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටිය දී ඔවුන් වෛද්‍යවරුන්ට අල්ලස් දී මගේ සේලයින් බෝතලයත් සමඟ ම මා පෞද්ගලික රෝහලකට ගෙන ගියා. දින කිහිපයකට පසු ඔවුන් මට බල කළා ඒ මිනිහව විවාහ කරගන්න කියලා."*

කිසිදු ගැළවීමක් නොපෙනෙන නිසා ෂාෆා තම තරුණ ස්වාමිපුරුෂයා සමඟ සිටීමට තීරණය කළ නමුත් ඇය තම පෙම්වතා සමඟ දිගටම සබඳතා පවත්වමින් සිටින බවට ඔහු සැක කළේ ය.

*"ඔහු නිතරම මට පහර දුන්නා," ඇය කීවාය. "මම ගැබ්ගෙන ඇති බව මා ඔහුට පැවසූ විට, ඔහු මාව රැගෙන පොලවේ ගැසුවා. ඉන් පසු ඔහු මට කීවේ ඔහුට මා අවශ්‍යව තිබුණේ එක් රාත්‍රියක් පමණක් බවත්, ඔහු දැනටමත් එය ඉටුකරගෙන තිබෙන නිසා මාව තවදුරටත් අවශ්‍ය නොවන බවයි."*

---

26 පනතේ 22, 23, 24 වගන්ති දනිමින්ම උල්ලංඝනය කරන හෝ එවැනි විවාහයක් සඳහා ආධාර හෝ අනුබල දෙන ඕනෑම රෙජිස්ට්‍රාර්වරයෙකුට මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ 82 වන වගන්තිය යටතේ රුපියල් 100 ක් නොඉක්මවන දඩයක් හෝ මාස 6ක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමක් හෝ ඒ දෙක ම පනවනු ලබයි.

27 2006 අංක 16 දරන දණ්ඩ නීති සංග්‍රහ පනත

28 Post War Trends in Child Marriage, FOKUS Women, 2015

29 <https://www.bbc.com/news/world-asia-39898589>

30 ඇයගේ පුද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා ෂාෆාගේ නම වෙනස් කර සඳහන් කොට තිබේ.

ප්‍රචණ්ඩත්වයේ ප්‍රතිඵලයක් ලෙස තම දරුවා අහිමි වූ බව ඇය වටහා ගත්තේ රෝහලේ දී ය. ෂාෆා පොලිසියට ගිය විට ඔවුන් ඇයගේ පැමිණිල්ල බැරෑරුම් ලෙස සැලකුවේ නැත. දිනක් ඇයට ගමේ මුස්ලිම් පල්ලියෙන් ඇමතුමක් ලැබුණි. එහිදී ඇගේ සැමියා විවාහය දිගටම කරගෙන යාමට එකඟ වූ නමුත් ඇය එය ප්‍රතික්ෂේප කළාය. දින කිහිපයකට පසු ඇයට නාඳුනන අයගෙන් දුරකථන ඇමතුම් සහ කෙටි පණිවිඩ ලැබීමට පටන් ගත්තේ ඔවුන් සමඟ නිදා ගැනීමට කොපමණ මුදලක් අය කරනවා දැයි විමසමිනි.

තම සැමියා සිය ඡායාරූපය සහ දුරකථන අංකය සමාජ මාධ්‍යවල පළ කර ඇති බව ෂෆාට වැටහුණි. අමතන්නන් ඇයට අසභ්‍ය වචනවලින් තර්ජනය කර මෙසේ පවසන ලදි: *"අපිට ඔබේ අංකය ලැබුනේ ඔබේ ස්වාමිපුරුෂයාගෙන්."*

ඇඬීම නවතාගැනීමට බැරි වුවත් තම කතාව පැවසීමට අධිෂ්ඨාන කරගෙන සිටි ෂාෆා පැවසුවේ *"මම මේ සියලු ඇමතුම් පටිගත කරා. තවමත් ඒ හැම කෙටි පණිවිඩයක් ම තියෙනවා."* සිදුවෙමින් පවතින දෙයට මැදිහත් වීමට ෂාෆාගේ පියා කැමති නොවී ය. නමුත් ෂෆාගේ මව දැන් තම දියණියව සමාජ සුභසාධන මධ්‍යස්ථානයකට රැගෙන යන අතර එහිදී ඇයගේ කම්පන සහගත විවාහයෙන් පසු ඇයට මානසික හා නීතිමය උපකාර ලබා ගත හැකි ය. ඔවුන් රහසිගතව මෙම මධ්‍යස්ථානයට පැමිණෙන්නේ විවෘතව මනෝ විද්‍යාත්මක උපකාර පැතීම තවමත් ශ්‍රී ලංකාවේ තහනම් කර ඇති බැවිනි. ගමේ දෛනික කම්කරු රැකියා කරමින් ෂෆාගේ මව තම දරුවන් පස්දෙනා රැකබලා ගනියි. 1990 දී දෙමළ කොටි බෙදුම්වාදී කැරලිකරුවන් විසින් ඇයව සිය ගමෙන් ඉවත් කරන ලදී.

*"එක් සිදුවීමක් නිසා මම මගේ දුව මගේ සහෝදරයාගේ නිවසට යැව්වා. මේ වගේ දෙයක් ඇයට සිදුවෙයි කියලා මම කිසි විටෙකත් හිතුවේ නැහැ,"* ඇය පැවසුවා ය. ඇය පැවසුවේ තමන් සිය දියණියව බලහත්කාරයෙන් විවාහ කරවීමට බල කිරීම පිළිබඳව විරෝධය පළ කළ නමුත් ඇගේ සහෝදරයා ඇයට ඇහුම්කන් නොදුන් බවයි. ***"ඒක බලහත්කාරයෙන් කරපු විවාහයක්"*** *ඇය කීවාය. "ඇගේ ස්වාමිපුරුෂයා ඔහු ගැන පතුරුවා ඇති බොරු නිසා ඇයගේ ආරක්ෂාව සහ අධ්‍යාපනය ගැන මම දැන් බය වෙනවා. ඇයට පන්තිවලට යන්නට බැහැ. කොටින්ම ඇයට බස් රථයක යන්නවත් බැහැ. ඇගේ මුළු අනාගතය ම අවිනිශ්චිතයි."*



**අභ්‍යාසය 4**

ඉහත සිද්ධි අධ්‍යයනයේ විස්තර සලකා බලමින් මෙම සිදුවීම විවාහය සඳහා වෙළඳාම් කිරීමකට සමාන ද? යන්න කණ්ඩායම තුළ සාකච්ඡා කරන්න. ඔබේ නිගමනවලට හේතු දක්වන්න.

# තුන්වන මොඩියුලය


| සැකැස්ම, අරමුණ සහ ප්‍රතිඵලය | | |
|---|---|---|
|  | **දේශන පැය ගණන** | 2 |
|  | **ඇගයීම් ක්‍රමවේදය** | පන්ති කාමර සාකච්ඡා |
| | **අධ්‍යයන පරමාර්ථ** | මෙම මොඩියුලය අවසානයේ සහභාගීවන්නන් හට:<br>• දරුවන් වැඩිහිටියන්ට වඩා වෙළඳාමට ගොදුරු වීමේ අවදානමට හේතු සහ කුට්ටනයට ලක් කරන්නන් හඳුනා ගැනීමට හැකියාව ලැබිය යුතු ය.<br>• දරුවන් වෙළඳාම් කිරීමේ විවිධ ආකාර හඳුනා ගැනීමට හැකියාව ලැබිය යුතු ය.<br>• දරුවන් වෙළඳාමට ලක් කිරීම හා බැඳුණු වරදවල් හඳුනා ගැනීමට හැකියාව ලැබිය යුතු ය.<br>• වෙළඳාමට ලක් කිරීම දරුවාට සහ සමාජයට බලපාන ආකාරය හඳුනා ගැනීමට හැකියාව ලැබිය යුතු ය. |

## 3.1 දරුවන් වෙළඳාම් කිරීම සිදු වන්නේ කෙසේද?

දරුවන් වෙළඳාම් කිරීම වැළැක්වීම උදෙසා ක්‍රියාමාර්ග ගැනීමට ප්‍රථමයෙන් දරුවන් වෙළඳාම් කිරීම් සිදුවන ආකාර සහ ඒ සඳහා හවුල් වන පාර්ශවයන් හඳුනාගැනීම වැදගත් ය.

*1. දරුවන් වැඩිහිටියන්ට වඩා වෙළඳාමට ගොදුරු වීමේ ඉහළ අවදානමක් පවතී.*

මේ හේතුවෙන් දරුවන් වෙළඳාමට ලක්වීමේ ඉහළ අවදානමක් දරන්නේ ඇයි යන්න සහ මේ සඳහා වන සමාජ වගකීම් කෙසේද යන්න වෙළඳාම සිදු වන ආකාර විග්‍රහ කිරීමට පළමුව අවබෝධ කරගත යුතු ය.




### දරුවන් වෙළඳාමට ලක්වීමේ ඉහළ අවදානමක්, දරන්නේ ඇයි?

වෙළඳාමට ලක්වීමේ අවදානම දරුවන් කෙරෙහි පමණක් යොමු නොවන බව අවධානයට ලක් කිරීම වැදගත් වේ. ඔවුන් වැඩිහිටියන් අවදානමට ලක්වන ආකාරයන්ට වඩා සුවිශේෂී ක්‍රමවේදයන් හා ආකාරයන් අනුව අවදානමට ලක් වේ. දරුවන් කිසිසේත් ම යෞවනයන් හෝ වැඩිහිටියන් ලෙස නොසැලකිය යුතු ය.

ඉහත සඳහන් කරන ලද කරුණු සියලු ම දරුවන් කෙරෙහි පොදුවේ අදාළ වුව ද පහත සඳහන් සුවිශේෂී අවස්ථා යටතේ දරුවන් අවධානයට ලක් වීමේ ප්‍රවණතාව ඉහළ අගයක් ගනියි.

- ළදරු භාවය සහ පූර්ව ළමාවිය
- කායික හා මානසික නොහැකියාවන් හෝ ආබාධ පැවතීම
- දරුවා හෝ ඔහුගේ පවුල අභ්‍යන්තරිකව අවතැන්භාවයට හෝ සරණාගතයන් බවට පත්වීම
- යුදමය ගැටුමක, සිවිල් අරගලයක, ස්වාභාවික හෝ මිනිසා විසින් නිර්මාණය කරන ලද ආපදාවකට ගොදුරු වීම.
- රෝගීභාවය
- පවුල් සංස්ථාව අක්‍රමවත් වීම
- විශේෂ අවශ්‍යතාවක් සහ රැකවරණය අවශ්‍ය දරුවන්

### 2. ළමයින් වෙළඳාම් කිරීමට හවුල්කාරීත්වය දරන පාර්ශවයන්

වෙළඳාම් කිරීම විවිධ තනි පුද්ගලයන් හා ආයතන ඔස්සේ සිදුවන ක්‍රියාවලියකි. සමහර පාර්ශවයන් වෙළඳාමට ඍජු ලෙස සම්බන්ධතාව දක්වන අතර එයට පහසුකම් සලස්වන්නන් අනෙක් පාර්ශවය වේ. මොවුහු වෙළඳාම සාර්ථක කර කරගැනීම උදෙසා එම ක්‍රියාවලිය තුළ විවිධ අදියරයන් හිදී ක්‍රියාත්මක වෙති. වෙළඳාම් කිරීමේ ක්‍රියාවලියට හවුල්කාරීත්වය දරන සියලූ ම පුද්ගලයන්, ඔවුන් ඍජුව හෝ වක්‍රව හෝ අතරමැදියෙකු ලෙස හවුල්කාරීත්වය දැරුව ද වෙළඳාම යන

වරදෙහි වරදකාරීත්වයට යටත් වේ. මේ බව විශේෂයෙන් වෙළඳාම වැළැක්වීමේ යටපත් කිරීමේ හා දැන් දඬුවම්කිරීමේ (විශේෂයෙන් කාන්තාවන් හා ළමයින්) සඳහා වන පැලේර්මෝ ප්‍රොටෝකෝලය මගින් විශේෂ අවධානයට ලක් කර ඇත.

මේ අනුව වෙළඳාමට හවුල්කාරීත්වය දරන්නන් ප්‍රධාන කාණ්ඩ ද්විත්වයකට වෙන්කර හඳුනා හඳුනාගත හැකිය.

**ළමයින් වෙළඳාම් කිරීම**

**වෙළඳාම කරන්නන්**

වෙළඳාම කිරීමේ ක්‍රියාවලියේ එක් අදියරක හෝ අදියර කිහිපයක දී තම හවුල්කාරීත්වය දරන පුද්ගලයන් මේ යටතට අයත් වේ.

ළමයින් ආර්ථිකමය, ලිංගිකමය හෝ වෙනත් ආකාරයකට සූරාකෑමේ අරමුණ සහිත පුද්ගලයන්

උදාහරණ:

- සේවයේ නියුක්ත කරන්නන්
- ලිපිද්‍රව්‍ය සපයන්නන්
- ප්‍රවාහනය කරන්නන්
- දූෂිත නිලධාරීන්
- වෙළඳාමට ලක්කළ දරුවන්ගේ සේවා යෝජකයන්

**අතරමැදි පාර්ශ්වකරුවන්**

වෙළඳාම සඳහා ඍජු ලෙස දායකත්වය නොදැරුව ද එහි විවිධ වූ අදියරයන් හිදී වෙළදාම කරන්නන්ට සහය වන පුද්ගලයන්.

උදාහරණ:

- දේශ සීමා මායිම් විවෘත කිරීම් පිළිබඳව තොරතුරු වෙළදාම කරන්නන් හට ලබාදෙන පුද්ගලයන්
- වෙළදාමට ලක්වන්නන් සංචලනය සදහා සුදුසු වේලාවන් පිළිබඳව කුට්ටනය කරන්නන් හට උපදෙස් ලබාදෙන පුද්ගලයන්
- දේශ සීමා මුරකරුවන්ට, ආගමන විගමන නිලධාරීන්ට, නීති ක්‍රියාත්මක කරන නිල්ධාරීන් වැනි පුද්ගලයන්ට අල්ලස් ලබා දෙන්නන්

## 3.2 වෙළදාම සිදුවන ප්‍රධාන ආකාර

ළමයින් වෙළදාමේ වින්දිතයන් බවට පත්විය විය හැකි ආකාර ගණනනාවකි. බොහෝ අවස්ථාවල දරුවන් වෙළදාමේ වින්දිතයන් බවට පත් වන්නේ, වෙළදාම කරන්නන් විසින් ආරම්භ කරන ලද ක්‍රියාවක් තුළිනි. තවත් අවස්ථාවක එය අසල්වාසීන්, සමීප ඥාතීන්, මිතුරන් හෝ දරුවන්ගේ දෙමව්පියන් මාර්ගයෙන් වුවද සිදුවිය හැකි ය.

**පැහැදිලි කිරීම 01 - මිතුරන් මගින්**

තිස් දෙහැවිරිදි කුමාරි, සමන් හා විවාහ වී සිටියි. සමන් මැදපෙරදිග සේවයේ නියුක්ත ය. මේ අතරතුර කුමාරි තම දියණිය පෙර පාසලට ප්‍රවාහනය කරන වෑන් රථයේ රියදුරා වන ප්‍රියන්ත සමග ප්‍රේම සම්බන්ධතාවක් ඇති කර ගනියි. ප්‍රියන්ත හා පවතින සම්බන්ධ ප්‍රතිඵලයක් වශයෙන් කුමාරි දරුවෙකු පිළිසිඳ ගනියි. කුමාරිට හෝ ප්‍රියන්තට දරුවකුගේ අවශ්‍යතාවක් නොමැත. මේ හේතුවෙන් ඔවුන්ට දරුවා ගබ්සා කිරීමට අවශ්‍ය වේ. කුමාරිගේ මිතුරියක් වන නාලනී කියා සිටියේ ගබ්සා කිරීම නීති විරෝධී නිසා එය නොකරන ලෙසත්, දරුවා ලැබෙන තුරු ඇයට නාලිනී සමග ජීවත් විය හැකි බවත් ය. නාලනී තවදුරටත් කියා සිටියේ දරුවා ඉපදුන පසු කළ යුතු දේ පිළිබඳව ඇයට සැලැස්මක් ඇති බවත් ය. මෙයට එකඟ වූ කුමාරි දරුවා බිහිවන තුරු නාලනී සමග ජීවත් වීමට සමඟ විය. නාලනී කුමාරිට පැවසුවේ දරුවාගේ රැකවරණය සැලැස්වීම උදෙසා ආයතනයක් පිළිබඳවව තමන් දන්නා බව ය. නමුත් නාලනී එම දරුවා පුද්ගලයෙකුට විකුණා මුදල් ලබා ගත් අතර, මිලදී ගත් පුද්ගලයා නැවතත් තවත් පුද්ගලයෙකුට එම දරුවා සිඟමනේ යෙදවීම සඳහා අලෙවි කළේය.

**පැහැදිලි කිරීම් 2 - අසල්වාසීන් මාර්ගයෙන්**

රිය අනතුරකින් දෙමව්පියන් අහිමි වී සිටි දහතුන් හැවිරිදි රවී සිය මාමා සහ නැන්දා සමග ජීවත් විය. රවීගේ මාමා ඔහුට රැකවරණය සැලැස්වීමට සිදුවීම කරදරයක් ලෙස සැලකුවේය. ඔහු නිරන්තරයෙන් රවීට හිරිහැර සිදු කළේය. රවිගේ අසල් අසල්වැසියෙකු වු සිරිසේන, රවීට ඔහුගේ පවුලෙන් හිරිහැර වන ආකාරය දුටුවේය. දිනක් සිරිසේන පුවත්පත්ක වූ වකුගඩුවක් ඉල්ලා පලකරන ලද දැන්වීමක් දුටුවේය. සිරිසේන රවීගෙන් කොළඹ හෝටලයක රැකියාවක් කිරීම උදෙසා කැමැත්ත පළ කරන්නේ දැයි විමසුවේය. සිය මාමාගේ හිරිහැර දරාගත නොහැකිව සිටි රවි, සිරිසේනගේ යෝජනාවට එකඟත්වය පළ කළේය. සිරිසේන රවීව කොළඹට කැටුව ගොස් පුවත්පතෙහි වකුගඩුවක් ඉල්ලා දැන්වීම් පළ කර තිබූ ප්‍රදීප්ට විකිණිය. ප්‍රදීප් වකුගඩු ලබා ගැනීම උදෙසා ආරෝග්‍ය ශාලාවකට නැවත විකුණුවේය.

**පැහැදිලි කිරීම 3 - දෙමව්පියන් විසින්**

දාහතර වියැති මාලා පවුලේ සිව් වන දරුවාය ඇයගේ දෙමව්පියන් අසළ වූ ගල් වළක කුලී ශ්‍රමිකයන් වූහ. මාලා ඉගෙනීමේ නිපුණ වුව ද දරිද්‍රතාවය හේතුවෙන් ඇගේ දෙමව්පියන්ට පහ ශ්‍රේණියෙන් ඉහළ අධ්‍යාපනයක් ලබාදීමට හැකියාවක් නොමැති විය. ඇයගේ දෙමාපියන් නන්දනී නැමැති තැනැත්තියට ණයගැතියන් වූහ. දිනක් ණය මුදල් රැගෙන යාමට පැමිණි නන්දනී මාලාගේ දෙමව්පියන්ට පැවසුවේ, කොළඹ පොහොසත් නිවසක පවුලක් දරුකමට හදා ගැනීම සඳහා දරුවකු සොයන බවයි. නන්දනී පැවසුවේ මාලාට යහපත් අධ්‍යාපනයක් සහ ජීවිතයක් ලැබෙනු ඇති බවයි. එලෙසම, දරුකමට හදාගන්නා දෙමව්පියන් මාලාගේ දෙමාපියන්ගේ ණය නිදහස් කරනු ඇති බවත්, අනෙකුත් දරුවන් රැකබලාගැනීමට අමතර මුදලක් ලබා දෙනු ඇති බවත් නන්දනී පැවසුවාය. නන්දනී මාලාගේ දෙමව්පියන්ට මුදල් ප්‍රමාණයක් ලබා දී මාලා කැටුව ගියා.ය අනතුරුව ඇය මාලාව පොහොසත් පවුලක මෙහෙකාරියක ලෙස අලෙවි කළා ය.

කෙසේ වෙතත්, රැකියා සොයා යෑම හේතුවෙන් ළමුන් තමන් විසින් ම වෙළඳාමට හසුවුණ අවස්ථා සිද්ධි කිහිපයක් ම ඇත. ළමුන් වෙළඳාමට එරෙහිව සටන් කිරීමේ දී ළමා වෙළඳාමේ ප්‍රධාන ආකාරයන් අවබෝධ කරගෙන සිටීම වැදගත් වන්නේ ය.


## ❖ විකුණනු ලැබීම



දරුවන් වාණිජ ලිංගික හෝ වෙනත් ඕනෑම ආකාරයේ සූරාකෑමකට යටත් කර ගැනීම උදෙසා විකිණීම, වෙළඳාමේ ප්‍රධාන ආකාරය වෙයි. දරුවන් වෙළඳාම් කරන්නන්ට අලෙවි කිරීම් සඳහා හේතු රාශියකි. පහත සඳහන් කරුණු මත පදනම්ව වෙළඳාම් කරන්නන් වැඩිහිටියන්ට වඩා දරුවන් යොදාගැනීමට කැමැත්ත පළ **කරයි.**

### 1. සමහර කර්මාන්ත හා වෙළඳපල පවත්නා ඉහළ ඉල්ලුම

අපරාධ වගකීම් දැරීම වයස සමග වෙනස් වීම හේතුවෙන් දරුවා නීති විරෝධී ක්‍රියාකාරකම් සඳහා යොදා ගැනීමට වෙළඳාම් කරන්නන් විශේෂ කැමැත්තක් දක්වයි.




**උදාහරණ :**

- මත්ද්‍රව්‍ය ප්‍රවාහනය
- අවි ආයුධ ප්‍රවාහනය
- සිඟමනේ යෙදවීමේ
- අසභ්‍ය වීඩියෝ පට සඳහා ළමයින් යොදා ගැනීම.



### 2. හැසිරවීම පහසු වීම

- දරුවන්ගේ වයස සහ අවදානමට ගොදුරු වීමට ඇති ප්‍රවණතාවය භාවිතයට ගනිමින් ඔවුන් හැසිරවීම පහසු වීම.
- දරුවන් පිළිබඳ සොයා බැලීම සඳහා කිසිවෙකු නොමැති වීම හෝ ඔවුන් වෙනුවෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට කිසිවෙකු නොමැති අවස්ථාවක් වෙළඳාම් කරන්නන් ප්‍රයෝජනයට ගනියි.



**උදාහරණ** : වීදි දරුවන් හා නොසැලකිල්ලට භාජනය වූ දරුවන්

**පැහැදිලි කිරීම**

16 හැවිරිදි සීතා පුත්තලම ජීවත්වූ 66 වියැති සිය මිත්තණිය සමග ජීවත් වෙයි. ඇගේ දෙමව්පියන් රිය අනතුරකින් ජීවිතක්ෂයට පත්ව තිබුණි. ඇයගේ මිත්තණිය සමෘද්ධි ප්‍රතිලාභිනියකි. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමෙන් පසු සීතා රැකියාවක් සොයාගැනීමට තීරණය කළාය. ඇය කුරුණෑගල ප්‍රදේශයේ ඇඟළුම් කර්මාන්ත ශාලාවක රැකියාවට එක් විය. සීතාට ආදරය හා කරුණාව පෑම මගින් ඇයගේ විශ්වාසය 28 හැවිරිදි අනුර අත්කර ගත්තේ ය. මුණගැසී මාස කීපයකට පසු අනුර තමාට ඉතාලියේ රැකියාවක් ලැබුණු බව පවසා ඇයට ඔහු හා එහි යාමට ආරාධනා කළේ ය. සීතා ඔහු සමග ඉතාලියට පිටත්ව ගියා ය. ඉතාලියට පැමිණි වහාම ඔහු ඇයව ගණිකා නිවාසයකට අලෙවි කළේ ය. සීතාගේ මිත්තණිය ඇය කුරුණෑගල ඇඟළුම් කම්හලේ සේවය කරන බව විශ්වාස කළ අතර ඇයගේ විදේශ ගතවීම පිළිබඳ කිසිවක් දැන සිටියේ නැත. සීතාගේ ප්‍රේම සම්බන්ධය දැන සිටි මිතුරියෝ ඇය අනුර හා විවාහ වී විදේශයක පදිංචි වී ඇති බව විශ්වාස කළහ. එම නිසා කිසිවෙක් ඇය පිළිබඳව සොයා බැලීමට උත්සාහ නොකළහ.

## ❖ රැවටීම/ බල කිරීම/ පෙළඹවීම/ තර්ජනය කිරීම

විකිණීමට අමතරව දරුවන් රැවටීමට ලක් කිරීම, බලහත්කාරය භාවිත කිරීම, පෙළඹවීම හෝ තර්ජනයට ලක් කිරීම මගින් වෙළඳාමට ලක් කළ හැකි ය.

## ❖ රැවටීමට හෝ උපායක ට ගොදුරු කර ගැනීම



සත්‍යය නොවන වෙනත් කරුණක් දරුවෙකුට විශ්වාස කිරීමට සැලැස්වීම උදෙසා හිතාමතා කරන ලද ක්‍රියාවක් රැවටීමකි. මේ පිළිබඳ සාක්ෂි ව්‍යාජ ගනුදෙනු, පෙළඹවීමේ කතන්දර, බොරු පොරොන්දු යන ක්‍රියාවන් ඔස්සේ ප්‍රධාන ව හඳුනාගත හැක. තවදුරටත් දරුවන් සම්පූර්ණයෙන් හෝ පාර්ශික වශයෙන් රැවටීමට ලක් කළ හැකි ය. දරුවන් යථාර්ථය නොපවතින යම් දෙයක පැවැත්ම පිළිබඳව විශ්වාස කරන්නේ නම් එය පූර්ණ රැවටීමක් ලෙස හඳුනා ගනී

**උදාහරණ :**

- දරුවාව නිවසට රැගෙන එන බව දන්වමින් ඔවුන්ගේ දෙමව්පියන් තමාව එවන ලද බව දරුවාට පැවසීම
- දරුවන්ට යම් දෙයක් ආහාර වශයෙන් ලබා දී සිහි විසඥ කර වෙළදාම් කිරීම
- දරුවාගේ දෙමව්පියන් රිය අනතුරකට ලක්වූ බව පවසා දරුවාව ආරෝග්‍යශාලාවට කැටුව එන ලෙස දැන්වූ බව ඒත්තු ගන්වමින් වෙළදාම් කිරීම.

  දරුවන්ට, විශේෂයෙන් ම යෞවනයන්ට මෙම අවස්ථාවන් පිළිබඳව දැනුවත්භාවය තිබුණ ද යම් සිද්ධිමය තත්ත්ව යටතේ රැවටීමට ලක් වීමේ හැකියාව පවතී.

**උදාහරණ :** යෞවනයකු බොජුන්හලක වේටර්වරයකු වශයෙන් සති දින තුළ උදය 9 සිට සවස 5 දක්වා කාලය ස්ථිර වේතනයක් සහිත රැකියාවකට එකඟ වේ. නමුත් යතාර්ථය වන්නේ එම අවන්හලේ ම රාත්‍රී කාලයේ රටබීම අලෙවිහලේ රාත්‍රියේ සේවය කිරීමට ඔහුට සිදුවීමයි.

## ❖ බලහත්කාරය භාවිත කරමින්



ශාරීරික බලය භාවිත කිරීමෙන්/ ප්‍රචණ්ඩත්වය සහ ශාරීරික හානි සිදු කරන බවට තර්ජනය කිරීම තුළින් දරුවන් වෙළදාම් කිරීමට පෙළඹවීම හෝ වෙළදාම් කිරීම මේ යටතට ගනී.

## ❖ පෙළඹවීම් මගින්

කරුණු ඒත්තු ගැන්වීම තුළින් දරුවාට හෝ ඔහුගේ පවුලේ අයට වෙළදාම කරන්නා පිළිබඳ විශ්වාස කිරීමට පෙළඹවීම.

**උදාහරණ :**

- දරුවාට සහ පවුලේ අයට ත්‍යාග ලබාදීම.
- ළමයාට අවවාද සහ අවධානය ලබා දීම
- දරුවාට යහපත් අධ්‍යාපනයක් සහ අනාගතයක් ලබා දෙන බව ඒත්තු ගැන්වීම.

## ❖ බලකිරීම හෝ තර්ජනය

වෙළදාම කරන්නන්, දරුවන් හෝ දෙමව්පියන් තම පාලනයේ තබාගැනීම, වාචිකව තර්ජනය කිරීම මේ යටතට ගනියි.

**උදාහරණ :** දරුවා වෙළදාම් කරන්නා සමග නොඑන්නේ නම් දරුවා මරා දමන බවට දෙමාපියන්ට තර්ජනය කිරීම.

❖ **බලය හෝ අධිකාරිය අයුතු ලෙස භාවිතය**

ළමයා හෝ ඔහුගේ/ ඇයගේ පවුලේ යැපෙනසුළුභාවය රඳවා තබා ගන්නා පුද්ගලයෙකු (ඥාතියෙකු හෝ සේවායෝජකයෙකු) තමා වෙත ඇති බලය හා අධිකාරිය අවභාවිතය කරමින් දරුවාගේ හෝ පවුලේ අයිතිවාසිකම් ප්‍රතික්ෂේප කරන අවස්ථා මේ යටතට ගනී. මෙහිදී වෙළඳාම කරන්නා තම බලය හෝ අධිකාරිය භාවිත කරමින් එකඟතාවයකට පැමිණවීමට දරුවාට හෝ පවුලේ අයට අනුබල දීම සිදු කරයි.

## 3.3 වෙළඳාම හා සම්බන්ධ අපරාධ වරදවල් - පූර්ව වෙළඳාම් අවස්ථාව/ වරදවල් සංයුක්තකරණය

වෙළඳාම අනෙකුත් වරදවල් මෙන් තනි අපරාධයක් වශයෙන් හුදෙකලා කළ නොහැකි ය. වෙළඳාම යන වරද සංස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය තුළ වෙළඳාම කරන්නන්, සහය දක්වන්නන් විවිධ ආකාරයේ වරදවල් රාශියක් එකවර සිදු කරයි. මෙවැනි වැරැදි සංයුක්තකරණය කරන ලද වරදවල් ලෙස හඳුනා ගනියි. මෙහිදී වෙළඳාම යන වරද සිදු කිරීමේ දී සිදුකරන වරදවල් සහ වෙළඳාමට පහසුකම් සැලැස්වීමේ දී සිදුකරන අපරාධ අතර වෙනස හඳුනා ගැනීම වැදගත් ය. එහි පළමු අවස්ථාව 2 වන මොඩියුලය මගින් සාකච්ඡා කර ඇත. මෙම මොඩියුලය මගින් වින්දිතයන් අනුගත කර ගැනීමට දරන උත්සාහයේ දී සිදුවිය හැකි වරදවල්, ඔවුන්ගේ පාලනය පවත්වා ගැනීමේද දී සිදුවිය හැකි වරදවල් හෝ වෙළඳාම් කිරීමේ ක්‍රියාවලියෙහි රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීමේදී හෝ ලාභය උපරිම කර ගැනීම උදෙසා කරන ලද වරදවල් ඇතුළත් වේ. මෙම සංයුක්තකරණය කරන වරදවල් කිරීමේ ක්‍රියාදාමයේ කවර අදියරක දී වුවද සිදුවිය හැකි ය.

- **පූර්ව වෙළඳාම් අවස්ථාවේ දී සිදු කරන වරදවල්**

  දරුවන් වෙළඳාම් කිරීම් යන්නට, දරුවකු එක් ස්ථානයකින් වෙනත් ස්ථානයකට රැගෙන යාම ද ඇතුළත් ය. මෙය යම් විටක එක් රටක සිට තවත් රටකට අපහරණය කිරීමක් ද විය හැකි ය. මෙහිදී සාර්ථක ලෙස දරුවා ප්‍රවාහනය කිරීම උදෙසා පහසුකම් සලස්වන්නන්, වෙළඳාම් කරන්නන් හෝ පහසුකම් සලස්වන්නන් පහත වැරදි සිදුකරයි.

  ❖ දරුවා බාලවයස්කරුවකු නොවන බව දැන්වීම් උදෙසා ව්‍යාජ ලිපි ලේඛන නිර්මාණය

  ❖ උප්පැන්න සහ සහතික/ ජාතික හැඳුනුම්පත්, ගුවන් බලපත්‍ර සහ අනෙකුත් ආගමන විගමන ලිපි ලේඛන නිර්මාණය කරන්නන්


  ❖ ව්‍යාජ ලිපි ලේඛන - වාහන බලපත්‍ර, වාහන අංක පුවරු, විවාහ සහතික වැනි ලේඛන


  ❖ ව්‍යාජ ලිපි ලේඛන සැකසීම සඳහා අල්ලස් ලබාදීම හෝ දේශ සීමා මායිම් තරණය කිරීමට අවසර ලබා දෙන්නන් හට අල්ලස් ලබා දීම.

- **පශ්චාත් වෙළඳාම් අදියර යටතේ වරදවල්**

  ❖ මුදල් විශුද්ධිකරණය

  මෙයින් අදහස් කරනුයේ අපරාධ සිදුකිරීම මගින් අපරාධකරුවන් උපයා ගන්නා මුදල් සුජාතකරණය කිරීමේ ක්‍රමවේදයයි. මේ අනුව මෙය පශ්චාත් වෙළඳාම් අදියර යටතේ සැලකිය යුතු වරදක් ලෙස හඳුනා ගනී. වෙළඳාම් කරන්නනන් ඉන් ඉපැයූ දූෂිත මුදල්/ කළු කඩ මුදල් සාමාන්‍ය ප්‍රවාහයේ පවත්නා සුජාත මුදල් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය මෙහිදී හඳුනාගත හැකිය. පහත සඳහන් දළ රූප සටහන් ඔස්සේ මෙම ක්‍රියාවලිය සිදුවන ආකාරය විග්‍රහ කර ඇත.






ලොව බොහොමයක් රටවල් මෙන්ම ශ්‍රී ලංකාවේ ද 2006 අංක 15 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත යටතේ ද වරදක් බව පිළිගනී.

3 (1) වගන්තිය - යම් දේපලක් සෘජුව ම හෝ වක්‍රව යම් නීති විරෝධී ක්‍රියාකාරකමකින් හෝ නීති විරෝධී ක්‍රියාකාරකමකින් ලද මුදලකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධි වූ බව දැනුවත් ව හෝ දැන ගැනීමට හේතු ඇතිව:

(අ) එසේ සෘජුව හෝ වක්‍රව යම් නීති විරෝධී ක්‍රියා, ක්‍රියාකාරකමක් නැතහොත් යම් නීති විරෝධී ක්‍රියාකාරකමකින් අත්පත් මුදලක් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධි වූ හෝ යම් දේපලක් පිළිබඳ ගනුදෙනුවක සෘජුව ම හෝ වක්‍රව යෙදෙන,

(ආ) සෘජුව හෝ වක්‍රව යම් නීති විරෝධී ක්‍රියාකාරකමකින් නැතහොත් යම් නීති විරෝධී ක්‍රියාකාරකමකින් ලත් මුදලකින් ව්‍යුත්පන්න වූ හෝ උපලබ්ධි යම් දේපලක් භාරගන්නා, සන්තකයේ තබාගන්නා, රඳවාගන්නා, බැහැර කරන හෝ ශ්‍රී ලංකාවට ගෙන එන, ශ්‍රී ලංකාවෙන් පිටතට ගෙන යනු ලබන හෝ ශ්‍රී ලංකාවේ ආයෝජනය කරන,

යම් තැනැත්තෙක් මුදල් විශුද්ධිකරණ වරදට වරදකරු විය යුතු අතර, මහාධිකරණය ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට ඒ වරද කරන ලද්දේ යම් දේපලක් පිළිබඳව ද ඒ දේපල වටිනාකමට නොඅඩු හා ඒ දේපල වටිනාකම් මෙන් තුන් ගුණයක්ට නොවැඩි දඩයකට හෝ අවුරුදු පහකට නො අඩු අවුරුදු 20 කට නො වැඩි කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධනාගාර ගත කිරීම දඩය හා බන්ධනාගාර ගත කිරීම යන්න දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය.

❖ **නීති විරෝධී මුදල් හුවමාරු කිරීම**

නීති විරෝධී මුදල් හුවමාරු කිරීම මුදල් විශුද්ධිකරණය පැහැදිලිව හඳුනාගත් හැකි අවස්ථාවයි. මෙම නීති විරෝධී මුදල් හුවමාරු වීම ආකාර දෙකක් යටතේ සිදුවෙයි.

- පළමු ආකාරය - වෙළඳාම් කිරිමෙන් නීති විරෝධී ලෙස උපයාගත් මුදල් ඒ සඳහා සම්බන්ධ වූ පුද්ගලයන් වෙත ලබාදීමෙන්
- දෙවන ආකාරය - වෙළඳාම් සඳහා අවශ්‍ය සේවා හා සහය සහයෝගය ලබාගැනීම සඳහා අල්ලස් ලබා දීමට භාවිත කරන ලද මුදල්

ඉහත සඳහන් කරන ලද පශ්චාත් වෙළඳාම් වැරදිවලට අමතරව, පහත සඳහන් වරදවල් ද මේ යටතේ සැලකිය හැකි ය. විශේෂයෙන් ම වින්දිතයන්, නැවත වින්දිතයන් බවට පශ්චාත් වෙළඳාම් අවස්ථාවල දී පත්වීමට හැකියාව ඇත.

උදාහරණ :

- නැවත වෙළඳාම - ළමයෙකු ශරීර අවයව ලබා ගැනීමට කරන ලද අවස්ථාවක අනතුරුව නැවත ළමා ශ්‍රමිකයකු ලෙස හෝ සිඟමනේ යෙදවීමේ සිදු කළ හැකි ය.
- ශාරීරික වධ හිංසාව හෝ මිනීමැරීම - දරුවකු වෙළඳාම් කිරීමෙන් අනතුරුව වධහිංසාවට ගොදුරු කිරීම, අමානුෂික නින්දිත සැලකීම්වලට භාජනය කිරීම්, ශාරීරික හිරිහැර සිදු කිරීම හා එහි උග්‍ර අවස්ථාව වන මරණයට පත් කිරීම පශ්චාත් වෙළඳාම් අවස්ථාවේ දී සිදුවිය හැකි ය. විශේෂයෙන් ම දරුවා පාලනය කිරීමට අපහසුවක් හෝ ඔහු පොලිසිය වෙත පැමිණිලි කරතැයි යන බිය මත මෙම ක්‍රියාව සිදු විය හැකි ය.
- අයුතු අවහිරය හෝ නීති විරෝධී රඳවා තබා ගැනීම - වෙළඳාම් කරන්නන් වින්දිත දරුවා අයුතු ලෙස රඳවා තබා ගැනීම හෝ සංචරණය අවහිර කිරීම, දරුවා පලායාමට උත්සහ කරන අවස්ථාවක දී සිදු කරයි.

**උදාහරණ** : *ගැහැණු ළමයින් ගණිකා වෘත්තිය සඳහා වෙළඳාම*

- දරුවන් වෙළඳාමේ හවුල්කරුවන් බවට පත්කර ගැනීම - වෙළඳාම් කරන්නන් තම කර්මාන්තය තුළට වෙළඳාමට ලක්වූ දරුවන් යොදවා ගැනීම
- ළමයින් අපරාධ කිරීම සඳහා යෙදවීම - වෙළඳාමට ලක්වූ දරුවන් වෙළඳාම කළ පුද්ගලයන් විසින් යම් යම් අපරාධ සඳහා යෙදවීම සිදු කරයි. **උදාහරණ** : *අවි ආයුධ ප්‍රවාහනය, මත්ද්‍රව්‍ය ප්‍රවාහනය*

ඉහත සඳහන් කරන ලද වැරදිවලට අමතරව, වෙළඳාම හෝ වෙළඳාම කිරීමේ ක්‍රියාවලිය තුළ
සිදුවන පහත වරදවල් ද නීතිය ඉදිරියේ වරදක් බව අවබෝධ කරගත් යුතු ය.

- වෙළඳාම කරන්නාට භාර දීම උදෙසා ඉතා කෙටි දුරක් වුව ද වින්දිත ළමයා ප්‍රවාහනය කිරීම.
- වෙළඳාම් ක්‍රියාවලිය සිදුවන ස්ථානයක අරක්කැමියකු හෝ ගෘහ පාලකයෙකු ලෙස සේවය කිරීම. වෙළඳාම ක්‍රියාවලියේ එක් අදියරක් ලෙස යොදා ගන්නා බව දනිමින්ම, කුලී පදනම යටතේ පහසුකම් ලබාදීම.
- වෙළඳාමට ලක්වූ දරුවන් ප්‍රවාහනය කිරීම සඳහා යොදා ගන්නා බව දනිමින්ම කුලී පදනම යටතේ ප්‍රවාහන පහසුකම් සැලැස්වීම.

## 3.4 වෙළඳාමේ ඵල විපාක

වෙළඳාමේ වින්දිතයා වෙත ළමයා තම පවුලෙන්, මිතුරන්ගෙන් හුදකලා වීම සහ/ හෝ ශාරීරික සහ/ මානසික හිරිහැරයට ලක්වීම සිදුවේ. යම් අවස්ථාවල දරුවාගේ හෝ ඔහුගේ/ ඇයගේ සමීපතම පවුලේ සාමාජිකයන්ගේ ජීවිත පවා අවදානමට ලක් වේ. ළමයින් වෙළඳාම් කිරීම අපරාධ මේ වරදක් පමණක් නොව එය දරුවාගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ද වේ. වෙළඳාම් කිරීම තුළින් තනි පුද්ගලයන්ට, පවුලට, සමාජයට හා රාජ්‍යයට විවිධාකාර ප්‍රති විපාකයන්ට මුහුණ දීමට සිදුවේ.

- **තනි පුද්ගලයන්ට**

  වෙළඳාම් කරන්නන් තර්ජනකාරී මාධ්‍යන් ඔස්සේ ළමයාගේ සංචලනය සීමා කරන අතර ළමයින්ව ඉතා අවම තත්ත්වයන් යටතේ ජීවත්වීමට, හෝ රැකියාවක නියුතු වීමට පරිසරය නිර්මාණය කරවමින් තම බලපෑම යටතේ රඳවා තබා ගනියි. ශාරීරික හෝ මානසිකමය වශයෙන් ආරක්ෂණ විධීන් අහිමි කරවමින්, දරුවන් පලා යාම වැළැක්වීම සඳහා වෙළඳාම් කරන්නන් කටයුතු සිදුකරයි. මෙය දරුවාගේ ශාරීරික සහ මානසික සංවර්ධනයට ඉතා හානිදායක ආකාරයට බලපායි.

- **ශාරීරික සෞඛ්‍යමය ගැටලු**

  වෙළඳාමට ලක්වූ ළමා වින්දිතයන් ඔවුන්ගේ මූලික මානව හිමිකමක් වන සෞඛ්‍යට සහ ආරක්ෂණයට ඇති අයිතිය අහිමි වීම අත්විඳියි. වෙළඳාමට ලක්වූ දරුවන් ඉතා අමානුෂික ජීවන තත්වයන් යටතේ රඳවා තබා ගැනීම, සිදුකරයි. ඔවුන්ට ප්‍රමාණවත් තරම් සෞඛ්‍යාරක්ෂිත ආහාර නොලැබී යයි. එලෙසම, ඔවුන් ශාරිරිකමය සහ ලිංගික අඩත්තේට්ටම් හා අපයෝජනයන්ට ලක්වන අතර මේ තුළින් දීර්ඝකාලීන ප්‍රති විපාකයන්ට මුහුණ දීමට ද සිදුවෙයි. එනම්:

- මත්ද්‍රව්‍ය සහ මත් පැන්වලට ඇබ්බැහි වීම: භාවාත්මක ලෙස පෙළඹ වීමේ ප්‍රතිඵලයක් ලෙස හෝ වෙළඳාම කරන්නන් විසින් භාවිත කරන මත්ද්‍රව්‍ය භාවිත කිරීමට බලපෑම් කිරීම, බල කිරීම හෝ ශාරීරික අපයෝජනය සඳහා මුහුණ දීමට හෝ මානසික වශයෙන් බලාපොරොත්තු රහිත ස්වභාවයෙන් තාවකාලිකව මිදීමට මේ ආකාරයෙන් ඇබ්බැහිව වීම සිදුවේ.

  - තැල්ම, කැළලි සහ පිළිස්සුම් තුවාල භෞතික අපයෝජන හා වධ දීමේ සලකුණු වශයෙන් ඉතිරි වේ.
  - දරුණු ශාරීරික හිංසනය හේතුවෙන් මතකයට බලපෑම් සිදු වන ආකාරයෙන් මොළයට සිදුවූ හානි.
  - කරකැවිල්ල, හිසේ කැක්කුම සහ හිරි වැටීමේ තත්ත්වයන්
  - පෙණහලු ආශ්‍රිත රෝග - ක්ෂය රෝගය, සෙංගමාලය
  - ඉතා හානිදායක වෛද්‍යමය ක්‍රියාකාරකම් සඳහා දරුවන් යොමු කිරීම හේතුවෙන් සිදුවන ආසාදන තත්ත්වයන් හෝ ශාරීරික විකෘතිතා
  - කල් පවත්නා කොඳු ඇට පේලිය, හෘදවාහිනී, ශ්‍රවණ හෝ ශ්වසන ආශ්‍රිත ගැටලූ ඇතිවීම දීර්ඝකාලීන ලෙස කෘෂි කර්මාන්තයේ යෙදෙමින් දැඩි ලෙස වැඩවල යොදන කර්මාන්තවල යෙදවීම, හෝ ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගැනීම හේතුවෙන් ඇති වේ.
  - පෝෂණ ඌනතා සහ බරපතල දන්ත සෞඛ්‍යමය ගැටළු
  - ළමා වින්දිතයන් බොහෝ වේලාවට වර්ධනයේ ඌනතා සහ දුර්වර්ණ වූ දත් යන තත්වයන්ගෙන් පෙළෙයි.
  - අවම විදුලි එළියක් සහිත ස්ථානයන්හි වැඩ කිරීම හේතුවෙන් ඇස් පෙනීම දුර්වල වීම හෝ අක්ෂි රෝගයන්ට ගොදුරුවීම.

**උදාහරණයක් වශයෙන්**, *තායිලන්තයේ ජාතික මානව හිමිකම් කොමිසම 2003 වර්ෂයේ වෙළඳාම් කිරීම ධීවරයන් සිය දෙනෙකුට බලපාන ලද ආකාරය වාර්තා කරන ලදී. වසර ගණනාවක ශ්‍රම සූරාකෑමෙන් අනතුරුව 39 දෙනකු මියගොස් තිබූ අතර නිවාස වෙත නැවත පැමිණි කණ්ඩායම ඉතා දරුණු රෝගී තත්ත්වයන්ට ගොදුරු වී තිබූ අතර මානසිකව කැලඹීමට ලක්වී තිබුණි. දෘශ්‍ය්ටි හා ශ්‍රවණය පිළිබඳ ගැටලූ සහ ඇවිදීමට නොහැකි වීම යන තත්ත්වයන්ට ද ගොදුරු වී තිබුණි.*

ඉහත දක්වන ලද ලැයිස්තුවට අමතරව වෙළඳාමට ලක්වූ ළමයින් ලිංගික සූරාකෑමට ගොදුරුව වන අතර ඒ හේතුවෙන් පහත ආකාරයේ බරපතළ සෞඛ්‍ය ගැටළුවලට ගොදුරු වනු ලැබේ.

- HIV/AIDS ඇතුළුව ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝගවලට ගොදුරුවීම.
- ගබ්සාව වීම හෝ බලහත්කාරී ගබ්සාවන්ට ලක් කිරීම. (ස්ත්‍රී දූෂණයට ලක්වීම හෝ ගණිකා සේවයේ යෙදවීම හේතුවෙන් අනවශ්‍ය ගැබ් ගැනීම්වලට ඇති ඉහළ අවදානම් සහ අනාරක්ෂිත ගබ්සාවන්)
- නිරන්තරයෙන් ම ඉහළ අවදානම් සහිත ගැබ් ගැනීම් තුළින් ඇතිවන සංකූලතා.

රෝගයක් ඇතිවීමට පෙර වළක්වා ගැනීමට සෞඛ්‍ය රක්ෂණාවරණයක් ලබා දීම මෙම වින්දිත දරුවන්ට තත්භාවී ලෙස නොපවතින්නකි. ප්‍රාථමික අවස්ථාවන්හි දී නිසි පරිදි ප්‍රතිකාර ලබා නොදුන් සෞඛ්‍යමය ගැටළු කාලයත් සමග බරපතල සහගත තත්ත්වයක් ලෙස වර්ධනය වෙමින් ජීවිතය පවා තර්ජනයට ලක්කරයි.

- **මානසික සෞඛ්‍යය ගැටලූ**

  තමන්ගේ පවුලෙන් වෙන් කර තැබීම, මිතුරන්ගෙන් හා සමාජයෙන් හුදකලා කිරීම හේතුවෙන් වන බිය නිසා, වෙළඳාමට ලක්වූ ළමා වින්දිතයෝ මානසික හා භාවාත්මක සංකූලතාවන්ට නිරන්තරයෙන් ම මුහුණ දෙති. මෙයට අමතරව ඔවුන් රැඳවුම්භාරයේ තබා සිටින අවස්ථාවේ දී වෙළඳාම්කරුවන්ගේ මානසික වධ හිංසාවට හා තර්ජනයන්ට ගොදුරු වෙයි. මෙම අත්දැකීම් කල් පවත්නා මානසික ගැටලූ බවට පරිවර්තනය විය හැකි අතර දරුවාගේ මානසික සෞඛ්‍යමය සහ යහපැවැත්ම කෙරෙහි තීරණාත්මක ලෙස බලපෑම් සිදුකරයි.

**වෙළඳාම් කිරීම හේතුවෙන් ඇතිවිය හැකි නිශේධනීය මානසික බලපෑම් පහත ආකාරයට හඳුනාගත හැකිය.**

- දිනපතා සිදුවන මානසික අපයෝජනය හා වධ හිංසහිංසාවට ලක් කිරීම හේතුවෙන් හටගන්නා මානසික කම්පනය මෙය විශාදය, පීඩනය ආශ්‍රිත ආබාධයන්, දිශානති හරණය (මං මුලාව), මානසික වූ ව්‍යාකූලභාවය සහ හදිසියේ මහත් කම්පනයකට පත් වීමේ තත්ත්වයන් ඇති වීම.
- ආත්ම විශ්වාසය නොමැති වීම තුළින් ස්වයං වරදකාරී හැඟීමක්, තමාට ම වෛර කර ගන්නා තත්ත්වයක් ඇතිවීම හෝ ආත්ම අභිමානය දුර්වල වීමෙන් සියදිවි හානි කර ගැනීම හෝ ඒ පිළිබඳ සිතිවිලි පහළ වීම සිදු වීම.
- අසරණභාවය, ලජ්ජාශීලී භාවය, අපකීර්තියට ලක් වීම, කම්පනය, අතීතාවර්ජනය, නරක සිහින පෙනීම, ප්‍රතික්ෂේප කිරීම, අවිශ්වාස කිරීම යන හැඟීම් ඇති වීම.
- තමා වෙනත් රටක සිටින බව දැන ගැනීමෙන් ඇතිවන සංස්කෘතික කම්පනය.

ළමයෙකු ලෙස මෙම විවිධාකාර අත්දැකීම් ඔස්සේ වින්දිතයකු බවට පත් වූ ළමාවිය තුළින් වැඩිහිටි වියේ දී මානසික ආබාධ සහ ගැටළුවලට ගොදුරු වීමේ ප්‍රවණතාව ඉහළ නංවයි.

- **සංවර්ධනයට වන බලපෑම**

  දීර්ඝ කාලීනව දරුවන් මානසික, කායික හා ලිංගික අපයෝජනයන්ට ගොදුරුවීම, කුසගින්න සහ මන්දපෝෂණයය, තර්ජනය සහ හුදකලා කිරීම දීර්ඝකාලීන සහ ස්ථිර වර්ධනයට බලපෑම් ආදිය ගැටලුකාරී බලපෑම් ඇති කරයි. තවදුරටත් ළමා කාලය අහිමි කිරීම, ගෞරවය සහ මානසික යහ පැවැත්මට වන බලපෑම් තුළින් ආත්ම විශ්වාසය අවම කරන අතර පෞද්ගලික අරමුණු නිශ්චය කරගැනීම සහ යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනැගීමේ දී දුර්වලතා ඇති කරයි.

  ළමයින් ලෙස තම මූලික අධ්‍යාපනය සම්පූර්ණ කර නොගන්නා වින්දිත දරුවන් සාක්ෂරතාවයෙන් තොර වීම හා පුද්ගලයෙකුට අවශ්‍ය හැකියාවන් වර්ධනය කර ගැනීමට නොහැකි වීම පශ්චාත් ළමා අවධියේ දී නිශේධනීය බලපෑම් ඇති කරයි. මේ හේතුවෙන් ගෞරවනීය ජීවත්වීමේ පරිසරයක් ගොඩනගා ගැනීමට නොහැකිවීම, පවුලට ශක්තියක් වීමට නොහැකිවීම හෝ තම අභිමතාර්ථ ඉටු කරගැනීමට නොහැකිවීම යන ගැටලුවලට මෙම දරුවන් මුහුණ දෙනු ලැබේ.

  දරුවන් කුට්ටනය කිරීම ළමයාගේ ශාරීරික සෞඛ්‍යයට පමණක් බලපාන්නක් නොව එය මානසික සෞඛ්‍යයට බලපෑම් සිදුකරමින් දරුවාගේ සංවර්ධනයට බලපෑම් කරන අතර එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මගින් තහවුරු කරන ලද ළමා අයිතිවාසිකම් ද උල්ලංඝනය කරනු ලබයි.

  - තම ශරීරය පිළිබඳව තීරණ ගැනීමට දරුවාට ඇති අයිතිය
  - කෲරත්වය සහ නිදහස් අදහස් අහිමි කිරීම්වලින් තොර වීමට ඇති අයිතිය
  - විවේකයට ඇති අයිතිය
  - පවුලක් සමඟ ජීවත් වීමේ අයිතිය
  - අධ්‍යාපනයට ඇති අයිතිය
  - පෞද්ගලිකත්වයට ඇති අයිතිය

### *(a) පවුල*

පවුල යන සංකල්පය විවිධ ආකාර යටතේ අර්ථ නිරූපණය කළ හැකි ය. පවුල, සංවිධිත සමාජය තුළ ඉතාම කුඩා ඒකකය වශයෙන් සෑම අවස්ථාවකදීම හඳුනාගනියි. සාම්ප්‍රදායිකව පවුල තුළින් දරුවන් අන්‍යෝන්‍ය ගෞරවය, ආදරයය, කරුණාව, සමාව දීම හා අන්‍යෝන්‍ය සම්බන්ධතා පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳ අවබෝධයෙන් ලබා ගනියි. පවුල ආරක්ෂාව, මානසික හා භෞතික පුනර්ජීවනය, කොන්දේසි විරහිත ආදරය ලබා දෙයි. ළමයින් වෙළඳාම පහත ආකාරයට පවුල කෙරෙහි බලපෑම් සිදුකරයි.

- ළමයින් වෙළඳාම් කිරීම පවුල කෙරෙහි සුවිශාල පීඩනයක් ඇති කරන අතර සමහර අවස්ථාවල දී පවුල් සංස්ථාව බිඳ වැටීමට ද හේතු වේ. බිය සංකාව, දැඩි ශෝකය සහ පවුලෙහි සාමාන්‍ය ක්‍රියාවලිය කඩාවැටීම දෙවන පරම්පරාවක් වින්දිතයන් බවට පත් කරයි.

- පවුලේ අනෙක් සාමාජිකයන් ද වෙළඳාමට ලක් වීමෙන් භීතියෙන් යුතුව ජීවත් වීම.
- වෙළඳාම් කරන ලද දරුවා යොදා ගෙන කරන ලද අසභ්‍ය ඡායාරූප සහ වීඩියෝ පට මගින් අනෙකුත් අවශ්‍යතා කැපකරමින් පවුලේ සාමාන්‍ය පැවැත්මට සහ අනිකුත් සාමාජිකයන් බලපෑමට ලක්වීම මේ තුළින් සිදු වෙයි. තම ජීවත් වන ප්‍රදේශයෙන් ඉවත් වී නොදන්නා ප්‍රදේශයක හුදකලාව පදිංචි වීමෙන් මෙම කැළල් සඳහා ප්‍රතිචාර දක්වයි.
- වෙළඳාමට ලක් වූ වින්දිතයකු යථා තත්ත්වයට පත්කර ගැනීම පවුලකට දැවැන්ත අභියෝගයක් වන අතර සමගාමී අනෙකුත් අවශ්‍යතා කැප කිරීම හේතුවෙන් පවුලේ සාමාන්‍ය පැවැත්මට සහ අනිකුත් සාමාජිකයන් බලපෑමට ලක්වීම මේ තුළින් සිදු වෙයි.
- ළමයින් වෙළඳාම පිළිබඳ අත්දැකීම් මැඩලීමට උත්සාහ කිරීම තුළ සාංකාව සහ පීඩනයකින් හෙබි වාතාවරණයක් පවුල තුළ උද්ගත වන අතර එය දෙවන පරම්පරාව කෙරෙහි මානසික බලපෑම් සිදුකරයි.

**(b) සමාජයට**

දරුවන් වෙළඳාමට ලක් කිරීමේ නිශේධනීය බලපෑම් දරුවා සහ පවුල් ඉක්මවා ව්‍යාප්ත වන්නේ ය. එය සමස්ත සමාජයටම නිශේධනීය ලෙස බලපායි. පහත දැක්වෙන විශේෂ අවස්ථා යටතේ වෙළඳාම සමාජයට බලපෑම් සිදුකරයි .

- වින්දිතයා, ඔහුගේ/ ඇයගේ පවුල, මිතුරන් සමාජය මගින් නොපිළිගැනීමට ලක්වේ. මෙය වින්දිතයා සමාජයට අන්තර්ග්‍රහණය කරගැනීමේ දී බලපානු ලබයි.
- වෙළඳාමට ලක්වී අනතුරුව ලිංගික සූරාකෑමට හෝ බලහත්කාරයෙන් ගණිකා සේවයට යොදවනු ලැබූ දරුවා ආසාදිතයකු විය හැකි ය.
- එක් ළමයෙකු යම් සමාජයකින් සාර්ථක ලෙස වෙළඳාම් කිරීම යන්න එම සමාජයේ සිටින සියලුම ළමයින්ගේ අවදානම ඉහළ නංවයි. මන්ද ඒ තුළින් එකී සමාජයේ ඇති අවදානමකින් යුතු දරුවන් සොයා ගැනීමට ශක්‍යතාවක් ඇති මූලයක් බවට පත්වී ඇති බව ඉන් ගම්‍ය වේ.
- සාර්ථකව සිදු වන ළමා වෙළඳාම තුළින් ව්‍යාපාරය සාර්ථක වන අතර ඉන් සමස්ත ළමා ප්‍රජාවටම ඉහළ තර්ජනයක් ඇති කරයි.

**(c) රාජ්‍ය**

ළමයින් වෙළඳාම් කිරීමෙන් රාජ්‍යයකට පහත ආකාරයේ නිශේධනීය බලපෑම් සිදුවෙයි.

**රාජ්‍ය ආරක්ෂාව** - දරුවන් වෙළඳාම ඇතුළුව මිනිසුන් වෙළඳාම් කිරීම් තුළින් රාජ්‍යයක නීතියේ ආධිපත්‍ය තර්ජනයට ලක්වෙයි. රාජ්‍ය අභ්‍යන්තර මෙන්ම බාහිර ආරක්ෂාව කෙරෙහිද මෙය බලපෑම් සිදුකරයි.

**රාජ්‍යයට දැරීමට සිදු වන මූල්‍ය පිරිවැය** - නීතිය ක්‍රියාත්මක කිරීමට වැයවන ඍජු පිරිවැය, බේරාගැනීම, පුනරුත්ථාපනය සහ දරුවා නැවත අන්තර්ග්‍රහණය කිරීම, විමර්ශනය, නඩු පැමිණ වීම සහ වෙළඳාම කළවුන් හට දඬුවම් පැමිණවීමට යන පිරිවැය.

**උදාහරණ-** රැඳවුම් බාරයේ තබා ගැනීමට යන නඩත්තු පිරිවැය

**සමාජ ආර්ථිකමය සංවර්ධනයට වන බලපෑම** - ළමයින් වෙළඳාම් කිරීම හේතුවෙන් බරපතළ ලෙස නැවත ප්‍රතිපූරණය කළ නොහැකි ආකාරයෙන් මානව සම්පත් අහිමි කිරීමක් සිදු සිදුකරයි. මෙය මගින් අනාගතයේ රැකියා අවස්ථා අහිමි කිරීම සහ කාර්යක්ෂමතාව පහළ යෑම සිදුවේ. වෙළඳාමට ලක්වූ දරුවන්ට තම හැකියාවන්. ශක්තිය. දැනුම හා අත්දැකීම් දායක කරගනිමින් රටේ සමාජ ආර්ථික වර්ධනයට දායකත්වය දැක්වීමට හැකියාව තිබුණි. එලෙසම ළමයින් වෙළඳාම් කිරීමට එරෙහිව සටන් කිරීම සඳහා අමතර මුදල් සහ මානව සම්පත් වෙන් කිරීමට සිදුවීම, ගැටළු පිටුදකිමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුලනය කිරීමට කටයුතු කිරීමට රාජ්‍යයකට සිදුවේ.

**රාජ්‍යයේ කීර්ති නාමයට වන නිශේධනීය බලපෑම** - ළමයින් වෙළඳාම් කිරීම පිළිබඳව ඉහළ අවදානමක් ඇති රටක්, අන්තර්ජාතික ප්‍රජාව විසින් හෙළා දකිනු ඇත. අන්තර්ජාතික සහ කලාපීය වශයෙන් එකඟ වූ කලාපීය හා ජාත්‍යන්තර බැඳියාවන් ඉටුකිරීමට රාජ්‍යයකට අන්තර්ජාතික ප්‍රජාව වෙත වගකීමක් ඇත. මෙය රාජ්‍යයක් හා අන්තර්ජාතික ප්‍රජාව අතර වන රාජ්‍ය තාන්ත්‍රික සම්බන්ධතා සහ වෙළෙඳ කටයුතු කෙරෙහි බලපෑම් සිදු කරයි.



**ඉගෙනුම් මෙවලම්**

**අභ්‍යාස**

**ක්‍රියාකාරකම 1 - තනි පුද්ගල අභ්‍යාසය**

සහභාගි වන්නන් පහත සඳහන් ප්‍රකාශ **වැරැදි හෝ නිවැරදි** භාවය ලකුණු කර වැරදි ප්‍රකාශය නිවැරදි කර දක්වන්න

| | | |
|---|---|---|
| 01 | ළමයින් වෙළඳාම යන්න තුළ යම් ආකාරයක ගමන් කිරීමක්, ප්‍රවාහනය හෝ රාජ්‍ය ය හරහා හෝ රාජ්‍යයක දේශ දේශසීමාවන සීමාවන් එපිටට සංසරණය වීම අනිවාර්යයෙන් සිදුවිය යුතු ය. | |
| 02 | ළමයින් වෙළඳාම් සිදුකරන්නේ ගණිකා වෘත්තියේ යෙදවීම උදෙසා පමණක් නොව වෙනත් ආකාරයේ ශ්‍රම සූරාකෑම්, පොදුවේ ඉහළ ඉල්ලුමක් පවත්නා හානිකර ක්‍රියා සුළු වේතනයක් හෝ වේතනයක් රහිතව අවම සේවා තත්ත්ව යටතේ ඉටුකරවා ගැනීමයි. | |
| 03 | ළමයින් වෙළඳාම් කිරීමේ අරමුණ වන්නේ ළමයින්ගේ ශ්‍රමය සූරාකෑම තුළින් ලාභ ඉපැයීමයි. | |
| 04 | ළමයින් වෙළඳාම් කිරීම යන්න තුළ භෞතිකව වශයෙන් බලපෑම් කිරීම, අවහිර කිරීම සහ /හෝ ප්‍රචණ්ඩත්වය යෙදවීම් අනිවාර්යෙන් අන්තර්ගත විය යුතු ය. | |
| 05 | වෙළඳාම් කරන්නන් සෑම අවස්ථාවකදී ම නාඳුනන පුද්ගලයන් ය. | |
| 06 | වෙළඳාමට ලක්වීම හේතුවෙන් යම් අපරාධමය වරදක් සිදු කළ දරුවකු අපරාධකරුවකු නොව වින්දිතයෙකු ලෙස හඳුනාගත යුතු අතර යුක්ති පද්ධතිය තුළ නැවත වින්දිතයෙක් වීම වැළැක්විය යුතු ය. | |
| 07 | ළමයින් වෙළඳාම් කිරීම සියළු අවස්ථාවන් හිදී සිදුකරන්නේ අත්දැකීම් සහිත සංවිධානාත්මක අපරාධකරුවන් ය. යහපත් අධ්‍යාපනයක් සහිත මධ්‍යම පාන්තික වැදගත් මිනිසුන් වෙළඳාම් කරන්නන් නොවේ. | |
| 08 | දරුවන් වෙළඳාම් කරන්නන් අත්‍යවශ්‍යයෙන් ම පිරිමි පුද්ගලයන් නොවන අතර වෙළඳාමේ වින්දිතයන් අත්‍යවශ්‍යයෙන් ම ගැහැනු දරුවන් ද නොවේ. | |
| 09 | ලිංගික අපයෝජනයට ලක්වූ වෙළඳාම් ළමා වින්දිතයන් සියලු ම අවස්ථාවල දී අපයෝජනය නිසා ඇතිවන භෞතික ලක්ෂණ මගින් හඳුනාගත හැකි ය. | |

**ක්‍රියාකාරකම් 2- සිද්ධි අධ්‍යනය**

කළුගම නගරයේ නිවසක දරුවන් සඟවාගෙන සිටින බවට අසල්වාසීන්ගෙන් ළමා අයිතිවාසිකම් ආරක්ෂක නිලධාරියාට ලැබුණු පැමිණිලි කිහිපයක් හේතුවෙන් එම නිලධාරියා එකී සුබෝපභෝගී නිවාසය පොලිසිය පරීක්ෂාවට ලක්කරන ලදී. එහිදී ඔවුන්ට දැක් ගත හැකි වූයේ පිටතින් අගුළුලන ලද කාමරයක් ඇති බවයි. පොලීසියට බලය යොදා කාමරය ඇරීමට සිදුවිය. එම කාමරය තුල දරුවන් 10 දෙනෙ ක් (ගැහැනු දරුවන් හය දෙනෙක් සහ පිරිමි දරුවන් හතර දෙනෙක්) ඔවුන්ට සොයාගත හැකිවිය විය. එම කාමරයේ ආලෝකය ඉතා දුර්වල වූ අතර, දුහුවිලි පිරී තිබුණි. කාමරයට බද්ධව එක් වැසිකිළියක් තිබුණි.

16 හැවිරිදි නිර්මලා පොලිසියට පැවසුවේ ඇයව මාමා විසින් නගරයට රැගෙන එන ලද බවය. ඔහු ඇයගේ දෙමව්පියන්ට පවසා තිබුනේ ඇයට යහපත් වේතන ලබාදෙන තම මිතුරකුගේ සාප්පුවේ රැකියාවක් ලබා ගෙන බවය. ඇයව 14 වන වියේ දී නගරයට කැඳවාගෙන පැමිණ ගණිකා නිවාසයක් පවත්වාගෙන යන කාන්තාවක් හට අලෙවි කර ඇත. ගණිකා නිවාස පාලිකාව ඇයව බලහත්කාරයෙන් අවුරුදු 2ක් තිස්සේ ගණිකා වෘත්තියේ යොදවා ඇති අතර නිදාගැනීම සඳහා ඉතා සුළු ඉඩක් සහ නියමිත පරිදි ආහාර ලබා දීම ද පැහැර ඇත. ඇය තවදුරටත් පොලිසිය වෙත පැවසුවේ පසුගිය කාල පරිච්ඡේදය තුල ඇය ඉතා කේන්ති යන ස්වභාවයෙන් යුත් තැනැත්තියක් බවට පත්ව ඇති බවත්, සමාජයෙන් එල්ලවන පීඩනය හේතුවෙන් ඇයගේ අනන්‍යතාවය හෙළි නොකරන ලෙස ද පොලිසියෙන් සහ ළමා ආරක්ෂණ නිලධාරියාගෙන් ඉල්ලා සිට ඇත.

14 වියැති පනිතා ළමා ආරක්ෂණ නිලධාරියා වෙත පවසා තිබුනේ ඇය ද පෙර කී ග්‍රාමයේ පදිංචිකාරියක් බවත් ඇයගේ දෙමව්පියන් වෛද්‍යවරුන් බවය. ඇය පැවසුවේ, පාසල නිමවී පාසල් ළමුන් ප්‍රවාහනය කරන වෑන් රථය පැමිණෙන තුරු පාසල් ගේට්ටුව අසල රැඳී සිටින අවස්ථාවේ දී, වෙනත් වෑන් රථයක් පැමිණ ඇය සිටින ස්ථානයේ නවත්වා ඇයව එම රථය තුලට බලහත්කාරයෙන් ඇතුළු කර මෙම ස්ථානයට රැගෙන ආ බව ය. ඇයට තවත් මාස දෙකකින් සිදුවන අයගේ විවාහය සඳහා සූදානම් වන ලෙස ඇය නිලධාරියට පවසා ඇත. එලෙසම ඇය ළමා ආරක්ෂා නිලධාරියාට පවසා තිබුනේ සතියකට දෙවරක් පමණ ඇය වෙත පැමිණෙන වයස අවුරුදු 45 ඉක්මවූ මිනිසා ඉදිරියේ කෙටි ඇඳුමකින් යුතුව නර්තනයේ යෙදීමට බල කරන බවත්, ඒ සෑම අවස්ථාවකදී ම එය වීඩියෝගත කරන බවත් ය.

15 හැවිරිදි නීල් තම නිවසට සහයක් දැක්වීම උදෙසා රැකියාවක් සොයමින් නගරයට පැමිණ ඇත. මාර්ගයේදී මුණ ගැසුණ මිනිසෙක් ඔහුට හෝටලයක රැකියාවක් සොයාදෙන බව පවසා ඇත. එම මිනිසා ඔහුව මෙම ස්ථානයට රැගෙන විත් බද්ධ නිවාසයේ අයිතිකරුට විකුණා ඇත. බද්ධ නිවාසයේ අයිතිකරු සංචාරක මාර්ගෝපදේශකයෙකි. සවස් කාලවල දී විවිධ හෝටල්වලට මොහුව රැගෙන යන බද්ධ නිවාසයේ අයිතිකරු ඔහුව සංචාරකයන්ට අලෙවි කරයි. මොහු ලිංගික සූරාකෑම් සහ අපයෝජනයන්ට වසරක පමණ කාලයක් ගොදුරු වී ඇත. නීල් පවසන්නේ සංචාරකයන් විශාල වශයෙන් ඔහුට මුදල් ලබා දුන්න ද නිවසේ අයිතිකරු ඔහු නීල් වෙනුවෙන් තැන්පත් කරන බව දක්වමින් ලබා ගන්නා බවයි.

මෙම සිදුවීම් ප්‍රවේශමෙන් කියවා පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. ඉහත සිද්ධි අධ්‍යනය තුළ වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් බැලූ බැල්මට සිද්ධියක් තිබෙන්නේ ද ?
2. එක් එක් අනු සිද්ධියේ වෙළඳාම හා සම්බන්ධ සියලූ ම මූලිකාංග හඳුනා ගන්න.
   (ක්‍රියාව, ආකාරය සහ අරමුණ )
3. ඉහත අධ්‍යනයේ පූර්ව, සිදුවීම අතරතුර සහ පශ්චාත් වෙළඳාම් අවස්ථාවන් හිදී සිදු කරන ලද අපරාධ හඳුනා ගන්න.

## හතර වන මොඩියුලය

| මූලධර්ම රාමුව සහ අදාල සෙසු ලේඛන | | |
|---|---|---|
| | දේශන පැය ගණන | 4 |
| | ඇගයීම් ක්‍රමවේදය | පංති කාමර සාකච්ඡා |
| | අධ්‍යයන අරමුණු | මෙම මොඩියුලය අවසානයේ දී සහභාගීවන්නන් හට පහත දෑ හැකි විය යුතු ය:<br>• ළමයකුගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකරනු ලබන අන්තර්ජාතික හා කලාපීය මානව හිමිකම් ලේඛන, සාමාන්‍ය මානව හිමිකම් ලේඛන හා ළමයින් වෙළදාම් කිරීමේ ගැටලුව කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම-සම්බන්ධයෙන් මූලික අවබෝධයක් වර්ධනය කිරීම.<br>• අන්තර් ජාතික හා කලාපීය ලේඛනයන් හී දක්වා ඇති ප්‍රධාන සංකල්පයන් හා නිර්වචනයන් පිළිබඳ දැනුවත් වීම.<br>• රාජ්‍යයන් තුල මෙකී ලේඛනයන් බලාත්මක කිරීම සඳහා යොදාගනු ලබන යාන්ත්‍රණයන් පිළිබඳව සහ එය සහභාගීවන්නාගේ භූමිකාවට සම්බන්ධ වන ආකාරය අවබෝධ කර ගැනීම. |

### a. අන්තර්ජාතික නෛතික රාමුව

**හැඳින්වීම**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙන් පසු යුගයේ දී, අන්තර් ජාතික මානව හිමිකම් නීති

ක්ෂේත්‍රය අන්තර් ජාතික මානව හිමිකම් ලේඛන ගණනාවකින් පෝෂණය වී තිබේ. මෙකී ලේඛන අතුරින් ළමයින්ව සුරාකෑමට එරෙහිව සටන් කිරීම පිණිස කටයුතු කරන සම්මුතීන් හා ප්‍රකාශනයන් ගණනාවක් වේ.

මෙම මොඩියුලය, පොදුවේ ළමා අයිතිවාසිකම් පිළිගනු ලබන සහ ළමුන් ද ඇතුලුව තැනැත්තන් වෙළදාම් කිරීම සම්බන්ධයෙන් අදාල වන ප්‍රධාන මානව හිමිකම් ලේඛනයන් පිළිබඳ සාකච්ඡා කිරීමට අරමුණු කරනු ලබයි.

### 4.1 ශ්‍රී ලංකාව විසින් ළමුන් වෙළදාම් කිරීමට අදාල ලේඛන අපරානුමත කිරීමේහි ලා වන තත්වය

දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNTOC) සහ තැනැත්තන් විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් වෙළදාම් කිරීම වැළැක්වීම මර්දනය කිරීම සහ දඬුවම් දීම සඳහා වන පැලමෝර් සංධානය (2000) (මෙය තැනැත්තන් වෙළදාම් කිරීමේ සංධානය හෝ පැලමෝර් සංධාන ද්විත්වයෙන් එකක් ලෙෂ ද හැඳින්වේ.)

**දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යනුඃ**

දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි අරමුණ වන්නේ දේශාන්තර සංවිධානාත්මක අපරාධ ඵලදායී ලෙස වළක්වා ගැනීමත් එයට විරුද්ධව සටන් කිරීමත් සඳහා වන සහයෝගීතාවය වර්ධනය කිරීමයි. (1 වන ව්‍යවස්ථාව). එමගින් මූලික වශයෙන් සංවිධානාත්මක අපරාධ කණ්ඩායම්වලට සහභාගී වීම එවැනි කණ්ඩායම් මගින් මුදල් විශුද්ධිකරණය කිරීම, දූෂණය, අපරාධකරණය කිරීම සහ යුක්තියට බාධා කිරීම අපරාධකරනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.

ශ්‍රී ලංකාව දේශාන්තර සංවිධානාත්මක අපරාධ සම්මුතිය 2000 දෙසැම්බර් 13 වන දින අත්සන් කළ අතර 2006 සැප්තැම්බර් 22 වන දින අපරානුමත කරන ලදී.[31]

**පහත සඳහන් අවස්ථාවන්වල දී අපරාධයක් දේශාන්තර වශයෙන් හඳුන්වනු ලබයි.**

a) එය රාජ්‍යයන් එකකට වඩා වැඩි සංඛ්‍යාවක දී සිදුකර තිබෙන අවස්ථාවක දී;

b) එය එක් රාජ්‍යයක් තුල සිදුකර තිබුන ද එහි ලා සූදානම් වීම, සැලසුම් කිරීම, මෙහෙයවීම හෝ පාලනයේ හරයාත්මක කොටසක් වෙනත් රාජ්‍යයක දී සිදුවී තිබෙන අවස්ථාවක දී;

c) එය එක් රාජ්‍යයක් තුල සිදුකර තිබුන ද එක් රජ්‍යයකට වැඩි රජ්‍යය ගණනාවක අපරාධ ක්‍රියාවන්ගේ නිරත අපරාධ කණ්ඩායමක් සම්බන්ධ වන විට; හෝ

d) එය එක් රාජ්‍යයක් තුල සිදුකර තිබුන ද එහි හරයාත්මක බලපෑමක් වෙනත් රාජ්‍යයකට පවත්නා විට (3.2 ව්‍යවස්ථාව)

**සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක්** යන්න දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි නිර්වචනය කර තිබෙන්නේ ඍජුව හෝ වක්‍රව මූල්‍යමය හෝ වෙනත් යම් ප්‍රතිලාභයක් ලබා ගැනීමේ සඳහා දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි (පැලමෝර් සංධානයෙන්) ස්ථාපනය කර ඇති බරපතල අපරාධ එකක් හෝ වැඩි ගණනක් සිදුකිරීමේ සහකාරීත්වය සහිතව කාලයක් පුරා පවත්නා තැනැත්තන් තිදෙනකු හෝ ඊට වැඩි ගණනක සංවිධානය වූ කණ්ඩායමක් ලෙස ය.

දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතිය සංධාන ද්විත්වයකින් ඌණපූරණය කරනු ලැබ ඇති අතර සම්මුතියෙහි 37 වන ව්‍යවස්ථාව ප්‍රකාරව යම් රාජ්‍යයකට සංධානයට පාර්ශවයක් වීම පිණිස මව් සම්මුතියෙහි පාර්ශවකාරීත්වය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වුවද යම් රාජ්‍යයක් සංධානයෙන් බැදෙන්නේ එම රාජ්‍යය එකී සංධානයේ පාර්ශවකාර රාජ්‍යයක් නම් පමණි. දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි සංධානයන් අර්ථ නිරූපණය කළ යුතු වන්නේ සම්මුතිය ආශ්‍රිතව වන අතර එහි ලා එකී සංධානයෙහි අරමුණ සැලකිල්ලට භාජනය කළ යුතු ය.

## 4.2. පැලමෝර් සංධානය යනුඃ

පැලමෝර් සංධානයේ පූර්විකාව, තැනැත්තන් වෙළඳාම් කිරීම විශේෂයෙන් කාන්තාවන් හා ළමයින් වෙළඳාම් කිරීම වැළැක්වීම සඳහා ආරම්භක රජ්‍යයන්, සංක්‍රාන්තික රාජ්‍යයන් හා ගමනාන්ත රාජ්‍යයන් හීදී තැනැත්තන් වෙළඳාම් කිරීම වැළැක්වීමට, තැනැත්තන් වෙළඳාම් කරන්නන්ට දඬුවම් කිරීම හා වින්දිතයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් පෘථුල

[31] https://www.unodc.org/documents/middleeastandnorthafrica/organized-crime/UNITED_NATIONS_CONVENTION_AGAINST_TRANSNATIONAL_ORGANIZED_CRIME_AND_THE_PROTOCOLS_THERETO.pdf

අන්තර්ජාතික ප්‍රවේශයක් අවශ්‍ය බව පිළිගනු ලබයි. තැනැත්තන් වෙළඳාම් කිරීමට අදාල සියලු ම පැතිකඩයන් ආමණ්ත්‍රණය කිරීමට අවශ්‍ය විශ්වීය ලේඛනයක නොපැවැත්ම ඒ මඟින් හඳුනාගනු ලබන අතර පැලමෝර් සංධානය මඟින් එවැනි ලේඛනයක් ඉදිරිපත් කිරීමට චේතනා කරනු ලබන බව සඳහන් කර තිබේ.

ශ්‍රී ලංකාව 2000 දෙසැම්බර් 13 වන දින පැලමෝර් සංධානය අත්සන් කරනු ලැබූ අතර 2015 ජූනි 15 වන දින එය අපරානුමත කරන ලදී.[32]

පැලමෝර් සංධානයේ අරමුණු වශයෙන් පහත ද හඳුනාගෙන තිබේ:

අ) කාන්තාවන්ට හා ළමයින්ට විශේෂ අවධානය යොමුකමින්, තැනැත්තන් වෙළඳාම වැළැක්වීම හා එයට එරෙහිව සටන් වැදීම

ආ) ඔවුන්ගේ මානව හිමිකම්වලට සම්පූර්ණ ගෞරවය ලබා දෙමින් එවැනි තැනැත්තන් වෙළඳාමට ලක් වූ වින්දිතයන්ට ආරක්ෂාව හා සහය ලබා දීම සහ

ඇ) මෙකී අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස රාජ්‍ය පාර්ශවයන් අතර සහයෝගීතාවය වර්ධනය කිරීම

(2 වන ව්‍යවස්ථාව).


### 4.2.1 නිර්වචනයන්

| පැලමෝර් සංධානයේ 3 (අ) ව්‍යවස්ථාව අනුව තැනැත්තන් වෙළඳාම් කිරීම පහත පරිදි වේ: | |
|---|---|
| ක්‍රියාව | • තැනැත්තන් බඳවා ගැනීම, ප්‍රවාහනය, මාරු කිරීම, රැකවරණය දීම හෝ භාරගැනීම |
| ක්‍රමවේදය | • තර්ජනය කිරීම හෝ බලහත්කාරයෙන් හෝ වෙනත් ආකාරයේ බලකිරීම්,<br>• පැහැරගෙන යාම,<br>• වංචාව,<br>• රැවටීම,<br>• බලය හෝ අසරණභාවය අයුතු ලෙස භාවිතාව; හෝ<br>වෙනත් පුද්ගලයෙකුගේ පාලනය කිරීමට හැකි පුද්ගලයෙකුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා ගෙවීමක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ලබාදීම හෝ ලබා ගැනීම,<br>යන ක්‍රමවේද මඟින් |
| අරමුණ | සූරාකෑමේ අරමුණ ඇතිව. |
| සූරාකෑම | අවම වශයෙන්,<br>• වෙනත් පුද්ගලයින් ගණිකා වෘත්තියේ යොදවා සූරාකෑම හෝ<br>• අන් ආකාරයෙන් ලිංගික සූරාකෑම<br>• බලහත්කාරයෙන් සේවයෙහි හෝ සේවාවන්හි යෙදවීම<br>• වහල් භාවය හෝ වහල් භාවයට සමාන ක්‍රියා<br>• දාසකම, හෝ<br>• අවයව ඉවත් කරගැනීම යනාදිය<br>සූරාකෑම යන්නට පහත ද ඇතුලත් විය යුතු ය. |

[32] Sri Lanka ratified the Palermo Protocol with the reservation "… [T]he Government of the Democratic Socialist Republic of Sri Lanka does not consider itself bound by paragraph 2 of Article 15 as provided for in paragraph 3 of Article 15."




**ඔබ දැන සිටියාද?**




මෙම අවස්ථාවන් හිදී අපරාධ වගකීමෙන් මුක්තවීම පිණිස "කැමැත්ත" යන ව්‍යතිරේඛය අදාල නොවේ. මෙය කිසිවෙකු සූරාකෑමට ලක්වීම පිණිස කැමැත්ත ප්‍රකාශ නොකරන බවට වන මූලධර්මය මත පිහිටා තිබේ. මන්දයත් –

- වැඩිහිටියෙක් සම්බන්ධයෙන් වන අවස්ථාවක කැමැත්ත අයෝග්‍ය ක්‍රම හරහා නිශේධ කර තිබෙන අවස්ථාවන් හිදී; සහ
- දරුවන් සම්බන්ධයෙන් වන අවස්ථාවන් හිදී ඔවුන්ගේ අසරණභාවය ඔවුන්ට කැමැත්ත දීමට ඇති හැකියාව නිශේධ කරනු ලබයි.

### 4.2.2 පැලමෝර් සංධානයේ අදාලතාවය

තැනැත්තන් වෙළඳාම් කිරීමේ සංධානය අදාල වන්නේ:

- 5 වන ව්‍යවස්ථාව යටතේ, යම් වරදක් ස්වභාවයෙන් දේශාන්තර වන අතර සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක් සම්බන්ධ වන අවස්ථාවන් හිදී, එකී වැරදි වැළැක්වීම, විමර්ශනය කිරීම සහ ඒවාට විරුද්ධව නඩු පැවරීමට සහ
- වින්දිතයින් ආරක්ෂා කිරීමට

( 4 වන ව්‍යවස්ථාව )

දේශාන්තර සංවිධානාත්මක අපරාධ පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ පැලමෝර් සංධානය තැනැත්තන් වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් අන්තර්ජාතික යාන්ත්‍රණයක් වර්ධනය කිරීමට අරමුණු කළ ද එමගින් රටක් ඇතුලේ ක්‍රියාත්මක වන එක් එක් තැනැත්තන් වෙළඳාම් කරන්නන්ට දඬුවම් කිරීම පිණිස දේශීය නීතින් සම්පාදනය කිරීම වැළැක්වීමක් හෝ සීමා කිරීමක් කරනු නොලබයි.

### 4.2.3. තැනැත්තන් වෙළඳාම් කිරීමට ලක්වූ වින්දිතයින් ආරක්ෂා කිරීම

පැලමෝර් සංධානයේ 6 වන ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය පාර්ශවයන් විසින්:

- නෛතික ක්‍රියාමාර්ග වැනි ද සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කරමින්, වින්දිතයන්ගේ පෞද්ගලිකත්වය හා අනන්‍යතාවය ආරක්ෂා කිරීම;
- අධිකරණමය හා පරිපාලනමය ක්‍රියාමාර්ගයන් පිළිබඳව (නෛතික නියෝජනය ද ඇතුලුව) වින්දිතයන්ට තොරතුරු සහ සහය සැපයීම;
- වින්දිතයන්ගේ වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ දරුවන්ගේ විශේෂ අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් රාජ්‍ය නොවන සංවිධානයන් සහ සිවිල් සමාජය සමඟ සහයෝගයෙන් පහත දැක්වෙන දෑ සපයා දීම හරහා ඔවුනට භෞතික, මානසික හා සමාජීය වශයෙන් යථාපැවැත්මට අවශ්‍ය ද සැපයීම:
    - සුදුසු නිවාස
    - උපදේශනය, නෛතික, වෛද්‍ය, මානසික සහ භෞතික උපකාර;
    - රැකියා, අධ්‍යාපන, සහ පුහුණු අවස්ථාවන් ලබා දීම;
- වින්දිතයන්ට භෞතික ආරක්ෂාව සපයා දීම; සහ
- ඔවුන් සිදුවූ හානියට වන්දි ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම.

## 4.3. ළමා අයිතිවාසිකම් සහ ළමුන් වෙළදාම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සෙසු අන්තර්ජාතික ලේඛන

**4.3.1 වගුව**

| ලේඛනය | අපරානුමත කළ දිනය |
|---|---|
| එ.ජා. වහල්භාවය පිළිබඳ සම්මුතිය, 1926 | 21 March 1958 |
| C029 අන්තර් ජාතික කම්කරු සංවිධනයෙහි බලහත්කාරයෙන් සේවයේ යෙදවීම පිළිබඳ සම්මුතිය, 1930 | 5 April 1950 |
| එ. ජා. තැනැත්තන් වෙළදාම් කිරීම සහ අන් අය ලිංගිකව සූරාකෑම මර්ධනය කිරීම පිළිබඳ සම්මුතිය, 1949 | 15 March 1958 |
| වහල්භාවය, වහල් වෙළදාම සහ ආයතනයන් සහ වහල්භාවයට සමාන පරිචයන් තුරන් කිරීම පිළිබඳ එ.ජා සම්මුතිය, 1956 | 20 March 1958 |
| සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතිය, 1966 | 11 June 1980 |
| C143 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ අපයෝජිත තත්ත්වයන් යටතේ සංක්‍රමනය හා සංක්‍රමණික සේවකයන්ට සමාන අවස්ථාවන් හා සැලකීම් ප්‍රවර්ධනය කිරීම සඳහා වන සම්මුතිය, 1975 | Not ratified |
| කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කම් තුරන් කිරීම පිළිබඳ එ.ජා. සම්මුතිය, 1979 | 5 October 1981 |
| ළමා අයිතිවාසිකම් පිළිබඳ එ.ජා. සම්මුතිය, 1989 | 12 July 1991 |
| ළමයින්ගේ ආරක්ෂාව සහ අන්තර් රාජ්‍ය දරුකමට හදාගැනිම සම්බන්ධ සහයෝගිතාව පිළිබඳ සම්මුතිය (‘දරුකමට හදා ගැනීම පිළිබඳ හේග් සම්මුතිය’; 1993) | 23 January 1995 |
| සියලු ම සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එ. ජා සම්මුතිය, 1991 | 11 March 1996 |
| C138 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ රැකියාවන්ට බඳවා ගැනීම පිළිබඳ වන අවම වයස පිළිබද සම්මුතිය, 1973 | 11 February 2000 |
| සන්නද්ධ අරගලයන්වල දී ළමයින් යොදා ගැනීම සම්බන්ධ, ළමා අයිතිවාසිකම් සම්මුතියේ වෛකල්පිත සංධානය, 2000 | 2000 |
| C182 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා වන සම්මුතිය, 1999 | 1 March 2001 |
| කාන්තාවන් සහ ළමයින් වෛශ්‍ය වෘත්තියේ යෙදවීම, වැළැක්වීමට සහ ඊට එරෙහිව සටන් කිරීම සඳහා වන දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ සම්මුතිය, 2002 | January 2002 |
| ළමා සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වන කලාපීය විධිවිධාන පිළිබඳ සාර්ක් සම්මුතිය, 2002 | January 2002 |
| C105 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම අහෝසි කිරීම සඳහා වන සම්මුතිය, 1957 | 7 January 2003 |
| ළමයින් විකිණීම, ළමා වෛශ්‍ය වෘත්තිය සහ ළමා අසභ්‍ය දර්ශනයන් පිළිබද ළමා අයිතිවාසිකම් සම්මුතියේ වෛකල්පිත සංධානය, 2000 | 2006 |
| එ.ජා. දේශාන්තර සංවිධානාත්මක අපරාධ සම්මුතිය ඌණපූරනය කිරීම පිණිස වූ තැනැත්තන්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමයින්, වෙළදාම් කිරීම වැළැක්වීම මර්දනය කිරීම සහ දඩුවම් දීම සඳහා වන සංධානය , 2000 (පැලමෝර් සංධානය) | 15 June 2015 |
| බැංකොක් ගිවිසුම සහ කාර්ය සැලැස්ම, 1998 | Ratification not required |

## 4.4 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය




එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය මානව හිමිකම් ඉතිහාසයේ සංධිස්ථානයක් වන අතර එය සියලු ම පුද්ගලයන් සහ රාජ්‍යයන් සඳහා අත්පත් කරගත යුතු පොදු ප්‍රමිතීන් වශයෙන් 1948 දෙසැම්බර් 10 වන දින පැරිස් හිදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් (මහා මණ්ඩල යෝජනා සම්මත 217 A) ප්‍රකාශයට පත් කරන ලදී. පළමු වරට ඒ මඟින් විශ්වීයව ආරක්ෂා කළ යුතු මූලික මානව හිමිකම් සඳහන් කරන අතර එය භාෂා 500 වඩා පරිවර්තනය වී තිබේ. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයේ 4 සහ 5 ව්‍යවස්ථාවන් ළමුන් විකිණීම සම්බන්ධයෙන් වඩාත් අදාල වේ.

**4 ව්‍යවස්ථාව** - කිසිම අයෙකු වහල්භාවයේ හෝ පරවශතාවයේ නොයෙදවිය යුතු ය. සියලු ම ආකාරයේ වහල්භාවය සහ වහල් වෙළඳාම තහනම් කළ යුතු ය.

**5 ව්‍යවස්ථාව** - කිසිදු පුද්ගලයකු වදහිංසාවට හෝ කෲර අමානුෂීය හෝ අවමන් සහගත සැලකීමට හෝ දඬුවමට යටත් නොකළ යුතු ය.

## 4.5 කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (1979) (CEDAW)

**සීඩෝ යනු**



තැනැත්තන් වෙළඳාම් කිරීම නතුවීම සඳහා කාන්තාවන් සහ ළමුන් විශේෂයෙන් අසරණභාවය පත්වන අපරාධයක් බවට සලකනු ලැබේ.[33] කාන්තා අයිතිවාසිකම් සඳහා වන විශේෂ ලේඛනයක් යන අදහස පළමුවරට 1975 වර්ෂයේ දී මෙක්සිකෝවේ දී පැවැත්වූ පළමු කාන්තා සමුළුවේ දී පැන නගින ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 1979 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 34/180 වන යෝජනා සම්මතය යටතේ දී පිළිගනු ලැබූ අතර එය අත්සන් කිරීම අපරානුමත කිරීම සහ ඇදා ගැනීම පිණිස විවෘත කරන ලදී. එය කාන්තාවන් සඳහා වූ අන්තර්ජාතික අයිතිවාසිකම් පනත වශයෙන් හඳුන්වනු ලැබීය. එය 1981 සැප්තැම්බර් 3 වන දින 27(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව බලාත්මකභාවයට පැමිණියේ ය. 2017 අගෝස්තු වන විට එම සම්මුතිය රටවල් 99 ක් අත්සන් කර ඇති අතර 189 ක් අපරානුමත කර තිබේ.[34]

ශ්‍රී ලංකාව මෙම සම්මුතිය 1980 ජුලි 17 වන දින අත්සන් කළ අතර 1981 ඔක්තෝබර් 5 වන දින එය අපරානුමත කරමින් එකී සම්මුතියට රාජ්‍ය පාර්ශවයක් බවට පත්විය. තැනැත්තන් වෙළඳාම් කිරීමට අදාල වන්නේ මෙම සම්මුතියේ 6 වන ව්‍යවස්ථාව වන අතර එහි සඳහන් කරන්නේ "සියලු ම ආකාරයෙන් කාන්තාවන් වෙළඳාම් කිරීමට ලක් කිරීම සහ ගණිකා වෘත්තියේ යොදවා සූරාකෑම මර්දනය කිරීම පිණිස, රාජ්‍යයන් විසින් ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග ද ඇතුලුව සියලු ම සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු ය".

33 See Article 9(4) of The Palermo Protocol to Prevent, Suppress and Punish Trafficking in Persons, especially Women and Children (2000)

34 https://treaties.un.org/Pages/ViewDetails.aspx?src=TREATY&mtdsg_no=IV-8&chapter=4&lang=en

### 4.5.1 කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට අදාල වෛකල්පිත සංධානය

කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට අදාල වෛකල්පිත සංධානය 1999 ඔක්තෝබර් 6 වන දින පිළිගත් අතර එය 2000 දෙසැම්බර් 22 වන දින බලාත්මකභාවයට පත්විය.[35] කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියේ පාර්ශවකාර රාජ්‍යයන් නිරායාසයෙන් ම මෙම වෛකල්පිත සංධානයට රාජ්‍ය පාර්ශවයන් බවට පත් නොවේ. එකී වෛකල්පිත සංධානයට පාර්ශවයක් වීමට නම් අදාල රාජ්‍යයන් එයට අත්සන්කොට අපරානුමත කළ යුතු ය.

ශ්‍රී ලංකාව 2002 ඔක්තෝබර් 15 වන දින ඇදාගැනීම මගින් කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට අදාල වෛකල්පිත සංධානයට පාර්ශවකාර රාජ්‍යයක් බවට පත්විය.

මෙම වෛකල්පිත සංධානය තුල ප්‍රධාන කාර්ය පටිපාටීන් දෙකක් සඳහන් කර තිබේ;

- කමිටුවට අදාල සම්මුතිය යටතේ ආරක්ෂා කර තිබෙන අයිතිවාසිකම් උල්ලංඝණය වූ බවට ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සඳහා තනි කාන්තාවකට හෝ කාන්තා කණ්ඩායමකට අවසර දෙන සන්නිවේදන ක්‍රියාපටිපාටිය.
- බරපතල සහ ක්‍රමානුකූලව කාන්තා අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමේ තත්ත්වයන් පිළිබඳ විමර්ශන ආරම්භ කිරීම සඳහා හැකි කරවන විමර්ශන ක්‍රියාපටිපාටියක්.

ඉහත කවර අවස්ථාව යටතේ දී වුවද රාජ්‍යය කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට සහ එහි වෛකල්පිත සංධානයට පාර්ශවකාර රාජ්‍යයක් විය යුතු ය.

### 4.5.2 කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ කමිටුව (සීඩෝ කමිටුව)

කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ කමිටුව (සීඩෝ කමිටුව) කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය ක්‍රියාවට නැංවීම නිරීක්ෂනය කරනු ලබයි. සීඩෝ කමිටුව එම සම්මුතියේ විෂය පථය පිළිබඳව ඉහළ ශක්‍යතාවයක් සහිත විශේෂඥයින් 23 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම විශේෂඥයින් වසර දෙකක නිල කාලයක් සඳහා තෝරා පත්කර ගනු ලබන අතර රාජ්‍ය පාර්ශවයන් විසින් නාමකරණය කරනු ලබයි.

සීඩෝ කමිටුව යනු බලාත්මක කරන ආයතනයක් නොවේ. එම කමිටුවට රාජ්‍යන්ට සම්මුතියට අනුගතවීමට බලකල නොහැකි අතර එලෙස අනුගත වීමට අපොහොසත් වීම හේතුවෙන් දඩුවම් දීමට හෝ හැකියාවක් නොමැත. කෙසේ වුවද එය රාජ්‍ය පාර්ශවයන් සමඟ සම්මුතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම දිරිගැන්වීම පිණිස සහයෝගයෙන් කටයුතු කරයි.

### 4.5.3 කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියෙහි වාර්තා කිරීමේ ක්‍රියාවලිය




කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියෙහි පාර්ශවකාර රාජ්‍යයන් විසින් කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතියට අනුව වෙනස්කොට සැලකීමට ලක්කරන ආකාරයේ නීතින් ප්‍රතිපත්තීන් සහ පරිචයන් ප්‍රතිසංස්කරණය කිරීම ද ඇතුලුව කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය ක්‍රියාත්මක කිරීමට භාරගනු ලබයි. කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ කමිටුව විසින් කලින් කලට කාලාන්තර වාර්තා කිරීමේ ක්‍රියාවලියක් තුලින් පාර්ශවකාර රාජ්‍යයන් විසින් කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිණිස ගනු ලබන ක්‍රියාමාර්ගයන් සුපරික්ෂා කරනු ලබයි.

ඒ අනුව සම්මුතියෙහි පාර්ශවකාර රාජ්‍යයන් විසින් සම්මුතිය අපාරනුමත කිරීමෙන් අනතුරුව වසරක් ඇතුලත සහ ඉන් අනතුරුව සෑම වසර හතරකට ම වරක් කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ

[35] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/OPCEDAW.aspx

කමිටුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට අපේක්ෂා කරනු ලබයි. මෙම වාර්තාව තුල පාර්ශවකාර රාජ්‍යයන් විසින් කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය ක්‍රියාත්මක කිරීමෙහි ලා ලද ප්‍රගතිය සහ ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විස්තරය කළ යුතු ය. පාර්ශවකාර රාජ්‍යය විසින් ඉදිරිපත් කරනු ලබන නිල වාර්තාව හැරුණකොට ඡායා වාර්තාවක් මාර්ගයෙන්, රාජ්‍ය පාර්ශවයක් විසින් භාරගනු ලැබූ වගකීම් ක්‍රියාවට නැංවීම පිළිබඳ ඔවුන්ගේ මතය ඉදිරිපත් කිරීමට රාජ්‍ය නොවන සංවිධානයන්ට අවසර ලබා දී ඇත.

## 4.6 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989) සහ එහි සංධානයන්

### 4.6.1 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය යනු

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (ළමා අයිතිවාසිකම් සම්මුතිය) ළමයින්ගේ සිවිල්, දේශපාලනික, ආර්ථික, සාමාජීය, සෞඛ්‍ය සහ සංස්කෘතිකමය අයිතිවාසිකම් සඳහන් කරනු ලබන මානව හිමිකම් සම්මුතියකි. මෙම සම්මුතිය 1989 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 44/25 දරන යෝජනා සම්මතය යටතේ පිළිගත් අතර එය අත්සන් කිරීම අපරානුමත කිරීම සහ ඇදාගැනීම පිණිස විවෘතව තබන ලදී.[36] එය 1990 සැප්තැම්බර් 2 වන දින එහි 49 වන ව්‍යවස්ථාව ප්‍රකාරව බලාත්මකභාවයට පැමිණෙන ලදී. එය රාජ්‍යයන් අතර අන්තර්ජාතික වශයෙන් පිළිගැනීමට ලක්වූ ගිවිසුමකි. මෙම සම්මුතිය අපරානුමත කරන ලද එක් එක් රාජ්‍යයන් ස්වකීය රට තුළ ළමා අයිතිවාසිකම් තහවුරු කිරීමේ වගකීමට යටත් වේ. 2017 අගෝස්තු වන විට රටවල් 140ක් මෙම සම්මුතිය අත්සන් කර තිබෙන අතර රටවල් 194ක් එය අපරානුමත කර තිබේ.[37]

ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් සම්මුතිය 1990 ජනවාරි 26 වන දින අත්සන් තබනු ලැබූ අතර 1991 ජූලි 12 වන දින අපරානුමත කරන ලදී.

ළමා අයිතිවාසිකම් සම්මුතිය ව්‍යවස්ථා 54කින් සමන්විත වේ. මෙම සම්මුතිය හරහා ළමයකු සතු අයිතිවාසිකම් සහ එම අයිතිවාසිකම් සුරැකීමේ හි ලා වැඩිහිටියෙකු සතු වගකීම් දක්වා තිබේ. මෙම අයිතිවාසිකම් කාණ්ඩ හතරකට බෙදා දැක්විය හැකි ය.

- ***ආරක්ෂණ අයිතිවාසිකම්*** **-** ආරක්ෂණ අයිතිවාසිකම් මගින් සියලු ම ආකාරයේ අපයෝජනයන් නොසලකාහැරීම් සූරාකෑම් සහ කෘෘරත්වයන්වලට එරෙහිව ළමයාගේ ආරක්ෂාව තහවුරු කරනු ලබයි.

- ***පැවැත්ම සඳහා වන අයිතීන් සහ සංවර්ධනය සඳහා වන අයිතීන්*** **-** මෙම කාණ්ඩ දෙක යටතේ ළමයකුගේ පැවැත්ම සහ පූර්ණ සංවර්ධනය සඳහා අවශ්‍ය වන සම්පත් කුසලතා සහ දායකත්වයන් සඳහා වන අයිතීන් තහවුරු කරනු ලබයි. ප්‍රමාණවත් ආහාර, ආරක්ෂාව, පිරිසිදු ජලය, විධිමත් අධ්‍යාපනය, මූලික සෞඛ්‍ය පහසුකම්, නිවාඩු හා විනෝදාංශ, සංස්කෘතිකමය ක්‍රියාකාරකම් සහ තොරතුරු සඳහා වන අයිතිවාසිකම් මෙම කාණ්ඩ දෙක යටතට පැමිණේ.

- ***සහභාගීත්ව අයිතිවාසිකම්*** **-** ළමයින්ට ඔවුන්ගේ සාමාජීය, ආර්ථික, ආගමික, සංස්කෘතික සහ දේශපාලන අයිතිවාසිකම්වලට බලපෑම් කරන කාරණයන් සම්බන්ධයෙන් ස්වකීය අදහස් ප්‍රකාශ කිරීමට අයිතියක් ඇත. අදහස් ප්‍රකාශ කිරීමට සහ ඇහුම්කනු දෙනු ලැබීමට ඇති අයිතිය, තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය හා සාංගමික අයිතිවාසිකම යන අයිතීන් මෙම කාණ්ඩයට අයත් වේ. මෙම අයිතිවාසිකම් සමාජය තුල ස්වකීය අයිතිවාසිකම් යථාර්ථවත් කර ගැනීමට සහ භුක්ති විඳීම සඳහා ළමයින්ට උපකාරී වේ.

[36] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/CRC.aspx

[37] https://treaties.un.org/Pages/ViewDetails.aspx?src=IND&mtdsg_no=IV-11&chapter=4&lang=en

- ***ළමයාගේ උපරිම යහපත***

  ළමා අයිතිවාසිකම් සම්මුතිය හරහා ළමයින්ට සම්බන්ධ මූලධර්මයක් වන ළමයාගේ උපරිම යහපත නැමැති ඉතා වැදගත් මූලධර්මය පිළිගනු ලබයි. ළමයින්ට බලපෑ හැකි ඕනෑම ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ළමයාගේ උපරිම යහපත යන මූලධර්මය ප්‍රාථමික වශයෙන් සලකා බැලිය යුත්තකි. ඒ අනුව වැඩිහිටියන් ඔවුන්ගේ පොදු හෝ පෞද්ගලික මට්ටමෙන් තීරණ ගැනීමේ දී සහ ළමුන් ඍජුව හෝ වක්‍රව සම්බන්ධ වන ක්ෂේත්‍රයන් වන ව්‍යවස්ථාදායක, අධිකරණ, මූල්‍යමය හෝ පරිපාලනමය වැනි ක්ෂේත්‍රයන් හී තීරණ ගැනීමේ දී මෙම මූලධර්මය අදාළ කර ගත යුතු ය.

**උදාහරණ වශයෙන් :**

- මහජන නිළධාරීන් වශයෙන් රෙගුලාසි පරිචයන් හෝ අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම හරහා වැඩිහිටියන් පරිපාලන තීරණ ගැනීමේ දී;
- නීති සහ ප්‍රතිපත්ති සකස් කිරීම හරහා නීති සම්පාදකයන්;
- නඩු තීන්දු ලබාදීමේ දී විනිසුරුවන් සහ ළමයන්ගේ ජීවිතයේ එදිනෙදා කටයුතු සම්බන්ධයෙන් දෙමාපියන් තීරණ ගැනීමේ දී ඒවා ඔවුනට ඍජුව බලපෑම් කළ ද නොකළ ද, තීරණ ගනු ලබන පුද්ගලයින් ළමයාගේ උපරිම යහපත යන්න ප්‍රමුඛතාවය සහිතව සලකා බැලිය යුතු ය.

### 4.6.2 ළමා අයිතිවාසිකම් සම්මුතියට අදාල වෛකල්පිත සංධානයන්



**ළමා අයිතිවාසිකම් සම්මුතියට වෛකල්පිත සංධානයන් ත්‍රිත්වයක් ඇත.**

1. ***ළමයින්ව සන්නද්ධ අරගලයන්ට සහභාගී කර ගැනීම සම්බන්ධ වෛකල්පිත සංධානය (2002)* (OPAC)**

   මෙම වෛකල්පිත සංධානය මඟින් රටේ සන්නද්ධ බලකායන් සඳහා අවුරුදු දහඅටට අඩු ළමුන් බඳවා නොගත යුතු බව තහවුරු කරනු ලබයි. මෙය 2002 ජූලි 12 වන දින බලාත්මකභාවයට පැමිණවෙන ලදී. එය වර්ෂ 2000 දී ශ්‍රී ලංකාව විසින් අත්සන් කර අපරානුමත කරන ලදී.[38]

2. ***ළමයින් විකිණීම, ළමා වෛශ්‍ය වෘත්තිය හා ළමා අසභ්‍ය දර්ශන පිළිබඳ වෛකල්පිත සංධානය (2002)* (OPSC)**

   මෙම සංධානය මගින් ළමයින් විකිණීම, ළමා වෛශ්‍යා වෘත්තිය හා ළමා අසභ්‍ය දර්ශන යනාදිය තහනම් කරන ලෙස පාර්ශවකාර රාජ්‍යන්ගෙන් ඉල්ලා සිටියි. මෙය 2001 ජනවාරි 18 වන දින දී බලාත්මකභාවයට පැමිණින. ශ්‍රී ලංකාව මෙම සංධානය 2002 දී අත්සන් කළ අතර 2006 දී අපරානුමත කරන ලදී.[39]

3. ***සන්නිවේදන ක්‍රියා පටිපාටිය පිළිබඳ වෛකල්පිත සංධානය (2014)* (OPIC)**

   මෙම වෛකල්පිත සංධානය ළමා අයිතිවාසිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් තනි පුද්ගලයන් වශයෙන් පැමිණිලි ඉදිරිපත් කිරීමට ළමුන්ට හා ඔවුන්ගේ නියෝජිතයන්ට අවකාශය ලබා දී ඇත. මෙම සංධානය 2014 අප්‍රේල් 14 ව දින බලාත්මකභාවයට පත්විය. ශ්‍රී ලංකාව මෙම සංධානයට අත්සන් තබා හෝ අපරානුමත කර නොමැත.[40]

### 4.6.3 ළමා අයිතිවාසිකම් පිළිබඳ කමිටුව

ළමා අයිතිවාසිකම් කමිටුව රාජ්‍ය පාර්ශවයන් විසින් ළමා අයිතිවාසිකම් සම්මුතිය ක්‍රියාත්මක කිරිම පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා වන විශේෂඥයින් 18 දෙනෙකුගෙන් සමන්විත ආයතනයකි. මෙම කමිටුව ළමයින්ව සන්නද්ධ අරගලයන්ට සහභාගී කර ගැනීම සම්බන්ධ වෛකල්පිත සංධානය සහ ළමයින් විකිණීම, ළමා වෛශ්‍ය වෘත්තිය හා ළමා අසභ්‍ය දර්ශන පිළිබඳ වෛකල්පිත සංධානය යන සංධානයන් ද්විත්වය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ද නිරීක්ෂණය කරනු ලබයි.

[38] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/OPACCRC.aspx
[39] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/OPSCCRC.aspx
[40] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/OPICCRC.aspx

### 4.6.4 ළමා අයිතිවාසිකම් සම්මුතිය යටතේ වන වාර්තාකරණ ක්‍රියාපටිපාටිය

සියලු ම රාජ්‍ය පාර්ශවයන් විසින් අයිතිවාසිකම් ක්‍රියාවට නැංවූ ආකාරය පිළිබඳව ළමා අයිතිවාසිකම් කමිටුවට වාර්තා කිරිමට වගකීමට බැඳී සිටිති. රාජ්‍ය පාර්ශවයන් විසින් ළමා අයිතිවාසිකම් සම්මුතියට පාර්ශවකාර රාජ්‍යයක් බවට පත්වී වසර දෙකක් ඇතුලත මුල් වාර්තාවක් සහ ඉන් අනතුරුව සෑම වසර පහකට වරක් ම කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය. ළමා අයිතිවාසිකම් කමිටුව මේ එක් එක් වාර්තාවන් සලකා බලා, “අවසානාත්මක නිරීක්ෂණයන්” වශයෙන් එහි ගැටලු ආමන්ත්‍රණය කරමින් පාර්ශවකාර රාජ්‍යයන් වෙත නිර්දේශයන් නිකුත් කරනු ලබයි.

සන්නිවේදන ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් වන වෛකල්පිත සංධානයට පාර්ශවකාර රාජ්‍යයන් විසින් ළමා අයිතිවාසිකම් සම්මුතියේ සහ එහි වෛකල්පිත සංධානයන් දෙකෙහි පිළිගත් අයිතිවාසිකම් උල්ලංඝණය කළ බවට චෝදනා කරමින් ඉදිරිපත් වී තිබෙන පැමිණිලි සලකා බැලීමට ද කමිටුවට හැකියාව පවතින අතර එම සම්මුතිය සහ වෛකල්පිත සංධානයන් දෙක යටතේ වන ක්‍රමික සහ බරපතල අයිතිවාසිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට ද හැකියාව තිබේ.

මෙම වාර්තාවන් සලකා බැලීමෙන් අනතුරුව කමිටුව විසින් සම්මුතිය ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය ඇගයීමට ලක් කරමින් සහ අනුමිතීන් හා නිර්දේශයන් සඳහන් කරමින් ඔවුන්ගේ වාර්තාවක් ඉදිරිපත් කරනු ලබයි.

### 4.7 තැනැත්තන් වෙළඳාම් කිරීම සහ වෙනත් අය වෛශ්‍ය වෘත්තියෙහි යොදවා සූරාකෑම වැළැක්වීම මර්දනය කිරීම සදහා වන එ.ජා සම්මුතිය (1949)

**තැනැත්තන් වෙළඳාම් කිරීම සම්බන්ධ පළමු අන්තර්ජාතික මැදිහත්වීම එම ගැටලුව දුටුවේ අත්‍යාවශ්‍යයෙන්ම ලිංගික සූරාකෑම පිණිස හෝ වහල්භාවයේ යෙදවීම පිණිස කාන්තාවන් පැහැරගෙන යෑම සහ අපහරණය කිරීමක් ලෙස බැවින් වින්දිතයාගේ මව් රටින් පිටත සිදුකරන ලද සූරාකෑමේ අවස්ථාවන් පිළිබඳව පමණක් අවධානය යොමු කරන ලදී.**

**1949 සම්මුතිය බලහත්කාරයෙන් වෛශ්‍යා වෘත්තියේ යෙදවීමේ ඇතැම් පැතිකඩයන් ආවරණය කරන ලද, පෙර පැවති සම්මුතීන් ගණනාවක් අභිබවා යන ලදී.[41] 1949 සම්මුතිය යටතේ පාර්ශවකාර රාජ්‍යයන් වෙත ප්‍රධාන වගකීම් තුනක් පවරනු ලබයි.:**




- **තැනැත්තන් වෙළඳාම් කිරීම තහනම් කිරීම;**
- **විශේෂිත පරිපාලනමය සහ බලාත්මක කිරීමේ පියවරයන් ගැනීම; සහ**
- **තැනැත්තන් වෙළඳාම් කිරීමට ලක්වූ පුද්ගලයන් අරමුණු කර ගත් සාමාජීය ක්‍රියාමාර්ග. 1958 දී ශ්‍රී ලංකාව මෙම සම්මුතියට පාර්ශවකාර රාජ්‍යයක් බවට පත්විය.[42]**

**1949 සම්මුතිය තැනැත්තන් වෙළඳාම් කිරීම සම්බන්ධ ගැටලුව ආශ්‍රිත ප්‍රධාන වෙනස්කම් දෙකක් හඳුන්වා දෙන අතර ඒ තුල වෛශ්‍යාව කුට්ටනකරුගේ වින්දිතයකු ලෙස දක්වන අතර පූර්ව සම්මුතීන්වල භාවිතා කළ “සුදු වහල් වෙළඳාම” සහ “කාන්තාවන්” යන වචන වෙනුවට ඒ තුළ වාර්ගිකත්වය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය නොහැගවෙන නිශ්ක්‍රීය වචන වින්දිතයන් හැඳින්වීමට භාවිතා කරනු ලබයි.**

[41] International Agreement of 1904 for the Suppression of White Slave Traffic; International Convention of 1910 for the Suppression of White Slave Traffic; International Convention of 1921 for the Suppression of the Traffic in Women and Children; and International Convention of 1933 for the Suppression of the Traffic in Women of Full Age

[42] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/TrafficInPersons.aspx

1949 සම්මුතිය වෛශ්‍යා වෘත්තිය දෙස ප්‍රථමවරට තැනැත්තන් වෙළඳාම් කිරීමේ පැතිකඩකින් බැලුව ද අවාසනාවකට මෙන් ඒ තුල **<u>වින්දිතයන් යන නිර්වචනය තුළට ළමයින් ඇතුළත් නොකරන</u>** ලදී. එම සම්මුතියේ වූ අනෙක් දුර්වලතාවය වන්නේ එය වර්ධනය කර සාකච්ඡාවට බඳුන් කර තිබෙන්නේ පහත දක්වෙන් ද වටාය:

- තැනැත්තන් වෙළඳාම් කිරීමේ නිර්වචනය හුදෙක් වෛශ්‍ය වෘත්තියේ යොදවා සූරාකෑමට පමණක් සම කර ඇති බැවින් එය වඩා පටු වේ;
- ස්වේච්ඡාවෙන් ගණිකා වෘත්තියේ යෙදීම පිළිබඳ එහි අදාලතාවය, එය රටවල් ගණනාවත නීත්‍යානුකූල වේ; සහ
- 1949 සම්මුතියේ අවධානය වින්දිතයින් ආරක්ෂා කිරීමට වඩා වෛශ්‍ය වෘත්තිය වටා ඇති ක්‍රියාවන් අපරාධකරණයට ලක්කිරීමට යොමුව ඇති අතර 1949 සම්මුතිය තැනැත්තන් වෙළඳාම් කිරීමට එරෙහිව සටන් කිරීම සම්බන්ධයෙන් නිශ්ඵලදායී බවට පත් කළ නිරීක්ෂණය කිරීමේ හා බලගැන්වීමේ යාන්ත්‍රණයන් හී මදකම.

### 4.7.1. තැනැත්තන් වෙළඳාම් කිරීම වැළැක්වීමට සහ ඊට එරෙහිව සටන් කිරීමට රාජ්‍ය පාර්ශවයන් කෙරෙහි වන වගකීම

9 වන ව්‍යවස්ථාව හරහා රාජ්‍ය පාර්ශවයන් වෙතින් පුළුල් ප්‍රතිපත්තීන්, වැඩසටහන් සහ සෙසු ක්‍රියාමාර්ග ගැනීම අපේක්ෂා කරනු ලබයි:

- තැනැත්තන් වෙළඳාම් කිරීම වැළැක්වීමට සහ එයට එරෙහිව සටන් වැදීමට; සහ
- තැනැත්තන් වෙළඳාම් කිරීමට ලක් වූ වින්දිතයින්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්, නැවත වින්දිතයින් බවට පත්වීමෙන් ආරක්ෂා කිරීම;
- තැනැත්තන් වෙළඳාම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව සටන් කිරීම පිණිස පර්යේෂණ, තොරතුරු සහ ජන මාධ්‍ය ව්‍යාපාර සහ සමාජීය හා ආර්ථික වැඩපිළිවෙලවල් වැනි පියවරයන් ගැනීම;
- පුද්ගලයන්ව, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන්ව තැනැත්තන් වෙළඳාම් කිරීමේ ගොදුරු බවට පත් කිරීමට හේතු වන **දරිද්‍රතාවය, අසංවර්ධිතභාවය සහ සමාන අවස්ථාවන් හී අප්‍රමාණවත්භාවය** වැනි සාධකයන් අඩුකිරීමට පියවර ගැනීම;
- තැනැත්තන් වෙළඳාම් කිරීම, විශේෂයෙන් ළමයින් සහ කාන්තාවන් සියලු ම ආකාරයේ සූරාකෑමට ලක්කරන සහ තැනැත්තන් වෙළඳාම් කිරීමට ලක්කරන සාධකයන් අධෛර්‍යයට පත්කිරීම පිණිස අධ්‍යාපනික, සාමාජීය හෝ සංස්කෘතිකමය පියවරයන් වැනි ව්‍යවස්ථාදායකමය හෝ සෙසු පියවරයන් ශක්තිමත් කිරීම කටයුතු කිරීම.

## 4.8 බලහත්කාරයෙන් සේවයේ යෙදවීමට අදාල අන්තර් ජාතික කම්කරු සංවිධානයේ සම්මුතීන්

### 4.8.1 1956 වහල්භාවය වහල් වෙළදාම සහ ආයතනයන් මෙන්ම ඒ හා සමාන පරිචයන් අහෝසි කිරීම සම්බන්ධයෙන් වන ඌණපූරණ සම්මුතිය

1956 වහල්භාවය වහල් වෙළදාම සහ ආයතනයන් මෙන්ම ඒ හා සමාන පරිචයන් අහෝසි කිරීම සම්බන්ධයෙන් වන ඌණපූරණ සම්මුතිය පළමු වරට ළමයින් සූරාකෑම පිදිබඳ අවධානය යොමු කරන ලදී. (ඌණපූරණ වහල් සම්මුතිය).[43]මෙම සම්මුතියේ 1(ඇ) ව්‍යවස්ථාව වහල්භාවය යන්න නිර්වචනය කරනු ලබන්නේ "අවුරුදු 18 ට අඩු ළමයකු හෝ තරුණ තැනැත්තකු, ඔහුගේ ස්වභාවික දෙමාපියන් දෙදෙනා ම හෝ ඉන් එක් අයකු හෝ භාරකරු විසින් වෙනත් පුද්ගලයකුට, යම් ප්‍රතිලාභයක් සහිතව හෝ රහිතව, එම ළමයාව හෝ තරුණ තැනැත්තාව හෝ ඔහුගේ ශ්‍රමය සූරාකෑම පිණිස පවරා දෙනු ලබන යම් ආයතනයක් හෝ පරිචයක්" වශයෙනි. මෙකී ඌණපූරණ වහල් සම්මුතිය හරහා ණය බැඳුම්කර සහ බලහත්කාරයෙන් සිදුකරනු ලබන විවාහයන් වහල්භාවය ස්ථාපනය කරන බවට හඳුනාගනු ලබයි.

ශ්‍රී ලංකාව ඌණපූරණ වහල් සම්මුතිය 1957 ජුනි 5 වන දින අත්සන් කළ අතර 1958 මාර්තු 21 වන දින අපරානුමත කරන ලදී.

### 4.8.2 1999 ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය පිළිබඳ අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුතිය (No.182) (අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති අංක182)

අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති අංක 182 මගින් විකිණීමට ලක් වූ ළමුන් මුහුණපාන විවිධ ආකාරයේ ශ්‍රම සූරාකෑම් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. ශ්‍රී ලංකාව මෙම අංක 182 සම්මුතිය 2011 මාර්තු මාසයේ දී අපරානුමත කරන ලදී.[44]

අංක 182 සම්මුතියෙහි 3 වන ව්‍යවස්ථාව ඉතා නරක ආකාරයේ ශ්‍රමය යන්න පහත පරිදි නිර්වචනය කරනු ලබයි.

(ආ) ළමයකුව වෛශ්‍ය වෘත්තිය සඳහා හෝ අසභ්‍ය දර්ශනයන් සඳහා හෝ අසභ්‍ය චිත්‍රපටි වල රංගනයේ යෙදීම සඳහා හෝ භාවිතා කිරීම, කුට්ටනය කිරීම හෝ ලබා දීම;

(ඇ) ළමයින්ව අයුතු ක්‍රියාවල යෙදවීම පිණිස විශේෂයෙන් අන්තර්ජාතික ලේඛනයන් හී සඳහන් කර තිබෙනා ආකාරයට මත්ද්‍රව්‍ය නිෂ්පාදනයට හෝ වෙළදාම් කිරීම පිණිස ළමයකු භාවිතා කිරීම කුට්ටනය කිරීම හෝ ලබා දීම;

(ඈ) අදාල ක්‍රියාවේ ස්වභාවය සහ එය සිදුකරනු ලබන තත්ත්වයන් හේතු කරගෙන ළමයින්ගේ සෞඛ්‍යයට ආරක්ෂාවට හා සදාචාරයට හානිකර වැඩ.

අංක 182 සම්මුතිය මගින් රාජය පාර්ශවයන්ගෙන් එම සම්මුතියේ අදාල ප්‍රතිපාදනයන්ට බලාත්මකභාවය ලබා දෙන්නේ ද යන්න නිරීක්ෂණය කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම සහ සැලසුම් කිරීම අපේක්ෂා කරනු ලබයි.(5 වන ව්‍යවස්ථාව). අංක 182 සම්මුතිය අනුව, පාර්ශවකාර රාජ්‍යයන් ඉතා නරක ස්වභාවයේ ළමා ශ්‍රමය ලබා ගැනීම මුලිනුපුටා දැමීමට අවශ්‍ය වැඩසටහන් ප්‍රමුඛතාවය සහිතව සැලසුම් කර ඒවා ක්‍රියාත්මක කළ යුතු අතර එසේ කිරීමේ දී ගැහැණු ළමුන්ගේ සුවිශේෂී තත්ත්වයන් පිළබඳව අවධානය යොමු කළ යුතු ය.(6 වන ව්‍යවස්ථාව). වැරදි සඳහා දණ්ඩන හෝ වෙනත් තහංචි සඳහා වන විධිවිධාන පිළිබදව ද අවධානය යොමු කළ යුතු ය.

[43] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/SupplementaryConventionAbolitionOfSlavery.aspx
[44] http://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:C182

### 4.8.3 1999 ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය පිළිබඳ අන්තර්ජාතික කම්කරු සංවිධානයේ නිර්දේශයන් (අංක.190) (ILOR No 190)

අන්තර්ජාතික කම්කරු සංවිධානයේ නිර්දේශ අංක 190හි විධිවිධානයන් මඟින් අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති අංක 182 උපාංගපූරණය කරනු ලබයි.[45] අන්තර්ජාතික කම්කරු සංවිධානයේ නිර්දේශ අංක 190 1999 ජුනි 17 වන දින පිළිගනු ලැබූ අතර එය අන්තර්ජාතික කම්කරු සංවිධානයේ සම්මුති අංක 182 හි 6 වන ව්‍යවස්ථාව තුළ සඳහන් කර ඇති ආකාරයට කාර්ය වැඩසටහන් සම්බන්ධයෙන් වැඩිදුර විස්තරයන් සපයනු ලබයි. විශේෂයෙන්, වැඩසටහන් සැලැස්ම සහ බලාත්මක කිරීම අරමුණු කරනු ලැබූයේ:

අ) ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය හඳුනාගැනීම සහ එය පිටුදැකීම;

ආ) ළමුන් ඉතා නරක ආකාරයේ ශ්‍රමය ලබා දීමෙන් වැළැක්වීම සහ එවැනි අවස්ථාවන්ගෙන් ඔවුන්ව ඉවත් කර ගැනීම, ඔවුන්ව පළිගැනීම්වලින් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අධ්‍යාපනික, භෞතික සහ මානසික අවශ්‍යතාවයන් ආමන්ත්‍රණය කරනු ලබන ආකාරයේ පියවරයන් හරහා ඔවුන්ගේ පුනරුත්ථාපනයට සහ නැවත සමාජගත කිරීමට අවශ්‍ය කරන විධිවිධාන සැපයීම;

ඇ) පහත ද සඳහා විශේෂ අවදානය යොමු කිරීම:
   අ. බාලවයස්කාර දරුවන්
   ආ) ගැහැණු දරුවන්

ඈ) ගැහැණු දරුවන් විශේෂයෙන් අවධානමට ලක්වන සැඟවුන කාර්යන් පිළිබඳ ගැටළු

ඉ) විශේෂ අසරණතා සහ අවශ්‍යතා සහිත සෙසු කාණ්ඩවල ළමුන්

ඊ) ළමුන් විශේෂයෙන් අවධානමට ලක්වන සමාජ කණ්ඩායම් හඳුනාගැනීම, ඔවුන් වෙත ළඟාවීම සහ ඔවුන් සමඟ කටයුතු කිරීම

උ) මහජන මතය සහ ළමුන් සහ ඔවුන්ගේ පවුල් ද ඇතුළු අදාල කණ්ඩායම් දැනුවත් කිරීම, සංවේදී කිරීම සහ දැනුවත්භාවය වර්ධනය කිරීම

### 4.8.4 1973 අන්තර් ජාතික කම්කරු සංවිධානයේ අවම වයස පිළිබඳ සම්මුතිය (අංක.138) (ILOC No 138)

අන්තර් ජාතික කම්කරු සංවිධානයේ සම්මුති අංක 138 යනු අන්තර් ජාතික කම්කරු සංවිධානය මඟින් 1978 දී පිළිගත් සම්මුතියකි.[46] එමඟින් පාර්ශවකාර රාජ්‍යයන් විසින් ළමා ශ්‍රමය ඵලදායී ලෙස තුරන් කර දැමීම තහවුරු කිරීම පිණිස සැකසූ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සහ තරුණ තැනැත්තන්ගේ පූර්ණ ශාරීරික හා මානසික වර්ධනය හා සැසඳෙන මට්ටමකට රැකියාවකට හෝ වැඩකට ඇතුලත් කර ගැනීමේ අවම වයස සාධනීය ලෙස ඉහළ නැංවීමට පියවර ගැනීම අපේක්ෂා කරනු ලබයි. (11 වන ව්‍යවස්ථාව). අන්තර් ජාතික කම්කරු සංවිධාන සම්මුති අංක 138 ශ්‍රමය සම්බන්ධ ක්ෂේත්‍රයේ සමාන සම්මුතීන් ගණනාවක් පරිච්චින්න කරනු ලබයි.[47]

අවම වශයෙන් අවුරුදු 15 රඳවා ගනිමින් ශ්‍රමය සඳහා අවම වයසක් නියම කිරීමට රටවලට නිදහස තිබේ. (2(3) ව්‍යවස්ථාව). කෙසේ වුවද 4 වන ව්‍යවස්ථාව දක්වන්නේ ආර්ථික හා අධ්‍යාපනික පහසුකම් ප්‍රමාණවත් තරම් වර්ධනය වී නොමැති සාමාජික රාජ්‍යයන්ට සේවක සංගම් හා අදාල සේවකයින් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව පළමු අවස්ථාවේ දී අවම වයස අවුරුදු 14 බව දැක්විය හැකිය.

නීතිය මඟින් අවුරුදු 13-15 අතර ළමයින් සඳහා සැහැල්ලු වැඩ නියම කළ හැකිය. (ඔවුන්ගේ සෞඛ්‍යයට හා පාසල් වැඩවලට හානිකර නොවන). තරුණ පුද්ගලයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හා සදාචාරයට හානිකර විය හැකි ආකාරයේ කාර්යයන් සඳහා අවම වයස ලෙස අවුරුදු 18 වන අතර එය සේවක සංගම් සහ අදාල සේවකයින් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව නියම කල හැකිය. (3 වන ව්‍යවස්ථාව)

ශ්‍රී ලංකාව අංක 138 සම්මුතිය 2000 පෙබරවාරි 11 වන දින, වැඩකිරීම සඳහා වන අවම වයස අවුරුදු 14 වශයෙන් පදනම් කර ගනිමින් අපරානුමත කරන ලදී.

[45] http://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:R190
[46] http://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:C138
[47] Minimum Age (Industry) Convention, 1919, the Minimum Age (Sea) Convention, 1920, the Minimum Age (Agriculture) Convention, 1921, the Minimum Age (Trimmers and Stokers) Convention, 1921, the Minimum Age (Non-Industrial Employment) Convention, 1932, the Minimum Age (Sea) Convention (Revised), 1936, the Minimum Age (Industry) Convention (Revised), 1937, the Minimum Age (Non-Industrial Employment) Convention (Revised), 1937, the Minimum Age (Fishermen) Convention, 1959, and the Minimum Age (Underground Work) Convention, 1965.

### 4.8.5 1930 අන්තර්ජාතික කම්කරු සංවිධානයේ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම පිළිබඳ සම්මුතිය (No.29) (ILOC No 29)

අන්තර්ජාතික කම්කරු සංවිධානයේ අංක 29 දරන සම්මුතියේ 2 වන ව්‍යවස්ථාව මගින් බලහත්කාරයෙන් හෝ අනිවාර්ය සේවයේ යෙදවීම යන්න පහත පරිදි නිර්වචනය කර තිබේ. "යම් පුද්ගලයකුව දඩුවමකට යටත් කරන බවට තර්ජනය කර ඔහු විසින් ස්වේච්ඡාවෙන් ලබා දෙනු නොලැබූ සියලු ම ආකාරයේ කාර්යයන් සහ සේවාවන්" කෙසේ වුවද ඒ සඳහා ව්‍යතිරේඛයන් දක්වා තිබේ.

- සම්පූර්ණයෙන් හමුදාමය ස්වභාවයක් ගනු ලබන හමුදා සේවයට ඇතුලත් සේවාවන්;
- සාමාන්‍ය පුරවැසි වගකීම් ඉටුකිරීම;
- අධිකරණයක් මගින් නියම කරනු ලැබූ දඩුවමක් වශයෙන් ඉටුකල යුතු කාර්යයන්
- සුළු ප්‍රජා සේවාවන් හෝ
- හදිසි අවස්ථා තත්ත්වයකදී සිදුකරනු ලබන ඕනෑම කාර්යක්.

මෙම සම්මුතියේ 1(1) වන ව්‍යවස්ථාව දක්වන්නේ මෙම සම්මුතිය අපරානුමත කළ අන්තර් ජාතික කම්කරු සංවිධානයේ සෑම සාමාජිකයකුම හැකි කෙටි ම කාලයක් තුල සියලු ම ආකාරයේ බලහත්කාරී හෝ අනිවාර්ය සේවය ලබා ගැනීම් නැතිකර දැමීමට පියවර ගත යුතු බවයි. ශ්‍රී ලංකාව මෙම සම්මුතිය 1950 අප්‍රේල් 5 වන දින අපරානුමත කරන ලදී.[48]
බලහත්කාරයෙන් සේවයේ යෙදවීම සහ තැනැත්තන් වෙළඳාම් කිරීම අතර සබඳතාවය එහි අරමුණ සඳහා වන නිර්වචනයේ ඇති සූරාකෑම යන වචනය සමග බැදී පවතී. සූරාකෑම යන්න බලහත්කාරයෙන් ශ්‍රමය හෝ සේවාවන් ලබා ගැනීම වහල්භාවය සහ ඒ හා සමාන ක්‍රියා පරවශතාවය සහ විවිධ ආකාරයේ ලිංගික සූරාකෑම් යන්න විශේෂයෙන් ඇතුළත් කිරීම සඳහා නිර්වචනය කර තිබේ. මෙම නිර්වචනයට අනන්‍ය ශ්‍රම සූරාකෑම යන්න පැලමෝර් සංධානය සහ අංක 29 සම්මුතිය අතර සබඳතාවය ඇති කිරීමෙහි ලා හැකියාව ලබා දේ.

## 4.9 1966 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය

සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය අන්තර්ජාතික මානව හිමිකම් සම්බන්ධයෙන් වන මුල් ගලකි.[49] එමගින් වහල්භාවය සහ බලහත්කාරයෙන් සේවයේ යෙදවීම තහනම් කරනු ලබයි. එම 8 වන ව්‍යවස්ථාව පහත පරිදි දක්වයි:

- කිසිම තැනැත්තකු වහල්භාවයට පත්කළ නොහැකි ය. වහල්භාවය සහ සියලු ම ආකරයන් හී  වහල් වෙළඳාම තහනම් වේ.(1 වන ව්‍යවස්ථාව)
- කිසිදු තැනැත්තකු දාසභාවයේ රදවාගත නොහැකි ය. (2 වන ව්‍යවස්ථාව)
- කිසිදු තැනැත්තකුට බලහත්කාරයෙන් හෝ අනිවාර්ය සේවයේ යෙදීමට බල නොකළ යුතු ය.(3අ ව්‍යවස්ථාව)

මෙම සම්මුතිය බොහෝ රටවල අයිතිවාසිකම් පනත්වල පදනම වන අතර මූලික මානව හිමිකම් උල්ලංඝණය කරනවාය යන පදනම මත වහල්භාවය සම්බන්ධ පරිචයන් තහනම් කරන ලද පරිචයන් වේ.

## 4.10 විදේශගත ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (1990) (විදේශගත ශ්‍රමිකයින් පිළිබඳ සම්මුතිය)

විදේශගත ශ්‍රමිකයින් පිළිබඳ සම්මුතිය මගින් විදේශගත ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්, තමන්ගේ මව්රටින් බැහැරව සේවය කිරීම හේතුවෙන් සූරාකෑමට ලක්විය හැකි පිරිසක් බවට පිළිගනු ලබන අතර ඔවුන්ට සැලකීම පිළිබඳ මූලික මූලධර්මයන් පිළිගනු ලබන නියාමයන් ස්ථාපනය කරනු ලබයි. එමගින් තවදුරටත් ඔවුන් මව් රටින් බැහැර සිටීම හේතුකර ගෙන සහ වත්මන් සේවා නියුක්තියේ තත්ත්වයන් හේතුකරගෙන මුහුණ පෑ හැකි අසරණතාවලට එරෙහිව ඔවුන්ව ආරක්ෂා කිරීමට අරමුණු කරනු ලබයි.

[48] http://www.ilo.org/dyn/normlex/en/f?p=NORMLEXPUB:12100:0::NO::P12100_ILO_CODE:C029
[49] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/CCPR.aspx

විදේශගත ශ්‍රමිකයින් පිළිබඳ සම්මුතිය එහි අනෙකුත් විධිවිධානයන් අතර, වධහිංසාව, කෲර අමානුශීය හෝ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම් වැළැක්වීම, වහල්භාවය හා පරවශතාවය, බලහත්කාරයෙන් හෝ අනිවාර්ය සේවයේ යෙදවීම, අනවසර තැනැත්තන් විසින් අනන්‍යතා ලේඛන බලහත්කාරයෙන් ලබා ගැනීම හා විනාශ කර දැමීම යනාදිය වැළැක්වීම තහවුරු කරනු ලබයි. එය තවදුරටත් විදේශගත ශ්‍රමිකයින්ගේ ඔවුන්ගේ පුද්ගලිකත්වයේ හා දේපළවල නිදහස හා ආරක්ෂාව, අත්තනෝමතික සිරභාරයට ගැනීමෙන් ආරක්ෂාව, අදාළ රාජ්‍යයේ ජාතිකයන් හා සමානතාවය ලැබීමට අයිතිය, සහ ස්වකීය මව් රාජ්‍යයේ තානාපති හෝ කොන්සල් සේවාවන් හී ආරක්ෂාව හා සහය ලබා ගැනීමට යොමු වීම යනාදිය තහවුරු කිරීමට උත්සහ කරනු ලබයි. ශ්‍රී ලංකාව විසින් මෙම සම්මුතිය 1996 දී අපරානුමත කරන ලදී. [50]

## 4.11 අන්තර්ජාතික මාර්ගෝපදේශ සහ මූලධර්ම

### 4.11.1 මානව හිමිකම් පිළිබඳ මහාකොමසාරිස් කාර්යාලයට මානව හිමිකම් හා තැනැත්තන් වෙළදාම් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ කරන ලද මූලධර්ම හා මාර්ගෝපදේශල පිනීවාල 2002 (මානව හිමිකම් පිළිබඳ මහාකොමසාරිස් කාර්යාලයේ තැනැත්තන් වෙළදාම් කිරීම පිළිබඳ මාර්ගෝපදේශය)[51] (OHCHR)

මානව හිමිකම් පිළිබඳ මහාකොමසාරිස් කාර්යාලයේ තැනැත්තන් වෙළදාම් කිරීම පිළිබඳ මාර්ගෝපදේශය සකස් කරනු ලැබුයේ තැනැත්තන් වෙළදාම් කිරීම වැළැක්වීමට සහ වින්දිතයන් ආරක්ෂා කිරීම පිණිස ප්‍රායෝගික අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රතිපත්ති මාලාවක් සැකසීම උදෙසා ය.

මෙම ලේඛනය තුල මාර්ගෝපදේශ 11ක් ඇතුලත් වන අතර එහි අරමුණ වන්නේ අන්තර්ජාතික, කලාපීය සහ දේශිය තැනැත්තන් වෙළදාම් කිරීම්වලට අදාල නීතීන්, ප්‍රතිපත්තීන් හා වෙනත් මැදිහත්වීම් තුලට මානව හිමිකම් පැතිකඩක් අන්තර්ග්‍රහණය කිරීම ප්‍රවර්ධනය කිරීම හා ඒ සඳහා පහසුකම් සැපයීම ය.

### 4.11.2 යුනිසෙෆ් (UNICEF): තැනැත්තන් වෙළදාම් කිරීමේ ළමා වින්දිතයකු ආරක්ෂා කිරීම සදහා වන මාර්ගෝපදේශයල නිව්යෝර්ක්ල 2006 (ළමා වෙළදාම පිළිබඳ යුනිසෙෆ් මාර්ගෝපදේශය)[52]

ළමා වෙළදාම පිළිබඳ යුනිසෙෆ් මාර්ගෝපදේශය මඟින් තැනැත්තන් වෙළදාමට ලක්වූ ළමුන් සම්බන්ධයෙන් ආරක්ෂාව සහ සහය ලබා දීම සඳහා වන යහපත් පරිචයන් පිළිබඳ ප්‍රමිතීන් සඳහන් කරනු ලබයි. මෙම මාර්ගෝපදේශය අන්තර්ජාතික මානව හිමිකම් ලේඛනයන් මත පදනම් වී ඇති අතර හඳුනා ගැනීමේ සහ මුදවාගෙන නැවත සමාජගත කරන තුරු ළමා වින්දිතයන්ගේ ආරක්ෂාව පිළිබඳ විමසා බලයි. ළමා වෙළදාම පිළිබඳ යුනිසෙෆ් මාර්ගෝපදේශය, ජාතික හා කලාප මට්ටමින්, ඒ ඒ දේශිය තත්ත්වයන්, සීමාවන් හා සම්පත් සැලකිල්ලට ගනිමින් ප්‍රතිපත්තීන් හා පරිචයන් නිර්මාණය කිරීමේ වේදිකාවක් වශයෙන් භාවිතා කිරීම අපේක්ෂා කරනු ලබයි. මෙම මාර්ගෝපදේශය හරහා ළමා වින්දිතයන් ආරක්ෂා කිරීම පිණිස ආණ්ඩුවට, රාජ්‍ය අංශයේ හා අන්තර්ජාතික සංවිධානයන්ට මෙන්ම රාජ්‍ය නොවන සංවිධානයන් හෝ සේවා සපයන ආයතනයන්ට උපකාර කිරීම අරමුණු කරනු ලබයි.

### 4.11.3 යුනිසේෆ් (UNICEF): යුරෝපයේ තැනැත්තන් වෙළදාම් කිරීමට ලක් වූ ළමුන් ආරක්ෂා කිරීම සම්බන්ධ මාර්ගෝපදේශ පිනීවා, 2006



**ඉගෙනුම් මෙවලම්:**

**අන්තර්ජාතික ලේඛනයන්**

**අත්සන් කිරීම, අපරානුමත**

**කිරීම සහ ඇද ගැනීම**

[50] http://www.ohchr.org/EN/ProfessionalInterest/Pages/CMW.aspx

[51] http://www.ohchr.org/Documents/Publications/Traffickingen.pdf

[52] https://www.unicef.org/eca/0610-Unicef_Victims_Guidelines_en.pdf

| | |
|---|---|
| **අත්සන් කිරීම යන්න අපරානුමත කිරීමට හෝ පිළිගැනීමට හෝ අනුමත කිරීමට යටත්වේ.** | අත්සන් කිරීම යන්න අපරානුමත කිරීමට හෝ පිළිගැනීමට හෝ අනුමත කිරීමට යටත් වන අවස්ථාවක දී අත්සන් කිරීම යන්නෙන් එකී ලේඛනයට නෛතික බැඳීමට ඇති කැමැත්ත ස්ථාපනය නොකරයි. කෙසේ වුවද, එමඟින් අත්සන් කරන ලද රාජ්‍යය තවදුරටත් සම්මුති සකස් කිරීමේ ක්‍රියාවලියේ ඉදිරියට යාමට ඇති කැමැත්ත ප්‍රකාශ කරනු ලබන බව අර්ථ ගැන්වේ. අත්සන හරහා එම රාජ්‍යයට එකී ලේඛනය අපරානුමත කිරීමට හෝ පිළිගැනීමට හෝ අනුමත කිරීමට හැකියාව ඇති කරයි. එමඟින් තවදුරටත් සද්භාවයෙන් යුතුව අදාල සම්මුතියේ අභිමතාර්ථය සහ අරමුණ පරාජය කරන ආකාරයේ ක්‍රියාවන් කිරීමෙන් වැළකී සිටීමේ වගකීමක් නිර්මාණය කරනු ලබයි.<br>(1969 සම්මුති නීතිය පිළිබඳ වියානා සම්මුතියේ 10 සහ 18 වන ව්‍යවස්ථාවන් ) |
| **අපරානුමත කිරීම** | අපරානුමත කිරීම යනුවෙන් අදහස් වන්නේ යම්කිසි සම්මුතියකින් නෛතිකව බැඳීම පිණිස යම් රාජ්‍යයක් විසින් කැමැත්ත පිළිබිඹු කරනු ලබන අන්තර්ජාතික ක්‍රියාවකි. (එම ක්‍රියාව හරහා පාර්ශවයන් ඔවුන්ගේ කැමැත්ත පෙන්වීමට චේතනා කරයි නම්). ද්වි පාර්ශවීය ගිවිසුමක් නම් අදාල පාර්ශවයන් දෙක ලේඛනයන් හුවමාරු කර ගැනීම හරහා අපරානුමතය ලබා ගන්නා අතර බහු පාර්ශවීය සම්මුතියක දී නම් සාමාන්‍ය ක්‍රියාපටිපාටිය වන්නේ අවශ්‍ය කරන අපරානුමිතීන් ලබා ගැනීම පිණිස සියලු රාජ්‍යයන් දැනුවත් කර අදාල ලේඛනය යම් ස්ථානයක තැම්පත් කර තැබීමයි. අපරානුමිතිය මඟින් දේශීය මට්ටමින් අවශ්‍ය කරන අනුමැතිය ලබා ගැනීම පිණිස රාජ්‍යයන් වෙත කාලය ලබා දෙන අතර එම සම්මුතියට දේශීය නීතිය තුළ බලාත්මකභාවය ලබා දීමට අවශය කරන ව්‍යවස්ථාවන් සම්පාදනය කිරීමට කාලය ලබා දේ.<br>(1969 සම්මුති නීතිය පිළිබඳ වියානා සම්මුතියේ 2 (1) (ආ), 14 (1) සහ 16 වන ව්‍යවස්ථාවන් ) |
| **ඇදාගැනීම** | ඇදා ගැනීම හරහා දැනටමත් සෙසු රාජ්‍යයන් සාකච්ඡා කර අත්සන් තබන ලද සම්මුතියක පාර්ශවකාරයෙකු වීමට වන ආරාධනයක් රාජ්‍යයක් විසින් පිළිගනු ලබන අවස්ථාවක් පිළිබිඹු වේ. මෙහිදී ද අපරානුමිතය හා සමාන ම නෛතික ප්‍රතිඵලයන් ඇති වේ. මෙය සාමාන්‍යයෙන් සිදු වන්නේ දැනටමත් සම්මුතිය ක්‍රියාත්මක වීම ආරම්භ වී ඇති අවස්ථාවන් හිදී ය.<br>(1969 සම්මුති නීතිය පිළිබඳ වියානා සම්මුතියේ 2 (1) (ආ), සහ 15 වන ව්‍යවස්ථාවන් ) |

## අභ්‍යාසය 4.1

## අන්තර්ජාතික ලේඛන අදාල කර ගැනීම

**අන්තර්ජාතික ලේඛනයන්ගෙන් පහත දැක්වෙන එක් ව්‍යවස්ථාවක් තෝරාගෙන එය විස්තර කරන්න:**

1. එය තැනැත්තන් වෙළඳාම් කිරීමට එරෙහි කාර්යයන් හී වැදගත් උපකරණයක් වන්නේ කෙසේද?

***අ. පැලමෝර් සංධානය (5 වන ව්‍යවස්ථාව):***

"1. සෑම රාජ්‍ය පාර්ශවයක් විසින් ම මෙම සංධානයේ 3 වන ව්‍යවස්ථාව යටතේ දක්වා ඇති ක්‍රියාවන් චේතනාන්විතව සිදුකරනු ලැබ තිබෙන අවස්ථාවන් අපරාධ වැරදි වශයෙන් හඳුනාගැනීමට අවශ්‍ය කරන පරිදි ව්‍යවස්ථාමය හෝ වෙනත් පියවරයන් ගතයුතුය.

"2. සෑම රාජ්‍ය පාර්ශවයක් ම මෙම ව්‍යවස්ථාවේ 1 වන ඡේදය අනුව සංස්ථාපනය කරන ලද වරදකට සහයකයකු වශයෙන් සම්බන්ධ වීම අපරාධමය වරදක් ලෙස ස්ථාපනය කිරීමට අවශ්‍ය කරන පරිදි ව්‍යවස්ථාමය හෝ වෙනත් පියවරයන් ගත යුතු ය.

***ආ. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය (1989) (34 වන ව්‍යවස්ථාව):***

"ළමයාව සියලු ම ආකාරයේ ලිංගික සූරාකෑම් හා ලිංගික අපයෝජනයන්ගෙන් ආරක්ෂා කිරීමට රාජ්‍ය පාර්ශවයන් වගකීම බාරගනු ලැබේ. මෙකී අරමුණු සඳහා, රාජ්‍ය පාර්ශවයන් විසින් පහත දෑ වැළැක්වීම පිණිස විශේෂයෙන් සුදුසු සියලු ම ජාතික, ද්විපාර්ශවීය හා බහු

| | |
|---|---|
| 2. එය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාවට නංවා තිබෙන්නේ කෙසේද? හැකි අවස්ථාවන් හී දී ඔබගේ පෞද්ගලික හෝ වෘත්තීය අත්දැකීම් ඇසුරින් උදාහරන භාවිතා කරන්න. | පාර්ශවීය ක්‍රියාපටිපාටීන් ගත යුතුය: …(ආ) ළමයින්ව වෛශ්‍ය වෘත්තියේ හෝ වෙනත් ආකාරයන් හී නීතිවිරෝධී ලිංගික පරිචයන් හී භාවිතා කිරීම…”<br>***ඇ. අන්තර්ජාතික කම්කරු සංවිධානයේ ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය පිළිබඳ සම්මුතිය, 1999 (අංක.182) (7(2)ව්‍යවස්ථාව):***<br>“සෑම පාර්ශවකාර රාජ්‍යයක් ම ළමා ශ්‍රමය තුරන් කිරීමෙහි ලා අධ්‍යාපනය ලබා දීමේ වැදගත්බව සැලකිල්ලට ගනිමින් (අ) ළමයින් ඉතා නරක ආකාරයේ ළමා ශ්‍රමය ලබාදීමේ ආකාරයන්හී නිරත වීම වැළැක්වීම පිණිස…ඵලදායී සහ නිශ්චිත කාලපරාසයක් තුල පියවරයන් ගත යුතු ය.”<br>***අවම වයස පිළිබඳ සම්මුතිය, 1973 (අංක.138) (3 වන ව්‍යවස්ථාව):***<br>“1.තරුණ පුද්ගලයන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හා සදාචාරයට හානිකර විය හැකි කුමන හෝ ආකාරයේ සේවා නියුක්තීන් හා කාර්යයන් සඳහා අවම වයස ලෙස අවුරුදු 18 විය යුතු ය.” |
| **අභ්‍යාසය 4.2** | **ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම** |
| පහත අවස්ථාවන් සලකා බලන්න. එ.ජා ළමා අයිතිවාසිකම් සම්මුතිය ප්‍රකාරව කවර අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇත්දැයි (එසේ වී ඇත්නම්) සාකච්ඡා කරන්න.[53] | A. අර්ජුන තම ගොවි දෙමාපියන් සමග ගොවිපලක ජීවත් වන වයස අවුරුදු 11ක පිරිමි ළමයෙකි. ඔහුගේ පියා අසනීප වූ අතර ඔහුගේ පවුල ගොවිපලේ හිමිකරුගෙන් ණයට මුදල් ලබා ගන්නා ලදී. එය නැවත පියවා දැමීම පිණිස අර්ජුන අදාල පුද්ගලයාගේ මෙහෙකරු වහයෙන් සේවය කිරීම ආරම්භ කරන ලදී. |
| | B. දුර්භික්ෂයට ලක්වූ දුප්පත් ග්‍රාමීය ප්‍රදේශයක් ජීවක් වන බිම්බා වයස අවුරුදු 10 ක ගැහැණු ළමයෙකි. අගනගරයේ වෙසෙන ඇයගේ ධනවත් නැන්දනිය පවසන්නේ බිම්බා ඇයගේ නිවසේ කාර්යයන් සඳහා උපකාර වන්නේ නම් බිම්බාට ඇය සමග පැමිණ ජීවත් විය හැකි බවයි. නැන්දණිය ඇයව පාසල් යැවීමට පොරොන්දු වේ. මෙම තත්ත්වය මෙම ගැහැණු ළමයා වෙසෙනෙ ප්‍රදේශයේ සාමාන්‍ය තත්ත්වයකි: මෙම රටතුල තමන්ගේ විශාල පවුලේ අවශ්‍යතාවයන් පිරිමැසීම පිණිස ස්වකීය ඥාතීන් සමග දරුවන් යැවීම සාමාන්‍ය සම්ප්‍රදායයි. |
| | C. චින්තක K නම් රාජ්‍යයේ සිට වයස අවුරුදු 10-12 පමණ වන බව සිට ගෙනා පිරිමි ළමයකු වන අතර ඔහුගේ පෙනුම ඊට වඩා බොහෝ ළාබාල වේ. (අවුරුදු 7-8 ක් පමණ). J රාජ්‍යයේ පොලිසිය විසින්, ඔහු තවත් රටවල් දහයක පමණ ළමුන් සමග වෙළඳපොළේ කුඩා භාණ්ඩ අලෙවි කරමින් සිටින අවස්ථාවේ දී භාරයට ගන්නා ලදී. පැය දෙකක පමණ විමර්ශනයකින් පසුව ළමයා ඇත්තවශයෙන්ම J රාජ්‍යයේ ස්වකීය පවුල සමග ජීවත් වන බව පොලිසිය අනාවරණය කර ගන්නා ලදී. එම පවුලට නීත්‍යානුකූල අවසර තිබුන ද නැති ද යන්න පැහැදිලි නොවීය. ඔහුව පාසලකට ඇතුලත් කර තිබුන ද චින්තක වැඩිම කාලයක් වෙළඳපොළේ ගත කරනු ලබන්නේ හවසට තම දෙමාපියන්ට සුළු මුදලක් ගෙනැවිත් දීම සඳහාය. |

[53] Source: *Training manual to fight trafficking in children for labour, sexual and other forms of exploitation / International Labour Office, International Programme on the Elimination of Child Labour (IPEC). - Geneva: ILO, 2009 - 4 v.*

D. හේෂානි T රාජ්‍යයේ සිට පැමිණි අවුරුදු 14 ක දැරියක් වන අතර ඇය තම සහෝදරයා විසින් එම රාජ්‍යයේ මධ්‍ය ප්‍රදේශයේ සිට එහි දකුණු ප්‍රදේශයට රැගෙන ඒම පිණිස කැමැත්ත පළ කර තිබිණි. ඇය තම සහෝදරයා සහ නැනා සමඟ Z රාජ්‍යයේ දේශසීමාව අසල දකුණු ප්‍රදේශයේ ජීවත් වේ. සෑම දිනක ම තම සහෝදරයා හඳුන්වා දෙනු ලැබූ තෙවන පාර්ශවයන්ට පළතුරු සහ බිත්තර විකිණීම පිණිස ඇය නීති විරෝධී ලෙස දේශසීමාව තරණය කරයි. හේෂානි පාසල් නොයයි. Z රාජ්‍යයේ කම්කරු පනත අනුව ඇය එහි පුරවැසියෙකු නම් ඇයට අන්තරාකර නොවන වැඩ කිරීමට අවසර දිය හැකි ය. ඇයගේ ආදායම් පිළිබඳ හේෂානි බොහෝ සතුටින් සිටියි. සෑම සතියකම ඇය තම කැමැත්තෙන් ඇගේ සහෝදරයාට තම දෛනික වියදම් ආවරණය කිරීමට යම් මුදලක් ලබා දේ.

## b. කලාපීය නෛතික රාමුව


**කාන්තාවන් සහ ළමයින් වෛශ්‍යා වෘත්තියේ යෙදවීම වැළැක්වීමට සහ ඊට එරෙහිව සටන් කිරීම සඳහා වන දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ සම්මුතිය (1997) (තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ සාර්ක් සම්මුතිය) සහ ළමා සුභසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වන කලාපීය විධිවිධාන පිළිබඳ සාර්ක් සම්මුතිය. (ළමා සුභසාධනය පිළිබඳ සාර්ක් සම්මුතිය)**

**හැඳින්වීම**

තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ සාර්ක් සම්මුතිය[54] සහ ළමා සුභසාධනය පිළිබඳ සාර්ක් සම්මුතිය[55] 11 වන සාර්ක් සමුළුවේ දී 2002 ජනවාරි මාසයේ 5 වන දින අත්සන් තබන ලදී (කත්මණ්ඩු 2002 ජනවාරි 4-6). මෙම සම්මුතිය එතැන් පටන් බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්තානය සහ ශ්‍රී ලංකාව විසින් ඒකමතිකව පිළිගත් අතර කාන්තාවන් සහ ළමුන් වෛශ්‍ය වෘත්තියේ යෙදවීම වැළැක්වීම, තහනම් කිරීම සහ මර්දනය කිරීමේ විවිධ පැතිකඩයන් සඳහා සහ නැවත මව් රටට යැවීම හා වින්දිතයන් පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් සියලු ම පාර්ශවකාර රාජ්‍යයන්ගෙන් සහයෝගීත්වය අපේක්ෂා කර සිටියි.

### 4.12 සාර්ක් සම්මුතිය පැහැදිලි කිරීම






54 http://un-act.org/publication/view/south-asian-association-for-regional-cooperation-saarc-convention-on-preventing-and-combating-trafficking-in-women-and-children-for-prostitution-2002/

55 http://www.ilo.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/---sro-new_delhi/documents/genericdocument/wcms_251025.pdf

**සාර්ක් සම්මුතියේ**
**1 වන ව්‍යවස්ථාව මඟින්**
**තැනැත්තන් වෙළදාම් කිරීම**

අ) "තැනැත්තන් වෙළදාම් කිරිමට යටත් වූ පුද්ගලයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව, මූල්‍යමය හෝ වෙනත් යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා රට තුල හෝ ඉන් පිටත, වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් හා ළමයින් එහා මෙහා ගෙනයාම, විකිණීම හෝ මිලදී ගැනීම'';

ආ) වෛශ්‍ය වෘත්තීය යනු වාණිජ අරමුණක් සඳහා තැනැත්තකු ලිංගික වශයෙන් සූරාකෑම හෝ අපයෝජනයට ලක්කිරීම වේ.;

ඇ) "තැනැත්තන් වෙළදාම් කිරිමට යටත් වූ පුද්ගලයා යනු රැවටීම, තර්ජනය, බලහත්කාරය, පැහැරගෙන යාම, විකිණීම, වංචනික විවාහයන්, ළමා විවාහයන් හෝ වෙනත් ඕනෑම නීති විරෝධී ආකාරයකින් තැනැත්තන් වෙළදාම් කරන්නන් විසින් වින්දිතයන් බවට පත් කරන ලද හෝ වෛශ්‍යා වෘත්තියේ යොදවන ලද කාන්තාවන් සහ ළමුන් වේ;

ඈ) තැනැත්තන් වෙළදාම්කරුවන් යනු සියලු ම ආකාරයේ තැනැත්තන් වෙළදාම් කිරීමවල යෙදී සිටින පුද්ගලයන්,නියෝජිතයින් හෝ ආයතනයන් වේ.;

ඉ) ළමයා යනු වයස අවුරුදු 18 අඩු පුද්ගලයෙකි.

| | |
|---|---|
| **11 ව්‍යවස්ථාව** | මෙමඟින් තමන්ගේ රාජ්‍යයන් හී තැනැත්තන් වෙළඳාම් කිරීම අපරාධමය වරදක් බවට පත් කිරීම පිණිස ව්‍යවස්ථාවන් සම්පාදනය කිරීම පිණිස කාර්යක්ෂම පියවර ගැනීමට පාර්ශවකාර රාජ්‍යයන් වගකීමට යටත් කරයි. |
| **IV ව්‍යවස්ථාව** | අධිකරණයන් විසින් සලකා බැලියයුතු, අපරාධය බරපතල බවට පත්කිරීම පිණිස බලපාන අවස්ථාපිත සාධකයන් සඳහන් කරයි. ඒවා නම්:<br>අ. සංවිධානාත්මක අපරාධ කණ්ඩායමක සම්බන්ධ වීම;<br>ආ. වරදකරු වෙනත් අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ ක්‍රියාවන්හි නිරත වීම;<br>ඇ. වරදකරු විසින් ප්‍රචණ්ඩත්වය හෝ ආයුධ භාවිතා කිරීම;<br>ඈ. වරද සිදුකිරීම පිණිස මහජන ධුරයක් අයුතු ලෙස භාවිතා කිරීම;<br>ඉ. ළමයින්ව වින්දිතයින් බවට පත්කිරීම හෝ වෙළඳාම් කිරීම;<br>ඊ. භාරකාරත්ව ආයතනයක දී, අධ්‍යාපනික ආයතනයක දී හෝ සමාජමය පහසුකම් සපයනු ලබන ආයතනයක දී වරද සිදුකිරීම;<br>උ. මේ හා සමාන වැරදි සඳහා පෙර වරදකරුවන් වී තිබීම. |
| **V ව්‍යවස්ථාව** | තැනැත්තන් වෙළඳාම් කිරීමට නතු වූ කාන්තා හෝ ළමා වින්දිතයින්ගේ රහස්‍යභාවය තහවුරු කිරීමට සහ වින්දිතයින් වෙනුවෙන් නෛතික හා උපදේශන සේවා ලබා දීමට අවශ්‍ය විධිවිධාන සැලසීම තහවුරු කිරීමට පාර්ශවකාර රාජ්‍යයන් වගකීමට යටත් කරනු ලබයි. |
| **VI ව්‍යවස්ථාව** | පරීක්ෂණයන්, විමර්ශනයන්, නඩු විභාග සහ වෙනත් නඩු කටයුතු හිදී අන්‍යෝන්‍ය නෛතික සහය ලබා දීමට පාර්ශවකාර රාජ්‍යයන් වගකීමට ලක්කරයි. ඒ තුළ පහත ද අන්තර්ගත විය හැකිය:<br>අ. සාක්ෂි ලබා ගැනීම සහ පුද්ගලන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීම;<br>ආ. තොරතුරු, ලේඛන සහ අපරාධ සහ අධිකරණ වාර්තා ද ඇතුලව වෙනත් වාර්තා ලබා දීම;<br>ඇ. ඔවුන්ගේ අනන්‍යතාවය ද ඇතුලව පුද්ගලයක් සහ භාණ්ඩ සොයා ගැනීම;<br>ඈ. සෝදිසි කිරීම් හා අල්ලා ගැනීම;<br>ඉ. ඉදිරිපත් කළ භාණ්ඩ ලබා දීම ද ඇතුළුව දේපළ භාරදීම (නඩු භාණ්ඩ);<br>ඊ. රැඳවියන් සහ වෙනත් සිටිනා අදාල පුද්ගලයන් මඟින් සාක්ෂි දීමට හෝ විමර්ශනයන්ට සහය වීමට සැලැස්වීම;<br>උ. පුද්ගලයන්ගේ පැමිණීමේ වාර්තා ඇතුළුව ලේඛන ලබා දීම |
| **VII ව්‍යවස්ථාව** | තැනැත්තන් වෙළඳාම් කිරීම උදර්පණීය වරදක් ලෙස පිළිගනු ලබන අතර පාර්ශවකාර රාජ්‍යයන්ට වරදකරුවන්ට ස්වකීය රාජ්‍ය තුල නඩු පැවරීමට හෝ වෙනත් සාමාජික රාජ්‍යයක් තුල නඩු පැවරීම පිණිස උදර්පණය කළ හැකි ය. |
| **VIII ව්‍යවස්ථාව** | කාන්තාවන් සහ ළමයින් තැනැත්තන් වෙළඳාම් කිරීමට ලක්කිරීම වැළැක්වීමට සහ තහනම් කිරීමට පියවර |

| | |
|---|---|
| | ගැනීම පිණිස පාර්ශවකාර රාජ්‍යයන් වගකීමට ලක්කරයි. එම පියවර අතර පහත ද ඇතුලත් වේ:<br>අ. නීතිය ක්‍රියාත්මක කරන නිළධාරීන්, අධිකරණ නිළධාරීන් සහ තැනැත්තන් වෙළදාම් කිරීම් සම්බන්ධ විමර්ශනයන්, පරීක්ෂණයන් සහ නඩු පැවරීම් සිදුකරන අදාල සෙසු නිළධාරීන් සඳහා පුහුණු සහ සංවේදීකෘත වැඩසටහන් ලබා දීම;<br>ආ. සම්මුතිය ක්‍රියාවට නැංවීම පිණිස කලාපීය කාර්යසාධක බලකායක් ස්ථාපිත කිරීම;<br>ඇ. සම්මුතිය ක්‍රියාවට නැංවීම පිණිස ද්විපාර්ශවීය යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම;<br>ඈ. තැනැත්තන් වෙළදාම් කිරීමට සම්බන්ධ සංවිධානයන්, ඔවුන් භාවිතා කරන ක්‍රමවේදයන් සහ ගොඩබිමෙන්, ජලයෙන් හා ගුවනින් භාවිතා කරන මාර්ගයන් සහ පරීක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනිම;<br>ඉ. රැකියාවට බඳවා ගැනීමේ මුවාවෙන් කාන්තාවන් සහ ළමුන් තැනැත්තන් වෙළදාම් කිරීමට ලක්කිරීම වැළැක්වීම පිණිස රැකියා සඳහා බඳවා ගන්නා නියෝජිත ආයතයන් පිළිබද සුපරික්ෂාකාරී වීම ද ඇතුළුව තැනැත්තන් වෙළදාම් කිරීමට ලක් කරන ක්‍රම පිළිබඳව සුපරික්ෂාකාරී වීම;<br>ඊ. තැනැත්තන් වෙළදාම් කිරීමට හේතු වන සාධකයන් පිළිබදව මාධ්‍ය හරහා දැනුවත් කිරීම් සිදු කිරීම. |
| **IX ව්‍යවස්ථාව** | තැනැත්තන් වෙළදාම් කිරීමේ වින්දිතයන්ට රැකවරණය, ප්‍රතිකාර, පුනරුත්ථාපනය සහ නැවත මව් රටට යාමට සලසා දීම, එයට පහත ද ඇතුලත් වේ:<br>අ. වින්දිතයාව ඔහුගේ මව් රටට නැවත යැවීම<br>ආ. මව් රටට යවන තෙක් නෛතික සහය සහ සෞඛ්‍ය පහසුකම් සලසා දීම<br>ඇ. වින්දිතයන්ව පුනරුත්තාපනය කිරීම පිණිස රාජ්‍ය අනුග්‍රහය සහිත හෝ රාජ්‍ය අන්ග්‍රහය නොලබන රක්ෂිත ස්ථාන සහ රැකවරණ නිවහන ස්ථාපිත කිරීම<br>ඈ. වින්දිතයන්ට නෛතික සහය, සෞඛ්‍ය පහසුකම්, උපදේශනය සහ රැකියා පුහුණුව ලබා දීම |

**<u>තැනැත්තන් වෙළදාම් කිරීම පිළිබද නිර්වචනයඃ සංසන්දනයක්</u>**

***සාර්ක් සම්මුතියේ 1 වන ව්‍යවස්ථාව***

“තැනැත්තන් වෙළදාම් කිරිමට යටත් වූ පුද්ගලයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව, මූල්‍යමය හෝ වෙනත් යම් ප්‍රතිෂ්ඨාවක් සඳහා රට තුළ හෝ ඉන් පිටත, වෛශ්‍යා වෘත්තීය සඳහා කාන්තාවන් හා ළමයින් එහා මෙහා ගෙන යාම, විකිණිම හෝ මිලදී ගැනීම”.

***තැනැත්තන්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් , වෙළදාම් කිරීම වැළැක්වීම මර්දනය කිරීම සහ දඬුවම් දීම සඳහා වන සංධානයේ  (පැලමෝර් සංධානය) 3 වන ව්‍යවස්ථාව***

"තැනැත්තන් වෙළදාම් කිරීම යනුවෙන් සූරා කෑමේ අරමුණ ඇතිව, තර්ජනය කිරීම හෝ බලහත්කාරයෙන් හෝ වෙනත් ආකාරයේ බලකිරීම් මගින් පැහැරගෙන යාම, වංචාව, රැවටීම, බලය අයුතු ලෙස භාවිතාව හෝ අසරණභාවය හෝ වෙනත් පුද්ගලයෙකු පාලනය කිරීමට හැකි පුද්ගලයෙකුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා ගෙවීමක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ලබාදීම හෝ ලබා ගැනීම මගින් පුද්ගලයින් බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, පවරා දීම, රැකවරණය ලබා දීම සහ භාර ගැනීම  අදහස්  විය යුතු ය. සූරාකෑම යන්නෙන්, අවම වශයෙන් අන් අයව වෛශ්‍ය වෘත්තියේ යෙදවීම හෝ වෙනත් යම් ආකාරයකින් ලිංගිකව සූරාකෑම, බලහත්කාරයෙන් සේවයේ යෙදවීම, වහල්භාවය හෝ වහල්භාවයට සමාන ක්‍රියා හෝ අවයව ඉවත්කර ගැනීම යන්න ඇතුලත් විය යුතු ය.

**අ.** තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ සාර්ක් සම්මුතිය පැලමෝර් සංධානයේ භාවිතා කර තිබෙන පුළුල් නිර්වචනය අනුගමනය නොකරන අතර එය වාණිජ ලිංගික සූරාකෑම පමණක් ආවරණය කරනු ලබන වඩාත් සීමා සහිත නිර්වචනයට නැවත ගමන්කර තිබේ.

**ආ.** තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ සාර්ක් සම්මුතිය තුල ඇතුළත් නිර්වචනය කාන්තාවන් සහ ළමුන් එහා මෙහා ගෙනයාම, විකිණීම හෝ මිලදී ගැනීමට පමණක් සීමා වන අතර ඒ තුළ පුද්ගලයින් බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, පවරා දීම, රැකවරණය ලබා දීම සහ භාර ගැනීම වැනි තැනැත්තන් වෙළඳාම් කිරීමේ විවිධ අවස්ථාවන් සලකා බලා නොමැත.

**ඇ.** තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ සාර්ක් සම්මුතිය හුදෙක් වෛශ්‍යා වෘත්තිය පිළිබඳ පමණක් අවධානය යොමු කළද සාර්ක් කලාපය තුල කාන්තාවන් සහ ළමයින් බලහත්කාරයෙන් සේවයේ යෙදවීම, අවයව ඉවත් කර ගැනීම විවාහය යනාදී ආකාරයන්ගෙන් සූරාකෑමට ලක් වේ. පැලමෝර් සංධානයේ නිර්වචනය තුල අවම වශයෙන් අන් අයව වෛශ්‍ය වෘත්තියේ යෙදවීම හෝ වෙනත් යම් ආකාරයකින් ලිංගිකව සූරාකෑම, බලහත්කාරයෙන් සේවයේ යෙදවීම, වහල්භාවය හෝ වහල්භාවයට සමාන ක්‍රියා හෝ අවයව ඉවත්කර ගැනීම යන්න ඇතුලත් වන ලෙස පුළුල්ව සූරාකෑම නිර්වචනය කර තිබේ.

**ඈ.** සාර්ක් සම්මුතිය තුල කාන්තාවන් සහ ළමුන් එක් අසරණ කණ්ඩායමක් වශයෙන් හඳුනාගනු ලබන අතර එහිදී කාන්තාවන් වැඩිහිටියන් බවත් ළමුන් යනු විශේෂ රැකවරණය හා අවධානය අවශ්‍ය කණ්ඩායමක් බව හඳුනා ගැනීමට සම්මුතිය අපොහොසත් වේ. එයට ප්‍රතිවිරුද්ධ ලෙස පැලමෝර් සංධානය වැඩිහිටි පුරුෂයන්, කාන්තාවන් සහ ළමුන් අතර වෙනසක් දක්වන අතර ළමයින් වෙළඳාම් කිරීම යන්න සූරාකෑම සඳහා බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, පවරා දීම, රැකවරණය ලබා දීම සහ භාර ගැනීම ලෙස නිර්වචනය කරනු ලබයි. එම නිසා, වින්දිතයා ළමයකු වන අවස්ථාවක දී, අදාළ වෙළඳාම් කිරීමේ ක්‍රියාව සඳහා කැමැත්ත ලබා දුන්නාය යන සාධකය අදාල නොවන අතර නිර්වචනයේ දක්වා ඇති ක්‍රමවේදය යොදාගෙන තිබේද යන්න ද අදාල නොවේ.

a. සාර්ක් සම්මුතිය කාන්තාවන්ට සහ ළමයින්ට පමණක් සීමා වන අතර එහි ලා විවිධ ආකාරයන්ගෙන් තැනැත්තන් වෙළඳාම් කිරීම්වලට ලක් වන පුරුෂයන් බැහැර කර තිබේ.



**අභ්‍යාසය 4.3**

පැලමෝර් සංධානයේ සහ තැනැත්තන් වෙළඳාම් කිරීම පිළිබඳ සාර්ක් සම්මුතියේ ඇති නිර්වචනයන් සංසන්දනය කර එවායේ ඇති සමානතා සහ අසමානතා වගුවක් ආශ්‍රිතව දක්වන්න.

**2005 අංක 30 දරන වෛශ්‍ය වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් වෙළඳාම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව සටන් කිරීම පිළිබඳ සම්මුති පනත**[56]



තැනැත්තන් වෙළඳාම් කිරීමට එරෙහිව පිළියම් යෙදීම පිණිස දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීමට අමතරව 2005 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් *සාර්ක් සම්මුතිය* යටතේ වන වගකීම ඉටු කිරීම පිණිස මෙම පනත සම්මත කරන ලදී.

වෛශ්‍ය වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් වෙළඳාම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහි සටන්කිරීම පිළිබඳ සම්මුති පනත (සාර්ක් සම්මුති පනත) තැනැත්තන් වෙළඳාම් කිරීම වැළැක්වීමට සහ ඊට නතු වූ, ලක් වූ කාන්තාවන් සහ ළමයින් පුනරුත්ථාපනය කිරීමට හා උදර්පණය කිරීමට අවශ්‍ය විධිවිධාන සලසයි. තවද, අපරාධ කාරණා පිළිබඳ අන්‍යෝන්‍ය සහය පනත[57] යටතේ පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් අතර සහයෝගීතාවය ශක්තිමත් කරන අතර පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් නොවන රටවල් සමග පනත යටතේ ආණ්ඩුව විසින් ඇතිකර ගෙන තිබෙන එකඟතාවයට අනුව දේශාන්තරව සිදුවන තැනැත්තන් වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීමට හා නඩු පැවරීම් ශක්තිමත් කිරීමට අදාල විධිවිධාන සලසයි.

[56] Act No. 30 of 2005.

[57] Act. No. 25 of 2002

පනත යටතේ පහත විධිවිධාන සලසනු ලබයි:

| අ. එමඟින් කාන්තාවන් සහ ළමයින් වෙළඳාම් කිරීම යන වරද පහත පරිදි නිර්වචනය කරයි. |
|---|
| අ. වෙශ්‍යා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීමේ කාර්යය සඳහා හෝ ඊට සම්බන්ධ වෙනත් කාරණාවක් සඳහා |
| ආ. ගොඩනැගිල්ලක් හෝ වෙනත් ස්ථානයක් හෝ යම් කොටසක් |
| ඇ. පවත්වා ගෙන යන, නඩත්තු කරන හෝ කළමනාකරණය කරන |
| ඈ. දැන දැනම මුදල් යොදවන හෝ මුදල් යෙදවීමට සහභාගි වන හෝ |
| ඉ. දැන දැනම බද්දට හෝ කුලියට දෙන යම් තැනැත්තෙකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය. |
| ඊ. ඒ සඳහා උත්සහ කරන උපකාර කරන සහ කුමන්ත්‍රණය කරන යම් කිසි පුද්ගලයකු එම සමාන වරද සඳහා වරදකරු වේ. |
| උ. අවම වසර 3කට සහ උපරිම වසර 15 ක් සඳහා අනිවාර්ය දඬුවමකට සහ දඩයකට යටත් වේ. |

*a.* මෙම පනත හරහා වින්දිතයින්ට වන්දි ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයන අතර එසේ වන්දි ගෙවීමට අපොහෙසත් වන්නේ නම් තවත් වසර 5ක් සඳහා වරදකරුව බන්ධනාගාර ගත කිරීමක් නියම කල හැකි ය.

*b.* මෙම වරද යටතේ චෝදනා ලැබ සිටින දේශිය මෙන්ම විදේශීය චූදිතයන් පිළිබඳ නඩු විභාග කිරීමේ බලය මහාධිකරණයට ලබා දී ඇත.

*c.* මෙම පනත හරහා වරදේ බරපතල බව තීව්‍රකරන අවස්ථාපිත සාධකයන්, වින්දිතයන්ගේ අයිතිවාසිකම් සහ සාර්ක් සම්මුතියේ දක්වා ඇති ආකාරයට කාන්තාවන් සහ ළමයින් වෙළඳම් කිරීමට එරෙහි සටන් කිරීම පිණිස විශේෂ පියවරයන් ගැනීමට අවශ්‍ය විධිවිධාන සපයනු ලබයි.

**දකුණු ආසියාවේ ළමා සුබසාධනය ප්‍රවර්ධනය කිරීම පිණිස කලාපීය විධිවිධාන සකස් කිරීම පිළිබඳ වන සාර්ක් සම්මුතිය**

මෙම සම්මුතිය කලාපයේ සිටින ළමයින්ගේ සුබසාධනය ඉහල නැංවීම සඳහා වන කැපවීමකි. මෙම සම්මුතියේ IVව්‍යවස්ථාවේ, 3 (අ) ඡේදය මඟින් තැනැත්තන් වෙළඳාම් කිරීමෙන් ළමයින් ආරක්ෂා කිරීම සඳහා අවශය වන නෛතික හා පරිපාලනමය යාන්ත්‍රණයන් සහ සමාජ ආරක්ෂණ ජාලයක් පවත්නා බවට තහවුරු කිරීම රාජ්‍ය පාර්ශවයන්ගෙන් අපේක්ෂා කරනු ලබයි.

## 4.13 තැනැත්තන් වෙළදාම් කිරීමට අදාල සෙසු කලාපීය ලේඛන

**සම්මුතීන්**

| |
|---|
| **අ. අප්‍රිකානු කාන්තාවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අප්‍රිකානු මානව සහ පුද්ගල අයිතිවාසිකම් පිළිබද ප්‍රඥප්තියට සබැඳි සංධානය** |
| මෙහි 4 වන ව්‍යවස්ථාව මගින් දක්වන්නේ කාන්තාවන්, තැනැත්තන් වෙළදාම් කිරීමට ලක්කිරීම වැළැක්වීමට සහ හෙළාදැකීම පිණිස, එකී වරදකරුවන්ට එරෙහිව නඩු පැවරීමට සහ අවධානමේ සිටින කාන්තාවන් ආරක්ෂා කිරීම පිණිස පාර්ශවකාර රාජ්‍යයන් විසින් සුදුසු සහ ඵලදායී පියවරයන් ගත යුතු බවයි. |
| **ආ. මානව හිමිකම් පිළිබද ඇමරිකානු සම්මුතිය** |
| වහල්භාවයෙන් නිදහස යන මාතෘකාවෙන් යුතු 6 වන ව්‍යවස්ථාව දක්වන්නේ<br>(1) කිසිදු තැනැත්තකු වහල්භාවයේ හෝ, වහල් වෙළදාම් සහ කාන්තාවන් වෙළදාම් කිරීම වැනි සියලු ම ආකාරයේ ක්‍රමවලින් තහනම් කළ ස්වේච්ඡා නොවන පරවශතාවයට යටත් නොකළ යුතු ය.<br>(2) කිසිදු තැනැත්තකු බලහත්කාරයෙන් හෝ අනිවාර්යෙන් සේවයේ යෙදීමට යටත් නොකල යුතු ය. |
| **ඇ. 2004 මානව හිමිකම් පිළිබද අරාබි ප්‍රඥප්තිය** |
| ප්‍රඥප්තිය සදහන් කරනු ලබන්නේ<br>(1) සියලු ම ආකාරයේ වහල්භාවයන් සහ තැනැත්තන් වෙළදාම් කිරීම් තහනම් වන අතර නීතියෙන් දඩුවම් කළ හැකි ය. කිසිදු පුද්ගලයකු කිසිදු අවස්ථාපිත සාධකයක් මත වහල්භාවයේ හෝ පරවශතාවයේ රදවා තබා ගත නොහැකි ය.<br>(2) බලහත්කාරයෙන් සේවයේ යෙදවීම, වෛශ්‍යා වෘත්තියේ යෙදවීම හෝ ලිංගික සූරාකෑමක් සදහා තැනැත්තන් වෙළදාම් කිරීම, වෙනත් අයෙකු වෛශ්‍ය වෘත්තියේ යොදවා සූරාකෑම හෝ වෙනත් යම් ආකාරයකින් සූරාකෑම, හෝ සන්නද්ධ අරගලයන් තුළ දී ළමයින් සූරාකෑමට ලක් කිරීම තහනම් වේ. |
| **ඈ. 2005 තැනැත්තන් වෙළදාම් කිරීමට එරෙහි ක්‍රියාවන් පිළිබද යුරෝපානු කවුන්සිලයේ සම්මුතිය** |
| මෙම සම්මුතිය තැනැත්තන් වෙළදාම් කිරිම වැළැක්වීම, වින්දිතයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ වරදකරුවන්ට නඩු පැවරීම යන ප්‍රධාන අරමුණු තුන මත පදනම් වී තිබේ. |
| **ඉ. 1999 ළමා අයිතිවාසිකම් සහ සුභසාධනය පිළිබද අප්‍රිකානු ප්‍රඥප්තිය** |
| මෙම ප්‍රඥප්තියේ 29 වන ව්‍යවස්ථාව පහත ද වැළැක්වීමට රාජ්‍ය පාර්ශවයන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව සදහන් කරයි:<br>(අ) දෙමාපියන් හෝ නීත්‍යානුකූල භාරකරුවන් ඇතුළු කවර හෝ තැනැත්තකු විසින්, කවර වූ අරමුණකට හෝ කවර වූ හෝ ආකාරයකින්, ළමයින් පැහැරගෙන යෑම, විකිණීම හෝ ළමයින් තැනැත්තන් වෙළදාම් කිරීමට ලක්කිරීම.<br>(ආ) සියලු ම ආකාරයේ සිගමන් යැදීම් සදහා ළමයින් යොදා ගැනීම |

**ප්‍රකාශනයන්**

a. තැනැත්තන්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමයින් වෙළදාම් කිරීමට එරෙහි ආසියාන් (ASEAN) ප්‍රකාශනය - 2004

*b.* අවිධිමත් හෝ ලේඛනගත නොවන සංක්‍රමණ පිළිබද බැංකොක් ප්‍රකාශනය - 1999

*c.* තැනැත්තන් වෙළදාම් කිරීම වැළැක්වීම සහ ඊට එරෙහිව සටන් කිරීම සම්බන්ධ බ්‍රසල්ස් ප්‍රකාශනය -2002

d. තැනැත්තන් වෙළදාම් කිරීමට එරෙහිව සටන් කිරීම පිළිබද බටහිර අප්‍රිකානු රාජ්‍ය ආර්ථික ප්‍රජාවේ ප්‍රකාශනය - 2001

e. කලාපීය ආරක්ෂාව පිළිබද නසොනිනි ප්‍රකාශනය-2002 (පැසිපික් දිවයින් සමුළුව) 2002

## පස්වැනි මොඩියුලය

| දේශීය නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව | | |
|---|---|---|
|  | දේශන පැය ගණන | 2 |
|  | ඇගයීම් ක්‍රමවේදය | පන්ති කාමර සාකච්ඡා |
| | අධ්‍යයන අරමුණු | මොඩියුලය අවසානයේ දී ශිෂ්‍යයන් හට,<br>• ළමුන් වෙළෙදාම් කිරීම පිළිබඳ අදාළ දේශීය ප්‍රතිපත්ති සහ නීතින් සම්බන්ධව අවබෝධය ලබාගැනීමට;<br>• කාර්යපටිපාටික නීතිය සහ එහි භාවිතය පිළිබඳ අවබෝධය ලබාගැනීමට;<br>• වින්දිතයන් වෙත පවතින ප්‍රතිකර්ම පිළිබඳ අවබෝධය ලබාගැනීමට හැකියාව හිමි වේ. |

### 5.1 ළමුන් වෙළෙදාම් කිරීම සම්බන්ධ දේශීය නීති සහ ප්‍රතිපත්ති

#### ජාතික ප්‍රතිපත්තිය

| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
|---|
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් තුළ නීති පැනවීම සහ රාජ්‍ය පරිපාලනය පිළිබඳ මූලධර්ම දක්වයි. මෙම මූලධර්ම රාජ්‍යය මත ප්‍රමිතීන් ඇති කිරීම සහ ප්‍රතිජානන යුතුකම් නියම කිරීම සිදුකරනු ලැබුව ද ඒවාට නීතිමය බලාත්මකභාවයක් ලබාදිය නොහැක.[58] දරුවන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ බොහෝ ප්‍රතිපත්ති හා යුතුකම් යොදා ගත හැකිය.<br>27(13) ව්‍යවස්ථාවෙහි විශේෂයෙන් දක්වන පරිදි, ළමයින් සහ යෞවනයන් කායික වශයෙන්, මානසික වශයෙන් සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සාමාජයික වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන බවට සහතික කිරීමටත්, ඔවුන් සූරාකෑම පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම්වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකිවන පරිදි ඔවුන්ගේ ශුභ සිද්ධිය රාජ්‍යය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතුව ප්‍රවර්ධනය කළ යුත්තේ ය. |
| **මානව හිමිකම් සුරැකීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම** (2017-2021) |
| 2017-2021 වසර සඳහා සකස් කරන ලද මානව හිමිකම් සුරැකීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) මානව හිමිකම් ක්ෂේත්‍රයේ ඉලක්කගත ක්‍රියාකාරකම් ලේඛනගත කරන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය; නීතිමය; ප්‍රතිපත්තිමය; සහ පරිපාලනමය රාමු තුළින් මානව හිමිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා වන ජාතික ක්‍රියාදාමයන් සහ යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීම අරමුණු කරයි.<br>මානව හිමිකම් සුරැකීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NHRAP) තේමාගත පරිච්ඡේද 10කින් සමන්විත වන අතර, ඉන් එක් පරිච්ඡේදයක් ළමුන්ගේ ආරක්ෂාව පිළිබඳ වෙන් කර ඇත. එම පරිච්ඡේදයෙහි ප්‍රධාන පරමාර්ථය වන්නේ ගුණාත්මකභාවය, ආරක්ෂාව සහ නැවත සමාජගත කිරීමේ සේවා ඇතුළත් අයිතිවාසිකම් පදනම් කරගත් ළමා ආරක්ෂණ ක්‍රමවේදයක් සකස් කිරීමයි. ජාවාරමට ගොදුරු වූවන්ට සහන සැලසීම සහතික කිරීම සඳහා ද මෙම සැලැස්ම විසින් රජය වෙත නියම කරයි. |

[58] 29 වන ව්‍යවස්ථාව

## ළමයින් වෙළෙඳාම් කිරීම වැළැක්වීම සඳහා පවතින අනෙකුත් ප්‍රතිපත්තීන්

ළමයින් වෙළෙඳාම් කිරීමට එරෙහිව පියවර ගැනීම සඳහා ඒ පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2017 සැප්තැම්බර් මස ජාතික මට්ටමින් දියත් කරන ලදී.

මෙම වැඩසටහන ඕස්ට්‍රේලියානු රජයේ මූල්‍ය අනුග්‍රහය මත ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක් වූ අතර එය අන්තර්ජාතික සංක්‍රමණ පිළිබඳ සංවිධානය සමඟ එක්ව අධිකරණ අමාත්‍යංශය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතියක කොටසකි. රූපවාහිනී දැන්වීම් හරහා සහ දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමින් රාජ්‍ය නිලධාරීන් මෙන්ම ප්‍රජාමූල සංවිධාන හරහා ජනාතව ද දැනුවත් කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

**කාන්තා ප්‍රඥප්තිය**

කාන්තා ප්‍රඥප්තිය 1993 මාර්තු මාසයේ දී සම්මත විය. මෙම ප්‍රඥප්තිය මඟින්, රාජ්‍යය විසින්, කාන්තාවන්ගේ පූර්ණ සංවර්ධනය හා අභිවර්ධනය සහතික කරනු පිණිස ව්‍යවස්ථා ප්‍රඥාපනය කිරීම ඇතුළු, විශේෂයෙන් ම දේශපාලන, සාමාජීය, ආර්ථික සහ සංස්කෘතික යන සියලු ම ක්ෂේත්‍රවල එනම්, කාන්තාවන්ට පුරුෂයන් හා සමාන පදනමක් මත මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස ක්‍රියාත්මක කිරීම හා භුක්ති විඳිම සහතික කරලීමේ කාර්යය සඳහා උචිත සියලු පියවර ගත යුතු බව දක්වයි.

**ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය**

1992 දී සම්මත කරන ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය අන්තර්ජාතික මානව හිමිකම් පිළිබඳ සම්මුතින්හි පිළිගත් අයිතිවාසිකම් නැවත අවධාරණය කරන අතර, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම කෙරෙහි දරුවන් කේන්ද්‍රගත වූ වැඩපිළිවෙලක් වෙත අවධානය යොමු කිරීම අනුමත කරයි. ඒ අනුව, ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මඟින්, *'ළමයින්ගේ සහ තරුණයන්ගේ ශාරීරික, මානසික, සදාචාරාත්මක, ආගමික සහ සමාජීය වශයෙන් පූර්ණ වර්ධනය සහතික කරනු පිණිස සහ සූරාකෑමෙන් සහ වෙනස්කම් දැක්වීමෙන් ඔවුන් ආරක්ෂා කරනු පිණිස රජය විසින් ළමයින්ගේ සහ තරුණයන්ගේ යහපත විශේෂ සැළකිල්ලකින් ප්‍රවර්ධනය කළ යුතු බවට අවධාරණය කරයි.'*

ප්‍රඥප්තියේ 33 වන ව්‍යවස්ථාව අනුව මද්‍යසාර, දුම්කොළ සහ දුම්කොළ නිෂ්පාදනවලින් ළමයින් ඈත් කිරීමට ව්‍යවස්ථාමය, පරිපාලන, සමාජ, සහ අධ්‍යාපන ක්‍රියාමාර්ග ඇතුළු සියළු උචිත ක්‍රියාමාර්ග රාජ්‍යය විසින් ගත යුතු බවට වගකීමක් පනවයි.

ප්‍රඥප්තියේ 3 වන ව්‍යවස්ථාව අනුව, **'දරුවාගේ උපරිම යහපත'** යන මූලධර්මයෙහි ඇති වටිනාකම හඳුනාගනිමින් ඒ පිළිබඳ දැඩි ලෙස අවධාරණය කරයි.

## දණ්ඩනීති සංග්‍රහය

ශ්‍රී ලංකාවේ අපරාධ නීතියේ මූලික හරයාත්මක නීතිය වන්නේ දණ්ඩනීති සංග්‍රහයයි.[59] 2018 ට පෙර වයස අවුරුදු 8 ට අඩු දරුවන් සියලු සාපරාධි වගකීම්වලින් නිදහස් වූ අතර මෑතකාලීනව දණ්ඩ නීති සංග්‍රහයට ගෙන ආ සංශෝධනය අනුව සාපරාධී වගකීම පැවරීමේ අවම වයස් සීමාව වයස අවුරදු 12 ලෙස ඉහළ නංවන කරන ලදී.[60] එමෙන් ම, යම් අවස්ථාවක දී තමාගේ හැසිරීමේ ස්වභාවය හා එහි ප්‍රතිඵල නිශ්චය කිරීමට ප්‍රමාණවත් ලෙස පැසුණු බුද්ධියක් නොලත් වයස අවුරුදු 12 කට වැඩි 14 කට අඩු ළමයකු කරනු ලබන කිසිවක් වරදක් නොවන බව දණ්ඩනීති සංග්‍රහය පිළිගනු ලබයි.[61]

1995 දී සහ 2006 දී දණ්ඩ නීති සංග්‍රහයට හඳුන්වා දුන් සංශෝධනවලට පෙර ළමයින් වෙළෙඳාම් කිරීමේ වරද: ස්ත්‍රී සැපයුම (1995 සංශෝධනයෙන් පසුව 'කුට්ටනය' යන වරද හඳුන්වාදෙනු ලැබීය)[62], අස්වාභාවික වැරදි[63], අපහරණය[64], පැහැරගෙන යාම[65], විවාහ වීමට බල කිරීම සඳහා කාන්තාවක් පැහැර ගැනීම[66] සහ වහල්භාවය[67] සම්බන්ධ පොදු ප්‍රතිපාදන මගින් ආවරණය විය.

එමෙන්ම, දණ්ඩනීති සංග්‍රහයේ සඳහන් අනෙකුත් ප්‍රතිපාදන වන: ස්ත්‍රී දූෂණය[68], අඩන්තේට්ටම් කිරීම[69], බලහත්කාරය[70], අසැබි පොත් ආදිය විකිණීම සහ බෙදාහැරීම[71] යන වැරදි ද මෙම ප්‍රතිපාදනවලට අතිරේකව හඳුනාගත හැක.

ගණිකා වෘත්තිය ඇතුළු සියලු ආකාරයේ සූරාකෑම් සඳහා පුද්ගලයින්, විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීමට එරෙහිව පිළියම් යෙදීම සඳහා 1995 දී[72] සහ 1998 දී[73]දණ්ඩ නීති සංග්‍රහයට හඳුන්වා දුන් සංශෝධන හරහා වැදගත් නෛතික ප්‍රතිසංස්කරණ සිදු කරන ලදී'.

තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරද නිශ්චිතව දක්වනු ලබන්නේ දණ්ඩ නීති සංග්‍රහයේ 360(ඇ) වගන්තිය තුළ ය. එම වගන්තියේ පැවති අපැහැදිලිතාවයන් හේතුවෙන් 2006 වසරේ දී එය දණ්ඩනීති සංග්‍රහයෙන් ඉවත් කර, පැලර්මෝ සංධානය සහ අනෙකුත් මානව හිමිකම් සම්මුති යටතේ ඇති වගකීම් අවධාරණය කරමින් තැනැත්තන් වෙළෙඳාම් කිරීම පිළිබඳ නව ප්‍රතිපාදනයක් හඳුන්වාදෙන ලදී.[74]

---

[59] 1883 අංක 02 දරන : සංශෝදිත*
[60] 75 වගන්තිය :2018 අංක 10 පනතින් සංශෝධිත*
[61] 76වගන්තිය :2018 අංක 10 පනතින් සංශෝධිත*
[62] 360(අ) වගන්තිය
[63] 365 වගන්තිය
[64] 350, 351, 352 වගන්ති
[65] 353 වගන්තිය
[66] 357 වගන්තිය
[67]361 වගන්තිය
[68]363 වගන්තිය
[69]342 වගන්තිය
[70]340 වගන්තිය
[71]285 වගන්තිය
[72]1995 අංක 22 දරන (සංශෝධන) පනත
[73]1998 අංක 29 දරන (සංශෝධන) පනත
[74]දණ්ඩනීති සංග්‍රහයේ තැනැත්තන් වෙළෙඳාම් කිරීම පිළිබඳ පැවති එකම පොදු විධිවිධානය වූයේ 360 ඇ.(1) (අ) වගන්තියයි. එය මුදල් හෝ වෙනත් සලකා බැලීමක් සඳහා පුද්ගලයන් මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරු කිරීම පිළිබඳව දක්වන ලදී. මෙම ක්‍රියාවන් සිදු කරනුයේ කුමන අරමුණක් සඳහා ද යන්න නිශ්චිතව දක්වා නොමැති වූ හෙයින්, පුළුල් පරාසයකට මෙම වගන්තිය අදාළ කිරීමට හැකි විය. මේ අනුව, මෙම කොටස පැහැදිලිව කියවීමෙන් පෙනී යන්නේ විවාහය, දරුකමට හදා ගැනීම, සූරාකෑමක් හෝ ජාවාරමක් ලෙස වෙනත් ඕනෑම කරුණක් සඳහා පුද්ගලයන් මිලදී ගැනීම හෝ හුවමාරු කිරීම 'තැනැත්තන් වෙළෙඳාම් කිරීම' යටතේ ආවරණය වන බවයි. කෙසේ වෙතත්, 360 ඇ (1) (ආ) වගන්තිය ස්වාධීනව කියැවිය හැකිද යන්න සම්බන්ධයෙන් ව්‍යාකූලතාවයක් ඇති වූ අතර, එය360 ඇ. වගන්තියේ (i) සිට (vi) දක්වා ඇති නීති විරෝධි දරුකමට හදාගැනීම පිළිබඳ ප්‍රතිපාදන සමග එක්ව කියවිය යුතු ද යන්න ප්‍රශ්නගත විය. පොදු එකඟතාවය වූයේ 360 ඇ (1) ආ වගන්තිය 360 ඇ (i) සිට (vi) දක්වා වගන්ති සමග එක්ව කියවිය යුතු බවයි. - *ළමයින් වෙළෙඳාම් කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය - 2002 අප්‍රේල්*

## 5.2. ළමුන් ද ඇතුලත්ව තැනැත්තන් වෙළෙඳාම් කිරිම

### 5.2.1. 2006 අංක 16 දරන දණ්ඩනීති සංග්‍රහ සංශෝධන පනත - 360(ඇ) (1) වගන්තිය

(අ) මුදල් හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා යම් තැනැත්තකු මිලදී ගන්නා, විකුණන හෝ හුවමාරු කරන නැතහොත් මිලදී ගැනීමට, විකිණීමට හෝ හුවමාරු කිරීමට වෙනත් තැනැත්තකු පොළඹවන නැතහොත් යම් තැනැත්තකු මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරු කිරීම සඳහා ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැලසීමට හෝ පෙළඹවීමට යම් දෙයක් කරන;

(ආ) බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම හෝ සේවය ලබාගැනීමේ, වහල්භාවයේ යෙදවීමේ, පරවශතාවයේ, ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ යෙදවීමේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා යොදාගැනීමේ කාර්ය සඳහා තර්ජනය කිරීමෙන්, බලහත්කාරයෙන්, වංචාවෙන්, රැවටීමෙන්, පෙළඹවීමෙන් හෝ වෙනත් තැනැත්තකුගේ පීඩාකාරී තත්ත්වයකින් අයුතු ප්‍රයෝජන ගැනීමෙන් යම් තැනැත්තකු බඳවාගන්නා, ප්‍රවාහනය කරන, ස්ථානමාරු කරන, ආරක්ෂාව සලසා දෙන, භාරගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදුකරන හෝ;

(ඇ) යම් ළමයකුගෙන් බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීමේ හෝ සේවය ලබාගැනීමේ, එම ළමයා වහල්භාවයේ යෙදවීමේ පරවශතාවය හෝ ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ කාර්ය සඳහා හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා එම ළමයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව එම ළමයා සේවයට බඳවා ගන්නා. ප්‍රවාහනය කරන, මාරු කරන, එම ළමයාට ආරක්ෂාව සලසා දෙන හෝ ළමයා භාර ගන්නා හෝ වෙනත් යම් නීතියක් යටතේ වරදක් වන ක්‍රියාවක් සිදු කරන තැනැත්තකු තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරද සිදුකරයි,

කවර හෝ තැනැත්තකු තැනත්තන් වෙළෙඳාම් කිරීමේ වරදට වරදකරු වන්නේ ය.

**ඔබ දැන සිටියා ද?**

තැනැත්තන් වෙළෙඳාම් කිරීමේ වරද සම්බන්ධයෙන් වරදකරු වන යම් තැනැත්තෙක් වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකිය; තවද ළමයකු සම්බන්ධයෙන් එම වරද සිදු කරනු ලබන අවස්ථාවක එම තැනැත්තා අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැකි ය.

**උක්ත වගන්තිය මගින් පහත යෙදුම් සම්බන්ධව සමාන අර්ථ නිරූපණ සපයනු ලබයි:**

- **බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩගැනීම යන්නට 358(අ) වගන්තිය සමාන අර්ථ දක්වයි.**
- **වහල්භාවයට පත් කිරීම යන්නට 358(අ) වගන්තිය තුළ සමාන අර්ථ දක්වයි.**
- **පහසුවෙන් අවදානමට ලක්විය හැකි තැනත්තන් සූරාකෑම, එවැනි පුද්ගලයෙකුගේ ආර්ථික, සංස්කෘතික හෝ වෙනත් තත්ත්වයන්ගෙන් ප්‍රයෝජන ගනිමින් ඕනෑම ක්‍රියාවකට යටත් වීමට පුද්ගලයෙකුට බල කිරීම යන්නට ද සමාන අර්ථ දක්වයි.**

| 360(ඇ) (1) වගන්තිය | |
|---|---|

(අ) මුදල් හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා යම් තැනැත්තකු මිලදී ගන්නා, විකුණන හෝ හුවමාරු කරන නැතහොත් මිලදී ගැනීමට, විකිණීමට හෝ හුවමාරු කිරීමට වෙනත් තැනැත්තකු පොළඹවන නැතහොත් යම් තැනැත්තකු මිලදී ගැනීම, විකිණීම හෝ හුවමාරු කිරීම සඳහා ප්‍රවර්ධනය කිරීමට පහසුකම් සැලසීමට හෝ පෙළඹවීමට යම් දෙයක් කරන තැනැත්තෙකු විසින් තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරද සිදු කරනු ලබයි.

**සිද්ධි අධ්‍යයනය 1**

රාණිට කොළඹ ගෘහ සේවිකාවක් ලෙස රැකියාවක් ලබා දෙන බවට නියෝජිතයකු පොරොන්දු වී ඇත. ඇය කොළඹට පැමිණි විට එම තැනැත්තා විසින් රාණි වෙනත් පුද්ගලයෙකුට විකුණයි. රාණි කොළඹ ගණිකා නිවාසයක රඳාවාතබා ඇත.

(ආ) බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම හෝ සේවය ලබාගැනීමේ, වහල්භාවයේ යෙදවීමේ, පරවශතාවයේ, ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ යෙදවීමේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ හෝ යම් නිතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා යොදාගැනීමේ කාර්ය සඳහා තර්ජනය කිරීමෙන්, බලහත්කාරයෙන්, වංචාවෙන්, රැවටීමෙන්, පෙළඹවීමෙන් හෝ වෙනත් තැනැත්තකුගේ පීඩාකාරී තත්ත්වයකින් අයුතු ප්‍රයෝජන ගැනීමෙන් යම් තැනැත්තකු බඳවාගන්නා, ප්‍රවාහනය කරන, ස්ථානමාරු කරන, ආරක්ෂාව සලසා දෙන, භාරගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදුකරන හෝ තැනැත්තෙකු විසින් තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරද සිදු කරනු ලබයි.

**සිද්ධි අධ්‍යයනය 2**

සීතා ඉතා දුප්පත් තැනැත්තියක් වන අතර ඇය සාප්පු හිමියෙකුට ණය වී සිටී. සාප්පු පාලකයා ඇයව පොලිසියට වාර්තා කරන බවට තර්ජනය කර ණය ගෙවන තුරු කිසිදු වැටුපක් හෝ විවේකයක් නොමැතිව වැඩ කිරීමට ඇයට බල කරයි.

(ඇ) යම් ළමයකුගෙන් බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීමේ හෝ සේවය ලබාගැනීමේ, එම ළමයා වහල්භාවයේ යෙදවීමේ පරවශතාවය හෝ ශරීර අංග ඉවත් කිරීමේ, වෛශ්‍යා වෘත්තියේ හෝ වෙනත් ආකාරයක අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ කාර්ය සඳහා හෝ යම් නීතියක් යටතේ වරදක් සංයුක්ත වන්නා වූ වෙනත් යම් ක්‍රියාවක් සඳහා එම ළමයාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව එම ළමයා සේවයට බඳවා ගන්නා. ප්‍රවාහනය කරන, මාරු කරන, එම ළමයාට ආරක්ෂාව සලසා දෙන හෝ ළමයා භාර ගන්නා හෝ වෙනත් යම් ක්‍රියාවක් සිදු කරන තැනැත්තෙකු විසින් තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරද සිදු කරනු ලබයි.

**සිද්ධි අධ්‍යයනය 3**

වයස අවුරුදු 16 දී සුනිල් නිවසින් පැන ගියේ නිවසේ ඇති වූ අයහපත් තත්ත්වය හේතුවෙනි. ප්‍රදේශයේ රැකියා ඒජන්සියක් ඔහුට අවන්හලක අර්ධකාලීන රැකියාවක්, නවාතැන් හා ආහාර ලබා දුන් අතර ඔහුට උදේ පාසලට යා හැකි බවට පොරොන්දු විය. සුනිල් ඊට එකඟ විය. ඔහු පැමිණි විට ඔහුට සතියේ දින 7ම වැඩිපුර පැය ගණනක් වැඩ කිරීමට සිදු වූ අතර ආහාර ලබාදුන්නේ අවම වශයෙන් ය. ඔහුට පාසැල් යාමට අවසර නොලැබුණි. ඔහු පැමිණිලි කළහොත් හෝ විවේක ගත් විට පහර දී වාචිකව අපයෝජනය කරනු ලැබීය. රාත්‍රියේ ඔහු කාමරයක සිර කර තබා තිබූ අතර ඔහුට කිසි තැනකට යාමට ඉඩ නොදුනි. ඔහු පලා යාමට උත්සාහ කළහොත් ඔහුව පොලිසියට වාර්තා කරන බවට ඔහුගේ සේවායෝජකයා තර්ජනය කළේ ය.

*ඔබ දැන සිටියාද?*

**වෙළෙඳාමට ගොදුරු වන තැනැත්තා දරුවකු වන විට, එම දරුවාගේ කැමැත්ත එහිදී වැදගත් නොවන බව.**

2005 අංක 30 දරණ ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීමේ සම්මුති පනත; (SAARC) අනුව ළමයින් වෙළෙඳාමේ යෙදීම යන යෙදුම පුළුල් ලෙස අර්ථනිරූපය කර ඇත. දණ්ඩ නීති සංග්‍රයේ මෙන්ම පැලර්මෝ සංධානයේ ද තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන්න අර්ථනිරූපණය තුළට ඇතුළත් නොවන ක්‍රියාවන් මෙම පනතෙහි ඇතුලත් වේ. මෙම පනත යටතේ ඕනෑම පුද්ගලයෙකු මිලට ගැනීම, විකිණීම හෝ හුවමාරු කිරීම වැනි, පුද්ගලයෙකු වෙළෙඳාම් කිරීමේ මාධ්‍යයන් පුළුල් ලෙස විග්‍රහ කරයි. මෙහිදී සූරාකෑම යන්නෙහි අරමුණ ද වඩාත් පුළුල් ලෙස විග්‍රහ කරනු ලබයි. නිදසුනක් වශයෙන් බලය අයුතු ලෙස භාවිතය හෝ අවදානම් සහගත තත්ත්වයි යන්න මිනිස් ජාවාරම් කිරීම හා සම්බන්ධිත ක්‍රියාවක් සිදුවීමට හේතුවන ක්‍රමයක් බවට වගන්තිය තුළ අන්තර්ගත කර නැත. තවද විවාහය සඳහා ළමයින් ප්‍රවාහනය කිරීම පැහැදිලිව ම ආවරණය නොකළ ද, එම වරදෙහි අර්ථ දැක්වීම තුළ අනිවාර්ය වැඩගැනීම හෝ සේවා ලබාගැනීම, වහල්භාවය, පරවශ්‍යතා හෝ වෙනත් ආකාරයේ ලිංගික සූරාකෑම් වැනි ක්‍රියාවන් ආවරණය කරනු ලබයි.

### 5.2.2. 2005 අංක 30 දරණ ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීමේ සම්මුති පනත[75](*SAARC*- සාක් සම්මුතිය)

පුද්ගල ජාවාරම මැඩපැවැත්වීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ සංශෝධනවලට අමතරව, සාර්ක් සම්මුතිය යටතේ ඇති වගකීම් ඉටු කිරීම සඳහා 2005 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකා රජය විසින් මෙම පනත සම්මත කරන ලදී.

**2005 අංක 30 දරණ ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීමේ සම්මුති පනත**
කාන්තාවන් සහ ළමුන් ජාවාරම වැළැක්වීම, වෙළඳාමට ගොදුරු වූ තැනැත්තන් උද්ර්පණය සහ පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සලසයි.

තවද, සාපරාධී කාරණාවල දී අන්‍යොන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත[76] යටතේ පොදුරාජ්‍ය මණ්ඩලීය රටවල් සහ පොදුරාජ්‍ය මණ්ඩලීය නොවන රටවල් සමඟ රජය විසින් ගිවිසුම්වලට එළඹ ඇති අතර, දේශසීමා අතර සිදුවන ජාවාරම් පිළිබඳ විමර්ශනය සහ නඩු පැවරීමේ දී එය ශක්තිමත් සාධකයකි..

**පනත මඟින් පහත සඳහන් විධිවිධාන සපයයි:**

ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් වෙළෙඳාම් කිරීමේ වරද පනත අර්ථ දක්වන්නේ පහත පරිදි ය:

- *ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් හා ළමුන් වෙළෙඳාම් කිරීම හෝ ඊට සම්බන්ධ ඕනෑම කාරණයක් සඳහා*
- *මූල්‍යමය කටයුතුවල නියැලී සිටින, දැනුවත්ව ඉඩ දෙන හෝ කුලියට දෙන, දැනුවත්ව මුදල් නඩත්තු කරන, හෝ කළමනාකරණය කරන*
- *ගොඩනැගිල්ලක් හෝ වෙනත් ස්ථානයක් නඩත්තු කරන*

*ඕනෑම පුද්ගලයෙක් ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් හා ළමුන් වෙළෙඳාම් කිරීමේ වරදට වරදකරු වේ* ඉහත සඳහන් දේ කිරීමට තැත් කරන, ආධාර කරන හෝ අනුබල දෙන හෝ කුමන්ත්‍රණය කරන ඕනෑම පුද්ගලයෙකු ද එම වරද ම සිදුකරයි. එවැනි තැනැත්තෙකු අවම වසර 3ක සහ උපරිමය වසර 15ක අනිවාර්ය සිරදඬුවමකට සහ දඩයකට යටත් විය යුතු ය.

**මිනිස් ජාවාරමට ගොදුරු වූවන්ට අයිතිවාසිකම් ඇති බව ඔබ දැන සිටියාද?**

[75] 2005 අංක 30 දරන
[76] 2002 අංක 25 දරන

a) ජාවාරමට ගොදුරු වූ තැනැත්තාට වන්දි ගෙවීම සඳහා ද මෙම පනත මගින් විධිවිධාන සලසා ඇති අතර වන්දි ගෙවීමට අපොහොසත් වන්නේ නම් වැරදිකරුට තවත් වසර 5 ක අමතර සිරදඬුවම් නියම කිරීමේ හැකියාව පවතී.

b) වරද සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින දේශීය මෙන්ම විදේශීය තැනැත්තන්ට එරෙහිව නඩු විභාග කිරීමේ බලය මහාධිකරණයට ලබා දී ඇත.

c) සාර්ක් සම්මුතියේ දක්වා ඇති පරිදි ජාවාරම්වලට ගොදුරු වූවන්ගේ අයිතිවාසිකම් සහ ගණිකා වෘත්තියේ යෙදවීම සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීම සඳහා ගත යුතු විශේෂ ක්‍රියාමාර්ග මෙම පනතින් තවදුරටත් දක්වයි.



**ඉගෙනුම් මෙවලම්**

**අභ්‍යාසය**

1. 360(ඇ) වගන්තියේ තැනැත්තන් වෙළෙඳාම් කිරීම යන වරදේ අංගයන් මොනවද යන්න සහ ඒවායේ අදාළත්වය පිළිබඳ ඔබට ලබා දී ඇති සිද්ධියේ/නඩුවේ සිද්ධිමය සාධක සමග සාකච්ඡා කරන්න.
2. ඔබ සතුව ඇති ඕනෑම සිද්ධියක් ආශ්‍රයෙන් සිද්ධි අධ්‍යයනයක් සකස් කරන්න.
3. තැනැත්තන් වෙළෙඳාම් කිරීම සහ කුට්ටනය යන වරදවල් අතර පවතින සමානතා සහ වෙනස්කම් සාකච්ඡා කරන්න.

4. මිනිස් වෙළඳාමට පහත සඳහන් දේ අතුරින් අදාල වන්නේ මොනවාද?[77]

| | |
|---|---|
| 1. අන්තර්ජාතික දේශසීමා නිත්‍යානුකූල ලෙස තරණය කිරීම | |
| 2. අන්තර්ජාතික දේශසීමා නිත්‍යානුකූල නොවන ලෙස තරණය කිරීම | |
| 3. ප්‍රවාහන වියදම් පියවන තුරු ශ්‍රමිකයන් විසින් වැටුප් රහිතව වැඩ කිරීම | |
| 4. විදේශ ගමන් බලපත්‍රය හෝ හැඳුනුම්පත් ලබා ගැනීම | |
| 5. ප්‍රචණ්ඩත්වය සහ අපයෝජනය | |
| 6. අභ්‍යන්තර සංක්‍රමණ | |
| 7. වහල්භාවය | |
| 8. විදේශගතව ස්වේච්ඡාවෙන් ම ලිංගික සේවා සැපයීම | |
| 9. සිරගත කිරීම | |
| 10. හුදකලා කිරීම | |

5. මිනිස් ජාවාරම පිළිබඳ පැලර්මෝ සංධානයේ අර්ථ දැක්වීමේ ඇති සියලු ම පද රවුම් කරන්න:[78]
'ලිංගික සූරාකෑම', 'අපහරණය', 'අඩන්තේට්ටම් කිරීම', 'ණයගැතිභාවය', 'බියගැන්වීම', 'අවදානම්සහගත තත්ත්වය', 'ව්‍යාජ විශ්වාසය', 'සංවිධානාත්මක අපරාධ', 'පරවශතා', 'වහල්භාවය', 'වරාය', 'ජාවාරම', 'ගණිකා වෘත්තිය', 'ශ්‍රමය සූරාකෑම', 'නූතන වහල් සේවය', 'ළමා කාමුක දර්ශන', 'අවයව ඉවත් කිරීම', 'ප්‍රවාහනය', 'බියගැන්වීම', 'වංචාව', 'බඳවා ගැනීම', 'දේශසීමා තරණය', 'හුවමාරුව', 'බලය භාවිතා කිරීම', 'බලය අවභාවිතය'

[77] Trafficking training Modules (International Organization for Migration Management, 7 Hill Street, Dublin < http://iomireland.ie/wp-content/uploads/2016/04/Train-the-Trainer-Manual-Original.pdf>
[78] එම.

### 5.2.3. තැනැත්තන් වෙළෙඳාම් කිරීම සම්බන්ධව දණ්ඩ නීති සංග්‍රහයේ වෙනත් විධිවිධාන

| වගන්තිය | වරදේ ස්වභාවය | දණ්ඩනය |
|---|---|---|
| 286 අ(1)<br>**ළමයින්ට අදාළව කරනු ලබන අසභ්‍ය පළකිරීම් ප්‍රදර්ශනය ආදිය**<br> | (අ) යම් අසභ්‍ය හෝ අශ්ශීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක පෙනී සිටීමට හෝ රඟපෑමට හෝ, යම් අසභ්‍ය හෝ අශ්ශීල ඡායාරූපයක හෝ චිත්‍රපටයක රූගත කරනු ලැබීමට, එහි නිරූපණයක් කිරීමට හෝ පෙනී සිටීමට යම් ළමයකු කුලියට ගන්නා හෝ සේවයෙහි නියුක්ත කරන, එහිලා උපකාර කරන, ඒ සඳහා කැමති කරවගන්නා, යොදවන, පොළඹවන, හෝ බලකරන, හෝ එවැනි ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් විකුණන හෝ බෙදාහරින නැතහොත් අන්‍යාකාරයකින් පළ කරන හෝ තමා සන්තකයෙහි තබාගන්නා කවර හෝ තැනැත්තකු, හෝ | අවුරුදු දෙකකට නොඅඩු හා අවුරුදු දහය නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් ද දඬුවම් කරනු ලැබිය හැක. |
| | (ආ) ළමයෙකුගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු, භාරකරුවකු හෝ ඒ ළමයාගේ භාරකාරත්වය දරන තැනැත්තෙකුව සිටිමින්, යම් අසභ්‍ය හෝ අශ්ශීල ප්‍රදර්ශනයක හෝ දර්ශනයක සේවයෙහි නියුක්ත කිරීමට හෝ එවැන්නකට සහභාගී වීමට හෝ (අ) ඡේදයෙහි සඳහන් අන්දමේ යම් ඡායාරූපයක හෝ චිත්‍රපටයක රූගත කරනු ලැබීමට, නිරූපණය කිරීමට හෝ පෙනීසිටීමට ඒ ළමයාට සලස්වන හෝ ඉඩ දෙන කවර හෝ තැනැත්තකු, හෝ<br><br>(ඇ)<br>i. ළමයකුගේ යම් අශ්ශීල ඡායාරූපයක් ගනු ලබන හෝ ගනු ලැබීමට උපකාර කරන කවර හෝ තැනත්තකු,<br>ii. එවැනි ඡායාරූපයක් බෙදාහරින හෝ පෙන්වන හෝ එවැනි යම් ඡායාරූපයක් සහිත යම් පළකිරීමක් බෙදාහරින හෝ පෙන්වන කවර හෝ තැනැත්තකු,<br>iii. එවැනි යම් ඡායාරූපයක් හෝ පළකිරීමක් බෙදාහැරීම සඳහා හෝ පෙන්වීම සඳහා තමා සන්තකයේ තබාගෙන සිටින කවර හෝ තැනැත්තකු,<br>iv. එවැනි ඡායාරූපයක් පළ කරන හෝ පළ කිරීමට සලස්වන හෝ යම් ප්‍රචාරක දැන්වීමක් පළ කරන්නා හෝ ඒ ප්‍රචාරක දැන්වීමෙහි නම් කර ඇති තැනැත්තා එවැනි යම් ඡායාරූපයක් හෝ පළකිරීමක් බෙදාහරින නැතහොත් පෙන්වන තැනැත්තකු හෝ එසේ කිරීමට අදහස් කරන තැනත්තකු ය යන පණිවිඩය දීමට හැකි වන ආකාරයේ යම් ප්‍රචාරක දැන්වීමක් පළ කරන හෝ පළ කිරීමට සලස්වන කවර හෝ තැනැත්තකු,<br><br>ළමයින්ට අදාළව අසභ්‍ය පළ කිරීම් සහ ප්‍රදර්ශනය පිළිබඳ වරද සිදුකරයි | |

| | | |
|---|---|---|
| | | |
| **286 අ (2)** | (2) විකාශනය සඳහා තමාට භාරදෙන ලද යම් ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් ළමයකුගේ අසභ්‍ය හෝ අශ්ශීල ඡායාරූපයක් හෝ චිත්‍රපටයක් බව, ඡායාරූප හෝ චිත්‍රපට විකාශකයකු වන යම් තැනැත්තකු විසින් සොයාගනු ලැබීමේ දී, ඒ තැනැත්තා විසින් නොපමාව ම ඔහුගේ සන්තකයේ එම ඡායාරූපය හෝ චිත්‍රපටය තිබෙන බව ළඟම පොලිස් ස්ථානය භාර නිලධාරියාට දැන්විය යුතු ය. | වගන්තියේ දැක්වෙන විධිවිධාන කඩකරමින් ක්‍රියාකරන ඡායාරූප හෝ චිත්‍රපට විකාශකයකු වන කවර හෝ තැනැත්තක් අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකින් බන්ධානාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එම දඬුවම් දෙකෙන් ම හෝ දඬුවම් කළ හැක. |
| | | |
| **286 ආ**<br>**ළමයකු ලිංගික අපයෝජනය කිරීම වැළැක්වීමට පරිගණක මගින් සේවා සපයන තැනැත්තකුගේ කාර්යය** | (1) පරිගණකයක් මගින් සේවා සපයන තැනැත්තකු විසින් ළමයකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා එම පරිගණක පහසුකම භාවිතා නොකරන බවට සහතික වීම පිණිස අවශ්‍ය සියලු පියවර ගත යුතුය.<br>(2) ළමයකු ලිංගික අපයෝජනය කිරීම සම්බන්ධයෙන් වරදක් සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා (1) උප වගන්තියේ සඳහන් යම් පරිගණක පහසුකමක් භාවිත කරනු ලබන බවට තමා දන්නා (1) වන උප වගන්තියේ සඳහන් තැනත්තකු විසින් ආසන්නත ම පොලිස් ස්ථානයේ ස්ථාන භාර නිලධාරීයා වෙත එම ක්‍රියාවට අදාළව එම කරුණ පිළිබඳව වහාම දැනුම් දී එම ක්‍රියාව සම්බන්ධයෙන් සහ උද්දේශිත වරදකරුගේ අනන්‍යතාවය ද සම්බන්ධයෙන් තමා සතු තොරතුරු එම නිලධාරියා වෙත හෙළි කරනු ලැබිය යුතු ය. | එම වගන්තිවල විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ එම දඬුවම් දෙකට ම හෝ යටත් කළ හැක. |
| | | |
| **286 ඇ**<br>**ළමා අපයෝජනය සඳහා පරිශ්‍රයක් භාවිතා කරන බවට දැනුම් දීමට ඇති කාර්යභාරය** | (1) ළමයකු අපයෝජනය කිරීම සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා යම් පරිශ්‍රයක් භාවිතා කරමින් සිටින බවට දැනගැනීමට ලැබෙන එම පරිශ්‍රය භාරව සිටින හෝ එම පරිශ්‍රයට රැකවරණය ලබාදෙන, එය පාලනය කරන හෝ එහි සන්තකය දරන යම් තැනැත්තෙක් එසේ දැනගැනීමට ලැබුණු විට එම කරුණ පිළිබඳව ආසන්නත ම පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධාරියා වෙත වහාම දැනුම්දිය යුතු ය. | එම වරදට වරදකරුවකු වූ අයකු අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ එම දඬුවම් දෙකට ම හෝ යටත් කළ හැක. |

| | | |
|---|---|---|
| | (2) ළමයකු අපයෝජනය කිරීම සංයුක්ත වන ක්‍රියාවක් සිදු කිරීම සඳහා යම් පරිශ්‍රයක් භාවිතා කරනු ලබන බව ආසන්නතම පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධාරියා වෙත දැනුම් දීම පැහැර හරින යම් තැනැත්තෙකු එම වරදට වරදකරුවකු වන්නේ ය. | |

| | | |
|---|---|---|
| **288**<br>**ළමයින් සිඟාකෑමට සැලැස්වීම හෝ කුට්ටනය** | සිඟාකෑමේ හෝ දන් ලැබීමේ හෝ දන් දීමට පෙළඹවීමේ කාර්යය සඳහා (යම් සිංදු කීමේ, ක්‍රීඩා කිරීමේ, රංගනයේ යෙදීමේ, යම් දෙයක් විකිණීමට ඉදිරිපත් කිරීමේ හෝ වෙනත් ආකාරයක ව්‍යාජයක් ඇතත් නැතත්) යම් වීදියක්, ස්ථානයක හෝ තැනක සිටීමට ළමයකුට සලස්වන හෝ කුට්ටනය කරන කවර හෝ තැනැත්තෙකු මෙම වරද සිදුකරයි. | අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් ද දඬුවම් කළ හැක. |
| | | |
| **308 අ**<br>**ළමයින් කෲරත්වයට භාජනය කිරීම**<br> | වයස අවුරුදු දහඅටකට අඩු යම් තැනැත්තකුගේ භාරකාරත්වය, භාරය හෝ ආරක්ෂකත්වය දරාසිටිමින්, ඒ තැනැත්තාට වේදනාවක් හෝ ඔහුගේ සෞඛ්‍යයට හානියක් සිදුවිය හැකි ආකාරයට (ඇස් පෙනීමට හෝ කන් ඇසීමට හෝ ශරීරයේ අවයවයකට හෝ ඉන්ද්‍රියකට සිදුකරන යම් තුවාලයක් හෝ ඇස්පෙනීමෙහි ලා හෝ කන් ඇසීමෙහි ලා සිදු කරන ලද යම් හානියක් හෝ යම් මානසික ව්‍යාකූලතාවයක් ඇතුළුව) ඕනෑකමින් ම ඒ තැනැත්තාට අඩන්තේට්ටම් කරනු ලැබීමට, හිංසා කරනු ලැබීමට නොසලකාහරිනු ලැබීමට හෝ අතරමං කරනු ලැබීමට සලස්වන හෝ කුට්ටනය කරන කවර හෝ තැනැත්තෙක් ළමයින් කෲරත්වයට භාජනය කිරීමේ වරද සිදු කරයි. | අවුරුදු දෙකකට නොඅඩු අවුරුදු දහයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කරනු ලැබිය යුතු අතර දඩයකින් ද දඬුවම් කළ හැකිය. ඒ තැනැත්තාට සිදු කරන ලද හානි වෙනුවෙන් අධිකරණය විසින් නියම කරනු ලබන වන්දියක් ගෙවන ලෙසට ආඥා කළ හැකි ය. |
| | | |
| **358 අ**<br>**ණය බැඳුම්කරයට හෝ දාසභාවයට පත් කිරීම බලහත්කාරයෙන් හෝ අනිවාර්යයයෙන් වැඩ ගැනීම වහල්කමට භාජනය කිරීම හෝ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම.** | (අ) යම් තැනැත්තකු ණය බැඳුම්කරයට හෝ දාසභාවයට පත්කරවන හෝ එසේ පත්කරවීමට සලස්වන,<br><br>(ආ) යම් තැනැත්තකු බලහත්කාරයෙන් හෝ අනිවාර්යයයෙන් වැඩගැනීමට යටත් කරවන හෝ එසේ යටත් කිරීමට සලස්වන,<br><br>(ඇ) යම් තැනැත්තකු වහල්කමට භාජනය කරවන හෝ එසේ භාජනය කිරීමට සලස්වන, | (අ), (ආ), (ඇ) ඡේද යටතේ වරදකට වරදකරුවකු වන තැනත්තකු අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හා දඩයකට ද (අ), (ආ), (ඇ) ඡේද යටතේ ළමයකුට අදාලව |

| | | |
|---|---|---|
|  | (ඈ) සන්නද්ධ අරගලයක යෙදවීම සඳහා යම් ළමයකු යොදාගන්නා හෝ බඳවාගන්නා තැනත්තෙක් මෙම වරදට වරදකරු වේ. | හෝ (ඈ) ඡේදය යටතේ වරදක් සිදු කරන අවස්ථාවක අවුරුදු තිහක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාකාරගත කිරීමකට සහ දඩයකට ද යටත් කළ හැක. |

| | | |
|---|---|---|
| **360 ආ (1)**<br>**ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම**<br> | (අ) යම් ළමයකු ලිංගික අපයෝජනය කිරීම සඳහා කවර හෝ ලිංගික ක්‍රියාවකට හෝ යම් අසභ්‍ය හෝ අශ්ශීල ප්‍රදර්ශනයකට නැතහොත් දර්ශනයකට ළමයකු සහභාගී කරවාගැනීම සඳහා යම් පරිශ්‍රයක රැඳී සිටීමට දැන දැන ම ඒ ළමයාට ඉඩ දෙන,<br>(ආ) ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වුවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයකු කුට්ටනය කරන්නකු,<br>(ඇ) මුද්‍රණ මාර්ගයෙන් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයකින් හෝ වාචිකව කරනු ලබන ප්‍රචාරක දැන්වීම මගින් හෝ වෙනත් සමාන මාර්ගයකින් ලිංගික සංසර්ගය සඳහා හෝ කවර වූව ද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා හෝ ළමයකුගේ සේවාදායකයකු වීමට යම් තැනැත්තකු පොළඹවන,<br>(ඈ) ළමයකු කෙරෙහි තමා දරන වගකීම් බලපෑම් හෝ ළමයකු විෂයෙහි තමාට ඇති ඥාති සම්බන්ධතාවය ඒ ළමයා ලිංගික සංසර්ගයේ යෙදවීම හෝ කවර වූවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා කුට්ටනය කිරීම පිණිස ප්‍රයෝජනයට ගන්නා,<br>(ඉ) ළමයකු ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ කවර වූවද ආකාරයක ලිංගික අපයෝජනය සඳහා ඒ ළමයා කුට්ටනය කිරීම පිණිස ඒ ළමයාට තර්ජනය කරන හෝ සාහසිකත්වය පාන,<br>(ඊ) යම් ළමයකු ලිංගික සංසර්ගයේ යෙදවීමේ හෝ කවර වූ ආකාරයක ලිංගික අපයෝජනය සඳහා වූ චේතනාවෙන් යුතුව ඒ ළමයාට හෝ ඔහුගේ දෙමව්පියන්ට මුදලින් ප්‍රතිඡ්ඨාවක් භාණ්ඩ හෝ වෙනත් ප්‍රතිලාභ ලබාදෙන,<br>තැනැත්තකු ළමයින්ගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වරද සිදුකරයි. | අවුරුදු පහකට නොඅඩු අවුරුදු විස්සක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හා දඩයකින් ද දඬුවම් කළ හැක. |
| | | |

| | | |
|---|---|---|
| **360 ඈ**<br>**දරුකමට හදාගැනීම සම්බන්ධ වැරදි**<br> | ළමයකු දරුකමට හදාගැනීමේ කාර්යය සඳහා -<br>(i) යම් තැනැත්තකුගේ දෙමාපියන්ගෙන් කෙනෙකුගෙන් හෝ නෛතික භාරකාරයාගේ කැමැත්ත නොමැතිව යම් විදේශ රටකට ගමන් කිරීම සඳහා එම ළමයාට කටයුතු සලස්වා දෙන හෝ ආධාර කරන<br>(ii) යම් ගර්භනී කාන්තාවකගේ නූපන් ළමයා දරුකමට හදාගැනීම සඳහා මුදල්වලට හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා එම ගර්භනී කාන්තාවගේ ලිඛිත හෝ වාචික කැමැත්ත ලබාගන්නා<br>(iii) ළමයින් දැරීමේ කාර්යය සඳහා කාන්තාවක් හෝ අඹුසැමි යුවලක් බඳවා ගන්නා;<br>(iv) උපත් ලියාපදිංචි කිරීම සම්බන්ධ තැනැත්තකු විසින් උපත් ලියාපදිංචි කිරීම සඳහා භාවිතා කරන ලේඛනයක් හෝ එම ලේඛනයේ අන්තර්ගත යම් උප්පැන්න වාර්තා ව්‍යාජ ලෙස වෙනස් කිරීමට අවසර දෙන<br>(v) මුදල් හෝ වෙනත් ප්‍රතිෂ්ඨාවක් සඳහා රෝහල්වලින්, කාන්තා නිවාසවලින්, සායනවලින්, ළදරු පාසල්වලින්, දිවා සුරැකුම් මධ්‍යස්ථානවලින්, ළමා මධ්‍යස්ථානවලින් ළමයින් කුට්ටනය කිරීමේ නියැලී සිටින හෝ ළමයාගේ මවට හෝ වෙනත් තැනැත්තකුට තර්ජනය කිරීමෙන් දරුකමට හදාගැනීම සඳහා එම ආයතනයෙන් හෝ මධ්‍යස්ථානයෙන් ළමයා කුට්ටනය කරන<br>(vi) ළමයාගේ මව ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටින හෝ එසේ පෙනී සිටීමට උපකාරී වන මෙම වරදට වරදකරු වේ. | අවුරුදු විස්සක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් නැතහොත් එම දඬුවම් දෙකට ම යටත් කළ හැක. |
| | | |
| **360 ඉ**<br>**ළමයකු පොළඹවාගැනීමට ඇවිටිලි කිරීම** | ළමයකු ලිංගික අපයෝජනය කිරීම සඳහා<br>(අ) අවුරුදු දහඅටට අඩු තැනැත්තෙක් හෝ<br>(ආ) අවුරුදු දහඅටට අඩු තැනැත්තකු බවට විශ්වාස කරන තැනැත්තකු<br><br>ශ්‍රී ලංකාව තුළ දී හෝ පිටත සිට කවර හෝ ආකාරයකින් පොළඹවා ගැනීමට ඇවිටිලි කරන කවර හෝ තැනැත්තකු ළමයකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීමේ වරද සිදු කරයි. | අවුරුදු දහයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට නැතහොත් එම දඬුවම් දෙකට ම යටත් කළ හැක. |
| | | |
| **365 ආ**<br>**බරපතල ලිංගික අපයෝජනය** | (1) ලිංගික තෘප්තිය ලබාගැනීම සඳහා ලිංගේන්ද්‍රිය හෝ මිනිස් ශරීරයේ වෙනත් යම් කොටසක් හෝ යම් උපකරණයක් හෝ වෙනත් යම් තැනැත්තකුගේ ශරීරයේ පිහිටි යම් විවරයක් තුළ හෝ ඒ වෙනත් තැනැත්තාගේ ශරීරයේ යම් කොටසක් පාවිච්චි කිරීමෙන් පහත විස්තරවල ඇතුලත් පරිවේෂණ යටතේ, | බරපතල ලිංගික අපයෝජනය සිදුකරන තැනැත්තකුට අවුරුදු හතකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූද |

| | | |
|---|---|---|
| | (අ) ඒ අනෙක් තැනැත්තාගේ කැමැත්ත නොමැතිව,<br><br>(ආ) බලහත්කාරය පාවිච්චි කිරීමෙන්, තර්ජනය කිරීමෙන්, හෝ බියගැන්වීමෙන් ඒ අනෙක් තැනැත්තාට මරණ භය හෝ තුවාල සිදුකිරීමේ භය ඇති කිරීමෙන් හෝ ඒ අනෙක් තැනැත්තා නීතිවිරෝධී ලෙස රඳවාගෙන සිටිය දී හෝ ඒ තැනැත්තාගේ කැමැත්ත ලබාගෙන ඇති අවස්ථාවක එසේ ලබාගත් කැමැත්ත ඇතිව<br><br>(ඇ) අනෙක් තැනැත්තා සිහි විකලව සිටිය දී හෝ මද්‍යසාර නැතහොත් මත් ද්‍රව්‍ය මගින් ඇති කරන ලද මත් අවස්ථාවක ඒ අනෙක් තැනැත්තා සිටිය දී එසේ ලබාගත් කැමැත්ත ඇතිව<br><br>363 වගන්තිය යටතේ ස්ත්‍රී දූෂණය යටතේ සංයුක්ත නොවන යම් ක්‍රියාවක් කරන තැනැත්තෙක් බරපතල ලිංගික අපයෝජනය සිදු කරයි. | කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධානාගාරගත කිරීමකින් හා දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු අතර වරද සිදු කරන ලද තැනැත්තා වෙනුවෙන් අධිකරණය නියම කරන ලද වන්දි මුදලක් ගෙවීමට ආඥා කළ හැකි ය.<br>වයස් අවුරුදු දහඅටකට අඩු තැනැත්තෙකුට බරපතල ලිංගිත අපයෝජනය සිදු කරන අයකු අවුරුදු දහයකට නොඅඩු වූ ද අවුරුදු විස්සක් නොඉක්මවන්නා වූ ද කාලයකට බරපතල වැඩ ඇතිව බන්ධානාගාරගත කිරීමකින් හා දඩයකින් ද දඬුවම් කරනු ලැබිය යුතු අතර වරද සිදු කරන ලද තැනැත්තා වෙනුවෙන් අධිකරණය නියම කරන ලද වන්දි මුදලක් ගෙවීමට ආඥා කළ හැකි ය. |
| | | |
| **365 ඇ**<br>**ඇතැම් වැරදිවලට අදාළ කරුණු පළ කිරීම.** | 345, 360(අ), 360(ආ), 363, 364(අ), 365, 365(අ), 365(ආ) වගන්ති යටතේ වූ වරදකට 'ගොදුරු වූ තැනැත්තුගේ' නම හෝ අනන්‍යතාවය හෝ එළිදරව් කරන තැනැත්තකු මෙම වරද සිදු කරයි. | අවුරුදු දෙකක් දක්වා දීර්ඝ විය හැකි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධානාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එම දඬුවම් දෙකින් ම දඬුවම් කළ හැක. |

**කුට්ටනය**
**දණ්ඩනීති සංග්‍රහයේ 360(අ) වගන්තිය**

1) කවර වූවද වයසක සිටින පුරුෂ හෝ ස්ත්‍රී යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ගණිකාවක් බවට පත් කිරීමට, කුට්ටනය කරන හෝ තැත්තකරන
2) ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු සමග අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදීම අරමුණු කොටගෙන වයස අවුරුදු දහසයට අඩු තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාව හැර යාමට කුට්ටනය කිරීම හෝ කුට්ටනය කිරීමට තැත් කරන එකී කාර්යය සඳහා එවැනි යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන,
3) කවර වුව ද වයසක සිටින, යම් තැනැත්තකු අන්‍ය දේශයක ගණිකා නිවාසයක නේවාසිකයකු හෝ ගණිකා නිවාසයක ගැවසෙන්නකු බවට පත් කිරීමේ චේතනාවෙන් (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ඒ තැනැත්තාට ශ්‍රී ලංකාව හැරයාමට කුට්ටනය කිරීමට තැත්තකරන හෝ එවැනි කාර්යයකට යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් ඉවත් කරන හෝ ඉවත් කිරීමට තැත් කරන,
4) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් තැනැත්තකු සමග අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදීම අරමුණු කොට ගෙන වයස අවුරුදු දහසයට අඩු යම් තැනැත්තකු ශ්‍රී ලංකාවට ගෙන එන හෝ ගෙන ඒමට තැත් කරන,
5) ගණිකා වෘත්තිය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත හෝ ගණිකා නිවාසයක නේවාසිකයකු හෝ ගණිකා නිවාසයක ගැවසෙන්නකු බවට පත්කිරීමට කවර වුව ද වයසක සිටින, යම් තැනැත්තකු (ඒ තැනැත්තාගේ කැමැත්ත ඇතිව හෝ නැතිව) ශ්‍රී ලංකාවේ ඒ තැනැත්තාගේ සුපුරුදු වාසස්ථානය අතැර යාමට කුට්ටනය කරන හෝ තැත්කරන,
6) යම් තැනැත්තකු අයුතු ලිංගික සංසර්ගයෙහි යෙදවීම හෝ ලිංගික අපචාරයකට පාත්‍ර කිරීම අරමුණුකොට ගෙන ඒ තැනැත්තාගේ කැමැත්ත නොමැතිව යම් ගණිකා නිවාසයක රඳවා ගන්නා,

යම් තැනැත්තකු 'කුට්ටනය' කිරීමේ වරද සිදු කරයි.

*දඬුවම*

කුට්ටනය කිරීමේ වරදට වරදකරුවකු වූ තැනැත්තකු අවුරුදු දෙකකට නොඅඩු අවුරුදු දහයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධානාගාරගත කිරීමකින් හා දඩයකින් දඬුවම් කළ හැකි ය.

## 5.2.4. ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ අනෙකුත් නීතින්

**1841 අංක 04 දරණ පාදඩ (අයාල) ආඥා පනත**

පාදඩ (අයාල) ආඥා පනත යනු අයාලේ යෑම සාපරාධි වරදක් ලෙස දක්වා ඇති පැරණි නීතියකි.

පහත දැක්වෙන තැනැත්තන් මෙම ආඥා පනත යටතේ අත්අඩංගුවට ගත හැක:

- කෝලාහලකාරී හෝ නොහික්මුණු ලෙස හැසිරෙන පුද්ගලයන්
- තමාට තමා නඩත්තු කිරීමට හැකියාව ඇති නමුත් එසේ කිරීම ප්‍රතික්ෂේප කරන හෝ නොසලකාහරින පොදු ස්ථානයක හෝ වීථියක සැරිසරමින් සිඟමන් යදින තැන්තතකු
- පවුලේ සාමාජිකයන් හිගාකෑමට හෝ යොදවන හෝ පොළඹවන පුද්ගලයින්
- ප්‍රසිද්ධ වීදියක, ස්ථානයක හෝ නිවාඩු නිකේතනයක අශෝභන ලෙස හැසිරෙන ගණිකාවක්
- අයිතිකරුගේ අවසරයකින් තොරව මඩුවක, ඉස්තොප්පුවක යනාදියක නවාතැන් ගන්නා අයකු
- අයිතිකරුගේ අවසරයකින් තොරව නිවසක් හෝ ගොඩනැගිල්ලක් අපවිත්‍ර කරන ඕනෑම පුද්ගලයෙක්
- හිතාමතාම අවිනීත ලෙස හැසිරෙන අයකු

- අසභ්‍ය පින්තූරයක් හෝ මුද්‍රණයක් ඕනෑම පොදු ස්ථානයක ප්‍රදර්ශනය කරන අයකු
- තුවාල නිරාවරණය කිරීමෙන් සහ වෙනත් ආකාරයකින් සිඟමන් ලබා ගැනීමට උත්සාහ කරන අයකු
- ව්‍යාජ මවාපෑම් යටතේ ආධාර එකතු කරන ඕනෑම පුද්ගලයෙක්
- ප්‍රසිද්ධියේ අශෝභන ක්‍රියාවක් සිදු කරන ඕනෑම පුද්ගලයෙක්
- අවසරයකින් තොරව ඕනෑම රජයේ හෝ පෞද්ගලික ස්ථානයක රැඳී සිට හමු වූ පුද්ගලයෙක්
- වෙනත් අයකු සමග ලිංගික සංසර්ගය සඳහා ප්‍රසිද්ධියේ ඇවිටිලි කරන අයකු
- ගණිකා වෘත්තියේ ඉපැයීම් මත ජීවත් වන ඕනෑම තැනැත්තෙක්
- නීති විරෝධී හෝ අස්වාභාවික සංසර්ගය සඳහා සංවිධානාත්මක ලෙස පුද්ගලයින් සම්පාදනය කරන ඕනෑම පුද්ගලයෙක්
- රැඳවුම්භාරයේ සිටින ගැහැනු ළමයකු දූෂණය කරන, වරදට පොළඹවන හෝ එසේ කිරීමට අනුබල දෙන තැනැත්තකු



**පාදඩ (අයාල) ආඥා පනතෙහි ගැහැනු ළමයා යනුවෙන් දක්වා ඇත්තේ වයස අවුරුදු 16ට අඩු ගැහැණු ළමයින් ය.**

පාදඩ (අයාල) ආඥා පනත යටතේ ගණිකා වෘත්තිය වැනි ක්‍රියාවන් වෙනුවෙන් දරුවන් යෙදවීම, අනෙක් ආකාරයන්ගේ ලිංගික සූරාකෑම සහ සිඟමන් යැදීමට දරුවන් යොදාගැනීම කරන අයකුට එරෙහිව නඩු පැවරිය හැකි අතර එවැනි ක්‍රියාවන්ගේ වින්දිතයන්ද අත්අඩංගුවට ගැනීමට හැකියාවක් පවතී.

- ප්‍රයෝගිකව මෙම ආඥාපනත බොහෝ විට ළමා ලිංගික ශ්‍රමිකයන් හෝ සිඟමනේ යෙදෙන ළමයින් අත්අඩංගුවට ගැනීම සඳහා යොදා ගනී.
- ඒ හා සමානව වීථියේ අසාමාන්‍ය ලෙස හැසිරෙන දරුවෙකු මෙම පනත යටතේ අත්අඩංගුවට ගත හැකිය.

| 1889 අංක 05 දරන ගණිකා නිවාස ආඥා පනත |
|---|
| **ගණිකා නිවාස ආඥා පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව,**<br>අ) ගණිකා නිවාසයක් පවත්වාගෙන යාම, කළමනාකරණය කිරීම, ක්‍රියා කිරීම හෝ සහාය දෙන,<br>ආ) කුලී නිවැසියෙකු, බදු ගැනුම්කරු, පදිංචිකරුවෙකු හෝ ඕනෑම පරිශ්‍රයක හිමිකරුවෙකු වී දැනුවත්ව එවැනි පරිශ්‍රයක් ගණිකා නිවාසයක් ලෙස පවත්වාගෙන යාමට හෝ පුරුද්දක් ලෙස ගණිකා වෘත්තියේ යෙදීමට අවසර දෙන,<br>ඇ) පරිශ්‍රයක බදුකරු හෝ ඉඩම් හිමියා වී, හෝ එවැනි බදුකරුගේ හෝ ඉඩම් හිමියාගේ නියෝජිතයා වී, එවැනි පරිශ්‍රයක් හෝ එහි යම් කොටසක් ගණිකා නිවාසයක් ලෙස භාවිතා කිරීමට අවසර දෙන හෝ දැනුවත්ව කැමැත්තෙන් ගණිකා නිවාසයක් ලෙස එවැනි පරිශ්‍රයන් හෝ එහි කොටසක් අඛණ්ඩව භාවිතා කරන,<br>ඕනෑම අයෙක් ගණිකා නිවාස ආඥා පනත යටතේ වැරදිකරුවකු වේ. |
| කෙසේ වෙතත්, එවැනි නීති විරෝධී ක්‍රියාවලට ගොදුරු වූ කාන්තාවන් සහ ළමයින් ගණිකා නිවාස ආඥා පනත යටතේ වරදකරුවන් නොවිය යුතු ය. |

<table>
<tr><td>02 වගන්තිය</td><td>අ) මෙම පනත යටතේ වැරදිකරු වූ පුද්ගලයෙකුට රුපියල් 500 නොඉක්මවන දඩයක් හෝ අධිකරණයේ අභිමතය පරිදි මාස හයකට නොවැඩි කාලයක් සඳහා ලිහිල් හෝ බරපතල සිර දඬුවමක් හෝ එම දඬුවම් දෙක ම හෝ නියම කළ හැක.<br><br>ආ) දෙවනවර හෝ ඉන්පසුව වරදකරු වන අයකුට රුපියල් 1000 ක දඩයක් හෝ වසර 1 නොඉක්මවන සිර දඬුමක් හෝ ඒ දඬුවම් දෙක ම නියම කල හැක.</td></tr>
<tr><td></td><td>ආඥා පනතේ දැඩි දඬුවම් දක්වා නැත. දඩ මුදල් සහ සිර දඬුවම් අවම ඒවා වේ.<br><br>ආඥා පනත යටතේ දක්වා ඇති සියලු වැරදි ඇප දියහැකි ආකාරයේ ඒවා වන අතර අත්අඩංගුවට ගැනීමට වරෙන්තු අවශ්‍ය වේ.<br><br>කෙසේ වෙතත් 2 වන වගන්තිය යටතේ වරද පිළිබඳ අර්ථ දැක්වීම යටතේ හැර ගණිකා නිවාස යන පදය ආඥා පනතේ පැහැදිලිව අර්ථ දක්වා නැත.</td></tr>
<tr><td></td><td></td></tr>
<tr><td colspan="2">කෙසේ වෙතත් දණ්ඩ නීති සංග්‍රහයේ 360 (ආ) (1) (අ) වගන්තිය අනුව, 'යම් ළමයකු ලිංගික අපයෝජනයට පාත්‍ර කිරීමේ කාර්යය සඳහා හෝ කවර වුව ද ආකාරයක ලිංගික ක්‍රියාවකට හෝ යම් අසභ්‍ය හෝ අශ්ලීල ප්‍රදර්ශනයකට නැතහොත්, දර්ශනයකට ළමයකු සහභාගී කරවාගැනීම සඳහා යම් පරිශ්‍රයක රැඳී සිටීමට දැන දැනම ඒ ළමයාට ඉඩ දෙන,' අයකු ළමයකුගෙන් අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීමේ වරද සිදු කරයි.<br><br>ඒ අනුව මෙම වගන්තියේ විග්‍රහ කර ඇති 'පරිශ්‍රය' යන්නට ගණිකා නිවාස ආඥා පනතේ දක්වා ඇති පරිශ්‍රය යන යෙදුමට ආදේශ කළ හැකි අතර වරදකරුවන්ට ගණිකා නිවාස ආඥාපනතට අමතරව දණ්ඩ නීති සංග්‍රහය යටතේ ද නඩු පැවරිය හැක.</td></tr>
</table>

**කාර්ය පටිපාටික නීතිය**

ළමයින් සඳහා වන යුක්ති ක්‍රියාදාමය තුළ අපරාධවලට ගොදුරු වූ දරුවන්ට (සහ සාක්ෂිකරුවන්ට) විශේෂයෙන් අදාළ වන නීති, ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ යාන්ත්‍රණයන් ඇතුළත් වේ.

**1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහ පනත**

දණ්ඩ නීති සංග්‍රහය යටතේ ළමයින් වෙළඳාම් කිරීම සම්බන්ධ විශේෂිත වැරදිවලට අමතරව, ළමා වින්දිතයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා ඇතැම් ක්‍රියාදාම මැදිහත්වීම් සිදු කර ඇත. නිදසුනක් ලෙස, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 453අ. වගන්තිය අනුව (1998 අංක 28 දරන පනතින් සංශෝධිත) ළමා අපචාර සම්බන්ධයෙන් වන නඩු කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතු ය.

තවද, 1998 අංක 27 දරණ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත අනුව ව්‍යවස්ථාපිත ස්ත්‍රී දූෂණය (වයස අවුරුදු 16ට අඩු ගැහැණු දරුවකු දූෂණය කිරීම) සම්බන්ධ නඩුවක් විභාග විය යුතු කාර්යපටිපාටිය ලඝු කාර්යපටිපාටිය ලෙස සංශෝධනය කරන ලදී.[79]මෙම සංශෝධනය හරහා නීතිපතිවරයාට සෘජුව ම මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ගොනු කිරීමට හැකියාව හිමි වූ අතර, එමගින් නඩු කටයුතු කඩිනමින් සිදුකිරීමට පහසුකම් සපයයි.

[79]1998 අංක 27 දරණ අධිකරණ සංවිධාන (සංශෝධන) පනත -2(1)(ආ)

**1895 අංක 14 දරන සාක්ෂි ආඥාපනත**

1872 ඉන්දීය සාක්ෂි ආඥාපනත අනුව සකස් කරන ලද මෙම ආඥා පනත, යුද්ධාධිකරණය සහ සමථකරුවන් ඉදිරිපිට දී කෙරෙන කටයුතු හැර අන් සියලු අධිකරණ ඉදිරියේ සිදු කරන අධිකරණ කටයුතු සඳහා අදාළ වේ.[80]

සාක්ෂි නීතියේ වඩාත් ම මුල් බැසගත් මූලධර්මවලින් එකක් වන්නේ ප්‍රවාදක සාක්ෂි බැහැර කිරීමේ රීතියයි. ප්‍රවාදක සාක්ෂි බැහැර කිරීමේ රීතියේ හරය වන්නේ, නඩු කටයුතුවල දී වාචික සාක්ෂි දෙන පුද්ගලයෙකු විසින් කරන ලද ප්‍රකාශයක් හැර වෙනත් ප්‍රකාශයක් පිළිගත නොහැකි බවයි. මෙම රීතියේ පදනම වන්නේ ප්‍රවාදක සාක්ෂි විශ්වසනීයත්වයෙන් තොර බවයි.

1995 සහ 1999 සාක්ෂි (විශේෂ විධිවිධාන) පනත් හරහා ප්‍රවාදක සාක්ෂි බැහැර කිරීමේ රීතිය ඉවත් කර ඉලෙක්ට්‍රොනික සහ පරිගණක සාක්ෂි ආවේශ්‍ය කරගැනීමට විධිවිධාන සලසයි. සාක්ෂි ආඥා පනතේ 163අ.(1) වගන්තිය අනුව ළමා අපචාර සම්බන්ධ නඩු කටයුත්තක දී, එම නඩුවේ චූදිතයා නොවන වැඩිහිටියකු ඉදිරිපිට දී නඩුකටයුත්ත සම්බන්ධව එම ළමයා විසින් ලබාදෙන සම්මුඛ සාකච්ඡාවක වීඩියෝ පටිගත කිරීමක් සාක්ෂි වශයෙන් අදාල කරගත හැක.[81] එමගින් දරුවාගේ සාක්ෂි විවෘත අධිකරණයේ දී මූලික සාක්ෂි විමසීමක් වශයෙන් ප්‍රතිස්ථාපනය කර ඇත. කෙසේ වෙතත්, ඉහත විධිවිධානය අදාළ වන්නේ මූලික සාක්ෂි විමසීමකට පමණක් වන අතර එහිදී දරුවාගෙන් හරස් ප්‍රශ්න විමසීමකට යොමු නොවන හෙයින්, අධිකරණ කටයුතු අතරතුර දී දරුවාට ඇතිවන මානසික කම්පනය අවම කිරීම සඳහා එය හේතු වේ.

**1939 අංක 48 දරණ ළමා හා යෞවන ආඥා පනත**

**මෙම ආඥාපනත මගින් විශේෂිත අධිකරණ පිහිටුවන ලබයි. ආඥා පනත අනුව,**

| 2 වගන්තිය | 88 වගන්තිය |
|---|---|
| **බාල වයස්කාර අධිකරණ (ළමා උසාවි) යනු අර්ථ දැක්වෙන්නේ ළමයකු හෝ යෞවනයකු සම්බන්ධව නඩු කටයුතු පවත්වාගෙන යා හැකි අධිකරණයකි.** | ළමයකු යනු වයස අවුරුදු 14 ට අඩු තැනැත්තකු වන අතර යෞවනයකු යනු වයස අවුරුදු 14ට වැඩි 16ට අඩු තැනැත්තකු ය. |

**චෝදනාවට ලක්වූ වරදෙහි ස්වභාවය දරුවාගේ හෝ තරුණයින්ගේ වයස සහ පරිණත මට්ටමට ගැළපෙන භාෂාවෙන් පැහැදිලි කිරීම සඳහා මෙම ආඥා පනත මගින් මහේස්ත්‍රාත්වරයාට නිශ්චිත වගකීමක් පැවරේ.**

**දරුවකු හෝ තරුණයෙකු සමඟ කටයුතු කරන සෑම උසාවියක් ම මූලික වශයෙන් දරුවාගේ සුභසාධනය කෙරෙහි අවධානය යොමු කළ යුතු බවට ද එය නියම කරයි.**

**1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය 1985 අංක 21 දරණ පාර්ලිමේන්තු පනත හරහා පිහිටවනු ලබයි. මෙම පනත 1994 අංක 04 හා 2009 අංක 56 යන පනත් හරහා සංශෝධනය වී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යයංශය යනු විදේශ සේවා නියුක්තිය පිළිබඳ මෙරට පවතින මූලික පාලන අධිකාරියයි.

[80] සාක්ෂි ආඥාපනත - 2(1)
[81] 1999 අංක 32 දරණ සාක්ෂි විශේෂ විධිවිධාන පනත අනුව සංශෝධිත සාක්ෂි ආඥා පනත

කාර්යංශයේ මූලික අරමුණ,

- බඳවාගැනීම් කාර්යපටිපාටිය විධිමත් කිරීම
- විදේශගත සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සුබසාධනය තහවුරු කිරීම
- ශ්‍රී ලාංකිකයන්ට වඩාත් යහපත් විදේශ සේවා නියුක්තික අවස්ථා නිර්මාණය කිරීම

| වගන්තිය | වරදේ ස්වභාවය | දණ්ඩනය |
|---|---|---|
| **62 වගන්තිය**<br>**නීති විරෝධී බඳවා ගැනීම්** | (1) මෙම පනතේ විධිවිධානවලට අනුකූලව හැර<br><br>(අ) රැකියාවක් සඳහා විදේශගත වීමට බලාපොරොත්තු වන පුද්ගලයෙකුගෙන් කිසියම් මුදලක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වීමට හෝ පිටත්ව යාමට එම පුද්ගලයාට හෝ වෙනත් පුද්ගලයෙකුට සහාය වීමට අදහස් කරන ඕනෑම පුද්ගලයෙකු සමඟ ගිවිසුමක් ඇතිකරගනු ලබන හෝ එසේකිරීමට උත්සාහ කරන අයකු;<br><br>(ආ) රැකියා අරමුණු සඳහා ශ්‍රී ලංකාවෙන් සංක්‍රමණය වීමේ හෝ පිටත්ව යාමේ අරමුණු සඳහා ඕනෑම පුද්ගලයෙකුට සංක්‍රමණය වීමට හෝ පිටත්ව යාමට හෝ සංක්‍රමණය වීමට හෝ පිටත්ව යාමට උත්සාහ කිරීමට හෝ උපකාර කිරීම සිදුකරන අයකු මෙම පනත යටතේ වරදකරු විය යුතු ය. | මෙම විධිවිධානය යටතේ වැරදිකරු වූ පුද්ගලයෙකුට රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් එක්දහස් පන්සියයකට නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර මාස දොළහකට නොඅඩු හා අවුරුදු දෙකකට නොඉක්මවන කාල සීමාවක් සඳහා එක් සිරදඬුවමකට යටත් කළ හැකි ය. |
| | (2) මෙම පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍රයක් නොමැතිව විදේශ රැකියා ඒජන්සියක ව්‍යාපාරය කරගෙන යන සෑම පුද්ගලයෙකුම මෙම පනත යටතේ සිදුකරන සියලු ම වැරදිවලට වැරදිකරුවන් විය යුතු ය. | රුපියල් විසි දහසකට නොඅඩු හා රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට සහ වරදකරු කිරීමෙන් පසුවද වරද අඛණ්ඩව සිදුකරන සෑම දිනක ම රුපියල් දහසක අතිරේක දඩයකට යටත් වේ. |
| | | |
| **63 වගන්තිය**<br>**කූට ලේඛණ සැකසීම සහ පෙළඹවීම**<br><br> | (අ) කිසියම් පුද්ගලයෙකුගේ රැකියා අරමුණු සඳහා සංක්‍රමණය වීමට අවශ්‍ය හෝ ඊට අදාළ ඕනෑම ලේඛනයක් ව්‍යාජ ලෙස සකස් කිරීම හෝ වෙනස් කිරීම හෝ ඔහු සන්තකයේ හෝ ඔහුගේ පාලනය යටතේ එවැනි ව්‍යාජ හෝ වෙනස් කිරීම් සඳහා භාවිතා කළ හැකි කිසියම් උපකරණයක් හෝ ලිපියක් තබාගන්නා;<br><br>(ආ) ඕනෑම තැනැත්තකු සංක්‍රමණය වීමට; මත් කිරීමෙන්, බලහත්කාරය, වංචාව හෝ හිතාමතා ම සාවද්‍ය ලෙස | රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් එක්දහස් පන්සියයකට නොඉක්මවන දඩයකට යටත් විය යුතු අතර මාස දොළහකට නොඅඩු හා අවුරුදු දෙකකට නොඉක්මවන කාල සීමාවක් සඳහා එක් සිරදඬුවමකට යටත් කළ හැකි ය. |

| | | |
|---|---|---|
| | නිරූපණය කිරීම, හේතු දැක්වීම හෝ පොළඹවා ගැනීම හෝ හේතු දැක්වීමට හෝ පොළඹවා ගැනීමට තැත්කරන අයකු මෙම පනත යටතේ වරදකරුවකු වේ | |
| | | |
| **64 වගන්තිය ගාස්තු අයකිරීම** | (අ) බලපත්‍රලාභියෙකු වී, වෙනත් ඕනෑම පුද්ගලයෙකුට ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවක් සැපයීම සඳහා 51 වන වගන්තියේ දක්වා ඇති ආකාරයට හැර වෙනත් ගාස්තුවක් අය කරන;<br><br>(ආ) බලපත්‍රලාභියෙකු නොවී, ඕනෑම පුද්ගලයෙකුට ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා සැපයීම සඳහා මුදල් මුදලක් ලබාගන්නා අයකු මෙම පනත යටතේ වැරදිකරුවකු වේ. | මහේස්ත්‍රාත්වරයකු විසින් ලඝු නඩු විභාගයකින් පසු රුපියල් දහසකට නොඅඩු සහ රුපියල් එක්දහස් පන්සියයකට නොඉක්මවන දඩයකට සහ මාස දොළහකට නොඅඩු හා වසර දෙකකට නොවැඩි කාලයකට සිර ද දඬුවම් නියම කළ හැකි ය. මහේස්ත්‍රාත්වරයා විසින් වරදකරුට එම ගාස්තුව හෝ මුදල් ආපසු ලබා දෙන ලෙසට නියම කළ යුතු ය. |
| | | |
| 68 වගන්තිය | 63 වන වගන්තිය යටතේ හෝ 64 වන වගන්තිය යටතේ වරදකට වරදකරු වූ ඕනෑම පුද්ගලයෙකු පසුව එම වගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබුවහොත්, එම වරදට ලබා දී ඇති දඬුවම මෙන් දෙගුණයක දඬුවමකට යටත් කළ හැකි ය. | |

## 5.3 ප්‍රතිකර්ම යාන්ත්‍රණ

අපරාධ නීතිය යටතේ වින්දිත දරුවෙකුට ලබා ගත හැකි පිළියම්වලට අමතරව, අපරාධ වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් ආරක්ෂා කරනු ලබන තවත් නීතිමය තත්ත්වයන් පවතී.

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව[82]

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 03 වන පරිච්ඡේදය යටතේ මූලික අයිතිවාසිකම් සහතික කරන අතර විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කිරීමක් හෝ උල්ලංඝනය කිරීමට ආසන්න වන විටක දී ඊට ප්‍රතිකර්ම සම්පාදනය කරනු ලබයි. රාජ්‍ය ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් ස්වකීය අයිතිවාසිකම් උල්ලංඝනය වී මාසයක් ඇතුළත පෙත්සම්කරුවෙකුට ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය. වින්දිතයින්ට වන්දි ගෙවීම ඇතුළුව සාධාරණ සහනයක් ලබා දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ බලය පවතී. මෙම අයිතිවාසිකම්වල විෂය පථය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කාලීනව පුළුල් කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පහත සඳහන් මූලික අයිතිවාසිකම් සහතික කරනු ලබයි.

| ව්‍යවස්ථාව | මූලික අයිතිවාසිකම |
|---|---|
| 10 ව්‍යවස්ථාව | සිතීමේ, හෘදය සාක්ෂියේ සහ ආගමික නිදහස |
| 11 ව්‍යවස්ථාව | වධහිංසාවන්ගෙන්, කුරිරු අමානුෂික අවමන්සහගත සැලකීම හෝ දඬුවම් වලින් මිදීමේ අයිතිය |

[82]ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - 1978

| | |
|---|---|
| 12(1) සහ 12(4) ව්‍යවස්ථාව | සමානාත්මතාවයට ඇති අයිතිය සහ නීතිය ඉදිරියේ සමාන ආරක්ෂාව, කාන්තාවන්, ළමුන්, සහ ආබාධිත තැනැත්තන්ගේ ප්‍රගතිය තහවුරු කිරීම |
| 12(2) ව්‍යවස්ථාව | ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලන මතය ඇතුළු හේතූන් මත වෙනස් කොට නොසැලකීම |
| 13 ව්‍යවස්ථාව | අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම, රඳවා තබා ගැනීම, දඬුවම් කිරීම සහ අතීතයට බලපාන දණ්ඩ නීති පැනවීම තහනම් කිරීම |
| 14 ව්‍යවස්ථාව | භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ, රැකියාවේ සහ යාමේ ඊමේ නිදහස |

දරුවෙකුට ඔහුගේ/ ඇයගේ අයිතිවාසිකම් වැඩිහිටියෙකු හරහා නොව ස්වාධීනව භුක්ති විඳිය හැකිය. එබැවින්, වෙළෙඳාමට ගොදුරු වූ දරුවෙකුට රජයේ නිලධාරීන්ට එරෙහිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිගත් ඕනෑම මූලික අයිතිවාසිකමක් සඳහා වූ ඔහුගේ/ ඇයගේ අයිතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කළ හැකිය. ළමයින් වෙළෙඳාම් කිරීම වැළැක්වීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ පැහැදිලිව ම ප්‍රතිපාදන සපයා නැතත්, වධහිංසාවලින් නිදහස් වීම, කුරිරු, අමානුෂික හා අවමන් සහගත ලෙස සැලකීම්වලින් නිදහස් වීම වැනි අයිතිවාසිකම් දක්වා ඇත. එමගින් සූරාකෑමේ අරමුණ සඳහා ළමයින් වෙළෙඳාම් කිරීමෙන් නිදහස් වීමේ අයිතිය පිළිගනී. තවද, අත්තනෝමතික අත්අඩංගුවට ගැනීම්, රඳවා තබා ගැනීම සහ දඬුවම් කිරීමෙන් මිදීමේ නිදහස හරහා විශේෂයෙන් ලිංගික සූරාකෑමට ගොදුරු වූ ළමයින් සම්බන්ධයෙන් සහ නීතිය යටතේ වරදක් වන වෙනත් ඕනෑම ක්‍රියාවක් සම්බන්ධයෙන් රජයේ අත්තනෝමතික ක්‍රියාවන්ගෙන් නිදහස් වීමේ අයිතිය පිළිගනී.

**අභියාචනාධිකරණය සතු රිට් ආඥා නිකුත් කිරීමේ අධිකරණ බලය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ කවර හෝ මුල් අවස්ථා අධිකරණයක හෝ විනිශ්චය සභාවක හෝ වෙනත් ආයතනයක වාර්තා පරීක්ෂා කර බලා නීතිය අනුව සර්ටියෝරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මැන්ඩමුස්, ක්වො වොරෙන්ටෝ යන ආඥා නිකුත් කිරීම සඳහා අභියාචනාධිකරණයට පූර්ණ බලය ඇත.

141 ව්‍යවස්ථාව අනුව අභියාචනාධිකරණය වෙත පහත අවස්ථාවලදී හබයාස් කෝපුස් ආඥා නිකුත් කළ හැක

(අ) නීතිය අනුව ක්‍රියා කිරීමට යම් පුද්ගලයකු අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස

(ආ) රජයේ හෝ පුද්ගල අත්අඩංගුවේ නීතිවිරෝධී ලෙස රඳවා තබාගෙන ඇති යමෙකු අධිකරණයට ඉදිරිපත් කරන ලෙස සහ අධිකරණයට ඉදිරිපත් කරන තැනැත්තා නිදහස් කරන ලෙස හෝ රිමාන්ඩ් භාරයේ තබන ලෙස හෝ ඔහු සම්බන්ධව නීතිය අනුව අන්‍යාකාරයකින් ක්‍රියා කරන ලෙස නියම කළ හැක.

145 ව්‍යවස්ථාව අනුව අභියාචනාධිකරණය වෙත මුල අවස්ථා අධිකරණයන්ගේ වාර්තා පරික්ෂාකිරීම සඳහා පරිශෝධන බලය පවතී.

**අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත**

2015 අංක 04 දරන අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ අරක්ෂා කිරීමේ පනතඅපරාධ වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරිම සහ ප්‍රවර්ධනය කිරීම පිණිස ද ඒ සඳහා ජාත්‍යන්තර සම්මතයන්, ප්‍රමිති සහ යහ භාවිතයන් මත පදනම්ව ඔවුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික අධිකාරියක් පිහිටුවීම සහ පොලිස් දෙපාර්තමේන්තුවේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂක කොට්ඨාසයක් පිහිටුවීම පිණිස ද වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂණ අරමුදලක් පිහිටුවීම සඳහා විධිවිධාන සපයයි.

| 3 වන වගන්තිය | 4 වන වගන්තිය සහ 5 වන වගන්තිය |
|---|---|
| 3 වන වගන්තිය මගින් වින්දිතයාට ගෞරවනීයව, සාධාරණත්වයෙන් හා සමානාත්මතාවයෙන් සැලකීමට | 3 වගන්තියේ දක්වා ඇති අයිතිවාසිකම්වලට අමතරව 4 වන වගන්තිය තුළ වින්දිතයකුගේ හිමිකම් සඳහන් වේ. |

ඇති අයිතිය සහ කඩිනම් සහන ලබා ගැනීමේ අයිතිය ඇතුළු පුළුල් අයිතිවාසිකම් ලැයිස්තුවක් සපයයි. ළමා වින්දිතයෙකුට සැලකීම පිළිබඳව ද මෙම වගන්තිය තුළ විශේෂ අවධානයක් යොමු කරයි. එහිදී දරුවා සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් දරුවාගේ යහපත සැලකිල්ලට ගත යුතුය. තව දුරටත් එය වින්දිතයින් හානිවලින් හා තර්ජනවලින් ආරක්ෂා කරන අතර ඕනෑම ශාරීරික හෝ මානසික හානියක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීමට පහසුකම් සපයයි. තොරතුරු දැන ගැනීමේ අයිතිය සහ නියෝජනය කිරීමේ අයිතිය වැනි නිසි ක්‍රියාදාම අයිතිවාසිකම් මෙම වගන්තිය මගින් සපයයි.

වින්දිතයාට අධිකාරියෙන් මුදල් වියදම් කිරීමට (අධිකරණ හෝ අර්ධ අධිකරණ ක්‍රියාමාර්ග) සහ පවතින සම්පත් මත පදනම්ව රජයේ හෝ අධිකාරියේ වෛද්‍ය ප්‍රතිකාර සඳහා මුදල් ලබා ගැනීමට හිමිකම් ඇත.

5 වන වගන්තිය මගින් සාක්ෂිකරුවන්ට ගෞරවනීය ලෙස සැලකීමට, හිරිහැරවලින් හෝ බිය ගැන්වීම්වලින් හෝ සැබෑ හෝ විය හැකි හානියක් හෝ තර්ජනයකින් නිදහස් වීමට ඇති අයිතිය නියම කර ඇත. වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හැර වෙනත් පුද්ගලයින් ද හිරිහැර කිරීම්, බිය ගැන්වීම් තුළින් ආරක්ෂා කිරීම සඳහා ද මෙම පනත මගින් විධිවිධාන සලසා ඇත.

**8 සිට 10 දක්වා වගන්ති මගින් පනත යටතේ දක්වා ඇති වැරදි සඳහන් කරනු ලබයි**.

**වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව වන වැරදි**

- අපරාධ වින්දිතයකුට හෝ සාක්ෂිකරුවෙකුට තර්ජනය කිරීම හෝ එම තැනැත්තාගේ, කීර්තිනාමයට හෝ දේපළවලට හානියක් කරන, (8 (1) වගන්තිය) හෝ
- අපරාධ වින්දිතයකුට හෝ සාක්ෂිකරුවෙකුට ස්වේච්ඡාවෙන් බරපතල තුවාල කිරීම හෝ යුතු ලෙස අවහිර කිරීම (8 (2) වගන්තිය) හෝ
- බලහත්කාරයෙන්, වංචනික ලෙස, බලය අයුතු ලෙස භාවිතා කිරීම හෝ වෙනත් ආකාරයකින් වින්දිතයෙකු හෝ සාක්ෂිකරුවෙකු යම් ස්ථානයකින් පිටවීමට බල කිරීම හෝ පොළඹවා ගැනීම (8 (3) වගන්තිය) හෝ
- පැමිණිල්ලක් ගොනු කිරීම වළක්වාලීම හෝ ගොනුකරන ලද පැමිණිල්ලක් හෝ කරන ලද ප්‍රකාශයක් ඉල්ලා අස්කර ගැනීම සඳහා සාක්ෂි දීම හෝ බල කිරීම හෝ,

සිදුකරන තැනැත්තෙක් වරදක් සිදු කරයි.

සියලු ම වැරදි මහාධිකරණයේ විභාග කරනු ලබන අතර නියම කළ හැකි උපරිම සිර දඬුවමක් හා දඩයක් විශේෂයෙන් දක්වා ඇත.

වින්දිතයින් සහ සාක්ෂිකරුවන් හැර වෙනත් පුද්ගලයින්ට හිරිහැර කිරීම්, බිය ගැන්වීම් යනාදියෙන් ආරක්ෂා කිරීම සඳහා ද මෙම පනතේ ප්‍රතිපාදන සපයයි. ඒ අනුව එවැනි තැනැත්තන්ගේ රැකියාවෙහි අහිතකර වෙනස්කමක් සිදු කිරීම වැළැක්වීම (8 (4) වගන්තිය), වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ රහස්‍යභාවය ආරක්ෂා කිරීම (8 (5) වගන්තිය), වැරදි සිදුකළ අයට එරෙහිව නඩු පැවරීමේ ආයතනයන්ගේ අල්ලස් හා දූෂණ ක්‍රියා වැළැක්වීම සඳහා ද (8 (6) වගන්තිය) ප්‍රතිපාදන දක්වා ඇත.

**ඉහත සියලු වැරදි <u>ඇප ලබාදිය නොහැකි සංඥය</u> වැරදි වේ**.

ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික මෙහෙවරක් (තානාපති කාර්යාලයක්)හරහා ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතා මගින් සාක්ෂි ලබාදීමට සාක්ෂිකරුවන් වෙත පහසුකම් සැපයීම සඳහා මෙම පනතට පසුකාලීනව සංශෝධනයක් එක් කරන ලදී.

## හයවන මොඩියුලය

| වගකීම් සහ බැඳීම් | | |
|---|---|---|
| | දේශන පැය ගණන | 6 |
| | ඇගයුම් ක්‍රමවේදය | පන්ති කාමර සාකච්ඡා |
| | අධ්‍යයන අරමුණු | මෙම මොඩියුලය අවසානයේ සහභාගීවන්නන් හට;<br>• ළමුන් වෙළඳාමට එරෙහිව සටන් වැදීම හා සම්බන්ධ වී පවතින වගකීම් හෝ බැඳීම් හඳුනා ගැනීමට; හා<br>• ළමුන් වෙළඳාමට එරෙහිව සටන් වැදීමට වගකීම හා බැඳීම පවතින්නේ කාහටද යන්න ඉගෙන ගැනීමට<br>හැකියාව ලැබෙනු ඇත. |

### a. සහභාගීත්වය, වළක්වා ගැනීම, ආරක්ෂණය, ප්‍රවර්ධනය හා පුනරුත්ථාපනය/ නැවත එක්කිරීම

මෙම අත්පොතෙහි පූර්ව මොඩියුල පහ මඟින් ඔබහට ළමුන් වෙළඳාම සිදුවන්නේ කවර ආකාරයකට ද; එහි විවිධ ආකාරයන්, හේතු සාධක හා ප්‍රතිවිපාක සහ ළමුන් වෙළඳාමට එරෙහිව සටන් කිරීම සඳහා පවතින ජාත්‍යන්තර හා දේශීය නෛතික රාමුව පිළිබඳ පුළුල් දැනුමක් හා අවබෝධයක් ලබා දී ඇත.

බිම් මට්ටමේ හෝ ඉදිරි පෙළ සිටින නීතිය බලාත්මක කරන්නා වූ නිලධාරීන් ලෙස, ළමා වෙළඳාම සහ එය ක්‍රියාත්මක වන්නේ කෙසේද යන්න පිළිබඳව පමණක් දැනුවත්ව සිටීම ප්‍රමාණවත් නොවන්නේ ය. ළමා වෙළඳාමට එරෙහිව සටන් වැදීමට මෙම වගකීම් හා බැඳීම් දරා සිටින්නේ කවුද යන්න සහ කිනම් අදියන් හිදී මෙම වගකීම් හා බැඳීම් සංතෘප්ත විය යුතු ද යන්න පිළිබඳව ඉගෙන ගෙන තිබීම අත්‍යාවශ්‍ය වන්නේ ය. එමනිසා, මෙම මොඩියුලය විවිධ වගකීම් සම්බන්ධව විවිධාකාර මට්ටම්වල දී හා විවිධ අදියරයන් හිදී පැන නඟින ළමුන් වෙළඳාමට එරෙහිව පවතින්නා වූ වගකීම් හා බැඳීම් පිළිබඳ සාකච්ඡා කරනු ඇත.

### 6.1 හැඳින්වීම

මෙම අත්පොතෙහි හතර වන සහ පස්වන මොඩියුල මඟින් ළමුන් වෙළඳාමට එරෙහිව සටන් කිරීම සහ ඒ මත පැන නඟින වගකීම්හි ස්වභාවය පිළිබඳව අවධාරණය කරනු ලබන අන්තර්ජාතික නීති හා දේශීය නීතීන් හා ප්‍රතිපත්ති පිළිබඳව ඔබව දැනුවත් කර ඇත.

**පැලෙර්මෝ ප්‍රොටෝකෝලයට (*Palermo Protocol*) අනුව රාජ්‍ය බැඳී පවතිනවා:**

- මිනිස් වෙළඳාම සාපරාධී වරදක් කිරීම
- මිනිස් වෙළඳාමෙහි යෙදෙන්නන් විමර්ශණය කිරීම, නඩු පැවරීම, කිරීමට සහ දඬුවම් කිරීම
- දේශසීමා පාලනය පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීම
- එම පියවර තුළ සහ සිවිල් සමාජයේ සහයෝගය සහිතව
- වින්දිතයන් ආරක්ෂා කිරීමට සහ ඔවුනට සහයෝගය ලබා දීමට අවශ්‍යය පියවර ගැනීම
- නීතිය බලාත්මක කරන නිලධාරීන් සහ දේශසීමා නිලධාරීන් පුහුණු කිරීම
- වින්දිතයන් බවට පත්වීමට අවදානම ඇති තැනැත්තන් සහ මහජනයා දැනුවත් කිරීමට උත්සාහයන් දැරීම


ඒ අනුව, ඵලදායීව ළමුන් වෙළඳාම මුලිනුපුටා දැමීම සඳහා පහත සඳහන් අදියරයන්හි මැදිහත් වීමේ වගකීම වෙන් වෙන්ව සහ සමගාමීව සිදුකළ යුතු ය.

- ළමුන් වෙළඳාම වැළැක්වීම සඳහා
- ළමා වින්දිතයන් සහ අවදානමට ලක්ව සිටින ළමුන් ආරක්ෂා කිරීමට
- ළමා වෙළඳාමේ වින්දිතයන් බවට පත් වූ ළමුන් මුදා ගැනීමෙන් පසු පුනරුත්ථාපනය කිරීමට හා සමාජය හා ඔවුන් නැවත එකතු කිරීමට
- වළක්වා ගැනීම, ආරක්ෂණය, පුනරුත්ථාපනය හා නැවත එක් කිරීම යන ක්‍රියාදාමයන් තුළ සහභාගීත්ව හා අයිතීන් පදනම් කරගත් ප්‍රවේශයක් යොදා ගැනීම
- ළමුන් වෙළඳාමට එරෙහි වළක්වා ගැනීම, ආරක්ෂණය, සහභාගීත්වය, පුනරුත්ථාපනය සහ නැවත එක් කිරීමේ යාන්ත්‍රණයන් ප්‍රවර්ධනය කිරීම

ළමුන් වෙළඳාමෙහි වූ සියළුම අදියරයන් හිදී ඉහත දක්වා ඇති වගකීම් සපුරාලිය යුතු බව අවධාරණය කරනු ලැබ ඇත. ඒවා නම්;

- බඳවා ගැනීමේ අදියර
- සංචලනය වීමේ අදියර
- සූරාකෑමේ අදියර

ළමුන් වෙළඳාම මිනිස් වෙළඳාම මෙන් පහසුවෙන් අනාවරණය කරගත හැකි වරදක් නොවන්නේ ය. අනෙක් වරදවල් බොහොමයක් මෙන් නොව මිනිස් වෙළඳාම විවිධ වූ අදියරයන්වල දී පුද්ගලයන් කිහිපදෙනෙකු මැදිහත්ව විවිධ ස්ථානවල දී හෝ විවිධ රටවල දී සිදුවන විස්තීර්ණ වරදක් වේ. එබැවින්, ළමුන් වෙළඳාමට එරෙහිව සටන් වැදීම සහ එය වළක්වා ගැනීම සඳහා වූ වගකීම එක් තනි පුද්ගලයකු හෝ එක් නියෝජිත ආයතනයක උරහිස මත පතිත වන්නක් නොවන්නේය. එය බොහෝ පාර්ශවකරුවන්ගේ හා තනි පුද්ගලයන්ගේ සාමූහික වගකීමක් වන්නේ ය. එනම්;




මෙලෙසින්, ළමුන් වෙළඳාමට එරෙහිව සටන් වැදීමට නම් කවුරුන්, කුමන වගකීම්, කිනම් මට්ටමේ දී සපුරාලිය යුතු ද යන්න පිළිබඳ මනා අවබෝධයක් ලබා ගෙන සිටීම අවශ්‍යයෙන් කළ යුතු දෙයක් වන්නේ ය. මෙම මොඩියුලයේ ඊළඟ කොටස් ඉහත දක්වා ඇති කරුණු සාකච්ඡා කරනු ඇත.

## 6.2 ළමා වෙළඳාම වැළැක්වීම සඳහා වූ වගකීම

ළමුන් වෙළඳාම් කිරීමට එරෙහිව සටන් කිරීමේ දී ප්‍රධාන අත්‍යාවශ්‍යතාවක් වන්නේ ළමුන් වෙළඳාම් කිරීම නතර කිරීම සඳහා වූ මැදිහත් වීම් හා යාන්ත්‍රණයන් හඳුන්වා දීම හා ක්‍රියාත්මක කිරීම ය. යම් තත්වයකට ප්‍රතිචාර දැක්වීමට වඩා ක්‍රියාකාරී උත්සාහයන් වඩා ප්‍රයෝජනවත් වන්නේය යන අදහස මත එය පදනම් වේ. නිවාරක ප්‍රයත්නයන් මගින් ළමුන් වෙළඳාම සම්බන්ධව, එය සිදුවීමෙන් පසු තත්ත්වය සකස් කරනවාට වඩා එය සිදුවීමට පෙර තත්ත්වය පිළිබඳ පාලනය කිරීම.

| වගකීම් නිර්මාණය කරන්නා | වගකීම |
|---|---|
| රාජ්‍ය | 1. ළමුන් වෙළඳාම සාපරාධී වරදක් බවට පත් කිරීම<br><br>• ස්වාභාවික පුද්ගලයකු/ පුද්ගලයන් හෝ නීතිමය පුද්ගලයෙක්/ පුද්ගලයන් විසින් කරනු ලැබුවා වුවද, පහත දැක්වෙන ව්‍යුහාත්මක ක්‍රියා සාපරාධී වරදවල් ලෙස ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යවස්ථාදායක සහ අනෙකුත් ක්‍රියාමාර්ග ගන්න.<br>✓ ළමුන් වෙළඳාම් කිරීමට උත්සාහ කිරීම.<br>✓ ළමුන් වෙළඳාම් කිරීමට සහාය වීම හෝ දිරිමත් කිරීම.<br>✓ ළමුන් වෙළඳාම සඳහා වෙනත් පුද්ගලයින් සංවිධානය කිරීම සහ/ හෝ යොමු කිරීම.<br>(මිනිස් වෙළඳාම දැනටමත් දේශීය නීති පද්ධතිය යටතේ වරදක් වන්නේ නම්, ළමුන් වෙළඳාම සඳහා වන වගකීම සහ දඬුවම් තීව්‍ර කිරීම සඳහා අදාළ නීතිමය විධිවිධාන සංශෝධනය කිරීම.)<br><br>• අදාළ වැරදි සඳහා අපරාධ වගකීම ස්ථාපිත කර ඇති බව සහතික කිරීම සඳහා ව්‍යවස්ථාදායක සහ වෙනත් ක්‍රියාමාර්ග ගැනීම<br>• ළමුන් වෙළඳාම සහ ඒ ආශ්‍රිත වැරදිවලට යොදාගත් උපකරණ හා මුදල් රාජසන්තක කිරීම සහ රාජසන්තක කිරීමෙන් ලැබෙන මුදල් වෙළඳාමට ගොදුරු වූ ළමුන්ගේ ප්‍රතිලාභ සඳහා යොදා ගැනීම පිණිස අවශ්‍ය නීතිමය සහ වෙනත් පියවර ගැනීම.<br>• ළමුන් වෙළඳාම හෝ ඒ ආශ්‍රිත වැරදි සඳහා සක්‍රීයව හෝ නිශ්ක්‍රීයව සහාය වන දූෂිත රාජ්‍ය නිලධාරීන්, දූෂිතයන් බවට පත් කිරීම සඳහා වන නීතිමය හා පරිපාලනමය පියවර ගැනීම<br><br>1995 දණ්ඩ නීති සංග්‍රහ සංශෝධනය - 1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත සහ 2006 අංක 16 දරණ පනත<br>1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනත<br>2006 අංක 31 දරණ ආගමනික හා විගමනික (සංශෝධන) පනත<br>2005 අංක 30 දරණ වෛශ්‍යා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම කටයුතු කිරීමේ සම්මුති පනත<br><br>2. රාජ්‍ය නිලධාරීන් සතු ශක්‍යතාව වැඩි දියුණු කිරීම<br><br>▪ ළමුන් වෙළඳාමට එරෙහිව සටන් කිරීම, දූෂණ පිටුදැකීම සහ ක්‍රියාකාරී විමර්ශනය යන ක්ෂේත්‍රයන්හි කටයුතු කරන සහ යුක්තිය පසිඳලීම, ආගමන සහ විගමන කටයුතුවල නියැලී සිටින හෝ ළමුන් සඳහා සපයනු ලබන ඕනෑම ආකාරයක සේවාවක නිරත වන රාජ්‍ය නිලධාරීන්ගේ<br>(උදා: ළමා ආරක්ෂණ නිලධාරීන්, පාසල් ගුරුවරුන් යනාදී වශයෙන්) ශක්‍යතාවය ගොඩනැගීම හා දැනුවත්භාවය ඉහළ නැංවීම.<br><br>3. රාජ්‍ය නිලධාරීන්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ මහජනතාව අතර සහයෝගිතාව වැඩි දියුණු කිරීම. එනම්;<br><br>▪ සමාජය සහ රාජ්‍ය නිලධාරීන් අතර සම්බන්ධතාවයේ දී තොරතුරු ලබා ගැනීමේ මධ්‍යස්ථාන සහ සන්නිවේදන මාර්ග පිහිටුවීම.<br><br>▪ ළමා වෙළඳාම වැළැක්වීමේ යාන්ත්‍රණ හඳුන්වාදීමට පෙර සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් විසින් සිදු කරන ළමා වෙළඳාමේ යාන්ත්‍රණ සහ ළමා වෙළඳාමේ ස්වභාවය සහ පරිමාණය හඳුනා ගැනීම සඳහා ළමුන් වෙළඳාම පිළිබඳ දත්ත එකතු කිරීම සහ පර්යේෂණ කටයුතු වැඩි දියුණු කිරීම.<br><br>▪ ප්‍රජා ප්‍රතිපත්ති වැඩසටහන් සංවර්ධනය කිරීම<br><br>4. දරිද්‍රතාවය, අධ්‍යාපන අවස්ථා නොමැතිකම, මත්ද්‍රව්‍ය භාවිතය වැනි ළමයින් වෙළඳාම පිළිබඳ අවදානමට ගොදුරු විය හැකි විවිධ මට්ටම්වල පවතින අදාළ සාධකවල සම්පූර්ණ පරාසය ආමන්ත්‍රණය කිරීම සඳහා ක්‍රමවේදයන් සහ ක්‍රියාමාර්ග හඳුන්වා දීම. |

| | |
|---|---|
| | 5. වෙනත් රටවල දේශසීමා පාලන ආයතන සමග පවතින සහයෝගිතාවය ශක්තිමත් කිරීම සහ විශේෂයෙන් මෙහි ආරම්භක සහ අවසාන ඉලක්කය පිහිටි රටවල් අදාලව රටවල් අතර තොරතුරු හුවමාරු යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීම. |
| **රාජ්‍ය ආයතන** | 1. ළමුන් වෙළදාමට අදාළ නෛතික හා පරිපාලන යාන්ත්‍රණ ඵලදායී හා වගකිවයුතු ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම.<br>2. ළමුන් වෙළදාම සඳහා භාවිතා කරන ව්‍යාජ ලියකියවිලි හඳුනා ගැනීම සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රම වැනි තාක්ෂණික නොවන හඳුනාගැනීමේ ක්‍රමෝපායන් වැඩිදියුණු කිරීම සඳහා අදාළ නිලධාරීන්ගේ හැකියාවන් ගොඩනැගීමට පහසුකම් සැපයීම.<br>3. දූෂිත නිලධාරීන් හෝ ළමුන් වෙළදාමට සම්බන්ධ නීතිමය හා පරිපාලනමය විධිවිධාන උල්ලංඝනය කරන නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීම.<br>4. සියලුම දේශීය හා විදේශීය රැකියා නියෝජිත ආයතන සහ මානව සම්පත් සේවා සපයන ආයතන (man-power agencies) ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම. |
| **මාධ්‍ය** | 1. ළමා වෙළඳාම පිළිබඳ ලක්ෂ්‍යයන්, පරිමාණය, ළමුන් වෙළදාමේ ප්‍රතිවිපාක සහ ළමුන් වෙළදාම සඳහා වන ද දඬුවම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා විද්‍යුත් මාධ්‍යවල හෝ මුද්‍රිත මාධ්‍යවල ප්‍රමාණවත් ඉඩ ප්‍රමාණයක් වෙන් කිරීම.<br>2. ළමුන් වෙළදාමට නිශ්ක්‍රීය වශයෙන් හෝ සක්‍රීයව සම්බන්ධ වී සිටින හෝ උපකාර කරන පුද්ගලයින් සහ ආයතන හඳුනා ගැනීමට ලැබී ඇති තොරතුරු බලධාරීන් සමඟ හෝ උපකාරී හුවමාරු කර ගැනීම මඟින් අදාළ බලධාරීන්ට සහාය වීම.<br><br>**සදාචාරාත්මක වාර්තාකරණය සඳහා වූ මාර්ගෝපදේශයන්:**<br>• කිසිදු හානියක් නොකරන්න - කෙටිකාලීන වශයෙන් හා/ හෝ දිගු කාලීනව වින්දිතයකු බවට පත් වූ දරුවාගේ තත්ත්වය වඩාත් නරක අතට හැරෙන කිසිදු ආකාරයේ සම්මුඛ පරීක්ෂණයක් හෝ තොරතුරු හෙළි කිරීමක් සිදු නොකරන්න.<br>• වාර්තා කිරීමේ ක්‍රියාවලියට පෙර හා ක්‍රියාවලිය පුරාම ළමා වින්දිතයාගේ සහ/ හෝ දෙමාපියන්ගේ, භාරකරුවන්ගේ කැමැත්ත ලබා ගන්න. ඔවුහු ඕනෑම අදියරක දී හෝ කිසියම් අංශයක් සම්බන්ධයෙන් කැමැත්ත ඉල්ලා අස්කර ගන්නේ නම් ඔවුන්ගේ එම තීරණයට ගරු කරන්න.<br>• ළමා වින්දිතයින්ගේ සහ සාක්ෂිකරුවන්ගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂාව සඳහා ප්‍රමුඛතාවය දෙන්න සහ ගරු කරන්න - වාර්තාකරණ ක්‍රියාවලිය පුරාම විශේෂයෙන් භාවිතා කරන ලද ඡායාරූප සම්බන්ධයෙන් මූලාශ්‍රයේ අනන්‍යතාවය සහ රහස්‍යභාවය ආරක්ෂා කරන්න.<br>• ළමා වින්දිතයින් නැවත කම්පනයට පත් නොකරන්න - ළමා වින්දිතයාට චිත්තවේගීය ලෙස පීඩාවක් ඇති කරන ආකාරයට ප්‍රශ්න නොකරන්න. ප්‍රශ්නවලට පිළිතුරු දීමට ඔවුන්ට බල නොකරන්න. නිවැරදි තොරතුරු පමණක් සපයන්න - ළමා වින්දිතයින්ට හෝ ඔවුන්ගේ දෙමාපියන්ට/ භාරකරුවන්ට සැම විටම නිවැරදි තොරතුරු සැපයීමට නොහැකි වනු ඇත. ඔවුන් විවිධ වේලාවන්හි වෙනස් ආකාරයකින් සිදුවීම් මතක තබා ගන්නවා විය හැකි ය.<br>• ජනමාධ්‍යවල භාවිතා කරන්නා වූ භාෂාව ගැන සැලකිලිමත් වන්න - ළමා වින්දිතයාව අපකීර්තියට, වේදනාවට පත් කිරීමට හෝ පහත් කොට සැලකීමට හේතු වන වචන හෝ වාක්‍ය ඛණ්ඩ භාවිතා නොකරන්න. |

| | |
|---|---|
| **අන්තර්ජාතික සංවිධාන/ සිවිල් සංවිධාන/ ප්‍රජාව හා තනි පුද්ගලයන්** | **අන්තර්ජාතික සංවිධාන**<br>ළමා වෙළඳාම සම්බන්ධයෙන් ආමන්ත්‍රණය කිරීම උදෙසා ආණ්ඩුවේ සහ එහි ආයතනවල ශක්‍යතාවන් ඉහළ නැංවීම<br>**සිවිල් සමාජ සංවිධාන/ ප්‍රජාව හා තනි පුද්ගලයන්**<br>✓ ඔවුන්ගේ ප්‍රජාව තුළ වන ළමුන් වෙළඳාමට අදාළ ඕනෑම ආකාරයක තොරතුරු සැපයීම හරහා අදාළ අධිකාරීන් වෙත සහායෝගය දැක්වීම.<br>✓ ළමුන් වෙළඳාම ධෛර්යමත් කරන ආකාරයේ වූ සැපයීම් හෝ ඉල්ලුම නොතකා හැරීම මගින් ළමුන් වෙළඳාම දෝෂදර්ශනයට ලක් කරන්න.<br>*උදාහරණ ලෙසඃ ළමුන් වෙළඳාම ධෛර්යමත් කරන ආකාරයේ ඉල්ලුමඃ ලාභදායී ගෘහස්ථ කම්කරු සේවය, ගණිකා වෘත්තිය, ළමා මනමාලියන්, නීති විරෝධී කර්මාන්ත තුළ වූ කම්කරු සේවය*<br>*උදාහරණ ලෙසඃ ළමුන් වෙළඳාම ධෛර්යමත් කරන ආකාරයේ සැපයීමඃ මිනිස් වෙළඳාමේ යෙදෙන්නවුන්ට වාහන කුළියට සැපයීම, මිනිස් වෙළඳාම සඳහා ව්‍යාජ ලියකියවිලි සෑදීමට ස්ථානයන් බදු දීම හෝ ළමුන් වෙළඳාමට ගොදුරු වූ දරුවන් රඳවා තබා ගැනීම.* |

## 6.3 වෙළඳාමට හසු වූ ළමා වින්දිතයන් ආරක්ෂාකර ගැනීම සඳහා වන වගකීම

ළමුන් වෙළඳාම නතර කිරීම සඳහා වූ නිවාරතා උත්සාහයන් හඳුන්වා දී තිබෙන අතරතුර, වින්දිතයන් ආරක්ෂා කිරීම හෝ ළමා වෙළඳාවේ වින්දිතයකු වීමට හැකියාව ඇති තැනැත්තන් ආරක්ෂා කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගැනීම ද ඒ හා සමානව වැදගත් වන්නේ ය. ඵලදායී වින්දිතයන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයක් මගින් පහත සඳහන් අංශයන් සඳහා ආමන්ත්‍රණය කළ යුතු ය.

- වින්දිතයන් හඳුනා ගැනීම
  හදිසි හා දිගු කාලීන සේවා, නිවාස, ආහාර, වෛද්‍ය හා දන්ත රැකවරණය, නීතිමය සහාය, සහ අධ්‍යාපනයට, වෘත්තීය පුහුණුවට, සහ ආර්ථික අවස්ථාවන්ට ප්‍රවේශ වීම ඇතුළුව අවශ්‍යය සේවාවන් මොනවාද යන්න තීරණය කිරීම සඳහා වින්දිතයන් හඳුනා ගැනීම ඉතා වැදගත් වේ.
- අදාළ සේවාවන් සඳහා වූ නිර්දේශයන් සැපයීම
  පහත දක්වා ඇති වගුව මගින් ළමා වෙළඳාමට ගොදුරු වූ වින්දිතයන් ආරක්ෂා කිරීමේ වගකීම් පෙන්වා දෙනු ඇත.

| බැඳී සිටින්නා | වගකීම |
|---|---|
| රජය | *1.* ඵලදායී වින්දිතයින් හඳුනා ගැනීමේ යාන්ත්‍රණයක් සහ ශක්තිමත් යොමු කිරීමේ සේවාවක් ඇතුළත් පුළුල් ළමා වින්දිතයින් ආරක්ෂා කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>▪ ළමා වෙළඳාමට ගොදුරු වූවන් හඳුනා ගැනීමට සහ ඔවුන්ව සම්මුඛ සාකච්ඡා කිරීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ සේවා සපයන්නන් සඳහා නිරන්තර පුහුණුවක් ලබා දීම<br>▪ ළමා වින්දිතයින් ආරක්ෂා කිරීමේ පද්ධතියේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය මානව, මූල්‍ය හා වෙනත් සම්පත් වෙන් කිරීම<br>▪ විමර්ශනය, නීතිය බලාත්මක කිරීම සහ නඩු පැවරීම ඇතුළුව අපක්ෂපාතී යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය වෙත සමානාත්මක හා ඵලදායී ප්‍රවේශයක් ලබා දීම සහතික කිරීම |

| | |
|---|---|
| | ✓ අපරාධවලට ගොදුරු වූවන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියක් 2015 අංක 04 දරණ අපරාධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීම සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ පිහිටු වීම.<br><br>✓ ශ්‍රී ලංකා පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශය. |
| **රාජ්‍ය ආයතන** | *1.* ළමා වෙළඳාමට ගොදුරු වූවන් සහ අවදානමට ලක්ව සිටින ළමුන් පිළිබඳ කල්තියා හඳුනා ගැනීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීම<br>*2.* විමර්ශන සහ නඩු පැවරීම් ඵලදායී ලෙස සිදු කිරීමට විමර්ශකයින් සහ නඩු පවරන්නන් දිරිමත් කිරීම<br>*3.* ළමා වින්දිතයින් දෙවන වරටත් වින්දිතයන් බවට පත්වීම වැළැක්වීම සඳහා විකල්ප විමර්ශන උපාය මාර්ග යොදා ගැනීම<br>*4.* ඵලදායී වින්දිත සහාය ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම. උදාහරණයක් වශයෙන්; වින්දිතයන් හට<br>▪ ස්ථිර හෝ තාවකාලික පදිංචිය ලබා දීම<br>▪ ළමා වින්දිතයින් සඳහා නවාතැන්, සෞඛ්‍ය මධ්‍යස්ථාන, අධ්‍යාපන හා වින්දනාත්මක පහසුකම් ක්‍රියාත්මක කිරීම<br>*5.* නීතිය ක්‍රියාත්මක කරන්නන්, සේවා සපයන්නන් සහ සිවිල් සමාජය අතර සහයෝගීතාව වැඩි දියුණු කිරීම තුළින් විචිත්‍රවත් හා ළමා හිතකාමී උපදෙස් සඳහා යොමු කිරීමේ පද්ධතියක් (referral system) ක්‍රියාත්මක කිරීම. උදා: ඵලදායී හදිසි ඇමතුම් (hotline) සේවාවක් ස්ථාපිත කිරීම සහ කළමනාකරණය කිරීම<br>*6.* නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ සහ සේවා සපයන්නන්ගේ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම<br>*7.* සෑම විටම දරුවාගේ අයිතිවාසිකම් සහ උපරිම යහපතට ගරු කරන්න, විශේෂයෙන් පෞද්ගලික රහස්‍යභාවය සඳහා ඇති අයිතිය ඇතුළත්ව<br><br>➢ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය<br>➢ කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව |
| **මාධ්‍ය** | *1.* ළමා වින්දිතයින්ට සාධාරණය ඉටු කිරීමට, දූෂිත නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ සේවා සපයන්නන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අධිකාරීන්ගේ අවධානය යොමු කරවා ගැනීම සඳහා කටයුතු කිරීම<br>*2.* ළමුන් වෙළඳාම සහ සියලු ආකාරයේ ළමා සූරාකෑම පිළිබඳ ක්‍රමවේදයන් කිසිම ආකාරයකින් නොඉවසන ආකාරයේ වාතාවරණයක් (zero-tolerance) නිර්මාණය කිරීමට සහාය වීම<br>*3.* කිසිදු තොරතුරක් මඟින් ළමා වින්දිතයින් හඳුනා නොගන්නා බවට සහතික වීමෙන් ළමා වින්දිතයින්ගේ පෞද්ගලිකත්වයට සහ රහස්‍යභාවයට ගරු කිරීම |
| **සිවිල් සමාජ සංවිධාන/ ප්‍රජාව හා තනි පුද්ගලයින්** | *1.* ළමා වින්දිතයින් වෙත ළඟාවීම, ළමුන් වෙළඳාම් කරන මාර්ගයන් හඳුනා ගැනීම සහ අදාළ අධිකාරීන් වෙත නිවැරදි සහ ඉක්මන් තොරතුරු ලබා දීම හරහා අනිසි වෙළඳාම්කරුවන් හඳුනා ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සහ සේවාවන්වලට සහාය වීම.<br>*2.* ප්‍රජාව තුළ ළමුන් වෙළඳාම සහ සූරාකෑම පිළිබඳව විමසිලිමත් වන්න. තවද, ඕනෑම ආකාරයක සැක සහිත පුද්ගලයින් හෝ ආයතන පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන්නන් දැනුවත් කරන්න. |

| | |
|---|---|
| | 3. වෙළඳාමට ගොදුරු වූ ළමයින් නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් වෙත හෝ සේවා සපයන්නන් වෙත යොමු කිරීමෙන් ඔවුන්ට සහාය වන්න. |

## 6.4 ළමා වෙළඳාමේ වින්දිතයන් පුනරුත්ථාපනය කිරීම හා නැවත සමාජය සමග ඒකාබද්ධ කිරීම සඳහා වූ වගකීම

වෙළඳාමට ගොදුරු වූවන් පුනරුත්ථාපනය කිරීම හා ඔවුන් නැවත සමාජය සමග ඒකාබද්ධ කිරීම ද ආරක්ෂණ යාන්ත්‍රණයට සමගාමීව සිදුවිය යුතු ය.

| බැඳී සිටින්නා | වගකීම |
|---|---|
| රජය හා රාජ්‍ය ආයතන | ✓ දරුවාගේ උපරිම යහපත සැලකිල්ලට ගනිමින් ළමා වින්දිතයින් පුනරුත්ථාපනය කිරීම සඳහා අදාළ සේවා සපයන්නන්ට පහසුකම් සහ යාන්ත්‍රණ හඳුන්වා දීම.<br>✓ සෑම විටම දරුවන්ගේ නිරුපද්‍රිත බව සහ ආරක්ෂාව සහතික කිරීම.<br>✓ ඔවුන්ගේ තනි පුද්ගල අවශ්‍යතා මත පදනම්ව ජීවන කුසලතා අධ්‍යාපනය, අධ්‍යාපනය හෝ පුහුණුව ස්ථාපිත කිරීම සහ ළමා වින්දිතයින් මෙම පහසුකම් සඳහා ප්‍රවේශ වන බවට සහතික කිරීම.<br>✓ සුදුසු සහ ආරක්ෂිත නම්, ළමා වින්දිතයින් ඔවුන්ගේ ප්‍රජා වෙත ආපසු යැවීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම.<br>✓ වෙළඳාමට ගොදුරු වූ ළමයින්ට මනෝ සමාජීය උපදේශනය සැපයීම සහතික කිරීම.<br>✓ කම්පනය මඟහරවා ගැනීම සඳහා දරුවා තුළ විශ්වාසය නැවත ගොඩනැගීමට පියවර ගැනීම. |
| මාධ්‍ය | වෙළඳාමට ලක්වූ ළමා වින්දිතයින් පිළිබඳ සමස්ත ආකල්පය වෙනස් කිරීමට රජයට සහාය වීම. |
| සිවිල් සමාජ සංවිධාන/ ප්‍රජව සහ තනි පුද්ගලයන් | නැවත සමාජය සමග ඒකාබද්ධ කිරීමේ දී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය හා රාජ්‍ය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම.<br>✓ අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා කටයුතු කිරීම (needs assessments)<br>✓ මනෝ සමාජීය චිකිත්සාව සහ මනෝවිද්‍යාත්මක සහාය ලබා දීම<br>✓ පවුල් නැවත එක් කිරීම<br>✓ ආරක්ෂිත නිවාස සහ මූලික අවශ්‍යතා සැපයීම<br>✓ ළමා වින්දිතයින් සඳහා වෘත්තීය හෝ ජීවන කුසලතා පුහුණු ලබා දීම<br>✓ ආරක්ෂිත නිවාසවල ළමයින් රැකබලා ගන්නන් සඳහා නිරන්තර නිපුණතා පුහුණුවක් ලබා දීම.<br>✓ ළමා වින්දිතයින් සමග රාජ්‍ය නිලධාරීන් විසින් ළමා හිතකාමී සන්නිවේදනය සහ සැලකීම සහිතව මැදිහත් වීම. |

## 6.5 සහභාගීත්ව සහ අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයක් යොදා ගැනීමේ වගකීම

ළමා වෙළඳාම වැළැක්වීම, ආරක්ෂා කිරීම, පුනරුත්ථාපනය කිරීම හා නැවත සමාජගත කිරීම සඳහා රාජය, සිවිල් සමාජය සහ මාධ්‍ය විසින් සහභාගීත්ව හා අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කළ යුතුය. ඒ අනුව, ළමා වෙළඳාම වැළැක්වීම, ළමා වෙළඳාමට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා වන මූල පිරිම් සහ ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී, සියලු පාර්ශවකරුවන් විසින් දරුවාගේ අයිතිවාසිකම්වලට ගරු කිරීමට, දරුවාගේ උපරිම යහපත මෙන්ම සමාන සැලකිලි දැක්වීමට හෝ වෙනස් කොට නොසැලකීමට සිහි තබා ගත යුතු ය.

> දරුවාගේ අයිතිවාසිකම්වලට **ගරු කරන්න**
>
> දරුවාගේ උපරිම යහපත සඳහා **මූලිකත්වය දෙන්න**
>
> සෑම දරුවෙකුට ම **සමාන සැලකිලි** දැක්වීමට හා ඔවුන්ට **වෙනස්කොට නොසැලකීමට සහතික වන්න**

මීට අමතරව, ළමා වෙළඳාමට ගොදුරු වූවන් හෝ අවදානමට ලක්ව ඇති ළමයින් ආරක්ෂා කිරීම සහ ළමා ජාවාරම වැළැක්වීම සඳහා වන මුල පිරිම් සැලසුම් කිරීමේ දී දරුවන්ට සහභාගී වීමට සහ ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවන් ලබා දිය යුතු ය. විශේෂයෙන් ම පුනරුත්ථාපන හා නැවත සමාජය සමඟ ඒකාබද්ධ කිරීම පිළිබඳ අවශ්‍යතා තක්සේරු කිරීමේ දී, නැවත පැමිණීම, පුනරුත්ථාපනය කිරීම සහ සමාජය සමඟ ඒකාබද්ධ කිරීමේ යෝජනා ක්‍රම සංවර්ධනය කිරීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ළමා වින්දිතයින්ගේ අදහස් සහ දරුවාගේ උපරිම යහපත ගැන සලකා බැලීම සහතික කිරීම අත්‍යවශ්‍ය වේ.

### 6.6 ළමා වෙළඳාම් විරෝධීබව ප්‍රවර්ධනය සහ නැවත සමාජගත කිරීමට වන වගකීම

ඒ හා සමානව, ළමා වෙළඳාමට එරෙහිව සටන් කිරීමට සහ වෙළඳාම්වලට ගොදුරු වූ ළමුන් හෝ අවදානමට ලක්ව සිටින ළමයින්ට යුක්තිය ඉටු කරවා ගැනීම උදෙසා ළමා වෙළඳාමට එරෙහි සහ නැවත සමාජගත කිරීමේ ව්‍යාපාර සහ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යය, මාධ්‍යය සහ සිවිල් සමාජය සතුව සමාන වගකීමක් ඇත. ළමා වෙළඳාමට රාජ්‍යය සහ ප්‍රජාව දක්වන ප්‍රතිචාරය වැඩිදියුණු කිරීමට සහ ආරක්ෂාව, වැළැක්වීම සහ නැවත ඒකාබද්ධ කිරීම සඳහා අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීමේ හැකියාව සහ වගකීම මාධ්‍යය සතුව ඇත.

### 6.7 නිගමනය

ළමා වෙළඳාමට ගොදුරු වූවන් හෝ අවදානමට ලක්ව සිටින ළමයින් ආරක්ෂා කිරීම සහ ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත හා සාර්ථක බව සහතික කිරීම සඳහා ළමා වෙළඳාම හෙළා දැකීමට සමාජයේ සෑම කෙනෙකුටම සෘජුව හෝ වක්‍රව වගකීමක් පැවරී ඇත. කෙසේ වෙතත්, ළමා ආරක්ෂණ හා සංවර්ධනයට සම්බන්ධ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ අනෙකුත් පුරෝගාමී නිලධාරීන් ළමා වෙළඳාම වැළැක්වීම සහ ළමා වෙළඳාමට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම හා පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් වන වගකීමට පමණක් නොව ඒ සඳහා වගවීමට ද මතක තබා ගත යුතු ය.



**ඉගෙනුම් මෙවලම්**

**ක්‍රියාකාරකම :**

සහභාගිවන්නන් කණ්ඩායම් පහකට බෙදන්න. සෑම කණ්ඩායමක් ම පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගනු ඇත.

1. රාජ්‍යය
2. රාජ්‍ය නොවන සංවිධාන
3. සමාජය/ ප්‍රජාව
4. මාධ්‍ය
5. තනි පුද්ගලයින්

සෑම කණ්ඩායමක් ම තමන් අදාළ පාර්ශවකරුවන් නියෝජනය කරන බව සලකා බැලිය යුතු අතර බැඳීම්, වගකීම් ක්‍රියාත්මක කිරීමේ අභියෝග සහ එක් එක් පාර්ශවකරුවන්ට අනෙක් පාර්ශවකරුවන්ගෙන් ලබා ගත හැකි ආධාර මොනවාද යන්න හඳුනාගත යුතු ය.

සෑම කණ්ඩායමක් ම තමන් හඳුනාගත් දේ ලැයිස්තු ගත කළ යුතු අතර (අවම වශයෙන් කරුණු පහ බැගින්) ඒවා සහභාගීවන්නන්හට ඉදිරිපත් කළ යුතුය

**ක්‍රියාකාරකම:**

මෙම මොඩියුලයට කිරීමට පෙර දින, සහභාගිවන්නන් කණ්ඩායම් පහකට බෙදිය යුතු ය. සෑම කණ්ඩායමක් ම ඕනෑම මාධ්‍යයකින් අනාවරණය කරන ලද දේශීය හෝ විදේශීය ළමා වෙළඳාම් පිළිබඳ සිද්ධියක් තෝරා ගත යුතු ය. මොඩියුලය අවසානයේ, මෙම කණ්ඩායම් විසින් එක් එක් පාර්ශවකරුවන් වෙන් වෙන්ව ගෙන පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් තෝරාගත් සිදුවීම පිළිබඳ සිද්ධි සිතියම් ගත කිරීම කළ යුතු ය.

1. සිද්ධිය වැළැක්වීමට ගත හැකිව තිබූ පියවර
2. ගැටළුව විසඳීම සඳහා සිද්ධියේ ආරම්භයේ සිට අවසානය දක්වා ගෙන ඇති පියවර
3. අනාගතයේ දී මෙවැනි සිදුවීම් තුරන් කිරීම සඳහා ගෙන ඇති හෝ ගත යුතු පියවර.

සෑම කණ්ඩායමකට ම තම සිද්ධි සිතියම්ගත කිරීම අනෙක් අයට ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලැබෙනු ඇත.

## හත්වන මොඩියුලය

| තොරතුරු සමඟ ගනුදෙනු කිරීම | | |
|---|---|---|
|  | **දේශන පැය ගණන** | 6 |
|  | **ඇගයීමේ ක්‍රමවේදය** | පන්ති සාකච්ඡා සහ නිරීක්ෂණය |
| | **අධ්‍යයන අරමුණු** | මොඩියුලය අවසානයේ සහභාගිවන්නන්ට<br><br>✓ වැරදිකරුවන් හඳුනා ගැනීමට;<br>✓ ළමයින් වෙළඳාම් කිරීමේ සිද්ධීන් හඳුනා ගැනීමට;<br>✓ ඵලදායී වාර්තා තබා ගැනීමේ ක්‍රම ඉගෙන ගැනීමට;<br>✓ තොරතුරු වාර්තා කිරීමේ ක්‍රම ඉගෙන ගැනීමට; සහ<br>✓ තොරතුරු බෙදා හැරීමට<br>හැකි වනු ඇත |

### a. තොරතුරු ලබා ගැනීම, වාර්තා තබා ගැනීම , වාර්තා කිරීම සහ බෙදා හැරීම

**හැඳින්වීම**

### 7.1 මිනිස් වෙළඳාම සම්බන්ධ ශ්‍රී ලංකා නීතිය

දණ්ඩ නීති සංග්‍රහය යනු මානව වෙළඳාම යන වරද සිදු කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවෙකු වන තැනැත්තෙකුට එරෙහිව නඩු පැවරීම සඳහා යොදා ගැනෙන දැනට ක්‍රියාත්මක ප්‍රධාන අපරාධ නීතියයි.

2006 අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනතේ 2 (2) වගන්තියේ විධිවිධානවලට අනුව, ළමුන් ඇතුළු පුද්ගලයින් වෙළඳාම් කිරීමේ වරද සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අධිකරණයට පාරදේශභූමික අධිකරණ බලය පවරා දී ඇත.

අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ පිළිබඳ සම්මුතියට අත්සන් තැබූ රාජ්‍යක් ලෙස, රජය විසින් 2006 අංක 16 දරණ දණ්ඩ නීති සංග්‍රහ (සංශෝධන) පනත පැනවීම මගින් මිනිස් වෙළඳාම පිළිබඳ අතිරේක ප්‍රොටෝකෝලය හා අනුගතව ව්‍යවස්ථාවක් හඳුන්වා දුන්නේය. 360 C (1) වගන්තිය මගින් ළමයින් වෙළඳාම් කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපාදන දක්වා ඇත.

**දණ්ඩ නීති සංග්‍රහය**

358 අ වගන්තිය - ණය බැඳුම්කරය, දාසභාවයට පත් කිරීම, බලහත්කාර හෝ අනිවාර්ය වැඩගැනීම, වහල්භාවය සහ යුද්ධයේ යෙදවීම සඳහා ළමයින් බඳවා ගැනීම.

360 අ වගන්තිය – කුට්ටනය

360 ආ (1) වගන්තිය – ළමයින් ලිංගිකව සූරාකෑම

360 ඇ වගන්තිය – තැනැත්තන් වෙළදාම් කිරීම

360 ඈ වගන්තිය - නීති විරෝධීව දරුකමට හදා ගැනීම් හා අදාළ වැරදි

360 ඉ වගන්තිය – ළමයෙකු පොළඹවා ගැනීමට ඇවිටිලි කිරීම

**සුවිශේෂී බලාත්මක කිරීම්**

1841 අංක 4 දරණ අයාල ආඥා පනත යටතේ ගැනෙන වැරදි

1889 අංක 5 දරණ ගණිකා නිවාස ආඥා පනත

1985 අංක 21 දරණ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත යටතේ ගැනෙන වැරදි


වෛශ්‍යා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් ජාවාරම් කිරීම වැලැක්වීම සහ ඊට එරෙහිව කටයුතු කිරීම පිළිබඳ සම්මුතිය (තවම ගැසට් කර නොමැත)

**දණ්ඩ නීති සංග්‍රහයේ 360 සී වගන්තිය**

| දණ්ඩ නීති සංග්‍රහය | ක්‍රියාව | කරනු ලබන ආකාරය | අරමුණ | |
|---|---|---|---|---|
| 360 ඇ (1) (අ) | කවුරුන් හෝ, මුදල් හෝ වෙනත් ප්‍රතිශ්ඨාවක් සඳහා තැනැත්තෙකු<br>• මිලදී ගැනීම<br>• විකිණීම<br>• හුවමාරු කිරීම<br>• මිලදී ගැනීමට, විකිණීමට හෝ හුවමාරුව සඳහා පෙළඹවීම සිදු කරන<br>• මිලදී ගැනීම විකිණීම, හුවමාරුව සඳහා ප්‍රවර්ධනය කිරීමට / පහසුකම් සැලසීමට හෝ පෙළඹවීමට යම් දෙයක් කරන | ඕනෑම මාධ්‍යක් | ඕනෑම අරමුණක් | |

| | | | | |
|---|---|---|---|---|
| 360 (1) (ආ) | • ඕනෑම පුද්ගලයෙකු බඳවා ගැනීම<br>• ඕනෑම පුද්ගලයෙකු ප්‍රවාහනය කිරීම<br>• ඕනෑම පුද්ගලයෙකු මාරු කිරීම<br>• ඕනෑම පුද්ගලයෙකු රඳවා තබා ගැනීම<br>• ඕනෑම පුද්ගලයෙකු බාර ගැනීම<br>• වෙනත් | • බලය<br>• වංචාව<br>• රැවටීම<br>• ප්‍රේරණය භාවිතයෙන් වෙනත් කෙනෙකුගේ අවදානම් සහගත භාවය සූරාකෑම | බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම<br>• වහල්භාවය<br>• පරවශ්‍යතා<br>• අවයව ඉවත් කිරීම<br>• ගණිකා වෘත්තිය<br>• ලිංගික සූරාකෑම<br>• ඕනෑම නීතියක වරදක් වන ඕනෑම ක්‍රියාවක් | තැනැත්තන් වෙළදාම් කිරීම |
| **360 ඇ (1) (ඇ)** | • දරුවෙකු බඳවා ගැනීම<br>• දරුවෙකු ප්‍රවාහනය කිරීම<br>• දරුවෙකු මාරු කිරීම<br>• දරුවෙකු සඟවා තබා ගැනීම<br>• දරුවෙකු බාර ගැනීම<br>• වෙනත් | දරුවාගේ කැමැත්ත ඇතිව හෝ නොමැතිව | බලහත්කාරයෙන් හෝ අනිවාර්යයෙන් වැඩ ගැනීම<br>• වහල්භාවය<br>• පරවශ්‍යතා<br>• අවයව ඉවත් කිරීම<br>• ගණිකා වෘත්තිය<br>• ලිංගික සූරාකෑම<br>• ඕනෑම නීතියක වරදක් වන ඕනෑම ක්‍රියාවක් | |

**360C (1) (ඇ)**




**සටහන** -

(ඇ). - හැඳින්වීම මඟින් 360 ඇ (1) වගන්තිය පිළිබඳව විශේෂ අවධානයත් සමඟ නීතියේ විධිවිධාන මතක් කළ යුතුය

මොඩියුල 4 සහ 5 මගින් දැනටමත් නීතිය පිළිබඳ නිර්වචන සහ අවබෝධය පිළිබඳව ආවරණය කර ඇති බැවින් සහභාගිවන්නන්ට ප්‍රතිපාදන පිළිබඳ නිසි දැනුමක් හා අවබෝධයක් තිබිය යුතු ය. මිනිස් වෙළඳාම පිළිබඳ සිද්ධීන් හඳුනා ගැනීම නිවැරදි අර්ථ නිරූපනයන් පිළිබඳව අවබෝධ කර ගැනීමෙන් තොරව කළ නොහැකිය. නිවැරදි දැනුම නොමැතිකම මානව වෙළඳාම පිළිබඳ වරද හඳුනා ගැනීමේ ව්‍යාකූලත්වයට හේතු වන බව සැලකිල්ලට ගත යුතු ය.

**උදාහරණය ;** දරුවෙකු ගෘහ සේවකයෙකු ලෙස සේවය කරමින් සිටියදී හසු වූවා නම්, අපරාධකරු විසින් සිදු කරන ලද වැරදි මොනවාද? මෙම වැරදිවලට අදාළ නීතිය කුමක්ද?

ළමයා වයස අවුරුදු 14 ට වැඩි නම් ශ්‍රී ලංකාවේ කම්කරු නීතිය යටතේ මෙය වරදක්ද?

සොයාගත් ළමයා වයස අවුරුදු 14 ට අඩු නම් එහි ප්‍රතිඵලය කුමක්ද?

අධ්‍යාපනයක් ලබා දෙන බවට පොරොන්දු වෙමින් ඔහුව නිවසට ගෙන ආවාද? (දරුවාගේ පවුල් පසුබිම වෙනත් කෙනෙකුගේ අවදානම් සපයන තත්ත්වය සූරාකෑම)

දරුවා කුරිරු/ ලිංගික අපයෝජනයට ලක්ව තිබේද? කරුණු ගවේෂණය කිරීම සඳහා තොරතුරු වාර්තා තබා ගැනීමේ ක්‍රමය මෙම දරුවාගේ අවදානම් සහගත තත්ත්වය හා සම්බන්දිත කරුණු ගවේෂණය කිරීම සඳහා තොරතුරු ක්‍රමවේදය වාර්තා කොට තබා ගැනීමේ ක්‍රමවේදයක් ඊළඟ කොටසේ සාකච්ඡා කෙරේ.



*තොරතුරු ලබා ගැනීම, වාර්තා තබා ගැනීම, වාර්තා කිරීම සහ බෙදා හැරීම සඳහා ඉගෙනුම් මෙවලම*

- UNICEF: Billion Dollar Business of Child Trafficking (මිනිත්තු 04 ) වීඩියෝ පටය ධාවනය කරන්න - https://www.youtube.com/watch?v=elhX3XGaFsE
- ප්‍රක්ෂේපන තිර - තිර 1 සිට 3 දක්වා (මිනිත්තු 6)
- ප්‍රක්ෂේපන තිර 2 හි සඳහන් කතාව වෙත අවධානය යොමු කරන්න (මිනිත්තු 15)
- ප්‍රක්ෂේපන තිර 2 හි සඳහන් කතාව වෙත අවධානය යොමු කර මානව වෙළඳාම කිරීමේ සිද්ධිය සහ අදාළ නීතියේ විධිවිධාන හඳුනා ගැනීම සඳහා විශේෂයෙන් සඳහනක් දී ඇති උදාහරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ විනිශ්චයන් පිළිබඳව ප්‍රශ්න කරන්න. (මිනිත්තු 10)
- සාකච්ඡාව (මිනිත්තු 10)

සහභාගිවන්නන් කුඩා කණ්ඩායම්වලට බෙදා ඔවුන්ගේ පවතින දැනුම හා අත්දැකීම් මත පදනම්ව මිනිස් වෙළඳාමේ මූලිකාංග හඳුනා ගැනීමට ඔවුන්ව මෙහෙයවන්න. එම අංග කොලයක් මත ලියා විවෘත කණ්ඩායම් සාකච්ඡාවේදී සාකච්ඡා කළ යුතුය. (මිනිත්තු 10)

(මිනිත්තු 55)

## 7.2. තොරතුරු ලබා ගැනීම

### අ. පර්යේෂණ ප්‍රොටෝකෝලය

**පසුබිම**

2018, මානව වෙළඳාම පිළිබඳ වාර්තාවේ ශ්‍රී ලංකාව මූලික වශයෙන් බලහත්කාරයෙන් ශ්‍රමය හා ලිංගික වෙළඳාමට ගොදුරු වූ පිරිමින්, කාන්තාවන් සහ ළමුන් සඳහා ප්‍රභවයක්, ගමනාන්තයක් ලෙසත්, අවම වශයෙන් අතරමැදි ස්ථානයක් ලෙස භාවිතා වන රටක් ලෙසත් සඳහන් කරයි.

ඉදිකිරීම්, ඇඟලුම් හා ගෘහ සේවා අංශවල වැඩ කිරීම සඳහා මැදපෙරදිග, අග්නිදිග ආසියාව සහ ඇෆ්ගනිස්ථානය වෙත සංක්‍රමණය වන ශ්‍රී ලාංකික පිරිමින්, කාන්තාවන් සහ ළමුන් වැඩි වශයෙන් බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීමට සහ ඔවුන්ගෙන් සමහරක් බලහත්කාර ගණිකා වෘත්තියට ද යටත් වන බව අනාවරණය වී ඇත. තවද, ගණිකා නිවාසවල සිදු වන ලිංගික ජාවාරම බොහෝ වෙරළබඩ ප්‍රදේශවල කාන්තාවන් සහ ළමයින් ඊට ගොදුරු කරවයි. ගැහැණු ළමයින්ට වඩා පිරිමි ළමයින් වාණිජ ලිංගිකත්වය හරහා සූරාකනු ලැබේ. සාමාජීය වශයෙන් අවදානම් සහිත ළමුන්ට නගරවල යාචකයන් වීමට හෝ ගෘහ සේවකයන් ලෙස කටයුතු කිරීමට බල කෙරෙන අතර යම් අවස්ථාවලදී ඔවුන් ශාරීරික, ලිංගික හා මානසික අපයෝජනයන්ට ලක් වීම, වැටුප් නොගෙවීම සහ චලනතාවය සීමා කිරීම සිදු වේ.

**අරමුණු**

මානව වෙළඳාම වැළැක්වීමේ අරමුණින්, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් විසින් ඊට ගොදුරු විය හැකි පුද්ගලයින් හඳුනා ගැනීමේ උත්සාහයන් වැඩි කළ යුතුය. වින්දිතයා හඳුනා ගැනීම වින්දිතයින්ගේ උපරිම යහපත සහතික කිරීම උදෙසා නිවැරදි ස්ථාන සඳහා ඔවුන් යොමු කිරීමේ ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

එබැවින් තොරතුරු ලබා ගැනීම, වාර්තා තබා ගැනීම, වාර්තා කිරීම සහ තොරතුරු බෙදා හැරීම සම්බන්ධයෙන් නිලධාරීන් පුහුණු කිරීම අත්‍යවශ්‍ය වේ. ළමයින් වෙළඳාම් කිරීමේ සිද්ධීන් හඳුනා ගැනීම සහ එම අවදානමට ලක්ව ඇති ළමුන් හඳුනා ගැනීම සඳහා ළමයින් සමඟ සෘජුව ම කටයුතු කරන නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ අනෙකුත් රාජ්‍ය නිලධාරීන්ගේ ශක්‍යතාවය වර්ධනය කිරීම සඳහා මෙම මොඩියුලය අවශ්‍ය වේ.

ක්‍රමවේදය

මෙම මොඩියුලයේ ඉදිරිපත් කර ඇති තොරතුරු අදාළ ව්‍යවස්ථාදායක නීති, ජාත්‍යන්තර සම්මුතීන් සහ නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සහ නඩු පවරන්නන් සමඟ සම්මුඛ සාකච්ඡාවලින් ලබා ගන්නා ලදී.

### ආ) සම්මුඛ පරීක්ෂණ ශිල්පීය ක්‍රම

**(i) සම්මුඛ පරීක්ෂණය සඳහා සූදානම් වීම**

- අනවශ්‍ය ප්‍රමාදයකින් හෝ අසාමාන්‍ය හදිසියකින් තොරව වින්දිතයාගේ ප්‍රකාශය සටහන් කළ යුතුය.
- වීඩියෝ පටිගත කිරීමට පෙර වින්දිතයා සමඟ පූර්ව සාකච්ඡාවක් පැවැත්විය යුතු අතර වින්දිතයා පුහුණු නොකරන ලෙස සම්මුඛ පරීක්ෂකවරයාට අනතුරු ඇඟවිය යුතු ය.
- වින්දිතයාට ඇයට/ ඔහුට පහසු පුද්ගලයෙකු සමඟ ඇසුරු කිරීමට ඉඩ දෙන්න. සුදුසු නම් ළමා මනස වටහා ගත හැකි, උපදේශකයෙකු යනාදී වශයෙන්.
- සම්මුඛ පරීක්ෂණයට පෙර වින්දිතයා ළමා මනෝ විද්‍යාඥයෙකු වෙත ඉදිරිපත් කළ යුතු ය.
- වින්දිතයා කිසිදු වේලාවක හුදෙකලා නොකළ යුතු ය. ක්‍රියාවලිය අතරතුර, මැදිහත්වීම් හෝ වෙනත් බාධා කිරීම් වළක්වා ගත යුතු ය.
- අවශ්‍ය නම් අවස්ථාපිත සාධක මත කාන්තා පොලිස් නිලධාරීන්ගේ සහාය ලබා ගත යුතු ය.
- සම්මුඛ පරීක්ෂණයේදී ආවරණය කළ යුතු කරුණු සම්බන්ධයෙන් ලැයිස්තුවක් සකස් කළ යුතු ය.
- මෙම ලැයිස්තුවට;
    - සිදුවීම් මාලාව,
    - සිද්ධිමය සාධක
    - වැරදිකරුවන් හඳුනා ගැනීම පිළිබඳ දේ ඇතුළත් විය හැකිය.

**(ii) සම්මුඛ පරීක්ෂණය අතරතුර**

- සම්මුඛ පරීක්ෂණයේ ප්‍රගති සමාලෝචනයේදී දී නව කරුණු හා සිදුවීම් මතු කරවීමට සම්මුඛ පරීක්ෂකවරයාට හැකි විය යුතු ය.
- සම්මුඛ පරීක්ෂක විසින් වින්දිතයාගේ භාෂාවෙන් ප්‍රකාශය සටහන් කළ යුතු ය.
- සම්මුඛ පරීක්ෂක විසින් නිරීක්ෂණය කරන ලද පරිදි වින්දිතයාගේ ශරීර භාෂාව සහ චිත්තවේගීය වෙනස ඉස්මතු කර වාර්තා කළ යුතු_ය.
- සම්මුඛ පරීක්ෂක විසින් අසනු ලබන ප්‍රශ්න අවශ්‍ය තරම් සරල හා කෙටි විය යුතු අතර, එය කම්පනයෙන් මිදීමට සහ නිසි ලෙස, සංවේදීව හා සම්පූර්ණයෙන් සිදුවීම් සිහිපත් කිරීමට වින්දිතයාට උපකාර කළ යුතු ය.
- භාවිතා කරන භාෂාව සහ පාරිභාෂිතය වින්දිතයාට තේරුම් ගත හැකි විය යුතු ය. සම්මුඛ පරීක්ෂණය අතරතුර, සම්මුඛ පරීක්ෂකවරයා කිසිදු අදහස් දැක්වීමක් හෝ විවේචනයක් නොකළ යුතු ය.
- නඩු විභාගයේදී ප්‍රතිවිරෝධතා පැවතීම අවම කිරීම සඳහා පටිගත කරන ප්‍රකාශ ගණන අවම කළ යුතු ය.
- වින්දිතයින් අපරාධයක් කර ඇති බවට ව්‍යාජ හැඟීමක් ලබා දීමෙන් වින්දිතයින් තුළ භීතිය ඇති කිරීම සඳහා ජාවාරම්කරුවන් ව්‍යාජ තොරතුරු සපයයි. එමනිසා සම්මුඛ පරීක්ෂකවරයා වින්දිතයාට වින්දිතයා තමා ය යන බව වටහා දිය යුතු අතර ඔහු/ ඇය අත්අඩංගුවට ගැනීමකට ලක් කළ හැකි වරදක් නොමැති බව පහදා දිය යුතු ය.
- ප්‍රකාශය සවිස්තරාත්මක විය යුතු අතර එය තාර්කික විය යුතු මෙන්ම වෙළඳාමේ සහ සූරාකෑමේ සියලු අංශ ආවරණය කළ යුතු ය.

- තවද, සූරාකෑමේ ප්‍රවර්ගය, වෙළඳාම් කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ විවිධ පුද්ගලයින්ගේ භූමිකාව සහ ඔවුන්ගේ අනන්‍යතාවය සහ සමස්ත සිදුවීම් දාමය වැනි තොරතුරු රැස් කිරීම කෙරෙහි සම්මුඛ පරීක්ෂකවරයා අවධානය යොමු කළ යුතු ය. (වින්දිතයාට නමෙන් වැරදිකරුගේ අනන්‍යතාවය හෙළි කිරීමට නොහැකි විය හැකි නමුත්, නඩු විභාගයේ දී ප්‍රයෝජනවත් වන වැරදිකරුවෙකුගේ විශේෂ භෞතික ලක්ෂණ ආදිය හඳුනා ගැනීමට හැකි වනු ඇත. ඇඳුම්, ස්වර්ණාභරණ ආදි සැලකිය යුතු ය. )

**(iii) වින්දිතයා සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීමෙන් පසු**

- නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමේ වින්දිතයාගේ උත්සාහය අගය කිරීමට වග බලා ගන්න.
- වින්දිතයාට ශාරීරික හා මානසිකව සිදු වූ සිදුවීම් සිහිපත් කිරීමෙන් ද්විතීයික හිංසනයට ලක්විය හැකි බැවින් සම්මුඛ සාකච්ඡා නැවත කිරීම සහ නැවත සිදුකිරීමට සැලසුම් කිරීම වළක්වා ගැනීම ඉතා වැදගත් වේ.
- වැරදිකරුට සහ වින්දිතයාට එකම වාහනයක ගමන් කිරීමට බල නොකළ යුතු ය. නැතහොත් වින්දිතයාට වෙනත් වැරදිකරුවන් සමඟ බන්ධනාගාර බස් රථයක ගමන් කිරීමට බල නොකළ යුතු ය. ඔවුන් දරුවන් වන බැවින් වැරදිකරු නිතර දැකීමෙන් වින්දිතයාගේ මානසික තත්ත්වයට බලපෑම් ඇති විය හැකි අතර එය තමාම වැරදිකරුවෙකු ලෙස හැඟීමට බල පෑ හැකි ය.

**(iv) ) ළමා වින්දිතයින්ගේ සම්මුඛ සාකච්ඡාවල විශේෂ ලක්ෂණ**

- සම්මුඛ පරීක්ෂණයට පෙර අතරතුරදී සහ පසුව ආහාර, ජලය, තේ, සනීපාරක්ෂක සැපයුම් ආදිය ලබා දීමෙන් වින්දිතයාගේ සැපපහසුකම් රැක බලා ගත යුතු ය.
- ළමා වින්දිතයින්ට විශේෂ ආහාර තෝරා ගැනීම වැනි විශේෂ අවශ්‍යතා සැපයිය යුතු ය.
- සම්මුඛ පරීක්ෂණ ස්ථානය වින්දිතයාට සුවපහසු විය යුතු ය. ළමයින්ට හිතකාමී වාතාවරණයක් පවත්වා ගත යුතු ය.
- වින්දිතයා කැඳවාගෙන එන පුද්ගලයාගේ ප්‍රකාශය සටහන් කළ යුතු ය.

ළමා වින්දිතයින්ගේ ප්‍රකාශය ලිඛිත ප්‍රකාශයකට වඩා වීඩියෝ පටිගත කිරීමක් ලෙස පටිගත කිරීමට පොලිසිය ප්‍රවේශම් විය යුතු අතර විමර්ශකයින්ට යටිතල පහසුකම් ලබා දිය යුතු ය. සිද්ධියට මුහුණ දුන් තැනැත්තාගේ සැබෑ නැවුම් හැසිරීම පිළිබිඹු කරන උසස් තත්ත්වයේ වීඩියෝ පටිගත කිරීමක් භාවිතා කිරීමට උත්සාහ කළ යුතු ය.

**සටහන** - කරුණාකර 4 සිට 8 දක්වා වන ප්‍රක්ෂේපන තිර බලන්න
තම අත්දැකීම් මත දරුවෙකු සම්මුඛ පරීක්ෂණයට ලක් කිරීම නිරූපණය කිරීමට සහභාගිවන්නන් දෙදෙනෙකුට ආරාධනා කරන්න
සම්මුඛ පරීක්ෂණ ක්‍රියාවලිය අදියර තුනකට බෙදීමෙන් සම්මුඛ පරීක්ෂණ ක්‍රමවේදයන් ඉස්මතු කරන්න: 1. සම්මුඛ පරීක්ෂණයට පෙර 2. සම්මුඛ පරීක්ෂණය අතරතුරේදී 3. සම්මුඛ පරීක්ෂණයෙන් පසුව
ළමා වින්දිතයින්ගේ සම්මුඛ පරීක්ෂණයේ විශේෂ ලක්ෂණය අවසාන කරුණ ලෙස සාකච්ඡා කළ යුතු අතර ළමා වින්දිත ප්‍රකාශයේ වීඩියෝ පටිගත කිරීමේ වැදගත්කම ඉස්මතු කළ යුතු ය. (ළමා වින්දිතයින් වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින් ය. විමර්ශනය අවසන් කිරීමෙන් පසු අපරාධ නඩු පැවරීමට අවම වශයෙන් අවුරුදු 2-3 කට වඩා ගත වේ. සමහර අවස්ථාවල වින්දිතයාට මතකය නොමැතිකම හේතුවෙන් සිද්ධිය සිහිපත් කළ නොහැක. එවැනි අවස්ථාවල නඩු පැවරීමේදී නඩුව පටිගත කිරීම මහගු උපකාරයක් වේ)



*තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉගෙනුම් මෙවලම්*

**අ. පර්යේෂණ ප්‍රොටෝකෝලය -** (මිනිත්තු 15)

මොඩියුලය 7 පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම

**ආ. සම්මුඛ පරීක්ෂණ ශිල්පීය ක්‍රම**

- සහභාගිවන්නන් දෙදෙනෙකුගේ සහාය ඇතිව එක් අයෙකු වින්දිතයා ලෙස සහ අනෙකා සම්මුඛ පරීක්ෂක ලෙස නිරූපණය කිරීම
- කරුණාකර 4 සිට 7 දක්වා ප්‍රක්ෂේපන තිර වෙත යොමු වන්න (ප්‍රක්ෂේපන තිරයකට මිනිත්තු 10)
- ප්‍රක්ෂේපන තිර 8 සඳහා (මිනිත්තු 15)

- ළමා වින්දිතයෙකුගේ සම්මුඛ සාකච්ඡාවක විශේෂ ලක්ෂණ පිළිබද සහභාගිවන්නන් සමඟ පළමු සාකච්ඡාව

- ඔවුන්ගේ අදහස් ලැයිස්තු ගත කිරීමට ෆ්ලිප් බෝඩ් භාවිතා කරන්න (මිනිත්තු 15)

- ඉන්පසු මොඩියුලයේ ***7.2.1.b (iv)*** කොටස බලන්න. (මිනිත්තු 10)

මිනිස් වෙළඳාම යනු කුමක්ද යන්න පිළිබඳ වීඩියෝ පටයක් වාදනය කරන්න

https://www.youtube.com/watch?v=DWoHgIoLCPg

(මිනිත්තු 65)

**ඇ. සදාචාරාත්මක ගැටළු**

"ආචාර ධර්ම" සදාචාරාත්මක මූලධර්ම ලෙස අර්ථ දක්වා ඇති අතර සෑම තත්ත්වයකදී ම දෙන ලද සන්දර්භයක් තුළ ඇති හරි වැරැද්ද තීරණය කිරීමට අවශ්‍ය වේ. ළමා වින්දිතයෙකු සම්බන්ධ අපරාධ පරීක්ෂණයකදී භාවිතා කරන සම්මුඛ පරීක්ෂණ ක්‍රම "''දරුවාගේ උපරිම යහපත" සැලකිල්ලට ගත යුතු ය.

නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ වෘත්තීය ආචාර ධර්ම පාලනය කරන ආයතනික යාන්ත්‍රණයක් හෝ නීති පැනවීමක් නොමැත.

වෛද්‍ය ආඥා පනතේ වෛද්‍ය වෘත්තිකයන්ගේ ආචාර ධර්ම පද්ධතිය. දක්වා ඇත[83].

- ➢ පළමු පියවර ලෙස, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරියෙකු මූලික ළමා අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් විය යුතු ය.
- ➢ ළමා වින්දිතයාගේ වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය, ජාතිය, ජනවාර්ගිකත්වය, සංස්කෘතිය, ජාතික සම්භවය, ආගම, ලිංගික දිශානතිය, ආබාධිතභාවය, භාෂාව හෝ සමාජ ආර්ථික තත්ත්වය ගරු කළ යුතු අතර සලකා බැලිය යුතු ය. ඔහු/ ඇය පරිවාස නිවාසයේ තැබීමේදී ද මෙම කරුණු වැඩිදුර සලකා බැලිය යුතු ය.

ළමා වින්දිතයාගේ තොරතුරු

වයස අවුරුදු 15 යි. කුරුණෑගල ජීවත් විය.

ඇය 26 හැවිරිදි කුමාර සමඟ ප්‍රේම සම්බන්ධයක් පවත්වාගෙන ගියාය.

ඇය කුමාර සමඟ පැන ගොස් ඔහු සමඟ ලිංගික සංසර්ගයේ යෙදුණාය.

පොලිසිය විසින් කොළඹ ගණිකා නිවාසයක සිදුකරන ලද වැටලීමක දී මේ වන විට අත්අඩංගුවට ගෙන තිබේ.

සම්මුඛ පරීක්ෂක දරුවාගේ හැසිරීම විවේචනය නොකළ යුතු

→

උදාහරණය : වින්දිතයා දෙමළ ජනවාර්ගිකයෙක් නම්, එය පරිවාසය තුළ දී වුවද ඇය/ ඔහුට සෑම විටම දෙමළ කතා කරන නිලධාරීන්ට ප්‍රවේශය ලබා දිය යුතු ය.

[83] 1927 ශ්‍රී ලංකා වෛද්‍ය ආඥා පනත

- සම්මුඛ පරීක්ෂණ නිලධාරියා ළමුන් සම්බන්දව සංවේදී විය යුතු අතර වින්දිතයාට සිදුවූ දේ විවේචනය කිරීම හෝ විනිශ්චය කිරීම නොකළ යුතු ය.
- ළමයෙකු සමඟ සන්නිවේදනය කිරීමේදී කණිෂ්ඨ පොලිස් නිලධාරීන් සෑම විටම ජ්‍යෙෂ්ඨ නිලධරයකු (සහකාර පොලිස් අධිකාරී හෝ ඊට ඉහළ) විසින් අධීක්ෂණය කළ යුතු ය. දරුවාගේ ආරක්ෂාව ඇතුළුව දරුවාගේ උපරිම යහපත පිළිබඳ මූලධර්මය මතකයේ තබා ගනිමින් තොරතුරු මුදා හැරීම කළ යුතු ය.
- ළමා ආරක්ෂාව සහතික කිරීම සඳහා සෑම විටම ඉහළ මට්ටමේ වෘත්තීය මට්ටමක් පවත්වා ගත යුතු ය.
- එවැනි කැමැත්ත ලබා නොගෙන කරන ක්‍රියාකාරකම් සිදු කිරීම නීතියෙන් හෝ රජයේ රෙගුලාසි මගින් හෝ වෙනත් ආචාර ධර්ම සංග්‍රහයක දක්වා ඇති පරිදි (උදාහරණ මාධ්‍යවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය) සිදු කිරීමට නියම කර ඇති විටක හැර අවශ්‍ය නම්, සියලු ආකාර සන්නිවේදනයන්හි දී දරුවාගේ දැනුවත්භාවයෙන් යුතුව ලබාදෙන කැමැත්ත දරුවාට සාධාරණ ලෙස තේරුම් ගත හැකි භාෂාවකින් පැහැදිලි කර දී ලබා ගත යුතු ය.
- විමර්ශනය තුළින් ලබාගත් සංවේදී තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා සාධාරණ පියවර ගැනීමට නිලධාරීන්ට / විමර්ශකයින්ට මූලික වගකීමක් ඇත.
- ළමා වින්දිතයාට දයානුකම්පාවෙන් හා ගෞරවයෙන් සැලකිලි ලැබීමට හිමිකමක් ඇත.



***සදාචාරාත්මක ගැටළු සඳහා මෙවලම්***

නිදසුනක් ලෙස, දෙන ලද අවස්ථාවක දී, වින්දිතයාගෙන් ඇසිය යුතු සහ වින්දිතයාගෙන් නොඇසිය යුතු ප්‍රශ්න ලැයිස්තුගත කිරීමට සහභාගිවන්නන් යොමු කරන්න. (මිනිත්තු 30 )

ළමා වින්දිතයාගේ තොරතුරු

වයස අවුරුදු 15 යි. කුරුණෑගල ජීවත් විය.

ඇය 26 හැවිරිදි කුමාර සමඟ ප්‍රේම සම්බන්ධයක් පවත්වාගෙන ගියාය.

ඇය කුමාර සමඟ පැන ගොස් ඔහු සමඟ ලිංගික සංසර්ගයේ යෙදුණාය.

පොලිසිය විසින් කොළඹ ගණිකා නිවාසයක සිදුකරන ලද වැටලීමකදී මේ වන විට අත්අඩංගුවට ගෙන තිබේ.

වින්දිතයාගෙන් ඇසිය යුතු සහ
වින්දිතයාගෙන් නොඇසිය යුතු ප්‍රශ්න
මොනවාද? (මිනිත්තු 20 )

- ඉහත දක්වා සිද්ධිය මත පදනම්ව විවෘත සාකච්ඡාවක් සහ ලබා දී ඇති තත්ත්වය පිළිබඳ ඔවුන්ගේ අවබෝධය පිළිබඳව සහභාගිවන්නන්ගෙන් විමසන්න. (මිනිත්තු 10)

ප්‍රක්ෂේපන තිර 10, 11
සාකච්ඡාව ගොඩනගන්න

(මිනිත්තු 60 )

## 7.3 තොරතුරු පටිගත කිරීම

### අ. දත්ත හැසිරවීම සහ ගබඩා කිරීම

මිනිස් වෙළඳාම සංක්‍රාන්ති අපරාධයකි. අපරාධ කළමනාකරණයට සහ නිවාරණ ක්‍රම දියුණු කිරීමට දත්ත පදනමක් සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.

#### I. පොලිස් අපරාධ වාර්තා අංශය (CRD)

අන්තර්ජාතික සංක්‍රමණ පිළිබඳ අන්තර්ජාතික සංවිධානයේ (IOM) තාක්ෂණික සහාය ඇතිව ශ්‍රී ලංකාවේ පොලිස් අපරාධ වාර්තා අංශය (CRD) 2009 ඔක්තෝම්බර් මාසයේදී සවිස්තරාත්මක හා මධ්‍යම දත්ත එක්රැස් කිරීමේ පද්ධතියක් ස්ථාපිත කරන ලදී. මෙම දත්ත ගබඩාව මිනිස් වෙළඳාම පිළිබඳ අදාළ දත්ත එක්රැස් කරන අතර ඒ පිළිබඳ සිද්ධි ලුහුබැඳ යාමට සහ නඩු පැවරීමට නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ට සහාය වේ.

#### II. ඇඟිලි සලකුනු රෙජිස්ට්‍රාර්

ඇඟිලි සලකුනු රෙජිස්ට්‍රාර් විසින් ඇඟිලි සලකුණු පිළිබඳ සීමිත දත්ත පදනමක් පවත්වා ගෙන යන අතර එහි ක්‍රියාකාරිත්වය පාලනය වන්නේ අපරාධ වැළැක්වීමේ ආඥා පනත මගිනි. ආඥා පනතට අනුව, එකී ආඥා පනතේ උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් දෝෂදර්ශනයට ලක්කරන ලද වූ සැකකරුවන්ගේ ඇඟිලි සලකුණු ලේඛනයක් තබා ගැනීමට අවසර ඇත. එකී පනතට ගෙනෙන ලද සංශෝධනයක් මගින් මිනිස් වෙළඳාම එම උප ලේඛනයට හඳුන්වා දෙන ලදී[84].

නීතිය ක්‍රියාත්මක කිරීමේ දී ඇති ප්‍රධාන බාධකවලින් එකක් වන්නේ දත්ත පදනමක් නොමැතිකමයි. ශ්‍රී ලංකාවේ අපරාධ සඳහා දත්ත පදනමක් ස්ථාපිත කිරීම මිනිස් වෙළඳාම කෙරෙහි පමණක් නොව සියලු ආකාරයේ අපරාධ සඳහා ද ඉතා වැදගත් වන්නේ ය. පොලිසිය දැනටමත් අපරාධ පිළිබඳ සංඛ්‍යාලේඛන වාර්තා කර ඇති හෙයින්, අපරාධයට අදාළ පාර්ශවයන්ගේ තොරතුරු ද එකම දත්ත ගබඩාවට ඇතුළත් කළ හැකි ය. මෙම වාර්තාකරණ පද්ධතිය අපරාධ නඩුවල දී ජාතික හා කලාපීය වශයෙන් වර්ධනය කළ හැකි ය. දැනටමත් පවතින පොලිස් වාර්තාවල සංඛ්‍යාලේඛන සම්පාදනය කර ඇති බැවින්, දැරීමට ඇති එකම අතිරේක පිරිවැය වනුයේ විශ්ලේෂණය, ඇගයීම සහ බෙදා හැරීමේ පිරිවැයයි. අපරාධ පිළිබඳ දත්ත සමුදාය අපරාධ විමර්ශන බුද්ධි ඒකකයන්ට පහසුකම් සපයන අතර එය වැළැක්වීමේ ක්‍රම දියුණු කිරීමට සහ මිනිස් වෙළඳාමට එරෙහිව සටන් කිරීම සඳහා බුද්ධි තොරතුරු බෙදා ගැනීමට එය උපකාරී වේ.

**<u>පොලිස් දෙපාර්තමේන්තුවේ දැනට පවත්නා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමයේ වාසි සහ අවාසි</u>**

| වාසි | අවාසි |
|---|---|
| අපරාධ පසුබිම් පරීක්ෂාවක් පහසුවෙන් පැවැත්විය හැකි වීම | නිවරද්‍ය නොවන දත්ත ඇතුළත් කිරීම් මානව දෝෂ |
| හොඳ දත්ත සන්නිවේදන පද්ධතියක හැකියාව | ව්‍යාජ තොරතුරු ගබඩා කිරීමේ හැකියාවන් |
| වැළැක්වීමේ ක්‍රම ක්‍රියාත්මක කිරීම | අනවසර වෙනස් කිරීම |
| සැකකරුවන් හඳුනා ගැනීමට සහාය වීම | දත්ත සොරකම් කළ හැකිය |
| වෙනත් රටවල් සමඟ තොරතුරු බෙදා ගැනීම පහසුය | රහස්‍යභාවය සහ පෞද්ගලිකත්වය පිළිබඳ ගැටළු |

---

[84] 2017 අංක .29 දරන පනත 18.11.2017 දින සිට බලාත්මක කරන ලදී



*දත්ත පටිගත කිරීමේ මෙවලම්*

**1. දත්ත හැසිරවීම සහ ගබඩා කිරීම (මිනිත්තු 20)**

- සාකච්ඡාව කණ්ඩායම් සාකච්ඡාවක් ලෙස පවත්වන්න.

| ප්‍රක්ෂේපන තිරය 12 |
|---|

- මතක අවදි කිරීම - දත්ත රැස් කිරීම වැඩි දියුණු කිරීම සඳහා අදහස් ෆ්ලිප් පුවරුවේ ප්‍රදර්ශනය කරන්න. (මිනිත්තු 15)
- සහභාගිවන්නන් සමඟ වාසි සහ අවාසි සාකච්ඡා කරන්න (මිනිත්තු 10)
- පවතින පද්ධතිය පිළිබඳ ප්‍රතිපෝෂණ සැසියක් පවත්වන්න. (මිනිත්තු 15)

| ප්‍රක්ෂේපන තිරය 13 |
|---|

(මිනිත්තු 45)

## 7.4 තොරතුරු වාර්තා කිරීම සහ බෙදා හැරීම

### a. තොරතුරු වලංගු කිරීම, වාර්තා කිරීම සහ බෙදා හැරීම

**(i) තොරතුරු වලංගු කිරීම**

තොරතුරු බෙදා හැරීමට පෙර වෙනත් ආයතන සමඟ සන්නිවේදනය කිරීමට අදහස් කරන කරුණු හෝ දත්තවල වලංගුබාවය තහවුරු කර ගැනීම වැදගත් වේ.

- දත්ත වලංගු කිරීම සඳහා, උපයෝගීතා පරීක්ෂණ හරහා දත්ත ධාවනය කිරීම වැනි සුදුසු පරීක්ෂණ ක්‍රියාත්මක කළ යුතු ය.
- අවිධිමත් දත්ත වලංගු කිරීම සඳහා, තොරතුරු ස්ථාපිත කිරීම සහ සත්‍යාපනය කිරීම සඳහා සුදුසු වැඩිදුර විමර්ශන ක්‍රම භාවිතා කළ හැකි ය.
- අන් අයගෙන් ලැබුණු ඕනෑම දත්තයක් වලංගු කිරීම සඳහා, ඔබට අවශ්‍ය කුමන තොරතුරු ද යන්න පිළිබඳව ඔබට පැහැදිලි බව කලින් සහතික කර ගන්න.

**දත්ත වලංගු කිරීමට උපදෙස්**

1. තොරතුරු වලංගුභාවය සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා නිලධාරීන්ගේ අත්දැකීම් සහ ඔවුන්ගේ දැනුම හා කුසලතාව භාවිතා කරන්න. එසේම ස්වාධීන මූලාශ්‍රයන් ඇසුරෙන් තවත් තහවුරු කල හැකි උපකාරී සාක්ෂි රැස් කරන්න.

| දරුවා සමඟ එන පුද්ගලයාගේ ප්‍රකාශය (උපකාරී සාක්ෂි)<br>විමර්ශන සටහන් නිවැරදිව වාර්තා කිරීම සහ අපරාධ සිදුවීම් නිරීක්ෂණය කිරීම. |
|---|

2. තොරතුරු අවශ්‍යතා සපුරාලන බවටත් තොරතුරු අදාළ බවටත් වග බලා ගන්න.

| වරදකරු හඳුනා ගැනීම අවශ්‍ය වන තොරතුරු (ශරීරයේ ඇති පච්ච සලකුණු, ඇඳුම් ආදී ) |
|---|

3. තොරතුරු සංවිධානය කිරීම

| |
|---|
| එක් සිද්ධියක් සඳහා එක් ගොනුවක් (ෆෝල්ඩරයක්) භාවිතා කරන්න, පහසු යොමු කිරීම සඳහා තොරතුරු පොත් අංක ලැයිස්තුගත කරන්න |

**III. බෙදා හැරීම**

- උසස් නිලධාරියෙකු විසින් තොරතුරු තහවුරු කර ඇති බවට සහ අනුමැතිය ලබා දී ඇති බවට සහතික වන්න (තොරතුරු බෙදා හැරීමට පෙර). විශේෂයෙන් ගෝලීය වශයෙන් තොරතුරු බෙදා හැරීමට ඔබට සිදුවුව හොත් දත්ත වලංගු කරන්න.
- කෙසේ වෙතත් තොරතුරු බෙදා හැරීම සඳහා වන සංවර්ධනය කරමින් පවතින ක්‍රියා පටිපාටියක් නොමැත.

***b.* සාමාන්‍ය ජනතාවට අදාළ බලධාරීන් වෙත තොරතුරු සැපයිය හැකි ආකාරය**

ශ්‍රී ලංකාවේ ඕනෑම පුද්ගලයෙකුට අපරාධයක් වාර්තා කිරීමට හෝ ආධාර ලබා ගැනීමට 119 අංකයෙන් පොලිස් හදිසි පාලන අංශය ඇමතිය හැකි ය. 2004 ට පෙර ශ්‍රී ලංකාවේ සංවිධානාත්මක පොලිස් හදිසි සේවාවක් නොතිබුණි. 2004 ට පෙර
011-2433333 හරහා හදිසි සේවය ලබා දී ඇත්තේ පුරවැසියන්ට (විදේශිකයන් ද ඇතුළුව) පමණි.

මෙම හදිසි ඇමතුම් මධ්‍යස්ථානය පිහිටා තිබුණේ පොලිස් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ය. පොලිස් හදිසි සේවය (119) 2004 නොවැම්බර් 8 වන දින මිරිහාන පිහිටි පොලිස්පතිවරයාගේ අණදෙන හා තොරතුරු අංශයේ පිහිටුවන ලදී. එතැන් සිට, මෙම සේවාව හදිසි අවස්ථාවක දී 119 ඇමතීම සඳහා ඕනෑම තැනැත්තෙකුට පහසුකම් සපයන අතර, එහිදී පොලිස් ප්‍රතිචාර කණ්ඩායම වහාම එම ස්ථානයට පැමිණෙනු ඇත.

**තවද ජාතික ළමා ආරක්ෂක අධිකාරිය (NCPA) විසින් වෙළඳාමට කිරීමේ වැඩි අවදානමක් ඇති ළමුන් හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර තිබේ. මෙම පද්ධතියට ගම් මට්ටමින් අනතුරු ඇඟවීම් කණ්ඩායම් සහ පාසල් ළමා ආරක්ෂක කමිටු ඇතුළත් වේ. එසේම NCPA හදිසි ඇමතුම් අංක 1929 හරහා ළමා අපයෝජන වාර්තා කිරීම සඳහා මහජනතාවට ක්ෂණික සහාය ඉල්ලා සිටිය හැකි ය.**

මහජනතාවට **1938** හරහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයෙන්ද සහාය ඉල්ලා සිටිය හැකි ය.

0112369800 හදිසි ඇමතුම් අංකයෙන් මහජන පැමිණිලි කම්කරු දෙපාර්තමේන්තුවේ ළමා හා කාන්තා අංශය වෙත ද යොමු කළ හැකි ය.

**ඇ. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන සංවිධාන, මාධ්‍ය වෙත තොරතුරු මුදා හැරීම සලකා බැලීම සහ මහජනතාවගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂණ ගැටළු**

මිනිස් වෙළඳාම පිළිබඳ සංකීර්ණ ගැටලුවට එරෙහිව සටන් කිරීම සඳහා අදාළ සියලු බලධාරීන්ගේ බහු-ආංශික සහභාගීත්වයේ වැදගත්කම අවබෝධ කරගත් ශ්‍රී ලංකා රජය, අධිකරණ අමාත්‍යාංශයේ නායකත්වය යටතේ සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහ සංක්‍රමණ සඳහා වන අන්තර්ජාතික සංවිධානයේ තාක්ෂණික සහය යටතේ සියලු ම පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය වැඩි කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා ඇත. එබැවින් 2010 ඔක්තෝම්බර් මාසයේ දී ජාතික මිනිස් වෙළඳාම මර්දන කිරීමේ ජාතික කාර්ය සාධක බලකායක් දියත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ මානව වෙළඳාම විසඳීම සඳහා ගනු ලබන සියලු මුලපිරීම් සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රමුඛ රාජ්‍ය ආයතනය වන්නේ අධිකරණ අමාත්‍යාංශයයි. මානව වෙළඳාම පිළිබඳ ගැටලුව ආමන්ත්‍රණය කිරීමේ දී සියලු ප්‍රධාන පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය හා සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය 2010 දී මිනිස් වෙළඳාම් මර්දනය කිරීමේ ජාතික කාර්ය සාධක බලකායක් පිහිටුවා තිබේ. කාර්ය සාධක බලකායේ සාමාජිකයින් මාසිකව රැස්වී තොරතුරු හා යහ භාවිතයන් සම්බන්ධව සහභාගී වන පාර්ශ්වකරුවන් අතර තොරතුරු බෙදා ගනී. දුරකථනඃ +94 (0) 11532 5300

රජයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම, නඩු පැවරීම්වල සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම සහ වින්දිතයින්ගේ ආරක්ෂාව වැඩි දියුණු කිරීම අරමුණු කර ගනිමින් මෙම කාර්ය සාධක බලකාය දියත් කරන ලදී. වැළැක්වීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීමේදී ද කාර්ය සාධක බලකාය ප්‍රයෝජනවත් වනු ඇත. මූලික රාජ්‍යමය කොටස්කරුවන් අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීමේ අදහසින් මෙම විශේෂ කාර්ය බලකාය පිහිටුවන ලදී.

කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වන්නේ ;

- විදේශ කටයුතු අමාත්‍යාංශය
- ආරක්ෂක අමාත්‍යාංශය
- කාන්තා කටයුතු හා ළමා සංවර්ධන අමාත්‍යාංශය,
- නීතිපති දෙපාර්තමේන්තුව
- කම්කරු අමාත්‍යාංශය
- සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශය
- අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව
- පොලිස් අපරාධ අංශය
- ආගමන හා ආගමන දෙපාර්තමේන්තුව
- පොලිස් කාන්තා හා ළමා කාර්යාංශය
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- පොලිස් අපරාධ වාර්තා අංශය
- පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
- ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී

- තවද, අධිකරණ අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය, කම්කරු සබඳතා අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, සේවක හා සේවා යෝජකයන්ගේ සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන ඇතුළු අදාළ රාජ්‍ය ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විතව කම්කරු දෙපාර්තමේන්තුව විසින් 'ළමා ශ්‍රමය වැළැක්වීම සහ තුරන් කිරීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවක්' යන අන්තර් ආංශික උපදේශක කමිටුවක් පිහිටුවන ලදී. ළමා ශ්‍රමයේ නරකම ආකාර පිළිබඳ ශ්‍රී ලංකාවේ මග සිතියම 2016 සම්බන්ධයෙන් තවදුරටත් කටයුතු කිරීමට කමිටුව පිහිටුවන ලදී. මේ මගින් ගැටුම්වලින් පීඩාවට පත් කලාපවල, වතු කලාපවල සහ දුප්පත් ග්‍රාමීය ප්‍රදේශවල ළමයින් වෙළඳාමට ලක් වීමට සහ ශ්‍රම සූරාකෑමේ හා ගණිකා වෘත්තියට ගොදුරු වීමට වැඩි අවදානමක් ඇති අය ලෙස හඳුනා ගනී. 2010 ඔක්තෝම්බර් මාසයේ දී පිහිටුවන ලද ජාතික මෙහෙයුම් කමිටුව සාමාජිකයින් අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කර ඇති අතර, එහි සාමාජික සංවිධානවල ප්‍රතිපත්ති හා වැඩසටහන් තුළට ළමා ශ්‍රම ගැටලු ආදී කරුණු ආමන්ත්‍රණය කළ හැකි ක්‍රමවේද ඒකාබද්ධ කිරීමට පහසුකම් සපයයි.
- අධිකරණ අමාත්‍යාංශය ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග එක්ව 2010 මාර්තු මාසයේදී පුද්ගලයින් වෙළඳාම් කිරීම පිළිබඳ පවත්නා නීති සම්පාදනය පිළිබඳ ජාතික පාර්ශවකරුවන්ගේ උපදේශන සැසියක් පවත්වන ලදී. මෙහි අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ මානව වෙළඳාම පිළිබඳ නීති එම විෂයයට අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වන්නේදයන්න සමාලෝචනය කිරීමයි. මෙම සැසියට නීතිපති දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, පොලීසිය, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, විදේශ කටයුතු අමාත්‍යාංශය, කම්කරු, කාන්තා කටයුතු හා ළමා සංවර්ධන අධිකාරිය සහ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් සහභාගී වූහ. මෙම උපදේශනයෙන් පසුව, ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැලසීම සහ පුද්ගලයන් වෙළඳාම පිළිබඳ ILO

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශයේ සහ ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම සභාපතිත්වය යටතේ පුද්ගලයන් වෙළඳාම පිළිබඳ මෙහෙයුම් කමිටුවක් පිහිටුවන ලදී.

- සංක්‍රමණිකයින් ලෙස යෑමට අපේක්ෂිත අයට මෙන්ම නැවත පැමිණෙන අයටද උපදේශන ආධාර සැපයීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය දිවයින පුරා පිහිටි සම්පත් මධ්‍යස්ථාන විසිපහක ක්‍රියාත්මක වන විශේෂ පුහුණුව ලත් උපදේශන නිලධාරීන් සේවයේ යොදවා ඇත. සුමිත්‍රයෝ, සහනපියස, Women in Need සහ සහනය වැනි වෙනත් සංවිධාන විසින් සපයනු ලබන උපදේශන සේවා වෙත යොමු කිරීමෙන් අවශ්‍යතා ඇති අයට තවදුරටත් සහාය වීම සඳහා ඔවුන් ඒ වෙත යොමු කිරීමේ පද්ධතියක් ද පවත්වාගෙන යයි. එවැනි ආයතන පූර්ව, පශ්චාත් සහ නඩු විභාගය වන කාලය අතරතුරදී පහසුකම් ලබා දීම සිදු කරනු ලැබේ.
- 1978 අංක 27 දරණ නීතිය යටතේ ස්ථාපිත කරන ලද ස්වාධීන ව්‍යවස්ථාපිත සංවිධානයක් වන ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවෙන් ප්‍රජාවේ වරප්‍රසාද නොලත් කොටස්වලට නොමිලේ නෛතික ආධාර සහ උපදෙස් ලබා ගත හැකි ය. එහි පරමාර්ථය වනුයේ සුදුසුකම් ලත් පුද්ගලයින්ට නීති උපදෙස් ලබා දීමෙන්, ඔවුන් නියෝජනය කිරීම සඳහා නීතිඥයින්ගේ සේවය ඇතුළුව නඩු පැවරීමේ සහාය ලබා දීමෙන් හා එවැනි කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් ආධාරවලින් ද කාර්යක්ෂම නීති ආධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමයි. දිවයින පුරා පිහිටි සියලුම මහාධිකරණවල පාහේ මෙහි ශාඛා ක්‍රියාත්මක වේ. නීති ආධාර කොමිෂන් සභාවේ සේවය කරන පළපුරුදු නීතිඥයින්ගේ කමිටුවකට නීති ආධාර අවශ්‍ය අයට නොමිලේ ප්‍රවේශ විය හැකි ය.
- දිවයින පුරා පිහිටුවා ඇති සියලු ම රජයේ රෝහල්වල වෛද්‍ය පහසුකම් සහ උපදේශන සේවා නොමිලේ ලබා ගත හැකි ය.
- ඉහත සඳහන් කළ පරිදි, මානව වෙළඳාමේ ක්‍රියාවලියට එරෙහිව ක්‍රියා කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් ඇත. වින්දිතයාගේ උපරිම යහපත සඳහා නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන්ට ආයතන අතර තොරතුරු බෙදා ගැනීමට සිදු වේ. කෙසේ වෙතත්, සෑම පාර්ශවයක් ම සෑම විටම වින්දිතයාගේ ගෞරවය ආරක්ෂා කළ යුතු ය.

ශ්‍රී ලංකාවේ දරුවන්ට උපකාර කරනු ලබන සක්‍රීය රාජ්‍ය නොවන සංවිධාන ලැයිස්තුව මෙසේ දැක්විය හැක.

- UNICEF
- Save the Children
- LEEDS
- CARE
- World Vision International

## 7.5 වගකිවයුතු වාර්තාකරණය සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා මාධ්‍යයේ කාර්යභාරය

ජනමාධ්‍යවේදීන් සඳහා වන ආචාර ධර්ම පද්ධතියට අනුව ලිංගික අපරාධවලට ගොදුරු වූවන්ගේ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම තහනම් කරයි. නමුත් ළමා වින්දිතයා සම්බන්ධ නිශ්චිත විධිවිධාන නොමැත.

| |
|---|
| **රජයේ දැනුම් දීම්. ශ්‍රී ලංකා පුවත්පත් කවුන්සිලය විසින් 1973 අංක 5 දරණ ශ්‍රී ලංකා පුවත්පත් කවුන්සිල නීතියේ 30(i) (අ) වගන්තිය යටතේ ජනමාධ්‍යවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය සකස් කර ඇති අතර එම නීතියේ 30 (3) වගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.**<br><br>**6 (1) අපරාධ හෝ අපරාධ නඩු වාර්තා කිරීම හෝ මුද්‍රණය කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් මාධ්‍යවේදියෙකු ලිංගික අපරාධවලට ගොදුරු වූවන් නම් කිරීම නොකළ යුතුය** |

ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 286 වන වගන්තිය යටතේ ළමයින් සම්බන්ධ ප්‍රකාශනය සම්බන්ධයෙන් කටයුතු කරන නමුත් මෙම විධිවිධානය තුළ රහස්‍යභාවය පිළිබඳ ප්‍රතිපාදන ප්‍රමාණවත් නැත.



***තොරතුරු වාර්තා කිරීම සහ බෙදා හැරීම සඳහා මෙවලම්***

**අ. තොරතුරු වලංගු කිරීම, වාර්තා කිරීම සහ බෙදා හැරීම**

- තොරතුරු වලංගු කිරීම සඳහා නිලධාරීන් විසින් දැනට ක්‍රමවේදයක් සකස් කර නොමැත. එබැවින් තොරතුරු වලංගු කිරීමේ වැදගත්කම සාකච්ඡා කළ යුතු අතර සාකච්ඡාව තුළ සහභාගිවන්නන්ගේ පවත්නා දැනුම භාවිතා කළ යුතු ය. (මිනිත්තු 15)

ප්‍රක්ෂේපන තිරය 14

උදාහරණයඃ අපරාධ පරීක්ෂණයක දී සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ පටිගත කිරීමේ දැනුම පොලිස් නිලධාරීන්ට ඇත. නමුත් ඒවා පටිගත කිරීම අවශ්‍ය නිසා පමණක් ම ප්‍රකාශය පටිගත කිරීම කිසිදු තොරතුරක් වලංගු කිරීමට උපකාරී නොවේ. වින්දිතයාගේ ප්‍රධාන ප්‍රකාශය හැරුණු විට අනෙක් සාක්ෂිකරුවන්ගේ අනෙකුත් ප්‍රකාශයන් වින්දිතයාගේ ප්‍රකාශය තහවුරු කිරීමේ වටිනාකමකින් යුක්ත විය යුතු ය.
මොඩියුලයේ දක්වා ඇති රජයේ සහ රාජ්‍ය නොවන සංවිධාන ලැයිස්තුව මගින් ඔවුන්ගේ කාර්යය සහ මැදිහත්වීම් පිළිබඳව කෙටියෙන් හඳුන්වා දෙන්න. (මිනිත්තු 15)
(මිනිත්තු 30)

**ආ. සාමාන්‍ය ජනතාවට අදාළ බලධාරීන් වෙත තොරතුරු සැපයිය හැකි ආකාරය**

- සහභාගී වන්නන් සමග විවෘත සාකච්ඡාවක් හරහා එකතු කරනු ලබන අදහස්, ප්‍රක්ෂේපන ඉදිරිපත් කිරීමක් මගින් තහවුරු කරන්න. (මිනිත්තු 20)

ප්‍රක්ෂේපන තිරය 15

**ඇ. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය නොවන සංවිධාන, මාධ්‍ය සඳහා තොරතුරු මුදා හැරීම පිළිබඳව සලකා බැලීම සහ මහජනතාවගේ පෞද්ගලිකත්වය සහ ආරක්ෂණ ගැටළු සඳහා තොරතුරු මුදා හැරීම** (මිනිත්තු 15)

**ඈ. වගකිවයුතු වාර්තාකරණය සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා මාධ්‍යයේ කාර්යභාරය.** (මිනිත්තු 15)

- වීඩියෝ පටය වාදනය කරන්න (මිනිත්තු 4) - 25 Painfully Disturbing Facts About Human Trafficking - https://www.youtube.com/watch?v=dqCSgCDGNT8
- සිද්ධි අධ්‍යයනය (මිනිත්තු 15)
- පුද්ගලිකත්වය සහ ආරක්ෂණ ගැටළු පිළිබඳ තනි පුද්ගලයන් සතු දැනුම පරීක්ෂා කිරීම (මිනිත්තු 10)
- කුඩා කණ්ඩායම් සාකච්ඡා (විනාඩි 15)
- ප්‍රතිපෝෂණ සැසිය (මිනිත්තු 15)

(මිනිත්තු 45)

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල,

ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

011 - 2778911-12 -14

011 - 2778915 / 011 - 2778767

ncpa@childprotection.gov.lk

chairman@childprotection.gov.lk

chairman.ncpa@gmail.com

www. childprotection.gov.lk


9789551417314